ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික වගා රක්ෂණය පිළිබඳ අධ්‍යයනය

රෝෂිණී රඹුක්වැල්ල
රුවිනි විදානපතිරණ
ටී.ජී. සෝමරත්න

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත
කොළඹ 07

22323

368.5
(5L)
හෙක්ට

රු. 250/-

ISBN No: 978-955-612-106-3

2009/06
2010/04

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික වගා රක්ෂණය පිළිබඳ අධ්‍යයනය

MFN 11006

රෝෂිණී රඹුක්වැල්ල
රැවිනි විදානපතිරණ
ටී.ජ්. සෝමරත්න

පර්වර්තන අංක: 02

2009 පෙබරවාරි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිර්මේ ආයතනය
114, විජේරාම මාවත
කොළඹ 07

22323
22323

පළමු මුද්‍රණය 2009 පෙබරවාරි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ අංක 122 වූ "Evaluation of Crop Insurance Schemes in Sri Lanka" නමැති ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය.

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියළුම හිමිකම් ඇවිරිණි

ISBN No: 978-955-612-106-03

පිට කවරය නිර්මාණය: බිමාලි මුණසිංහ

පෙරවදන

කෘෂිකර්මාන්තය යනු නිරන්තරයෙන් අවදානමක් සහිත වූ ව්‍යාපාරයකි. උසස් තත්ත්වයේ බීජ, රසායනික ද්‍රව්‍ය සහ මනා කළමනාකාරීත්වයක් සහිත ව වගා කිරීමට පුද්ගලයෙකු හට හැකියාව පැවතිය ද අයහපත් කාලගුණික විපර්යාසයන් හමුවේ ඔහුගේ වගාවන් ක්ෂණිකව විනාශ විය හැක. එසේම කාලගුණික වෙනස් වීම් තුළින් ඇතිවන බාධාවන්ට, කෘෂි උවදුරු හා පළිබෝධ හානිවලට, වෙනත් ස්වාභාවික උපද්‍රව සහ අනපේක්ෂිත මිල උච්චාවචනයන්ට ගොවීහු නිරතුරුව ම ගොදුරු වෙති. ඒ අනුව ඕනෑම භෝග හානියක් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ සමාජ-ආර්ථික ව්‍යුහය වෙත ඉතාමත් අහිතකර අයුරින් බලපානු ලබයි.

කෘෂිකාර්මික රක්ෂණය යනු මෙම වගා හානි තුළින් සිදුවන අනපේක්ෂිත අවදානම අවම කිරීමේ එක් ක්‍රමෝපායයකි. ස්වාභාවික උපද්‍රවයන් හේතුවෙන් සිදුවන වගා හානිවල දී ගොවීන්ට වන්දි ලබා දීම මගින් ඔවුන්ගේ ආදායම් ස්ථායීතාවය තහවුරු කිරීම, නිෂ්පාදනය වැඩි දියුණුවන ආකාරයේ සහ සම්පත් ඵලදායී ලෙස යොදාගත හැකි වන ආකාරයේ දියුණු තාක්ෂණික ක්‍රම යොදාගැනීමට ගොවීන් තුළ පවතින අවදානම අවම කිරීම, ණය සපයන මූල්‍ය ආයතනවල ආයෝජන අවදානම අවම කිරීම හරහා වගා ණය ලබා ගැනීමට වැඩි අවස්ථාවක් සපයා දීම යන අරමුණු, කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයේ ප්‍රධාන අරමුණු වශයෙන් හැඳින්විය හැක.

මෙවන් වූ වාතාවරණයක ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපෘතිය පිළිබඳ කෙරුණු මෙම ඇගයීම වඩාත් උචිත හා කාලීන භාවයෙන් යුක්ත වූ ප්‍රයාමයක් විය. මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු වී ඇත්තේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් ක්‍රියාත්මක කෙරෙන වී වගා රක්ෂණය කෙරෙහි වන අතර එහි වර්තමාන ක්‍රියාකාරීත්වය, ගැටළු සහ අනාගත අපේක්ෂාවන් ඇගයීමට ලක් කිරීමට ද අධ්‍යයනය තුළින් උත්සාහ කෙරේ.

වගා රක්ෂණ ක්‍රමය සම්බන්ධයෙන් ගොවීන් මුහුණ දෙන ගැටලු, රක්ෂණ ක්‍රමය සම්බන්ධයෙන් ඔවුන් තුළ පවතින දැනුවත්භාවය සහ එය වැඩි දියුණු කිරීමට ගොවීන් ඉදිරිපත් කළ යෝජනා පිළිබඳවත්, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ රක්ෂණ ක්‍රමයන්හි පවතින සමානතා සහ වෙනස්කම් පිළිබඳවත් අධ්‍යයනය තුළින් සොයා ගනු ලැබූ කරුණු අතර වේ. එමෙන්ම අධ්‍යයනය තුළින් හෙළි වූ තවත් කරුණක් වූයේ, මුල් කාලීනව වගා රක්ෂණ ක්‍රමයේ සාර්ථකත්වයක් දැකිය හැකි වුවත්, පසු කාලීනව එහි අරමුණු කරා ළඟා වීමේ පසුබෑමක් විද්‍යාමාන කරන බවකි. 2004/05 මහ කන්නයේ රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශය තුළ ම රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය 2% ක් පමණි. ගොවීන්ගෙන් 99% ක් ම වගා රක්ෂණ ව්‍යාපෘතිය සඳහා දායක වී ඇත්තේ හුදෙක් ඔවුන්ගේ වගා හානි හෝ අවදානම් අවම කරගැනීමේ අරමුණ ඉටුකර ගැනීමට නොව, වගා ණය ලබාගැනීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහාය. ඒ අනුව පෙනී යන්නේ කෘෂිකාර්මික රක්ෂණය යනු හුදෙක් ඉල්ලුම මත පදනම් වූ ප්‍රතිපත්තියක් නොවන බවයි.

මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් තුළින් ශ්‍රී ලංකාවේ වගා රක්ෂණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයට සහ සංවර්ධන සැලසුම් සඳහා උපකාර වනු ඇතැයි මම විශ්වාස කරමි.

වී.කේ. නානායක්කාර
අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ස්තුතිය

මෙම අධ්‍යයනය සඳහා මූල්‍ය අනුග්‍රහය සැපයූ කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ විධායක අධ්‍යක්ෂ මහාචාර්ය එච්.පී.එම්. ගුණසේන මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මෙම පර්යේෂණ වාර්තාව සිංහල භාෂාවට පරිවර්තනය කර පළ කිරීමට උනන්දු කළ සහ ඒ සඳහා අවශ්‍ය පරිපාලනමය පහසුකම් සපයා දෙමින් නිතරතුරුව අප දිරිමත් කළ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ ටී.කේ. නානායක්කාර මහතාට සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එල්.පී. රූපසේන මහතාටත් අපගේ හෘදයාංගම ස්තුතිය පිරි නැමේ. එමෙන්ම තම කාලය කැප කරමින් උසස් මාර්ගෝපදේශකත්වයක් සපයමින් පර්යේෂණ සඳහා විවිධ අයුරින් සහාය දැක් වූ ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ හිටපු අංශ ප්‍රධාන සී.පී. චිත්‍රා හතුරුසිංහ මහත්මියටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කිරීමේදී සංඛ්‍යාන නිලධාරී නාලක විජේසූරිය මහතා විසින් ලබා දුන් සහයෝගය උසස් ලෙස අගයන අතර තොරතුරු රැස් කිරීමේ කාර්යයෙහි නියැලුණු පර්යේෂණ සහකාරවරුන් වූ ජේ.කේ.එම්.ආර්.කේ. රණසිංහ, ඩබ්.ඒ.එස්. ඉරෝෂන්, එල්. රත්නවීර සහ ඩබ්.ආර්.යූ. සමන්ති නිරෝෂා මහත්ම මහත්මීන්ටත් අපගේ ස්තුතිය පිරි නැමේ. තවද, ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කිරීමේදී සහාය ලබා දුන් ඩබ්. එච්. ඩී. දුමින්ද ප්‍රියදර්ශන මහතාට ද අපගේ ස්තුතිය පිරිනැමේ.

දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කළ සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශයේ ජ්‍යෙෂ්ඨ දත්ත විශ්ලේෂක එම්.එල්.ඩී. සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අපගේ ස්තුතිය පිරි නැමෙන අතර, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ, යූ.ඒ. නන්දසේන මහතා (සාමාන්‍යාධිකාරී), කේ.බී.එස්. සෝමරත්න මහත්මිය (අධ්‍යක්ෂ/සංවර්ධන අංශය), ආර්.බී. විජේකෝන් මහතා (අධ්‍යක්ෂ, පර්යේෂණ අංශය) එස්. වීරසිංහ මහතා (අධ්‍යක්ෂ, පශු සම්පත් අංශය) යූ.ඒ. චන්ද්‍රදාස (අධ්‍යක්ෂ, ගොවි විශ්‍රාම අංශය) සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ, ප්‍රධාන කාර්යාලයේ සියළුම කාර්ය මණ්ඩලයට තොරතුරු රැස් කිරීමේ දී ලබාදුන් සහයෝගයට ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කොට ගැනේ. එමෙන්ම ක්ෂේත්‍ර මට්ටමේ තොරතුරු රැස් කිරීමේදී තම වටිනා කාලය කැප කරමින් අවශ්‍ය සහාය ලබාදුන්, කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂවරුන්, ක්ෂේත්‍ර නිලධාරීන්, දිස්ත්‍රික් නිලධාරීන්ටත් කුරුණෑගල, අනුරාධපුර, මනම්පිටිය, පොලොන්නරුව සහ හම්බන්තොට ප්‍රදේශයන් හි ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ට අයත් සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් අපගේ කෘතඥතාව පිරිනැමේ. එමෙන්ම දත්ත හා තොරතුරු රැස්කිරීමේදී සහාය ලබාදුන් සෙලින්කෝ රක්ෂණ සමාගමෙහි තාක්ෂණික කළමනාකරු රුවන් හේමගේ මහතාට සහ එම කාර්ය මණ්ඩලයට ද විශේෂ ස්තුතිය පිරිනැමේ.

මෙම වාර්තාවෙහි සංස්කරණ කටයුතු සිදු කළ පර්යේෂණ නිලධාරිණී සුසිලා ලූර්දු මහත්මියට ද අපගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමේ. එසේම මෙම වාර්තාවෙහි පරිගණක ගත කිරීමේ කාර්යය ඉතා මැනවින් ඉටු කළ ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ චන්ද්‍රානි නානායක්කාර මහත්මිය සහ එච්.ඒ.ඩී. පෝෂිනී සාංජනා මෙනවියටත් අපගේ ස්තුතිය පිරිනැමේ. මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ මහත් උනන්දුවකින් කටයුතු කළ ප්‍රකාශන ඒකකයේ වැඩ බලන අංශ ප්‍රධාන එස්. රාමේස්වරන් මහතාටත්, මෙම වාර්තාවේ මුද්‍රණය කිරීමේ කටයුතු ඉටු කළ මුද්‍රණ ඒකකයේ කාර්ය මණ්ඩලයටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

රෝෂිණී රඹුක්වැල්ල (පර්යේෂණ නිලධාරිණී)
රුවිනි විදානපතිරණ (පර්යේෂණ නිලධාරිණී)
ටී. ඒ. සෝමරත්න (පර්යේෂණ නිලධාරී)

කෙටි යෙදුම්

AIB	-	Agricultural Insurance Board (කෘෂිරක්ෂණ මණ්ඩලය)
AAIB	-	Agricultural and Agrarian Insurance Board (කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය)
CICL	-	Ceylinco Insurance Company Limited (සෙලින්කෝ රක්ෂණ සමාගම)
LNR	-	Loss Notification Register (හානි දැනුම් දීමේ ලේඛණය)
IPR	-	Indemnity Payment Register (වන්දි ගෙවීමේ ලේඛණය)
IDA	-	International Development Agency (අන්තර් ජාතික සංවර්ධන ආයතනය)
HARTI	-	Hector Kobbekaduwa Agrarian Research and Training Institute (හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය)
කෘ. ගො. ර. ම.	-	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

සාරාංශය

කෘෂිකර්මාන්තය සාපේක්ෂ ව ඉහළ අවදානමක් සහ අස්ථිරභාවයක් හා බැඳී පවතින්නකි. ශ්‍රී ලංකාවේ දුප්පත් ජන කොටසක් වශයෙන් සැලකෙන ගොවීන්, අනපේක්ෂිත අයුරින් සිදුවන මිල උච්චාවචනයන්ට අමතර ව කාලගුණික වෙනස් වීම් තුළින් සිදු වන බාධා, භෝග සඳහා වැළදෙන රෝග හා අනිකුත් ස්වභාවික උපද්‍රව තුළින් පීඩා විඳිනු ලබති. ගොවීන්ගෙන් 75%කට ත් වඩා පිරිසක් ඉඩම් හෙක්ටයාර් 1කට වඩා අඩු ඉඩම් හිමියන් වන අතර, වර්ෂයකට කන්න 2ක් තුළ තම ප්‍රධාන ආදායම ගොවිතැන තුළින් උපයාගනී. භූමිය, ඔවුන්ගේ ප්‍රධාන ප්‍රාග්ධනය වශයෙන් සැලකිය හැකිය. ඒ අනුව යම් භෝගයක් සඳහා වන අලාභයක් හෝ හානියක්, ග්‍රාමීය ප්‍රදේශවල ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය කෙරෙහි අහිතකර අන්දමින් බලපානු ලබයි. ජපානයට පසු දකුණු ආසියාතික රටවලින් කෘෂිකර්මික අංශයේ නියැළි ප්‍රජාවට සිය භෝග සඳහා ගංවතුර, නියඟ, කෘමි හානි, ලෙඩරෝග, වන සතුන්ගේ වන හානි සඳහා කෘෂිකාර්මික රක්ෂණයක් හඳුන්වා දුන් ප්‍රථම රට වශයෙන් ශ්‍රී ලංකාව හැඳින්විය හැකිය.

කෘෂිකාර්මික රක්ෂණය වගා හානියක දී සිදුවන හානිය අවම කරමින් සහනයක් සැලසීම සඳහා භාවිතා කළ හැකි එක් ක්‍රමෝපායකි. ස්වභාවික උපද්‍රවයක් හේතුවෙන් සිදු වන වගා හානියක දී ගොවීන්ට වන්දි ලබා දීම මගින් ඔවුන්ගේ ආදායම් ස්ථායිතාවය ඇති කිරීම, නිෂ්පාදනය වැඩි දියුණු වන ආකාරයේ හා සම්පත් ඵලදායක ලෙස යොදාගත හැකි වන ආකාරයේ දියුණු තාක්ෂණික ක්‍රම යොදා ගැනීමට ගොවීන් තුළ පවතින ආයෝජන අවදානම අවම කිරීම, ණය දෙන මූල්‍ය ආයතනවල අයෝජන අවදානම අඩු කිරීම තුළින් ගොවීන්ට වගා ණය ලබා ගැනීම සඳහා වැඩි අවස්ථාවක් ලබා දීම වැනි අරමුණු කෘෂිකර්ම රක්ෂණ ක්‍රමයක ප්‍රධාන අරමුණ වශයෙන් සැලකිය හැකිය.

වගා රක්ෂණ ක්‍රමයකින් අපේක්ෂා කරන ප්‍රතිලාභ න්‍යායාත්මකව මනාව පැහැදිලි කොට ඇත. ග්‍රාමීය කෘෂිකාර්මික අංශයේ ඵලදායකත්වය ඉහළ නැංවීම පිණිස කෘෂිකාර්මික රක්ෂණය ක්‍රමයකින් ලැබෙන සහාය ඉතාමත් වැදගත්ය. එය ග්‍රාමීය කෘෂි ප්‍රජාවට පමණක් නොව, සමස්ත ප්‍රජාවට ම වක්‍ර වශයෙන් ප්‍රතිලාභ අත්කර දෙනු ලබයි. විශාල වශයෙන් පැතිරුණු වගා හානියකදී සිය ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය වන ග්‍රාමීය ප්‍රජාවට එය සෘජුව ම බලපාන අතර එම තත්ත්වය අනිකුත් අංශවල නිපදවනු ලබන භාණ්ඩ සඳහා පවතින ඉල්ලුමේ අඩු වීම කෙරෙහි ද බලපානු ලබයි. මේ අනුව යම් මට්ටමකින් ගොවීන්ගේ ආදායම් ස්ථායීතාවය, මුළු මහත් ආර්ථිකයේ ම ස්ථායීතාවයට යම් පමණකින් හෝ දායක වනු ලබයි.

1958 මහ කන්නයේ සිට ශ්‍රී ලංකාවේ කෘෂිකර්මික රක්ෂණ ක්‍රමය ආරම්භ වූයේ නියමු ව්‍යාපෘතියක් වශයෙනි. මෙහි දී දිස්ත්‍රික්ක පහක් තුළ වී වගා අක්කර 26,000 ක් රක්ෂණය කරන ලදී. 1974 වර්ෂයේ දී යල සහ මහ දෙකන්නය තුළම මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයක් රක්ෂණ ආවරණයට යටත් කර ගන්නා ලදී. 1974 අංක 27 දරණ කෘෂිරක්ෂණ පනත මගින් කෘෂිරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලද අතර, වී, අතිරේක භෝග හා පශු සම්පත් යන ක්ෂේත්‍ර සඳහා රක්ෂණ ආවරණය සැපයීම ආරම්භ කරන ලදී. 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මගින් රක්ෂණ කටයුතු වඩාත් පුළුල් කරන ලද අතර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට රක්ෂණ කටයුතු පවරන ලදී. මෙහි දී රක්ෂණ කටයුතු ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ පුළුල් ව ව්‍යාප්ත කරන ලද අතර රක්ෂණ මණ්ඩලය ස්වයං මූල්‍ය පදනමක් මත ක්‍රියාත්මක වන්නක් බවට පත් කරන ලදී.

දශක හතරකටත් වඩා වැඩි කාලයක් තුළ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක වුව ද, ඒ සඳහා ගොවීන්ගේ සහභාගීත්වය ඉතාමත් අවම මට්ටමක පවතී. 2005 වර්ෂයේ වගා රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය, මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 1% ක් පමණි. වාර්ෂිකව වගා කළ වී බිම් ප්‍රමාණයට සාපේක්ෂ ව රක්ෂිත බිම් ප්‍රමාණය ඉතා අවම ප්‍රතිශතයක් වන අතර එය ක්‍රමික ව පහළ යමින් ද පවතී. මෙම ක්‍රමික පහළ යාම නොසලකා හරිමින් රජය විසින් වගා රක්ෂණය දියුණු කිරීම සඳහා වැඩි අයෝජනයක් සිදු කරන ලදී. 1999 නව පනත මඟින් පෞද්ගලික අංශයටද රක්ෂණ කටයුතු සඳහා නියැළීමට අවස්ථාව ලබා දෙන ලදී. කෙසේ නමුත් එය අපේක්ෂිත මට්ටමින් සාර්ථක නොවූ අතර වර්තමානය වන විටත් කෘෂි රක්ෂණ ක්ෂේත්‍රයේ නියැළි එක ම පෞද්ගලික රක්ෂණ ආයතනය සෙලින්කෝ රක්ෂණ සමාගමයි. කෘෂිකර්මික ක්ෂේත්‍රයේ වැඩි ආයෝජනය, ගොවීන්ගේ ආදායම් ස්ථායිතාවය, නිෂ්පාදන නැංවීම සහ රාජ්‍ය වියදම් අවම කිරීම· කෘෂි රක්ෂණයක ප්‍රධාන කරුණු වශයෙන් සැලකිය හැකි අතර, රජය මෙය ව්‍යාප්ත කර සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන බැවින් ඒ සඳහා ගොවීන්ගේ සහභාගීත්වය අඩු වීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් ක්‍රියාත්මක වන වගා රක්ෂණ ක්‍රමයේ වර්තමාන ක්‍රියාකාරීත්වය, ගැටළු සහ විභවතා පිළිබඳ අධ්‍යයනය මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර, වර්තමානයේ ක්‍රියාත්මක වගා රක්ෂණ ක්‍රමයේ බාධාවන් සහ ගැටලු සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වත්මන් ක්‍රියාකාරීත්වය හා සංවිධාන ව්‍යුහය සම්බන්ධව අධ්‍යයනය කිරීම, වගා රක්ෂණ ක්‍රමය සම්බන්ධ ව ගොවීන්ගේ දැනුවත් භාවය පිළිබඳ අධ්‍යයනය කිරීම, වගා රක්ෂණයට දායක වී ඇති ගොවීන්ගේ ස්වභාවය සහ රක්ෂණයට දායක වීමට හේතු අධ්‍යයනය කිරීම, රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ රක්ෂණ ක්‍රමයන්හි පවතින සාමාන්‍ය හා වෙනස්කම් අධ්‍යයනය කිරීම සහ පවතින වී වගා රක්ෂණ ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සෙසු අරමුණු වෙයි.

මෙම අධ්‍යයනය, ප්‍රධාන වශයෙන් වී වගා රක්ෂණය හා සම්බන්ධ වන බැවින් වී වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක හතරක් වන අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා තෝරා ගන්නා ලදී. සරල සසම්භාවී නියැදි ක්‍රමය අනුව නියැදිය තෝරා ගන්නා ලදී. ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිතා කළ අතර, ක්ෂේත්‍ර අධ්‍යයනය 2006 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ සිදු කරන ලදී. ද්විතීක දත්ත කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් සහ සෙලින්කෝ රක්ෂණ සමාගමෙන් ලබාගත් අතර, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, හා ප්‍රකාශිත ග්‍රන්ථ ආදිය පරිශීලනයෙන් ද ලබා ගන්නා ලදී.

අධ්‍යයනය තුළින් හෙළි වූ කරුණුවලට අනුව, මුල් කාලීනව වගා රක්ෂණ ක්‍රමයේ සාර්ථකත්වයක් දක්නට ලැබුන ද ක්‍රමිකව එහි කැපී පෙනෙන පහළ යාමක් දක්නට ලැබුණි. එය 2004/05 මහ කන්නයේ 1% ක් දක්වා පහළ ගොස් තිබුණි. සෙලින්කෝ රක්ෂණ සමාගමේ රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කළ ද, රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේ ම රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය, ඉතා පහළ මට්ටමක පවතී. වගා රක්ෂණය කෙරෙහි ගොවීන්ගේ විශ්වාසය පළුදු වී ඇති අතර ඔවුන්ගේ ස්වේච්ඡා දායකත්වය කැපී පෙනෙන ලෙස පහළ ගොස් ඇත. වන්දි ප්‍රමාණවත් නොවීම, වන්දි ගෙවීම ප්‍රමාද වීම, හානි තක්සේරුව හා වන්දි ගෙවීම විනිවිද භාවයකින් තොර වීම, ගොවීන්ගේ සහභාගීත්වය අඩු වීම සඳහා හේතුවන ප්‍රධාන සාධක වේ. වගා හානිය අඩුවෙන් තක්සේරු කිරීම ද එක් හේතු සාධකයකි. කෙසේ නමුත් වී වගා රක්ෂණ ක්‍රමය තුළින් අපේක්ෂා කරන ලද වගා හානියක දී ප්‍රමාණවත් පරිදි වන්දි ගෙවීම තුළින් ගොවීන්ගේ ආදායම් ස්ථායිතාවය යන අරමුණ ඉටු කරගැනීම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය අපොහොසත් වී ඇති බව පෙනී යයි. රක්ෂණයට දායක වී ඇති ගොවීන්ගෙන් 99%ක් ම ඒ සඳහා දායක වී ඇත්තේ වගා ණය ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත් භාවය එනම් එහි ක්‍රියාකාරීත්වය හෝ එහි ප්‍රතිලාභය සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුවත් භාවය ඉතා අවම මට්ටමක පවතී. ගොවීන් හා රක්ෂණ නිලධාරියා අතර ප්‍රමාණවත් පරිදි සංනිවේදනයක් නොතිබීම හා සංකීර්ණ

ඉල්ලුම්පත් පිරවීමේ ක්‍රමය ද වගා රක්ෂණය ගොවීන් අතර ජනප්‍රිය නොවීමට බලපාන ලද තවත් හේතු වශයෙන් හඳුනා ගැනුණි.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය එහි මූල්‍යමය ස්ථායිතාවය ආරක්ෂා කරගැනීම සඳහා අධික අවධානම් ප්‍රදේශ සඳහා රක්ෂණ ආවරණ නොසැපයීම, එහි ප්‍රධාන අරමුණින් ඉවත් වීමක් ලෙස සැලකිය හැකිය. මෙම අධ්‍යයනය තුළින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට ඉක්මන් හා කාර්යක්ෂම අධීක්ෂණය, වගා හානි තක්සේරුව හා වන්දි ගෙවීම් ආදිය කාර්යක්ෂම කිරීම සඳහා නිර්දේශ සැපයිය හැකිය. වන්දි ගෙවීමේ ප්‍රමාදය විසඳා ගැනීමට, කෘෂිරක්ෂණ මණ්ඩලයේ කාර්යයන්, පවතින ශාඛා කාර්යාල හරහා විමධ්‍යගත කිරීමක් සිදු කළ හැකි අතර හානි තක්සේරු කිරීම සඳහා මනා පුහුණුවක් සහිත පුද්ගලයන් යෙදවිය යුතුය.

එමෙන්ම, රක්ෂණ ආවරණ මුදල, වගා සඳහා වැයවෙන පිරිවැයෙන් 2/3 ක් හෝ අවම වශයෙන් ආවරණය වන පරිදි වැඩි කළ යුතු අතර, කාලයත් සමඟ නිෂ්පාදන පිරිවැයේ සිදුවන වෙනස් වීම්වලට අනුකූල වන පරිදි රක්ෂණ ආවරණ මුදල ද වෙනස් කළ යුතුය. කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක වාසි සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම සඳහා මනා ව්‍යාප්ති සේවයක් හඳුන්වා දිය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික බැංකු වලින් වගා ණය නිකුත් කිරීමේ දී වගා රක්ෂණය අනිවාර්යය කිරීම සිදු කළ හැකිය. රජයේ පොහොර සහනාධාර වැඩපිළිවෙල සමඟද මෙය සම්බන්ධ කළ හැකි අතර, ප්‍රතිරක්ෂණ ක්‍රමයක්, කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයට හඳුන්වා දීම ද ඉතා වැදගත්වේ.

පටුන

පෙරවදන iii
ස්තුතිය iv
කෙටි යෙදුම් v
සාරාංශය vi
පටුන ix
වගු ලේඛනය xiv
ප්‍රස්ථාර ලේඛනය xvi

පළමු වන පරිච්ඡේදය 01

හැඳින්වීම

1.1 අධ්‍යයන පසුබිම 01
1.2 පර්යේෂණ ගැටලුව 02
1.3 අධ්‍යයන අරමුණු 03
1.4 පර්යේෂණ ක්‍රමවේදය 03
1.4.1 අධ්‍යයන ප්‍රදේශ 03
1.4.2 නියැදි ප්‍රමාණය 04
1.4.3 දත්ත රැස් කිරීමේ ක්‍රමය 05
1.4.3.1 ප්‍රාථමික දත්ත 05
1.4.3.2 ද්විතියික දත්ත 05
1.4.3.3. සම්මුඛ සාකච්ඡා 05
1.4.4. දත්ත විශ්ලේෂණය 05
1.5 සීමාවන් 05
1.6 පර්යේෂණ වාර්තාවේ සැකැස්ම 06

දෙවන පරිච්ඡේදය 07

වගා රක්ෂණ ක්‍රමයේ වැදගත්කම සහ කෘෂි රක්ෂණ ව්‍යාපෘතියට සම්බන්ධ ප්‍රතිපත්ති

2.1 කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අවධානම හා අවධානම් කළමනාකරණය 07
2.2 වගා රක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය 08
2.3 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපෘතියේ ඓතිහාසික පසුබිම හා ප්‍රතිපත්ති 09

තුන්වන පරිච්ඡේදය 13

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සහ සංවිධාන ව්‍යුහය

3.1 හැඳින්වීම 13
3.1.1 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දර්ශනය 14
3.1.2 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මෙහෙවර 14

3.1.3 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අරමුණු 14
3.1.4 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අපේක්ෂිත පරමාර්ථ 14
3.2 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ව්‍යුහය සහ පරිපාලනය 15
3.3 කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපෘති වර්ග 17
3.4 වී වගා රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය 18
3.4.1 වාරික ප්‍රමාණය සහ රක්ෂණ ආවරණ වටිනාකම 19
3.4.2 වගා රක්ෂණ කාලසටහන 21
3.4.3 හානි දැනුම් දීම 21
3.4.4 හානි තක්සේරුව 21
3.4.5 වන්දි ගෙවීමේ පදනම 22
3.4.6 වන්දි සැකසීම 22
3.4.7 වන්දි ගෙවීම 24
3.4.8 අභියාචනා 24
3.5 අනිකුත් රක්ෂණ ව්‍යාපෘති 24
3.5.1 අතිරේක භෝග වගා රක්ෂණ ව්‍යාපෘතිය 24
3.5.2 අනිකුත් භෝග රක්ෂණ ව්‍යාපෘති 24
3.5.3 අපනයන භෝග රක්ෂණ ව්‍යාපෘතිය 24
3.5.4 විසිතුරු මල් සහ පැළෑටි රක්ෂණය 24
3.5.5 පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය 24
3.5.5.1 සතුන් රක්ෂණ සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි 25
3.5.5.2 රක්ෂණ ආවරණය ලබාගත හැකි හේතූන් 25
3.5.5.3 වාරික මුදල සහ රක්ෂණ ආවරණය 25
3.5.5.4 වට්ටම් ප්‍රමාණය 26
3.5.5.5 ප්‍රතිලාභ ලබාදීම 26
3.5.5.6 වන්දි ගෙවීම 26
3.5.6 වී ගබඩා රක්ෂණය 27
3.5.7 ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 27
3.5.7.1 සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක අවශ්‍යතාවය 27
3.5.7.2 අරමුණු 27
3.5.7.3 අවශ්‍ය සුදුසුකම් (හැකියාව) 28
3.5.7.4 මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ 28
3.5.8 "සුවසෙත" සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය 29
3.5.9 ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 29

හතරවන පරිච්ඡේදය **30**

පෞද්ගලික අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය

4.1 හැඳින්වීම 30
4.2 සංවිධාන ව්‍යුහය හා පරිපාලනය 33
4.3 කෘෂිකාර්මික රක්ෂණ ක්‍රම 34
4.4 වී වගා රක්ෂණයේ ක්‍රියාකාරීත්වය 35
4.4.1 රක්ෂණ වාර මුදල්/රක්ෂණ ආවරණය 35
4.4.2 වගා රක්ෂණ කාලසටහන 35

4.4.3 ගෙවූ රක්ෂණ වාරික මුදලේ වලංගු භාවය 36
4.4.4 හානිවීම් වාර්තා කිරීම 36
4.4.5 රක්ෂණය කරන ලද ආපදා වූ ප්‍රදේශ පිරික්සුම 36
4.4.6 සම්මත අස්වැන්න 36
4.4.7 අස්වනු කැපීමේ අවස්ථාවේ අස්වනු තක්සේරුව 37
4.4.8 රක්ෂණ වන්දි ගෙවීම 37
4.4.9 හානි ප්‍රතිශතය තීරණය කිරීම 37
4.4.10 වන්දි ගෙවීම් ගණනය කිරීම 38
4.4.11 සෙලින්කෝ රක්ෂණ සමාගමේ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය 38
4.5 අනෙකුත් රක්ෂණ ක්‍රම 38
4.5.1 අතිරේක භෝග රක්ෂණ ක්‍රම 38
4.5.2 අනෙකුත් වගාවන් සඳහා වන රක්ෂණ ක්‍රම 39
4.5.3 පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය 39
4.5.4 සෙලින්කෝ "ග්‍රාමීන්" 40
4.5.5 සෙලින්කෝ "ගොවි විශ්‍රාම" 41

පස්වන පරිච්ඡේදය 42

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය

5.1 අතීත ක්‍රියාකාරීත්වය විමර්ශනය 42
5.2 රක්ෂණය කරන ලද වගා බිම් ප්‍රමාණය අනුව, අවුරුදු දහයක කාලසීමාව තුළ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය 43
5.3 වී වගා රක්ෂණයේ ක්‍රියාකාරීත්වය තක්සේරු කිරීම 44
5.3.1 හානි දර්ශක විශ්ලේෂණය 45
5.3.2 ගෙවීම් දර්ශකය 47
5.3.3 සහභාගීත්ව දර්ශකය 49
5.3.4 වියදම් දර්ශකය විශ්ලේෂණය 51

හයවන පරිච්ඡේදය 53

කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අනෙකුත් රක්ෂණ ක්‍රමයන් පිළිබඳ විමසුමක් සහ රාජ්‍ය මැදිහත් වීම

6.1 අනිකුත් රක්ෂණ ව්‍යාපෘතීන් 53
6.1.1 පශු සම්පත් රක්ෂණය 53
6.1.2 අතිරේක භෝග රක්ෂණය සහ අනිකුත් භෝග රක්ෂණ ව්‍යාපෘතිය 55
6.1.3 ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 58
6.1.4 "සුවසෙත" සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය 62
6.2 කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය සහ රාජ්‍ය මැදිහත් වීම 63

හත්වන පරිච්ඡේදය 67

වී වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ දායකත්වය

7.1 හැඳින්වීම 67
7.2 අධ්‍යයන ප්‍රදේශ තුළ තෝරාගත් ගොවීන්ගේ නියැදියේ සමාජ ආර්ථික පසුබිම 67
7.2.1 අධ්‍යාපන මට්ටම සහ වයස් කාණ්ඩය 67
7.2.2 මූලික රැකියාව සහ මාසික ගෘහ ආදායම 69
7.3 ඉඩම් අයිතියේ ස්වභාවය සහ වාර ක්‍රමය 70
7.3.1 ඉඩම් අයිතියේ ස්වභාවය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 70
7.3.2 වාර ක්‍රමය අනුව නියැදියේ ව්‍යාප්තිය 70
7.3.3 වගා කළ බිම් ප්‍රමාණය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 71
7.4 වගාව සඳහා ණය ලබාගැනීම 71
7.4.1 ණය ලබාගැනීමේ මූලාශ්‍ර 71
7.4.2 ණය ප්‍රමාණය 73
7.4.3 ණය ආපසු ගෙවීම 74
7.4.4 වගා ණය ව්‍යාපෘතිය යටතේ වගා රක්ෂණ ක්‍රමයේ අවශ්‍යතාවය 74
7.5 වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ සහභාගීත්වයට බලපාන සාධක 75
7.5.1 වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත් භාවය 75
7.5.2 රක්ෂණය පිළිබඳ දැනුවත් වීමේ මාර්ගයන් 77
7.5.3 රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය 77
7.6 රක්ෂණ වාරික මුදල් සහ රක්ෂණ ආවරණය 79
7.6.1 වාරික මුදල් මට්ටම 79
7.6.2 රක්ෂණ වාර මුදල් ගෙවීමේ මාර්ගයන් 80
7.6.3 රක්ෂණ ආවරණය 80
7.7 වී වගාව සඳහා වන හානි 81
7.7.1 වී වගාව සඳහා සිදුවන හානි වර්ග 81
7.7.2 වගා හානි සිදුවන අවස්ථා 83
7.7.3 වගා හානි දැනුම් දීම සඳහා ගතවන කාලය 83
7.7.4 හානි දැනුම්දීම 84
7.7.5 හානි වූ බිම් ප්‍රමාණය 84
7.8 හානි තක්සේරුව, වන්දි ගෙවීම් සහ ප්‍රතිලාභ 85
7.8.1 හානි තක්සේරු කිරීමේ හා අගය කිරීමේ අදියර 85
7.8.2 වන්දි ගෙවීමේ ක්‍රමය 86
7.8.3 වන්දි ලැබීමට ගතවන කාලසීමාව 86
7.8.4 වගා හානි සඳහා වන්දි ලැබීම 87
7.8.5 වන්දි ගෙවීම සම්බන්ධයෙන් ගොවීන්ගේ තෘප්තිමත් භාවය සහ අභියාචනා 87
7.8.6 රක්ෂිත ගොවීන්ට ලැබෙන අනිකුත් ප්‍රතිලාභ 88

අටවන පරිච්ඡේදය 90

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන වී වගා රක්ෂණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක්

8.1 හැඳින්වීම 90

8.2 වී වගා රක්ෂණයේ ක්‍රියාකාරීත්වය 90
8.2.1 පරිපාලනය 90
8.2.2 රක්ෂිත වගා බිම් ප්‍රමාණය 90
8.2.3 දළ හානි දර්ශකය (Gross Loss Ratio) 92
8.2.4 රක්ෂණ වාරික ප්‍රමාණය සහ රක්ෂණ ආවරණය 93
8.3 වී වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ සහභාගීත්වය 94
8.3.1 වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත් භාවය 94
8.3.2 හානි දැනුම් දීම 94
8.3.3 වගා සඳහා ණය ලබාගැනීමේ මූලාශ්‍ර 95
8.3.4 වන්දි ගෙවීම 95
8.3.5 වන්දි ගෙවීමේ ක්‍රමය 96
8.3.6 වන්දි ලබාගැනීමට ගතවන කාලය 96
8.3.7 ගොවියන්ගේ තෘප්තිමත්භාවය 97

නමවන පරිච්ඡේදය **98**

කෘෂිකර්ම රක්ෂණය සඳහා සහභාගී වන පාර්ශවයන් මුහුණ පාන ගැටලු සහ ඔවුන්ගේ යෝජනා

9.1 පසුබිම 98
9.2 ගොවීන්ගේ දෘෂ්ටිකෝණයට අනුව කෘෂි රක්ෂණය පිළිබඳ ගැටලු හා ඔවුන්ගේ යෝජනා 98
9.3 කෘෂිකර්ම රක්ෂණ ආයතන මුහුණ පාන ගැටලු 100
9.4 ගොවීන්ගේ යෝජනා 101
9.5 කෘෂිරක්ෂණ ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා 102

දහවන පරිච්ඡේදය 103

නිගමන සහ යෝජනා

10.1 නිගමන 103
10.2 යෝජනා 105

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 107
ඇමුණුම 1 108
ඇමුණුම 2 109
ඇමුණුම 3 110
ඇමුණුම 4 112
ඇමුණුම 5 113

වගු ලේඛණය

1.1 නියැදි ප්‍රමාණය 04
3.1 වී වගා රක්ෂණ ක්‍රමයේ රක්ෂණ ආවරණ වටිනාකම් සහ රක්ෂණ වාර්ක මුදල් විවිධ වාර්මාර්ග ක්‍රම සහ අවදානම් මට්ටම් අනුව (සාමාන්‍ය ව්‍යාපෘතිය යටතේ) 20
3.2 රක්ෂණ ආවරණ සහ වාර මුදල් (වී වගාව සම්බන්ධ විශේෂ බීජ වී ව්‍යාපෘතිය යටතේ) 20
3.3 හානි දර්ශකය (රක්ෂණ ආවරණ වටිනාකම රු. 6.000/= ට අදාළව) 23
3.4 සතුන් වර්ගය, වයස් සීමාවන් හා උපර්ම රක්ෂණ වටිනාකම් 26
3.5 සතුන් කණ්ඩායම් අනුව වට්ටම 26
4.1 සෙලින්කෝ රක්ෂණ සමාගමේ වී වගා රක්ෂණයේ ක්‍රියාකාර්ත්වය 32
4.2 රක්ෂණ ආවරණය සහ රක්ෂණ වාර මුදල් 35
4.3 රක්ෂිත සතුන් සංඛ්‍යාව හා වන්දි ගෙවූ ප්‍රතිශතය 40
5.1 පර්පාලනය, රක්ෂණ බිම් ප්‍රමාණය, වාර්ක සහ වන්දි මුදල් ප්‍රමාණය (1958-2006) 43
5.2 හානි දර්ශක විශ්ලේෂණය 46
5.3 වන්දි ගෙවීම් දර්ශක විශ්ලේෂණය 48
5.4 රක්ෂණය කළ වගා බිම් ප්‍රමාණය අනුව සහභාගීත්ව දර්ශකය 49
5.5 සහභාගීත්ව දර්ශකය රක්ෂණ ආවරණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව අනුව 50
5.6 රක්ෂණ ආවරණය ලබාගත් මුළු ගොවීන්ගේ ප්‍රතිශතය සහභාගීත්ව ක්‍රමය අනුව 51
5.7 වියදම් දර්ශකය 52
5.8 2005 වර්ෂයේ වී වගා රක්ෂණයේ ආදායම් සහ වියදම් ගිණුම 52
6.1 පශු සම්පත් රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාර්ත්වය (1996-2005 දක්වා) 54
6.2 රක්ෂිත සතුන් සංඛ්‍යාව වර්ග අනුව 54
6.3 වන්දි ගෙවීම 55
6.4 පශු සම්පත් රක්ෂණ ව්‍යාපෘතිය යටතේ රක්ෂණය කිර්මට ඉලක්කගත සතුන් සංඛ්‍යාව සහ රක්ෂිත සතුන් සංඛ්‍යාව 55
6.5 උක් වගා රක්ෂණය 56
6.6 පොල් වගා රක්ෂණය 57
6.7 මිර්ස් වගා රක්ෂණය 57
6.8 ලොකුළුෑණු වගා රක්ෂණය 58
6.9 ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක වී ඇති ගොවීන් සංඛ්‍යාව 59
6.10 ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ඉලක්ක සහ බඳවා ගැනීම් 60
6.11 1987 සිට 2005 ජුලි 31 දින දක්වා ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී ඇති ගොවීන් සංඛ්‍යාව (වයස් පරතරය අනුව) 61
6.12 ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ක්‍රියාකාර්ත්වය 61
6.13 සුවසෙත සෞඛ්‍ය රක්ෂණය සඳහා දායකත්වය 63
6.14 පර්පාලන වියදම් සඳහා රජයේ ආධාර ප්‍රමාණයන් 65
6.15 ප්‍රාග්ධනය සඳහා රජයේ ආධාර 65
6.16 ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට රජයේ දායකත්වය 66
7.1 දිස්ත්‍රික්ක අනුව ගොවීන්ගේ නියැදියේ ව්‍යාප්තිය 68
7.2 වයස් කාණ්ඩ අනුව නියැදියේ ව්‍යාප්තිය 68
7.3 අධ්‍යාපන මට්ටම 68

7.4 මූලික රැකියාව 69
7.5 මාසික ගෘහ ඒකක ආදායම 70
7.6 ඉඩම් අයිතියේ ස්වභාවය අනුව නියැදියේ ව්‍යාප්තිය 70
7.7 වාර් ක්‍රමය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 71
7.8 වගා කළ බිම් ප්‍රමාණය අනුව ව්‍යාප්තිය 71
7.9 වගා ණය ලබාගැනීම සම්බන්ධව ගොවීන් දක්වන ලද ප්‍රතිචාර 72
7.10 ණය ලබාගන්නා මූලාශ්‍ර 72
7.11 ණය ප්‍රමාණය 73
7.12 ලබාගත් ණය මුදලේ සහ රක්ෂිත අක්කර ප්‍රමාණයේ මධ්‍ය අගයන් 73
7.13 වගා ණය ආපසු ගෙවීම 74
7.14 වගා ණය ලබාගැනීමේදී වගා රක්ෂණය ලබාගැනීම පිළිබඳ පූර්ව අවශ්‍යතාවය 75
7.15 ගොවීන්ගේ දැනුවත් භාවය 76
7.16 රක්ෂණය සඳහා සහභාගී වීමට බලපාන හේතු සාධක 76
7.17 දැනුවත් භාවය ලබාගත් මාර්ගයන් 77
7.18 රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය 77
7.19 වගා කළ වී වගා බිම් ප්‍රමාණයේ හා රක්ෂිත වී වගා බිම් ප්‍රමාණයේ මධ්‍ය අගයන් 78
7.20 වගා කළ වී වගා බිම් ප්‍රමාණය සහ රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 79
7.21 වාරික මුදල් ප්‍රමාණය සහ ගොවීන්ගේ ව්‍යාප්තියේ ප්‍රතිශතය 79
7.22 රක්ෂණ වාරික ගෙවීමේ මාර්ගයන් 80
7.23 රක්ෂණ ආවරණ මුදල, ණය මුදල සහ නිෂ්පාදන පිරිවැය 81
7.24 භෝග සඳහා වන හානි වර්ග 82
7.25 වගා හානි සිදුවී ඇති අදියරයන් 83
7.26 වගා හානි වාර්තා කිරීම සඳහා ගතවන කාලය 84
7.27 හානි දැනුම්දීම 84
7.28 වගා හානි වූ බිම් ප්‍රමාණය 85
7.29 තක්සේරු කමිටුවේ ස්වභාවය 85
7.30 තක්සේරු කරන අවස්ථාව 86
7.31 වන්දි ලැබෙන මාර්ගයන් 86
7.32 වන්දි ලැබීමට ගතවන කාලය 87
7.33 රක්ෂණ වන්දි ලැබීම 87
7.34 ගොවීන්ගේ තෘප්තිමත් භාවය 88
7.35 වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ දායකත්වයේ ස්වභාවය 88
8.1 වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ සහභාගීත්වයට බලපාන හේතු 91
8.2 කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන වී වගා රක්ෂණයෙහි දළ හානි දර්ශක අගයන් සැසඳීම 92
8.3 රක්ෂණ ආවරණ ප්‍රමාණය සහ වාරික ප්‍රමාණයන් සැසඳීම 93
8.4 රක්ෂණ පිළිබඳ දැනුවත් භාවය ලබාගත් මාර්ගයන් 94
8.5 රක්ෂණ ක්‍රම 2 යටතේ රක්ෂිත ගොවීන් වගා හානි පිළිබඳව දැනුම් දීම 95
8.6 රක්ෂණ ක්‍රම 2 යටතේ වගා ණය ලබාගැනීමේ මූලාශ්‍ර 95
8.7 රක්ෂණ ආයතන 2 යටතේ වගා හානි සඳහා වන්දි ගෙවීම 96
8.8 රක්ෂණ ආයතන 2 යටතේ රක්ෂණය වූ ගොවීන් වන්දි ලබාගැනීමේ මාර්ගයන් 96
8.9 රක්ෂණ ක්‍රම 2 යටතේ වන්දි ලබාගැනීමට ගතවන කාලය 97
8.10 රක්ෂණ ක්‍රම 2 යටතේ වන්දි ලබාදීම පිළිබඳව ගොවීන්ගේ තෘප්තිමත්භාවය 97

ප්‍රස්ථාර ලේඛණය

3.1	කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය	16
4.1	සී/ස. සෙලින්කෝ රක්ෂණ සමාගමේ සංවිධාන ව්‍යුහය	33
4.2	වගා රක්ෂණ කාල සටහනේ ආකෘතිය	36
5.1	පසුගිය වසර දහයක කාලසීමාව තුළ රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය	43
6.1	ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ක්‍රියාකාර්ත්වය	60
7.1	වගා රක්ෂණය හා වගා ණයෙහි ක්‍රියාකාර්ත්වය	75
7.2	අධ්‍යයනයට ලක් කල ප්‍රදේශ වල වාර්තා වූ මුළු වගා හානි ප්‍රතිශතයන්	82
8.1	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් රක්ෂණය කරන ලද මුළු වී වගා බිම් ප්‍රමාණය	91

පළමුවන පරිච්ඡේදය

හැඳින්වීම

1.1 අධ්‍යයන පසුබිම

කෘෂිකර්මාන්තය සැම විට ම අවදානම්කාරී ස්වරූපයකින් යුක්ත ව්‍යාපාරයක් වශයෙන් සැලකේ. අනපේක්ෂිත අයුරින් සිදුවන මිලෙහි ඉහළ පහළ යැම්වලට අමතර ව, කාලගුණික වශයෙන් ඇතිවන බාධාවන්, කෘමි රෝග, ලෙඩ රෝග සහ නොයෙක් ස්වාභාවික උපද්‍රවයන්ට මුහුණ දීමට කෘෂිකර්මාන්තයේ යෙදී සිටින ගොවීන්ට සිදු වේ. ශ්‍රී ලංකාව තුළ කෘෂිකර්මාන්තය තුළ නියැළී සිටින ගොවි ප්‍රජාව, ආර්ථික වශයෙන් පහළ මට්ටමක සිටින ජන කොටසක් වශයෙන් සැලකෙන අතර ගොවි ප්‍රජාවගෙන් 75%කට වැඩි පිරිසකට හිමිවී ඇත්තේ හෙක්ටයාර් 1කට වඩා අඩු බිම් ප්‍රමාණයකි. ප්‍රධාන ජීවනෝපායය වශයෙන් කෘෂිකර්මාන්තයේ නියැළී සිටින්නන් ලබන ආදායම අවම මට්ටමක පවතින අතර වී වගාවේ නියැළී සිටින්නන්ගේ ආදායම වර්ෂයකට කන්න 2 කට සීමාවනු ලබයි. ඒ අනුව, කුමන හේතුවක් නිසා හෝ ඇතිවන වගා හානියක් හෝ පාඩුවක් ග්‍රාමීය ප්‍රදේශවල සිටින එම ගොවි ප්‍රජාවගේ සාමාජය ආර්ථික තත්ත්වය කෙරෙහි ඉතා තදින් බලපානු ලබයි. ශ්‍රී ලංකාව තුළ සුළු පරිමාණ ගොවීන් නිරන්තරයෙන් මුහුණ දෙනු ලබන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අස්ථාවරභාවය, කාලගුණික හෝ අනිකුත් හේතූන් නිසා ඇති වන්නා වූ අවදානම්කාරී ස්වභාවය යන ගැටලු කෙරෙහි රාජ්‍ය අවධානය යොමු වූ අතර, දකුණු ආසියානු රටවල් අතර ජපානයට පසු වගා රක්ෂණ ක්‍රමය හඳුන්වා දුන් ප්‍රථම රට බවට ශ්‍රී ලංකාව පත් විය. ඒ අනුව ගංවතුර, නියඟය, කෘමිහානි සහ ලෙඩරෝග ආදිය මගින් භෝග සඳහා සිදුවන හානි සඳහා ආවරණය සැලසීම සඳහා වගා රක්ෂණයක් හඳුන්වා දෙනු ලැබිය.

කෘෂිකර්මාන්තය තුළ අවදානම් කළමනාකරණ ස්වරූපයකින් ක්‍රියාත්මක වනු ලබන වගා රක්ෂණයෙන් අපේක්ෂිත මූලික අරමුණු 3 කි.

- ස්වාභාවික උපද්‍රව හේතුවෙන් සත්‍ය වශයෙන් ඇති වන්නා වූ වගා හානියකින් සිදු වන්නාවූ පීඩාකාරී බලපෑම් වලින් තොරව ගොවීන්ගේ ආදායම් ස්ථායීතාවය ඇති කිරීම. උදා. වගා හානියකදී මූල්‍යමය වශයෙන් ගොවීන්ට සිදු වන්නාවූ හානියෙන් ගොවීන් රැක ගැනීම.

- නිෂ්පාදනය වැඩි දියුණු කළ හැකි සහ සම්පත් කාර්යක්ෂම අයුරින් යොදා ගත හැකි වන පරිදි වැඩි දියුණු කරන ලද තාක්ෂණික ක්‍රම භාවිතයට අවදානමකින් තොරව ගොවීන් නැඹුරු කර වීම.

- වගා රක්ෂණ ක්‍රමයක් තුළින් ණය ලබා දෙන ආයතනවල අවධානම අවම කිරීම තුළින්, ගොවීන් වෙත වගා ණය ගලා යාම වැඩි කිරීම.

වගා රක්ෂණ ක්‍රමයක ප්‍රතිලාභ සම්බන්ධයෙන් න්‍යායාත්මක වශයෙන් මනා ලෙස පැහැදිලි කිරීම් සිදු කොට තිබේ. ග්‍රාමීය කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයකට ග්‍රාමීය කෘෂිකර්මාන්තය සමග ඒකාබද්ධ වෙමින්, එහි ඵලදායකත්වය ඉහළ නැංවීම මනාව සිදු කළ හැකිය. විශාල වශයෙන් සිදු වන වගා හානියක දී එම තත්ත්වය, ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වශයෙන් කෘෂිකර්මාන්තයේ නියැළී සිටින ග්‍රාමීය ප්‍රජාව කෙරෙහි ප්‍රබල ලෙස බලපානු ලබන අතර කෘෂි රක්ෂණ ක්‍රමයක ප්‍රතිලාභ පොදුවේ සමාජයේ සියලුම කොටස්වලට බලපානු ලබයි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආගම් තත්ත්වය පහළ වැටීම, අනිකුත් ක්ෂේත්‍රවල නිපදවන භාණ්ඩ හා සේවා සඳහා පවත්නා ඉල්ලුමේ ක්ෂණික පහළ වැටීමකට

හේතු විය හැකිය. මේ අනුව කෘෂි රක්ෂණය තුළින් ඇති වන ගොවීන්ගේ ආදායම් ස්ථායීතාවය, මුළු ආර්ථිකයේ ම ස්ථායීතාවය කෙරෙහි යම් බලපෑමක් සිදු කළ හැකි තත්ත්වයකි. රක්ෂණ ක්‍රමයක නිසි ආවරණය සැලසීම තුළින් ගොවීන් තුළ, නව වගා ක්‍රම සහ නව තාක්ෂණික ක්‍රම මගින් කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වැඩි වැඩියෙන් ආයෝජනය කිරීම සඳහා ද පෙළඹ වීමක් ඇති වේ (Ray, 1967).

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය 1958 මහ කන්නයේ සිට නියමු ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වූ අතර ඒ යටතේ දිස්ත්‍රික්ක 5ක් තුළ වී වගා බිම් අක්කර 26,000 ක් රක්ෂණ ආවරණය කරන ලදී. 1974 වන විට යල මහ දෙකන්නයේම මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයක් රක්ෂණයට යටත් කොට තිබිණි (Sandarathne, 1974). 1985 අග භාගයේ මෙම කෘෂි රක්ෂණ ක්‍රමය අනිකුත් භෝග වන මුං ඇට, කව්පි, මිරිස්, සෝයා බෝංචි සඳහා පමණක් නොව පශු සම්පත් ක්ෂේත්‍රය තුළට ද ව්‍යාප්ත කරන ලදී.

1973 අංක 20 දරණ පාර්ලිමේන්තු පනත මගින් කෘෂි රක්ෂණ මණ්ඩලය ස්ථාපිත කරන ලද්දේ, වී, අතිරේක භෝග සහ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැළී සිටින ගොවීන්ට ප්‍රතිලාභ සැලසීමේ අරමුණෙනි. 1974 වසරේ සිට රජයේ ඒකාබද්ධ අරමුදලේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක ආයතනයක් වූ කෘෂි රක්ෂණ මණ්ඩලය, 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මගින් 1999 අගෝස්තු 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ස්වයං මූල්‍ය පදනමක් කරා අවතීර්ණ විය.

මෙම නව පනත යටතේ කෘෂිකාර්මිකයා යන්නට ඉතා පුළුල් අර්ථකථනයක් සැලසීමෙන් රක්ෂණ මණ්ඩලය මගින් ඉටු කළ යුතු සේවාවන් සහ සේවාදායක පිරිස හා තලය පුළුල් වශයෙන් ව්‍යාප්ත කිරීමට උත්සාහ ගන්නා ලදී. එතෙක් මෙම මණ්ඩලයේ විෂය පථයට යොමු වී නොතිබුණු වතු වගා, සියලුම භෝග වගා සඳහා රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙන් ම කෘෂිකාර්මිකයන් සඳහා වෛද්‍යාධාර ක්‍රම, වෙනත් ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ධීවර කටයුතු සඳහා රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමට ද නව පනතේ විධි විධාන සලසා තිබිණි.

ඉහත කරුණු අනුව කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වී ඇත්තේ, කෘෂිකර්ම ක්ෂේත්‍රය හා ධීවර ක්ෂේත්‍රය ආවරණය වන රක්ෂණ ක්‍රම දියත් කිරීම හරහා ගොවීන් සහ ධීවරයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රම හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සලසා දීම වැනි කාර්යයන් තුළින් කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රය සහ එහි නියැළෙන ප්‍රජාව සුරැකීම සහ එම ප්‍රජාවගේ සාමාජ්‍ය හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම තුළින් එම කර්මාන්තයන් සුරක්ෂිත කොට නංවාලීමත් සමස්ත ජාතික නිෂ්පාදනයට ඵලදායී අයුරින් දායක කර වීමත් වේ.

1.2 පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාව තුළ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය දශක හතරකට වැඩි කාල සීමාවක් තුළ ක්‍රියාත්මක වුව ද, ඒ සඳහා ගොවීන්ගේ දායකත්වය ඉතාමත් අවම මට්ටමක පවතී. 2002 වර්ෂයේ මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් රක්ෂණ ආවරණය ලබාගෙන තිබූ බිම් ප්‍රමාණය 2.8% කි. එක් එක් කන්නය තුළ ක්‍රියාත්මක ව පැවති රක්ෂණ ආවරණ කුඹුරු බිම් ප්‍රමාණය, වී වගා කර තිබුණු මුළු කුඹුරු අක්කර ප්‍රමාණය හා සසඳන කළ මණ්ඩලයේ රක්ෂණ අනුපාතය ඉතා පහළ මට්ටමක පවතින බව විද්‍යාමාන විය (වාර්ෂික වාර්තාව-AAIB 2001). මේ තත්ත්වය මත වාර්ෂිකව රක්ෂණ මණ්ඩලයේ ඉලක්කගත රක්ෂණ ආවරණ බිම් ප්‍රමාණය සහ සත්‍ය වශයෙන් රක්ෂණය කරන ලද බිම් ප්‍රමාණය අතර විශාල පරතරයක් පවතින බව පෙනී යන කරුණකි. රක්ෂණ ආවරණයට යටත් වන වී වගා බිම් ප්‍රමාණයේ ක්‍රමික අඩු වීමක් වසර කිහිපයක් මුළුල්ලේ ම දැකිය හැකි විය (වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව, 2002). මෙම පසුගාමී තත්ත්වයන් එසේ ම තිබිය දී, කෘෂිකාර්මික ක්ෂේත්‍රය නංවාලීමේ

අරමුණින් යුක්තව රජය විසින් ශ්‍රී ලංකාව තුළ වගා රක්ෂණ ක්‍රමය ජනප්‍රිය හා වැඩි දියුණු කිරීමේ ප්‍රයත්නයක් කෙරෙහි වැඩි අවධානයකින් යුක්ත ව ක්‍රියා කරන ලදී. ඒ අනුව 1999 කෘෂි රක්ෂණ පනත සංශෝධනය මගින් පුද්ගලික අංශයට ද මෙම ක්ෂේත්‍රයේ ආයෝජනය කෙරෙහි වැඩි අවස්ථාවක් සලසා දුන් නමුදු , මේ වනවිට සෙලින්කෝ රක්ෂණ සමාගම පමණක් වගා රක්ෂණ ක්‍රමයට අවතීර්ණ ව සිටී.

මේ අනුව කෘෂි රක්ෂණ ක්‍රමය කෙරෙහි ගොවීන්ගේ ඇති අඩු දායකත්වය පිළිබඳවත් රාජ්‍ය අංශයේ සහභාගිත්වය සහ පෞද්ගලික අංශයේ මැදිහත් වීම් ආදිය පිළිබඳවත් සොයා බලා අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවයක් පැණ නැගී ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ ආයෝජන ඉහළ නැංවීම, ගොවීන්ගේ ආදායම් ස්ථායීතාවය ඇති කිරීම, නිෂ්පාදනය ඉහළ නැංවීම සහ රාජ්‍ය වියදම් අඩු කිරීම වැනි ප්‍රතිලාභ කෘෂි රක්ෂණ ක්‍රමයක පවතින බව පැහැදිලි ව සඳහන් වුව ද, එම න්‍යායික තත්ත්වයන් ප්‍රායෝගික වශයෙන් යොදා ගැනීමේ දී යම් පරස්පරතාවයක් පවතින බව ගොවීන්ගේ අඩු සහභාගිත්වය තුලින් පෙනී යන කරුණක් වන අතර, මෙම වෙනස සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම කාලීනව වැදගත් වී ඇත. ඒ අනුව ගොවි ප්‍රජාව මෙම කෘෂි රක්ෂණ ක්‍රමය කෙරෙහි දක්වන්නේ මන්දගාමී ස්වරූපයක් ද? යම් කොටසක් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නේ ද, යන්න සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයෙහි ප්‍රතිශෝධනයන් සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය නිර්දේශ ලබාදීම අවශ්‍ය කරුණක් බවට පත් වී ඇත.

1.3 අධ්‍යයන අරමුණු

අධ්‍යයනයේ මූලික අරමුණ :

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ, වගා රක්ෂණ ක්‍රමයෙහි, විශේෂයෙන් ම වී වගා රක්ෂණ ක්‍රමයේ වර්තමාන ක්‍රියාකාරීත්වය, ගැටලු සහ අනාගත විභවතා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමයි.

අධ්‍යයනයේ අනෙකුත් විශේෂිත අරමුණු :

1) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන වර්තමාන වගා රක්ෂණ ක්‍රමයේ පවතින ගැටලු සහ සීමාවන් අධ්‍යයනය කිරීම
2) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වර්තමාන ක්‍රියාකාරීත්වය සහ සංවිධාන ව්‍යුහය පිළිබඳ අධ්‍යයනය කිරීම
3) වගා රක්ෂණ ක්‍රමය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත්භාවය පිළිබඳව සොයා බැලීම
4) වගා රක්ෂණ ක්‍රමයට දායක වී ඇති ගොවීන්ගේ ස්වභාවය හඳුනා ගැනීම සහ ඔවුන් රක්ෂණයට දායක වීම සම්බන්ධ ව හේතු සාධක සොයා බැලීම
5) රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ක්‍රියාත්මක කෘෂිකාර්මික රක්ෂණ ක්‍රම සම්බන්ධයෙන් පවත්නා වෙනස්කම් සමානතා පිළිබඳව අධ්‍යයනය කිරීම
6) පවත්නා රක්ෂණ ක්‍රමයන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම

1.4 පර්යේෂණ ක්‍රමවේදය

1.4.1 අධ්‍යයන ප්‍රදේශ

මෙම අධ්‍යයනය තුළ ප්‍රධාන වශයෙන් වී වගා රක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බැවින් වී වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක වන අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා තෝරා ගන්නා ලදී.

1.4.2 නියැදි ප්‍රමාණය

බහු පියවර සසම්භාවී නියැදි ක්‍රමය (Multistage Ramdom Sampling Technique) යටතේ නියැදිය තෝරා ගන්නා ලදී. පළමුව ඉහත සඳහන් කළ පරිදි දිස්ත්‍රික්ක හතර තෝරා ගන්නා ලදී. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2003/2004 මහ කන්නයේ දත්තවලට අනුව, ඉහත දිස්ත්‍රික්ක හතර තුළින් ගොවිජන සේවා මධ්‍යස්ථාන තුන බැගින් තෝරා ගන්නා ලද අතර, එසේ තෝරා ගැනීමේ දී රක්ෂණ ආවරණය ලබාගෙන ඇති වැඩි ගොවීන් පිරිසක් සිටීම යන සාධකය පදනම් කර ගන්නා ලදී. මෙම දිස්ත්‍රික්ක හතර තුල සලකා බලනු ලැබූ ගොවිජන සේවා මධ්‍යස්ථානවල කෘෂි කාර්මික හා ගොවි රක්ෂණ මණ්ඩලයේ රක්ෂණය වී ඇති ඉලක්ක ජනගහනය 1,011 ක් වන අතර ඉන් 20% ක් නියැදි ප්‍රමාණය වශයෙන් සලකන ලදී. එම දිස්ත්‍රික්ක හතර තුළ සලකා බලනු ලැබූ ගොවිජන සේවා මධ්‍යස්ථානවල, සෙලින්කෝ රක්ෂණ සමාගම යටතේ රක්ෂණය වී ඇති මුළු ඉලක්ක ජනගහනය 465 ක් වන අතර, ඉන් 20% ක් නියැදි ප්‍රමාණය වශයෙන් සලකන ලදී. අවසාන වශයෙන් එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් රක්ෂණය වී ඇති ගොවීන් සංඛ්‍යාවට සමානුපාතික වශයෙන්, නියැදිය තෝරා ගන්නා ලදී. මේ සඳහා සරල සසම්භාවී නියැදි ක්‍රමය යොදා ගන්නා ලදී.

වගු අංක 1.1: නියැදි ප්‍රමාණය

අධ්‍යයන දිස්ත්‍රික්ක හා ප්‍රදේශ	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB)		සෙලින්කෝ රක්ෂණ සමාගම (CICL)	
	රක්ෂිත මුළු ගොවීන් සංඛ්‍යාව	නියැදි ප්‍රමාණය	රක්ෂිත මුළු ගොවීන් සංඛ්‍යාව	නියැදි ප්‍රමාණය
අනුරාධපුර දිස්ත්‍රික්කය			56	11
මැදවච්චිය ගොවිජන සේවා මධ්‍යස්ථානය	108	22		
පේමඩුව ගොවිජන සේවා මධ්‍යස්ථානය	85	17		
නොච්චියාගම ගොවිජන සේවා මධ්‍යස්ථානය	85	17		
කුරුණෑගල දිස්ත්‍රික්කය			45	09
ගනේවත්ත ගොවිජන සේවා මධ්‍යස්ථානය	58	11		
ඉබ්බාගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානය	34	07		
වේරවැල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය	25	05		
පොළොන්නරුව දිස්ත්‍රික්කය			164	33
මනම්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය	141	28		
සෙවනගම ගොවිජන සේවා මධ්‍යස්ථානය	104	21		
හිඟුරක්ගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය	80	16		
හම්බන්තොට දිස්ත්‍රික්කය			200	40
අම්බලන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථානය	92	18		
ලුනම ගොවිජන සේවා මධ්‍යස්ථානය	89	18		
යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථානය	110	22		
එකතුව	1,011	202	465	93

මුළු නියැදි ප්‍රමාණය 295 කි.

1.4 .3 දත්ත රැස් කිරීමේ ක්‍රමය

1.4.3.1 ප්‍රාථමික දත්ත

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ සෙලින්කෝ රක්ෂණ සමාගමේ යන දෙඅංශයේ ම රක්ෂණය වී ඇති ගොවීන්ගෙන් අවශ්‍ය ප්‍රාථමික තොරතුරු ලබා ගැනීම සඳහා විධිමත් ව සකස් කරන ලද ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදී. පර්යේෂණ කණ්ඩායම විසින් ප්‍රශ්නාවලිය පූර්ව පරීක්ෂණයකට ලක් කරන ලද අතර, ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු 2006 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ සිදු කරන ලදී.

1.4.3.2 ද්විතීයික දත්ත

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේත්, සෙලින්කෝ රක්ෂණ සමාගමේත් වාර්තාගත තොරතුරු හා දත්ත තුළින් ද්විතීයික දත්ත ලබා ගන්නා ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා සහ ප්‍රකාශයට පත් වී ඇති පොත්පත් හා ලිපිලේඛන මගින් ද අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී.

1.4.3.3 සම්මුඛ සාකච්ඡා

පර්යේෂණ නිලධාරි කණ්ඩායම විසින්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේත්, සෙලින්කෝ රක්ෂණ සමාගමේත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් හමු වී කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා තුළින් වර්තමාන රක්ෂණ ක්‍රමයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගන්නා ලදී.

හමු වූ නිලධාරීන්

- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ සෙලින්කෝ රක්ෂණ සමාගමේ නිලධාරීන්
- ප්‍රාදේශීය නිලධාරීන්
- ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික්ක කාර්යාලවල සහකාර අධ්‍යක්ෂවරුන්
- ගොවි සමාගම්වල සාමාන්‍යාධිකාරිවරුන්
- ගොවි සංවිධානවල සභාපතිවරුන්
- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වරුන්

1.4.4 දත්ත විශ්ලේෂණය

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ, සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය විසින් දත්ත පරිගණක ගත කොට සැකසීම සිදු කරන ලද අතර, විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම මගින් එනම්, පරාසයන්, සාමාන්‍යයන්, ප්‍රතිශතයන් සහ නොයෙකුත් දර්ශක භාවිතයෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

1.5 සීමාවන්

- අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ආනාරක්ෂිත තත්වයන් හේතුවෙන් එහි ක්ෂේත්‍ර කටයුතු සිදු නොවීම.

- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රමවත් පරිගණක ගත දත්ත පද්ධතියක් භාවිතා නොකිරීම හේතුවෙන් ද්විතියික දත්ත ලබා ගැනීමේ දී අසීරුතාවයන්ට මුහුණ දීමට සිදු විය.

1.6 පර්යේෂණ වාර්තාවේ සැකැස්ම

මෙම පර්යේෂණ වාර්තාව පරිච්ඡේද දහයකින් සමන්විත වේ. පළමුවන පරිච්ඡේදය මගින් පර්යේෂණ පසුබිම, ගැටලුව සහ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡා කරන ලදී. කෘෂිකාර්මික අංශයේ අවදානම් කළමනාකරණය, කෘෂි රක්ෂණ ක්‍රමයේ වැදගත්කම සහ කෘෂි රක්ෂණ ක්‍රමයේ ඓතිහාසික පසුබිම හා ශ්‍රී ලංකාවේ කෘෂිරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳව දෙවන පරිච්ඡේදය තුළින් විස්තර කරනු ලබයි. තුන්වැනි පරිච්ඡේදය, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සහ සංවිධාන ව්‍යුහය පිළිබඳ සාකච්ඡා කිරීමට වෙන් වී ඇති අතර සිව්වන පරිච්ඡේදය මගින් සෙලින්කෝ රක්ෂණ සමාගමේ ක්‍රියාත්මක කෘෂිරක්ෂණ ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා විස්තර කෙරේ. පස්වන පරිච්ඡේදය තුළින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වී වගා රක්ෂණ ක්‍රමයේ වත්මන් ක්‍රියාකාරිත්වය පිළිබඳ පුළුල් ව සාකච්ඡා කෙරෙන අතර හයවන පරිච්ඡේදය මගින් රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාත්මක වනු ලබන අනිකුත් රක්ෂණ ක්‍රම පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරනු ලබයි. වී වගා රක්ෂණ ක්‍රමය හා ඒ සඳහා ගොවීන්ගේ සහභාගිත්වය පිළිබඳව හත්වන පරිච්ඡේදයෙන් ද, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ හා සෙලින්කෝ රක්ෂණ සමාගමේ ක්‍රියාත්මක වී වගා රක්ෂණ ක්‍රමයන් පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් අටවන පරිච්ඡේදයෙන් ද සිදු කෙරේ. වගා රක්ෂණ ක්‍රමයට සම්බන්ධ පාර්ශවයන්ගේ ගැටලු සහ ඔවුන් ඒ සඳහා කරනු ලබන යෝජනා නවවැනි පරිච්ඡේදයෙන් සාකච්ඡා කරන අතර, ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා අවශ්‍ය නිගමන හා යෝජනා දසවැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

දෙවන පරිච්ඡේදය

වගා රක්ෂණ ක්‍රමයේ වැදගත්කම සහ කෘෂි රක්ෂණ ව්‍යාපෘතියට සම්බන්ධ ප්‍රතිපත්ති

2.1 කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අවදානම හා අවදානම් කළමනාකරණය

කෘෂිකාර්මාන්තය එහි සියලු පැතිකඩයන්ගේ සහ සම්බන්ධතාවයන්ගේ ස්වරූපය අනුව සලකා බැලීමේ දී, එහි අවිනිශ්චිත ස්වභාවය කැපී පෙනෙන සාධකයකි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී බෙදා හැරීම් හා හුවමාරු ක්‍රමයන්හි දී, අනිකුත් ව්‍යාපාරික අංශ සේ ම සාමාජ්‍ය හා ආර්ථිකමය වශයෙන් අවිනිශ්චිත ස්වභාවයක් කෘෂිකර්මාන්තය තුළ පවතී. කෙසේ වුවත් කෘෂිකර්මය අනිකුත් අංශයන්ට සාපේක්ෂ ව ස්වභාවික පරිසරය සමඟ ගැටෙන බැවින් භෞතික වශයෙන් ඉහළ අවදානම් හා අවිනිශ්චිතතාවන්ට මුහුණ දීමට සිදු වේ.

මේ අනුව, අනිකුත් ආර්ථිකමය ව්‍යාපාරයන්ට හෝ අංශයන්ට සාපේක්ෂ ව, කෘෂිකර්මාන්තය ඉහළ මට්ටමේ අවදානම් හා අවිනිශ්චිත ස්වභාවයක පවතින බව පෙනී යයි. කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය දැඩි ලෙස ස්වභාව ධර්මයේ විවිධ බලපෑම් වලට ලක් වීම ඒ සඳහා හේතු වෙයි. එමෙන්ම නිෂ්පාදනය සඳහා තීරණ ගැනීමේ සිට අවසන් වශයෙන් අස්වැන්න වෙළඳපළට ඉදිරිපත් කරන අවස්ථාව දක්වා වූ දිගු කාලීන නිෂ්පාදන කාල පරාසයක් කෘෂිකර්මාන්තය තුළ පැවතීම ද මෙම අවදානම් හා අවිනිශ්චිත තත්වය සාපේක්ෂ ව ඉහළ යාම කෙරෙහි හේතු වේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අවදානම පුළුල් වශයෙන් කොටස් 2 කට බෙදා දැක්විය හැකිය. එනම් නිමවුම් අවදානම හා මිල අවදානම යනුවෙනි. ස්වභාවිකව සිදුවන උපද්‍රවයන් නිමවුම් අවදානම කෙරෙහි හේතු වන අතර, ආර්ථිකයේ සිදුවන යම් යම් අවිනිශ්චිතතාවයන් මිල අවදානම කෙරෙහි හේතු වෙයි. කෙසේ වුවත් කෘෂිකර්මාන්තයේ නියැළී සිටින්නන්ට, ප්‍රධාන වශයෙන් ස්වභාව ධර්මයේ විවිධ අවදානම්වලට මුහුණ දීමට සිදු වේ.

ස්වභාවිකව සිදුවන එවන් උපද්‍රවයන් පුළුල් වශයෙන් කොටස් 3 කට බෙදිය හැකිය.

1. කාලගුණය සම්බන්ධයෙන් සිදුවන සිදු වීම්, එනම් නියඟය, ජලගැලීම්, තෙතමය වැඩි වීම, තෙතමනය අඩු වීම් වැනි සාධක. මෙවන් තත්වයන් වගාවේ ඵලදාව සහ පවතින අස්වනු යනාදිය සඳහා අහිතකර ආකාරයෙන් බලපානු ලබයි
2. පුළුල් වශයෙන් පැතිරෙන භෝග සඳහා වැළඳෙන රෝග
3. කෘමී සහ වසංගත රෝග

වගාවන්ට අහිතකර කාලගුණික තත්වයන්, වගාව සඳහා බිම් සැකසීමේ සිට, අවසන් අස්වනු නෙළන අවස්ථාව දක්වා වූ කුමන අදියරේ දී හෝ වගාව සඳහා බාධාවන් ලෙසින් පැමිණිය හැකිය. ස්වභාව ධර්මයේ අහිතකර බලපෑම් සමහර අවස්ථාවල ඉතා පුළුල් වශයෙන් ව්‍යාප්තවන විශාල ආපදාවක් බවට පත් විය හැකිය. 1982 දී එස්.එම්. අසාන් විසින් සඳහන් කළ පරිදි, කෘෂිකර්මාන්තයේ නියැළී සිටින ගොවි ප්‍රජාවගෙන් බහුතරයක් එවන් විශාල වූ අවදානමක් දාරාගැනීමට තරම් හැකියාවකින් යුක්ත නොවන අතර, විශාල පරිමාණයෙන් සිදුවන එවන් වගා හානියක දී, කෘෂිකර්මික නොවන අනිකුත් නිෂ්පාදන සඳහා ද ඉල්ලුමේ ක්ෂණික පහළ යාමක් අපේක්ෂා කළ හැකිය. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්තය තුළ නියැළී සිටින ගොවිප්‍රජාව සම්බන්ධයෙන් සලකා බැලූ විට ඔවුන්ගෙන් බහුතරයක් අඩු ඉතිරිකිරීම් මට්ටමක් සහිත හා ඉහළ ණය ගැතිභාවයකින් යුක්ත පිරිසක් බැවින් වගාව සඳහා සිදුවන විශාල උපද්‍රවයකින් පමණක් නොව, ඉතා සුළු ආපදාවකින් වුව ද පීඩා විඳීමේ

අවදානමක් සහිත වූ පිරිසකි. එවන් සුළු ආපදාවකින් වුවද, ඊළඟ කන්නයේ වගාව සඳහා අවශ්‍ය මූල්‍යමය හැකියාවකින් තොර වීමේ අවදානමට මුහුණ දීමට ඔවුන්ට සිදු වේ. මේ අනුව කුමන ආකාරයේ හෝ සහනදායී සහායක් හා ආවරණයක් ඉතාමත් තදින් අවශ්‍යව පවතී.

2.2 වගා රක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පවතින අවදානම නම් වූ ගැටලුව අවම කිරීම සඳහා යොදා ගත හැකි එක් ක්‍රමෝපායයක් වශයෙන් කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය භාවිතා කළ හැකිය. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැළී සිටින ගොවීන්, දුගී භාවයේ විෂමචක්‍රය තුළ සිර වෙමින් සිටින අතර, සීමිත සම්පත්, අඩු යෙදවුම් හා සීමිත නිමවුම් යන කරුණු මේ තත්ත්වය වඩාත් තීව්‍ර කරනු ලබයි. ගොවියාට පාලනය කළ නොහැකි ආකාරයට සිදු වන ස්වභාවික බලවේග හේතුවෙන් සිදු වන හානි, දියුණු ජල සම්පාදිත ක්‍රම, ගංවතුර උවදුරු වැළැක්වීමේ යෝජනා ක්‍රම, කෘෂි වසංගත මර්දනය කළහැකි කෘෂි රසායන ද්‍රව්‍ය වැනි ක්‍රම මඟින් යම්තාක් දුරකට මර්දනය කළ හැකි වුවත්, එම පිළියම් ඉක්මවා යන හානි වලින් ගොවියන් තම වගා කටයුතු සඳහා වැයකොට තිබූ මූල්‍යමය හා ශ්‍රම සම්පත් සම්පූර්ණයෙන් අහිමි වී යාමෙන් ඇතිවන අනර්ථකාර ප්‍රතිඵල වැළැක්වීමට පියවර ගත යුතු වේ. බොහෝ ගොවීන් කෘෂිකර්මය සඳහා ආයෝජනය කරනු ලබන්නේ ඉතාමත් මහන්සියෙන් උපයාගන්නා ලද මුදල් වන අතර බොහෝ විට පෞද්ගලික ණය ලබා දෙන්නන් සහ බැංකු මඟින් වගාවට අවශ්‍ය මූල්‍ය සපයා ගනු ලබයි. මේ අනුව බලන විට, යම් කන්නයකදී සිදුවන වගා හානියක්, ඊළඟ කන්නයේ වගාව සඳහා අවශ්‍ය ආයෝජන ශක්තිය අඩපණ කරනු ලබයි. මේ අනුව බලන විට කෘෂිකර්මාන්තයේ ආයෝජන සුරක්ෂිතතාව ඇති කිරීම තුළින් ගොවීන්ගේ ආදායම් ස්ථායිතාවය ආරක්ෂා කිරීම සඳහා කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක් තුළින් විශාල මෙහෙයක් ඉටු කළ හැකිය (Ekanayake, 1990). වගා හානි සඳහා රජය මඟින් සෘජුවම ආධාර ලබා දීම, එවන් අවිනිශ්චිත ආපදා සඳහා යෙදිය හැකි එක් පියවරක් වුවත්, එවන් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම තුළින් රජයට විශාල මූල්‍යමය බරක් දැරීමට සිදු වේ. එමෙන්ම එසේ සැපයෙන සහනවල ප්‍රමාණය හෝ එහි අඛණ්ඩ ක්‍රියාකාරිත්වය රජයේ ප්‍රතිපත්ති හා සම්පත් ප්‍රමාණය මත තීරණය වේ. ඒ අනුව බලන විට, කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක් මඟින්, රජයකට මුහුණ දීමට සිදු වන එවන් දුෂ්කරතා මඟහරවා ගනිමින්, වගා හානි සඳහා මුහුණ දෙන ගොවීන්ට සහන සැලසීමේ අඛණ්ඩ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ හැකිය. ඒ අනුව සමූහයක් වශයෙන් ගොවි ප්‍රජාව විසින් අඛණ්ඩ ව වැය කරනු ලබන සුළු මුදලක් මඟින් අනාගතයේ අවිනිශ්චිත වශයෙන් ඇති විය හැකි අලාභයන් සමනය කර ගත හැකිය.

එමෙන්ම විශාල වශයෙන් ව්‍යාප්ත වන වගා හානියක දී ප්‍රාග්ධනමය වශයෙන් සිදුකරන යෙදවුම්වල අවදානම අවම කිරීම ණය ලබාදෙන ආයතනවල අවදානම අවම කිරීම තුළින් ගොවීන්ට ණය ලබා ගැනීම සඳහා සහාය වීම යන කරුණු ද කෘෂි රක්ෂණ ක්‍රමයකින් අපේක්ෂා කළ හැකිය.

ආයතනික වශයෙන් ණය ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා කෘෂිරක්ෂණ ක්‍රමයෙන් ලබාදෙන ආවරණය පිළිබඳ සැලකීමේ දී, එය පහත සඳහන් පරිදි වේ. එනම් ණය දෙන ආයතනයක් විසින් ගොවීන් වෙත වගා ණය සපයා ඇති විට, සිදු වන විශාල වගා හානියක දී, ගොවීන්ගෙන් ණය ආපසු අය කර ගැනීමේ අවදානමට මුහුණ දීමට ණය දෙන ආයතනවලට සිදු වේ. එසේ දිගින් දිගට ම සිදු වීම එම ආයතන වලට ඉදිරි ණය ලබා දීමේ කටයුතුවල දී ද්‍රවශීලතා ප්‍රශ්නවලට මුහුණ දීමට හේතු සාධක වේ. වගා රක්ෂණ ක්‍රමයක් තුළින් එවන් විටක සිදුවන හානි සඳහා ගොවීන්ට සැපයෙන වන්දි තුළින් ණය ලබා දෙන ආයතනවලට තම ණය මුදල් ආපසු අය කරගැනීමේ හැකියාව පවතී. එමෙන්ම මනා කෘෂි රක්ෂණ ක්‍රමයක ආවරණය පවතී නම්, භූමිය හා වාරිමාර්ග ජලය මනා ලෙස උපයෝගී කරගැනීමේ හැකියාව ද පවතී. මෙහිදී ඉහළ අවදානමකින් යුක්ත ඉඩම් පවා වගාව සඳහා යොදවා ගත හැකි අතර, එක් තැනක පල් නොවී ගොවීන්ට සිය නිෂ්පාදන චක්‍රය මනා ලෙස සිදු කර ගෙන යාමේ හැකියාව පවතී (Sandarathna, 1968). එමෙන්ම නවීන තාක්ෂණික ක්‍රම සහ උපාංග වැනි දේ සිය වගා කටයුතු

සඳහා ආයෝජන අවදානමකින් තොරව යොදා ගැනීමට ද මනා කෘෂි රක්ෂණ ක්‍රමයක් තුළින් ගොවීන්ට හැකියාව ලැබේ.

ප්‍රධාන වශයෙන්, වගා රක්ෂණය තුළින් ප්‍රධාන වශයෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් වල ග්‍රාමීය සංවර්ධනය සඳහා පවතින මූලික ගැටලු 2කට විසඳුම් සපයනු ලබයි. එනම්, අඩු ආදායම් ලාභී ගොවීන් සිය වගා කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීමට මැලිවීම සහ ගොවීන්ට ණය ලබා දෙන මූල්‍ය ආයතනවල කාලයක් තිස්සේ ගොවීන්ට වගා ණය ලබාදීමෙන් පවතින මූල්‍ය දුබලතාවයන් යන ප්‍රශ්නවලට පිළියම් වශයෙනි. මෙවන් අවදානම් අවම වීම තුළින්, ගොවීන්ට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආයෝජන අවස්ථා වැඩි කර ගැනීමේ හැකියාවක් පවතී (Lele, 1975; Binswanger and Sillers, 1983).

මේ අනුව අලෙවිකරණ පහසුකම්, සහතික මිල ප්‍රතිපත්ති, ආයතනමය ණය පහසුකම් හා දියුණු ව්‍යාප්ති සේවා සැපයීම වැනි කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාමාර්ගයන් සමඟ ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකර්මික රක්ෂණ ක්‍රමයක් තුළින්, ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ ආර්ථික තත්වය දියුණු කිරීම, වගා කරන බිම් ප්‍රමාණය පුළුල් කිරීම, සූක්ෂම වගා ක්‍රම භාවිතයෙන් ඉහළ ඵලදායිතාවයක් ලබාගැනීම තුළින් සමස්ථ කෘෂි ක්ෂේත්‍රයේ ම ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. සංවර්ධනය වන රටවල කෘෂිකර්ම රක්ෂණයේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනයන් රාශියක් සිදු කර ඇති පී.කේ. රායි මහතා සඳහන් කරන පරිදි වගා රක්ෂණ ක්‍රමයක් මඟින් ගොවීන්ගෙන් ආදායම ස්ථාවර කිරීම මඟින් ඔවුන්යේ ආර්ථික තත්වය ශක්තිමත් කරන අතර, ණය ගැනීමට ඇති සුදුසු භාවය දියුණු කරයි. ණය දෙන ආයතනවල වගකීම ද ආරක්ෂා කරන අතර නවීන කෘෂිකාර්මික ශිල්ප ක්‍රම භාවිතයට හැකියාව හා ධෛර්යය ලබා දීම තුළින් සමස්ත කෘෂි නිෂ්පාදනය වැඩි කිරීමට සහාය දෙයි (Ray, 1967) .

2.3 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපෘතියේ ඓතිහාසික පසුබිම සහ ප්‍රතිපත්ති

වී වගාව සඳහා "සියලු අවදානම්" (All-risk) සඳහා රක්ෂණය, ආසියාතික රටවලින් ප්‍රථමයෙන් ක්‍රියාත්මක වූයේ ශ්‍රී ලංකාව තුළයි. එය ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) මූල්‍යාධාර යටතේ සීමිත පරීක්ෂණ මට්ටමින් සිදු වූවකි (Ray, 1981). 1956 දී ශ්‍රී ලංකා රජය විසින්, කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වන එක්තරා යන්ත්‍රයක් වශයෙන් හඳුනා ගන්නා ලද අතර සමාජය හා ආර්ථිකමය වශයෙන් සමාජය තුළ කොටු වී සිටින ජන කොටසකට යම් සහනයක් හා ආරක්ෂාවක් සැලසිය හැකි බව ද අවබෝධ කරගන්නා ලදී. එම වර්ෂය තුළ ම ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහාය ශ්‍රී ලංකාවට ලැබුන අතර, ඒ යටතේ කෘෂි රක්ෂණ ව්‍යාපෘතියක් සඳහා ක්‍රියාකාර වැඩ සැලස්මක් සකස් කරන ලදී. ඒ අනුව 1958 අගභාගයේ එනම් 1958/59 මහ කන්නයේ සිට, පරීක්ෂණ මට්ටමින් වී වගාව සඳහා වගා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙහි ද වී වගාබිම් අක්කර 28,000ක් දිස්ත්‍රික්ක 6ක් ආවරණය වන පරිදි රක්ෂණය කරන ලද අතර, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව විසින් එහි පරිපාලන කටයුතු සිදු කරන ලදී. කාලසීමාවන් කිහිපයක් යටතේ කෘෂිරක්ෂණ කටයුතුවල සිදු වූ විකාශනය පිළිබඳව මී ළඟට සාකච්ඡා කෙරේ.

1958/59 මහ කන්නයේ සිට 1960/61 මහ කන්නය දක්වා කාලසීමාව

නියාමක පදනමක් මත 1958/59 මහ කන්නයේ සිට වී වගා රක්ෂණය දිස්ත්‍රික්ක 6ක් තුළ අක්කර 28,000 ක පමණ වී වගා බිම් ප්‍රමාණයක ක්‍රියාත්මක කරන ලද අතර, විවිධ පළාත් ආවරණය වන පරිදි එය සිදු කරන ලදී. මෙය අවුරුදු 4ක් පුරා ක්‍රියාත්මක කරන ලද අතර, රක්ෂණ ක්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම හා ඒ සම්බන්ධව ගොවීන්ගේ ප්‍රතිචාර දැනගැනීම ඒ තුළින් අපේක්ෂා කරන ලදී. මෙම වගා රක්ෂණ ක්‍රමයේ පරිපාලන කටයුතු ගොවිජනසේවා කොමසාරිස් මඟින් සිදු කරන ලද අතර, ඒ සඳහා වී වගාවට සම්බන්ධ අනිකුත් දෙපාර්තමේන්තු සහ ආයතනවල උපකාරය සහ

සහයෝගය ද ලබා ගන්නා ලදී. කෙසේ වුවත් මේ යටතේ මුළු වී වගාබිම් ප්‍රමාණයෙන් 3%ක ප්‍රමාණයක් රක්ෂණ ආවරණය කරන ලදී. මෙම නියමු ව්‍යාපෘතිය යටතේ රක්ෂණ වාරික අය කිරීම, අස්වනු නෙළීමෙන් පසුව සිදු කරන ලද අතර ගොවීන්ට සිදුවන කරදරකාරී ස්වභාවය අවම කිරීම ඉන් අපේක්ෂා කරන ලදී.

1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත

1958/59 මහ කන්නයේ සිට ආරම්භ වූ වගා රක්ෂණ ක්‍රමයට නීතිමය පදනමක් සැපයීම තුළින් එහි පැවති අඩුපාඩු තුරන් කිරීම 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ අරමුණ විය. තෝරා ගත් ප්‍රදේශ සඳහා අනිවාර්ය වගා රක්ෂණ සැපයීමත්, වගා රක්ෂණ උපදේශක මණ්ඩලයක් පිහිටු වීමත් එම සංශෝධිත පනතින් සිදු වූ අතර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා ඇති ගොවිකාරක සභා සහ ඒවා ක්‍රියාත්මක නොවූ ප්‍රදේශවල සමුපකාර සමිතිවල සහයෝගය ඇතිව එය ක්‍රියාත්මක කරන ලදී. ගොවිජන සේවා කොමසාරිස්වරයා යටතේ ක්‍රියාත්මක වූ මෙම පනතින් ගොවිජනතාවට අනිවාර්ය වී වගා රක්ෂණය හා නිශ්චිත හානි සඳහා රක්ෂණ වන්දි ලැබීම සිදු විය.

1962/63 සිට 1972 දක්වා කාලය

1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත 1961/62 මහ කන්නයේ සිට ක්‍රියාත්මක වූ අතර එය 1973 දක්වා ක්‍රියාත්මක විය. ඒ යටතේ වී වගා බිම් අක්කර 200,000 ප්‍රමාණයක් දිස්ත්‍රික්ක 16ක් තුළ රක්ෂණය කරන ලදී. පළමු වසර 6 තුළදී සාර්ථක මට්ටමින් ක්‍රියාත්මක වුව ද මතු වූ මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් එහි ප්‍රතිසංස්කරණ කිහිපයක් සිදු කළ යුතු බව පෙනී යන ලදී. රක්ෂණ වාර මුදල් ගෙවීම සඳහා ගොවීන්ගේ උනන්දුව අඩුවීම හා අස්වනු ලැබීමෙන් පසු වාරමුදල් ගෙවීමට අවසර ලබාදීම හේතුවෙන් කල්තියා රක්ෂණය කර නොතිබූ වගාවන්ට පවා වන්දි ගෙවීමට සිදු වීමත් නිසා රක්ෂණ ක්‍රමයේ ලැබීම් හා වන්දි ගෙවීම් අතර විශාල පරතරයක් පැවතීම මත රජය මගින් දැරිය යුතු පිරිවැය ප්‍රමාණය ඉතා ඉහළ මට්ටමක පැවතුණි. එමෙන්ම මේ ක්‍රමය අවශ්‍යතා ප්‍රමාණයට වඩා මධ්‍යගත වීම මත වන්දි ගෙවීමේ දී සිදු වූ ප්‍රමාදයන් ද මෙහි අසාර්ථකත්වයට හේතු විය.

1973 සිට 1983 දක්වා කාලය

1971 බලයට පත් සමඟි පෙරමුණ ආණ්ඩුව යටතේ කෘෂිකාර්මික පනත කාලානුරූපවම නැවත වෙනස් වූයේ 1973 අංක 27 දරණ කෘෂිකාර්මික රක්ෂණ පනතින්ය. මෙය 1974 අප්‍රේල් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වූ අතර මේ යටතේ කෘෂි රක්ෂණ ක්‍රමයේ වැදගත් පරිපාලනමය වෙනස්වීම් රාශියක් සිදු කිරීමට අපේක්ෂා කරන ලදී.

1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්ෂණ පනත

1974 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වීම ආරම්භ වූ මෙම පනත මගින්, කාර්යක්ෂ ම වූ නව කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය පිහිටුවනු ලැබීය. මෙම පනතින් අපේක්ෂිත අරමුණු පහත පරිදි වෙයි.

I. වී වගා කරන ගොවීන් සඳහා ප්‍රතිලාභ සැලසීමේ උපක්‍රමයක් වශයෙන් පුළුල් කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
II. කෘෂිකාර්මික රක්ෂණය සංවර්ධනය හා උසස් කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ අධ්‍යයනයන් සිදුකිරීම.

මෙම ව්‍යාපෘතිය අදියර 3 ක් යටතේ පිහිටුවන ලදී. එනම්,

I. වී වගාව සඳහා රක්ෂණය සැපයීම. මේ යටතේ සියලු වී වගා බිම් අනිවාර්යයෙන් රක්ෂණය කළ යුතු විය.
II. පශු සම්පත් ක්ෂේත්‍රය හා තෝරාගත් අතිරේක භෝග සඳහා රක්ෂණය සැපයීම.
III. සාම්ප්‍රදායික නොවන භෝග සඳහා රක්ෂණය සැපයීම.

මෙම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සහනාධාර අර්ධ වශයෙන් සපයන ලද අතර පරිපාලන වියදම් සඳහා රාජ්‍ය අධාර සපයා දෙන ලදී. ආරම්භක ප්‍රාග්ධනයක් ලෙස රු.200,000ක් මණ්ඩලය වෙත ලබා දුන් අතර වන්දි ගෙවීම් හා ක්‍රියාකාරී වියදම් වාර මුදල් ආදායමින් පියවා ගත යුතු යැයි සලකන ලදී. එහෙත් යම් වගා කන්නයක් සඳහා ගෙවනු ලබන වන්දි ප්‍රමාණය කෘෂි රක්ෂණ ක්‍රමයේ මුළු වගකීම් 15% කට වඩා ඉක්මවා සිටින අවස්ථාවල මෙම ක්‍රමය සඳහා රජයේ ආධාර ලැබිය හැකි විය. කෙසේ වුවත් මෙම නව පනත මගින් පහත සඳහන් ප්‍රධාන වෙනස්කම් සිදු කරන ලදී.

a) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂි රක්ෂණ මණ්ඩලය (AIB) පිහිටුවීම.
b) කෘෂි රක්ෂණ ක්‍රමය මුළු රට ම ආවරණය වන පරිදි හඳුන්වා දීම.
c) වී වගා රක්ෂණය අනිවාර්යය කරන ලද අතර, කෘෂි රක්ෂණ මණ්ඩලයට, වාර මුදල් ගෙවීම පැහැර හරින ගොවීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය අධිකාරී බලය පවරා දෙන ලදී.
d) යම් කන්නයක් සඳහා කෘෂි රක්ෂණ මණ්ඩලය නියම කරන ලද කාලසීමාව තුළ අවසාන දිනට පෙර රක්ෂණ වාර මුදල් ගෙවිය යුතු විය.
e) පශු සම්පත් ක්ෂේත්‍රය සහ අනිකුත් විශේෂිත භෝග සඳහා වන ස්වේච්ඡා රක්ෂණය පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම කරන ලදී.
f) කෘෂි රක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා, කෘෂිකාර්මික ණය සැපයීමේ ක්‍රමය සහ සහතික මිල ක්‍රමය යටතේ වී මිල දී ගැනීම සමඟ නව කෘෂිකර්ම රක්ෂණ ක්‍රමය සම්බන්ධ කිරීමට පියවර ගන්නා ලදී.

1983 සිට 1987 දක්වා කාලය

1983 සිට ආරම්භ වූ කාලසීමාව තුළ ඇතැම් වැදගත් ප්‍රතිපත්තිමය වෙනස්කම් කිහිපයක් සිදු කරන ලද අතර මෙහි දී මෙම ප්‍රතිපත්තිමය වෙනස් වීම් බොහොමයක් වී වගා රක්ෂණය සම්බන්ධයෙන් සිදු කරන ලදී.

a) රජය විසින් පොලී රහිත දිගු කාලීන ණයක් වශයෙන් රු. මිලියන 50ක මුදලක් ලබා දෙන ලද අතර, රක්ෂණ වාරික අය වීම් සහ වන්දි ගෙවීම් අතර වූ හිඟය පියවා ගැනීම සඳහා උපකාරී විය.
b) සමානුපාතික ක්‍රමය යටතේ වන්දි ගෙවීම් වැනි ක්‍රමයන් පුද්ගලික හා ප්‍රාදේශීය කණ්ඩායම් මට්ටමින් ද අහෝසි කිරීම.
c) ඊළඟ වගා කන්නය ආරම්භ වීමට පෙර රක්ෂණ වන්දි ගොවීන් වෙත ළඟා කිරීම සඳහා අවශ්‍ය කඩිනම් හා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසීම.
d) වී වගා රක්ෂණය සම්බන්ධ නීති හා රෙගුලාසි ඉතා ඉක්මන් හා පහසු ක්‍රමයකට වන්දි ගෙවීමට සුදුසු ආකාරයෙන් ප්‍රතිසංස්කරණය කිරීම.
e) නොකඩවා වගා කන්න 5 ක් තුළ රක්ෂණ ආවරණය ලබාගත් එහෙත් වන්දි සඳහා හිමිකම් නොකියන ලද ගොවීන් සඳහා දිරිගැන්වීමක් වශයෙන් නොමිලේ රක්ෂණ ආවරණයක් සැපයීම.

1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත

1973 අංක 27 දරණ කෘෂිරක්ෂණ පනත මගින් ද කෘෂිරක්ෂණය සඳහා ආවරණය වූ ක්ෂේත්‍රය ඉතාමත් සීමිත වූ අතර, සමස්ත කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආවරණය වන පරිදි කෘෂිකාර්මික රක්ෂණ නීතියක් හඳුන්වා දීමේ කාලීන අවශ්‍යතාවය මත, කෘෂි රක්ෂණ ක්ෂේත්‍රයේ කටයුතු වඩාත් පුළුල් කරමින් 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත සම්මත කරගන්නා ලදී.

මෙහි දී කෘෂිරක්ෂණ කටයුතු "කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය" (AAIB) වෙත පවරන ලද අතර, එය ස්වයං මුල්‍ය පදනමකින් යුක්තව ක්‍රියාත්මක වන ආයතනයක් බවට පත් කරන ලදී. මෙය 1999 අගෝස්තු 16 වන දින සිට ක්‍රියාත්මක වන ලදී. ඒ අනුව ,

1. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින්, පුළුල් රක්ෂණ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරන ලද අතර වී ඇතුළු අතිරේක භෝග, බහු වාර්ෂික භෝග, ආපනයන භෝග, වැවිලි භෝග, ඖෂධීය පැළෑටි සහ පලතුරු වගා රක්ෂණය, වන වගා සහ මල් හා විසිතුරු පැළ රක්ෂණය, පශු සම්පත් ක්ෂේත්‍රය, ධීවර ක්ෂේත්‍රය, කෘෂිකාර්මික යෙදවුම් හා ආම්පන්න, ගබඩා රක්ෂණය යන ක්ෂේත්‍ර මේ යටතට අයත් වේ.
2. කෘෂිකාර්මිකයන් උදෙසා සිදු කරන වෛද්‍ය ප්‍රතිලාභ රක්ෂණ ක්‍රමය, ගොවියන් හා ධීවරයන් සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
3. එමෙන්ම, පෞද්ගලික අංශය සඳහා ද කෘෂිරක්ෂණ කටයුතුවල නියුක්ත වීමේ නීතිමය බලය පනත මගින් ලබා දෙන ලදී.

1987 අංක 12 දරණ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත, 1990 අංක 23 දරණ ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත, යන සියලු පනත්වලට අදාල කටයුතු සිදු කිරීමේ බලය ද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණය මණ්ඩලය වෙත පවරා දෙන ලදී.

තුන්වන පරිච්ඡේදය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සහ සංවිධාන ව්‍යුහය

3.1 හැඳින්වීම

කෘෂි රක්ෂණ මණ්ඩලය 1973 දී ස්ථාපනය කරන ලද්දේ වී වගාව හා අතිරේක භෝග වගාව මෙන් ම පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය රක්ෂණ ආවරණය සැපයීමේ ප්‍රධාන අරමුණු සහිතවය. මෙම කාලය තුළ රක්ෂණ ව්‍යාපාරයේ ඒකාධිකාර බලය රජය සතුව පැවතීම හේතුවෙන් වී වගාව සඳහා වගා රක්ෂණ ආවරණය සැපයීමේ තනි අධිකාර බලය කෘෂි රක්ෂණ මණ්ඩලයට පැවරුණු අතර, වී වගාවේ නිරත වූ ගොවීන්ට වගා රක්ෂණය ලබා ගැනීම අනිවාර්ය කරන ලදී. කෙසේ නමුත් අතිරේක භෝග සහ පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැළි ගොවීන්ට රක්ෂණ ආවරණය ලබා ගැනීම අනිවාර්ය නොවූ අතර, ඔවුන්ට ස්වේච්ඡා පදනමකින් යුක්ත ව රක්ෂණ ආවරණය ලබා ගත හැකි විය.

අවුරුදු ගණනාවක් තුල කෘෂිරක්ෂණ මණ්ඩලය වී වගාව සඳහා රක්ෂණ ආවරණය සැපයුව ද, රැස් කරනු ලබන වාර මුදල් වන්දි ගෙවීමේ අවශ්‍යතාවයට තරම් ප්‍රමාණවත් නොවූ බැවින් එම හිඟය පියවීම සඳහා රජයේ භාණ්ඩාගාරයෙන් සැලකිය යුතු මට්ටමේ මුදලක් කෘෂි රක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙන ලදී. මෙම අරමුදල් හිඟතාවය, කෘෂි රක්ෂණ මණ්ඩලයට සිය රක්ෂණ ආවරණ කටයුතු විශාල වගා බිම් ප්‍රමාණයක් කරා පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට බාධාවක් ව පැවතුණි. එමෙන්ම පවත්නා සම්පත් අනුව කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් වන්දි වශයෙන් ගෙවීමට අනුමත කරන ලද මුදල් ප්‍රමාණයන් ගොවීන්ට සත්‍ය වශයෙන් සිදු වන වගා හානි ප්‍රමාණය ආවරණය කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය.

1999 අගෝස්තු 16 වන දින සිට පටන් ක්‍රියාත්මක වූ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මගින්, කෘෂි රක්ෂණ මණ්ඩලයේ කටයුතු අලුතින් ස්ථාපනය කරන ලද කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB) වෙත පැවරුණි. මෙම නව පනත යටතේ "කෘෂි කාර්මිකයා" යන්නට ඉතා පුළුල් අර්ථකතනයක් සැලසීමෙන් මෙම මණ්ඩලය මගින් ඉටු කළ යුතු සේවාවන් මෙන් ම සේවා දායක පිරිස හා තලය ව්‍යාප්ත කර වැඩි කරන ලදී. එතෙක් මෙම මණ්ඩලයේ විෂය පථයට යොමු වී නොතිබූ වතු වගා සියලුම භෝග වගා සඳහා රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙන් ම, කෘෂිකාර්මිකයන් සඳහා වෛද්‍යාධාර ක්‍රම, සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙන් ම සහ ධීවර කටයුතු සඳහා රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමට ද නව පනතේ විධිවිධාන සලසා තිබුණි. ගොවි සහ ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය තුළින් ගොවි සහ ධීවර ප්‍රජාවගේ පුළුල් සංවර්ධනයක් සහ ඔවුන්ගේ සමාජ ආර්ථිකයේ තිරසාර සංවර්ධනයක් අපේක්ෂා කරන ලදී.

රටේ බහුතරය වන ගොවි හා ධීවර ජනතාව රාජ්‍ය සහනාධාර අපේක්ෂාවෙන් ජීවත් නොවන පිරිසක් බවට යොමු කළ හැකි සහ එම පිරිස් යැපුම් මට්ටමින් මුදවා ගත හැකි සමාජ ආර්ථික සංවර්ධන ක්‍රමෝපායයන් තුළ අනිවාර්ය අංගයක් වූ ඉතිරි කිරීමේ පළපුරුද්ද ප්‍රගුණ කරවීම හා අපනයන සැලසුම් කර ගැනීමට පෙළඹවීම ඉහත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමවල මූලික පරමාර්ථය බව තවදුරටත් පැහැදිලි වන අතර, ප්‍රජාව තුළ එම ආකල්ප සහ අවබෝධය තහවුරු කිරීම තුළින් මින් උපරිම ඵල නෙළා ගත හැකි වනු ඇත. 1998 න් පසු රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් සැපයීම සීමා වීම සමග රක්ෂණ මණ්ඩලයට සිය මූල්‍යමය පැවැත්ම සඳහා සැලසුම් සකස් කළ යුතු විය. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සිය ආදායම රක්ෂණ වාර්ක මුදලින් රැස් කර

22323

ගත යුතු අතර රක්ෂණ ක්‍රියාකාරිත්වයන් වන්දි ගෙවීම් සහ පරිපාලන කාර්යන් වියදම් දැරිය යුතු ප්‍රධාන කාර්යන් වශයෙන් හඳුනා ගත හැකිය.

3.1.1 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දර්ශනය

කෘෂිකාර්මික රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ අවදානම අවම කර, ගොවියාට සමාජ ආරක්ෂණයක් සලසා තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයට දායක වීම මෙහි දර්ශනය වශයෙන් සැලකේ.

3.1.2 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මෙහෙවර

- කෘෂිකාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් වූ ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි කෘෂිකාර්මිකයාගේ යහපත පිණිස, ගොවිපළ ආදායම ස්ථායී කර, අවධානම අවම කිරීම තුළින් ගොවිජන ජීවිතය සුරක්ෂිත කිරීම සඳහා වගා රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය තුළින් ගොවි හා ධීවර ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- කෘෂි රක්ෂණ මණ්ඩලය මූල්‍යමය වශයෙන් ස්වයං විශ්වාසයකින් යුක්ත ව ක්‍රියාත්මක වන තත්ත්වයකට පත් කිරීම

3.1.3 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අරමුණු

- ස්වාභාවික උපද්‍රව සහ අනිකුත් සඳහන් කොන්දේසි මත සිදුවන හානි සඳහා, වී, වැවිලි භෝග, පශු සම්පත් හා ධීවර යන විවිධ ක්ෂේත්‍රයන්හි නියැලී සිටින කෘෂිකාර්මිකයන්ට හානිපූරණය සලසන පූර්ණ රක්ෂණ ක්‍රමයක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මිකයාගේ යහපත සඳහා කෘෂිකාර්මික උපකරණ හා මෙවලම් සහ චංචල හා නිශ්චල දේපළ සම්බන්ධයෙන් රක්ෂණ ක්‍රමයක් කෘෂිකාර්මිකයාගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවා ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මික සහ උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන සහ ඖෂධ පැළෑටි, ධීවර සහ වන නිෂ්පාදිත ගබඩා කිරීම සහ කල් තබා ගැනීම සම්බන්ධයෙන් වූ රක්ෂණ ක්‍රමයක් කෘෂිකාර්මිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවා ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මිකයන්ගේ හා ධීවරයන්ගේ ප්‍රතිලාභය උදෙසා වෛද්‍ය ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

3.1.4 කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අපේක්ෂිත පරමාර්ථ (ඉදිරි අවුරුදු 6 සඳහා - 2010 තෙක්)

- වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 10% කට වැඩි ප්‍රමාණයක් රක්ෂණ ආවරණය කිරීම
- අපනයන කෘෂි භෝග යටතේ අක්කර 10,500 ක් රක්ෂණය කිරීම
- අතිරේක භෝග රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ, අතිරේක භෝග වගා බිම් අක්කර 500 ක් රක්ෂණය කිරීම
- වැවිලි භෝග (Plantation Crop) රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ කුඩා තේ වතු, පොල්, කජු වැනි වැවිලි භෝග අක්කර 9,400 ක් ආවරණය කිරීම

- විසිතුරු පැළෑටි රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ විසිතුරු පැළෑටි 20,600 ක් රක්ෂණය කිරීම
- අර්තාපල් වගා බිම් අක්කර 1000 ක් රක්ෂණ ආවරණය කිරීම
- වී සඳහා ඉහළ මිලක් ලබා දීමේ අපේක්ෂාවෙන් වී ගබඩා 500 ක් රක්ෂණය කිරීම
- පශු සම්පත් යෝජනා ක්‍රමය යටතේ ගවයින් 8,600 ක් සහ එළුවන් 8,500ක් රක්ෂණය කිරීම
- "සුවසෙත" සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගොවීන් 17,000 ක් රක්ෂණය කිරීම
- ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගොවීන් 388,000 ක් බඳවා ගැනීම තුළින් එහි ගොවීන් සංඛ්‍යාව 1,150,000 දක්වා වැඩි කිරීම
- ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ ආවරණය ලබාගෙන ඇති සංඛ්‍යාව 69,000 දක්වා වැඩි කිරීම
- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ඉහත අරමුණු ළඟා කර ගැනීම සඳහා පරිපාලනයේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම

3.2 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ව්‍යුහය සහ පරිපාලනය

1973 අංක 27 දරණ පනත මගින් පිහිටුවන ලද කෘෂි රක්ෂණ මණ්ඩලයේ කටයුතු, 1999 අංක 20 දරණ පනත මගින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය පිහිටුවීමත් සමග ඒ වෙත පැවරුණි. කෘෂි රක්ෂණ මණ්ඩලය 1973 දී කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අතර, කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය කෘෂිකර්ම වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. මෙම මණ්ඩලය සභාපතිගේ ප්‍රධානත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වන අතර, සභාපති පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි.

සටහන 3.1: කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය තුළ අංශ 5ක් පවතින අතර, එම අංශ සාමාන්‍යාධිකාරීවරයා හෙවත් ප්‍රධාන විධායක නිලධාරියා මගින් පාලනය කරනු ලබයි. රක්ෂණ මණ්ඩලයේ කටයුතු පහත දැක්වෙන අංශවලින් සිදු කෙරෙයි.

a) රක්ෂණ ක්‍රියාකාරීත්වයන්
b) පශු සම්පත් ක්‍රියාකාරීත්වයන්
c) ජීවනාංකික පර්යේෂණ හා අලෙවි
d) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ අංශය
e) පුහුණු හා ව්‍යාප්ති අංශ
f) මූල්‍ය අංශය
g) පරිපාලන අංශය
h) අභ්‍යන්තර විගණන අංශය

රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇති අතර දිස්ත්‍රික් කාර්යාල 25 ක් ද, උප කාර්යාල 5ක් ද, රක්ෂණ මණ්ඩලය සතුව පවතී. එම එක් එක් දිස්ත්‍රික් කාර්යාල සහ උප කාර්යාල සහකාර අධ්‍යක්ෂවරුන් 26ක් යටතේ පාලනය වනු ලබයි. ඇතැම් සහකාර අධ්‍යක්ෂවරුන් දිස්ත්‍රික් කාර්යාල හෝ උප කාර්යාල 1කට වැඩි ප්‍රමාණයක් කළමනාකරණය කරනු ලබයි. සංවර්ධන නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් එක් එක් දිස්ත්‍රික් කාර්යාල තුළ සහකාර අධ්‍යක්ෂවරුන්ට සහාය වනු ලබයි. මේ වන විට සංවර්ධන නිලධාරීන් 44ක් ද, ක්ෂේත්‍ර නිලධාරීන් 72ක් ද දිස්ත්‍රික්ක කාර්යාලවලට අනුයුක්ත ව සේවය කරනු ලබයි (ඇමුණුම1). මණ්ඩලයේ අනුමත සේවක මණ්ඩලය 457 කි. දැනට ස්ථිර සේවකයින් 299ක් ද, අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 117ක් ද මණ්ඩලය තුළ සේවය කරනු ලබයි.

ප්‍රධාන කාර්යාලය තුළ සිටින අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති විධිමත් ව සැකසීම (formulation) සහ වෙනස් කිරීම් ආදිය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. ප්‍රධාන කාර්යාලයේ සිටින අදාල අංශවල ප්‍රධානීන් එම ප්‍රතිපත්තිවලට අදාළව ක්‍රියාකාර සැලසුම් සකස් කරනු ලබන අතර දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය වෙත අදාළ උපදෙස් ලබා දෙනු ලබයි. එමෙන්ම එම අංශ ප්‍රධානීන් විසින් ලබා දුන් උපදෙස් අනුව ඇති කරන ලද ක්‍රියාකාර සැලසුම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් අධීක්ෂණය හා නිරීක්ෂණය ද සිදු කරනු ලබයි.

ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පහත සඳහන් කාර්යයන්ගෙන් සමන්විත වෙයි.

a) කාර්යන්ට අදාළව සැලසුම් නිසි ලෙස සැකසීම
b) ගොවීන්ගෙන් වාරික එක්රැස් කිරීම
c) හානි දැනුම් දීම
d) හානි තක්සේරුව
e) වන්දි ගෙවීම
f) වන්දි ගෙවීම් සම්බන්ධයෙන් ගොවීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

3.3 කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපාති වර්ග

වී වගාව සඳහා නියමු ව්‍යාපෘතියක් වශයෙන් 1961/62 මහ කන්නයේ සිට වගා රක්ෂණ ක්‍රමය ආරම්භ කරන ලදී. 1974 වර්ෂයට පසු එය අනිකුත් භෝග සඳහා ව්‍යාප්ත කරන ලද අතර, 1984 වර්ෂයේ සිට කෘෂි රක්ෂණ මණ්ඩලය ක්ෂේත්‍ර භෝග සඳහා රක්ෂණ ක්‍රමයන් හඳුන්වා දෙන ලදී. එහි මුල් අවධියේදී මිරිස්, මුංඇට, සෝයා බෝංචි, කව්පි සහ උක් වගාවන් රක්ෂණය කරන ලද අතර පසුව එම රක්ෂණය,

එළවළු, එළු, අන්නාසි, පැෂන්, බුලත්, පොල් වැනි විවිධ භෝග රාශියක් කරා ව්‍යාප්ත කරන ලදී. පශු සම්පත් රක්ෂණය 1974 වර්ෂයේ ආරම්භ කරන ලදී. 1987 දී කෘෂිරක්ෂණ මණ්ඩලය ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද අතර 1990 දී එය ධීවර ක්ෂේත්‍රයට ද ව්‍යාප්ත කරන ලදී.

වර්තමානයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය පහත සඳහන් භෝග හා අංශ සඳහා රක්ෂණ ආවරණය සපයනු ලබයි.

i. වී
ii. අනිකුත් භෝග
(ඉරිඟු, කුරක්කන්, කව්පි, සෝයා බෝංචි)
iii. මිරිස්
iv. උක්
v. ලොකුළුණු
vi. දුම්කොළ
vii. බුලත්
viii. පලතුරු
(අන්නාසි, අඹ, පැපොල්, පැෂන්, දෙහි, රඹුටන්)
ix. කෙසෙල්
x. කජු
xi. පොල්
xii. අල
xiii. විසිතුරු පැළෑටි
xiv. වී ගබඩා
xv. හරිතාගාර ගෘහ සහ ඒ යටතේ කරනු ලබන වගා රක්ෂණය
xvi. පශු සම්පත්
- ගව රක්ෂණය
- කිරි එළදෙනුන්, කිරි මී දෙනුන්, පට්ටි එළ හරක්, පට්ටි මී හරක්, බර අදින එළ හරක්, බර ඇදීමට හා සීසෑමට ගන්නා මී හරක්, වැස්සි පැටවුන්
- එළු රක්ෂණය
- බැටළු රක්ෂණය
- කුකුළු පැටවුන් රක්ෂණය

xvii. වෛද්‍ය ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමය (සුවසෙත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය)
xviii. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය
- ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමය

3.4 වී වගා රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය

ශ්‍රී ලංකාව තුළ සෑම කන්නයක් තුළම පාහේ, මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 15%ක් පමණ ප්‍රමාණයක් හානියට පත් වන අතර ඒ තත්ත්වය ගොවීන්ගේ ආදායම් තත්ත්වයේ අස්ථායීතාවය කෙරෙහි හේතු වනු ලබයි. එවැනි තත්ත්වයක් රක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය වඩාත් ඉස්මතු කර පෙන්වනු ලබයි. සාර්ථකව ක්‍රියාත්මක වන රජයක මූලික අවධානය යොමු විය යුත්තේ රට සහලින් ස්වයංපෝෂණය

කිරීමේ කාර්යය සඳහාය. නිදහසින් පසු, සෑම රජයක ම උත්සාහය වූයේ වී නිෂ්පාදනය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක වශයෙන් ඉහළ නැංවීමයි. මෙම අරමුණ කරා ලඟා වීම සඳහා ගොවීන් ඉහළ අස්වැන්නක් ලබා දෙන බීජ භාවිතය සඳහා අභිප්‍රේරණය කර වීම, වැඩි දියුණු කළ තාක්ෂණික ක්‍රම සහ වගා ක්‍රම සඳහා ඔවුන් යොමු කිරීම ආදිය සිදු කරන ලදී. කෙසේ නමුත් මෙම වැඩි දියුණු කළ ක්‍රම භාවිතා කිරීමෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා බොහෝ විට ගොවීහු සාම්ප්‍රදායික වූ අඩු අස්වනු ලැබෙන බීජ හා ක්‍රම කෙරෙහිම යොමු වී සිටිති. ඒ අනුව ඔවුන්ට ඉහළ ආයෝජන අවදානමක් දැරීමට නම් යම් ආයෝජන සුරක්ෂිතතාවයක් ඇති කළ යුතුය. මේ නිසා රජය විසින් රක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් පිළිගෙන ඇත. ඒ තුළින් වී වගාවේ නිරත ගොවීන් ආරක්ෂා කිරීමත්, වගාව සඳහා ඔවුන්ගේ ආයෝජන ඉහළ නැංවීම සඳහා ඔවුන්ව අභිප්‍රේරණය කිරීමත් අපේක්ෂා කෙරේ.

මෙම වී වගා රක්ෂණ ක්‍රමය යටතේ, පහත සඳහන් ස්වාභාවික ආපදාවලින් සිදුවන මුළු වගා හානි සඳහා හෝ අර්ධ වශයෙන් සිදු වන වගා හානි සඳහා රක්ෂණ අවරණය සපයනු ලබයි (කෙසේ නමුත් කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ ස්වාභාවිකව සිදු වන විශාල උපද්‍රවයකින් විනා, වගාවන් 100%කින් ම විනාශ වීම දුර්ලභය. බොහෝ විට වගාවන් සඳහා හානි සිදුවන්නේ යම් කොටසකටය).

i. ගං වතුර
ii. නියඟය
iii. ජලය වැඩිකම
iv. ජලය අඩුකම
v. භෝග සඳහා වන රෝග
vi. කෘමි හානි
vii. වන සතුන් මගින් සිදු වන හානි

රක්ෂණ කාලසීමාව:

වී වගාව පැළ කිරීමේ සිට අස්වනු නෙළා ගන්නා අවස්ථාව දක්වා

3.4.1 වාරික ප්‍රමාණය සහ රක්ෂණ ආවරණ වටිනාකම

රක්ෂණ ආවරණ වටිනාකම සහ රක්ෂණ වාරිකය, යම් යම් ප්‍රදේශවල ඉඩම් පංතිය (Land Class) සහ අවදානම් මට්ටම අනුව වෙනස් වනු ලබයි. ප්‍රධාන වශයෙන් අවදානම් මට්ටම් 3 ක් හඳුනාගත හැකිය.

i. අඩු අවදානම්
ii. මධ්‍යම අවදානම්
iii. ඉහළ අවදානම්

ඉඩම් පංතිය අනුව ගත් කල,

i. මහා වාරිමාර්ග
ii. සුළු වාරිමාර්ග
iii. වර්ෂා පෝෂිත යනුවෙන් වර්ග කිරීම සිදු කළ හැකිය

පසුගිය රක්ෂණ අත්දැකීම් අනුව ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුව, අවදානම් මට්ටම් 3ක් හඳුනා ගනු ලබයි. අඩු අවදානම් කලාප සඳහා රක්ෂණ වාර මුදල, රක්ෂණ ආවරණ වටිනාකමෙන් 5% ක් වශයෙන් ද, මධ්‍යම අවදානම් කලාප සඳහා රක්ෂණ ආවරණ වටිනාකමෙන් 7.5%ක් වශයෙන් ද, ඉහළ අවදානම් කලාප සඳහා රක්ෂණ වාරිකය, රක්ෂණ ආවරණ වටිනාකමෙන් 10%ක් වශයෙන් ද ගණනය කොට ඇත.

එක් එක් ඉඩම් පංතියේ වගාව සඳහා වැය වන පිරිවැය අනුව රක්ෂණ ආවරණ වටිනාකම තීරණය කරනු ලබයි. යම් ගොවිජන සේවා ප්‍රදේශයක් තුළ ඇති කුඹුරු ඉඩමක්, එහි ඉඩම් පංතියේ ස්වභාවය හා ගොවිජන සේවා ප්‍රදේශයේ අවදානම් මට්ටම යන සියලු කරුණු සැලකිල්ලට ගනිමින් රක්ෂණ ආවරණ වටිනාකම තීරණය කරනු ලබයි. වර්තමානයේ ක්‍රියාත්මක වනු ලබන රක්ෂණ වාර මුදල් සහ රක්ෂණ ආවරණ වටිනාකම් පහත වගුව මගින් පෙන්වා දී ඇත.

වගු අංක 3.1: වී වගා රක්ෂණ ක්‍රමයේ රක්ෂණ ආවරණ වටිනාකම් සහ රක්ෂණ වාරික මුදල් - විවිධ වාරිමාර්ග ක්‍රම සහ අවදානම් මට්ටම් අනුව (සාමාන්‍ය ව්‍යාපෘතිය යටතේ)

ඉඩම් පංතිය	අඩු අවදානම් 5%		මධ්‍යම අවදානම් 7.5%		ඉහළ අවදානම් 10%	
	ආවරණ මුදල අක්කරයට රුපියල්	වාර මුදල අක්කරයට රුපියල්	ආවරණ මුදල අක්කරයට රුපියල්	වාර මුදල අක්කරයට රුපියල්	ආවරණ මුදල අක්කරයට රුපියල්	වාර මුදල අක්කරයට රුපියල්
මහා වාරිමාර්ග	6,000/= 4,400/=	300/= 220/=	3,600/= 2,600/=	270/= 195/=	2,400/= 1,700/=	240/= 170/=
සුළු වාරිමාර්ග	5,000/= 3,700/=	250/= 185/=	3,000/= 2,200/=	225/= 165/=	2,000/= 1,400/=	200/= 140/=
වර්ෂාපෝෂිත	4,000/= 2,800/=	200/= 140/=	2,300/= 1,600/=	175/= 120/=	1,500/= 1,000/=	150/= 100/=

මූලාශ්‍රය: AAIB

වාර මුදල් අයකිරීම

වාර මුදල් අය කිරීම ආකාර 2 කට සිදු වන අතර, එකතු කරන ලද වාර මුදල් කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල වෙත යොමු කරනු ලබයි.

a) ක්ෂේත්‍ර නිලධාරීන් විසින් වාර මුදල් එකතු කරනු ලබයි
b) වගා ණය ලබා දුන් බැංකු මගින්, රක්ෂණ වාර මුදල් රැස් කොට ප්‍රධාන කාර්යාලය වෙත යවනු ලබයි

වගු අංක 3.2: රක්ෂණ ආවරණ සහ වාර මුදල් (වී වගාව සම්බන්ධ විශේෂ බීජ වී ව්‍යාපෘතිය යටතේ)

ඉඩම් පංතිය	ආවරණ මුදල අක්කරයට රුපියල්	වාර මුදල අක්කරයට රුපියල්
මහා වාරි මාර්ග	15,000/= - 10,000/=	750/= - 500/=
සුළු වාරිමාර්ග	12,000/= - 8,000/=	600/= - 400/=
වර්ෂාපෝෂිත	8,000/= - 5,000/=	480/= - 300/=

මූලාශ්‍රය : AAIB

මීට අමතර ව මහා වාර ක්‍රමය යටතේ වී වගාව සඳහා විශේෂ රක්ෂණ ආවරණ මුදලක් හා වාරික මුදලක් තීරණය කර ඇති අතර මේ යටතේ, රක්ෂණ ආවරණ මුදල අක්කරයට රු.10,000/= - රු.15,000/= අතර ද, රක්ෂණ වාර මුදල අක්කරයට රු.500/= - රු.750/= අතර ද පවතී.

3.4.2 වගා රක්ෂණ කාල සටහන

සෑම කන්නයක ම, අදාළ අධිකාර බලය සහිත නිලධාරීන් විසින් එක් එක් ගොවිජන සේවා කොට්ඨාස සඳහා වගා කාලසටහන් සකස් කරනු ලබයි. මෙම කාලසටහනට අනුමත වී වර්ගයන් සහ එහි කාලසීමාව, බිම් සැකසීම හෝ තවාන් දැමීම සඳහා නියමිත අවසන් දින, වාර මුදල ගෙවිය යුතු අවසන් දිනය හෝ හානි තක්සේරුව සිදු කළ යුතු අවසන් දිනය යන සියලු කරුණු අඩංගු වේ.

3.4.3 හානි දැනුම් දීම (Notification)

රක්ෂිත වගා බිමක් සඳහා රක්ෂණ ආවරණයට යටත් වන යම් හේතුවක් මත සිදු වන වගා හානියක්, එය සිදු වී දින 14ක් ඇතුළත, අදාළ ගොවියා විසින් ම දැනුම් දීම සිදු කළ යුතුය. එසේ දැනුම් දීමට අපොහොසත් වන විට අදාළ රක්ෂණ නියෝජිතයාට හානිය පිළිබඳ සඳහන් කරමින් නියෝජිතයෙකු මගින් ලිපියක් ගෙන ගොස් භාරදීම හෝ තැපැල් කිරීම සිදු කළ යුතුය. එම ලිපියේ අදාළ සියලුම තොරතුරු සඳහන් කිරීම කළ යුතුය.

හානිය සිදු වූ දිනය එක් එක් වී වර්ගයට අදාළ කාලසීමාව තුළට ඇතුළත් විය යුතු අතර හානි සිදු වූ දිනය වගා කළ දිනට පසු දිනයක් ම විය යුතුය. අපරික්ෂාකාරීත්වය හේතුවෙන් සිදු වන හානි සඳහා වන්දි ලබා දීම සිදු නොකරයි. කෘමි හානියක් හෝ වගාවට යම් ලෙඩ රෝගයක් වැළඳීමෙන් හානියක් සිදු වී ඇත්නම් එය එම ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක විසින් සහතික කළ යුතු අතර එම සහතිකය සාක්ෂියක් වශයෙන් අනිකුත් අදාළ ලිපිලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

හානි දැනුම් දීමේ ලේඛනය (Loss Nortification Register-LNR) ගොවිජන සේවා කාර්යාල හෝ මහවැලි කාර්යාලය විසින් පවත්වාගෙන යා යුතු අතර රක්ෂිතයන් විසින් තම හානි පිළිබඳ පැමිණිලි එහි වාර්තා කළ යුතුය.

3.4.4 හානි තක්සේරුව

හානි තක්සේරු කිරීමේ කණ්ඩායම පහත දැක්වෙන සාමාජිකයන් තිදෙනාගෙන් සමන්විත විය යුතු අතර රක්ෂිත හා හානි වූ වගා බිම් ඔවුන් විසින් අධීක්ෂණය කළ යුතුය.

i. ගොවිජන සේවා කාර්යාලවල සිටින කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරු හෝ බැංකුවේ ක්ෂේත්‍ර නිලධාරී
ii. කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ හානි තක්සේරු නිලධාරී
iii. ගොවි සංවිධානයේ නියෝජිතයෙකු (ගොවි නියෝජනය)

යම් වගා බිමකට සිදු වන හානිය, හානි දැනුම් දීමේ ලේඛනයේ සඳහන් කළ යුතු අතර අස්වනු නෙළීමට සති 2 කට පෙර එය තක්සේරු කරනු ලබයි. හානි තක්සේරුව ඇස් මට්ටමින් සිදු කරනු ලබයි.

3.4.5 වන්දි ගෙවීමේ පදනම

a) මූලික අදියරේ සිදු වන හානි

වගා කිරීමේ සිට මාසයක් ඇතුළත දින 30ක් තුළ සිදු වන හානි මෙහි දී නැවත පැළ සිටුවීමේ හැකියාව එම කන්නය තුළ ම පවතී නම්, අක්කරයකට බීජ වී සඳහා වැය වූ පිරිවැය පදනම් කරගෙන නැවත වගා කිරීම සඳහා වන්දි ලබා දෙනු ලබයි. මෙය අක්කරයට වී බුසල් 2ක් වශයෙන් වේ.

b) ප්‍රථම අදියරේ සිදු වන හානි

වගා කිරීමේ සිට මසක් ඇතුළත සිදු වන හානි. මෙහි දී එම කන්නය තුළ නැවත වගා කිරීමේ හැකියාවක් නොපවතින අවස්ථාව සැලකිල්ලට ගනු ලබයි. මෙහිදී රක්ෂණ ආවරණ වටිනාකමින් 60% ක් වන්දි වශයෙන් ගෙවනු ලබන්නේ 20% ක ක්‍රියාත්මක අතිරික්තයකට යටත්වය.

c) දෙවැනි අදියරේ සිදුවන හානි

වගා කිරීමෙන් මාසයකට පසු සහ මල් හටගන්නා අවස්ථාව දක්වා වූ කාලය තුළ සිදු වන හානි මේ යටතට ගැනේ. මෙහිදී 20% ක ක්‍රියාත්මක අතිරික්තයට යටත් ව රක්ෂණ ආවරණ වටිනාකමින් 80%ක් වන්දි වශයෙන් ගෙවනු ලබයි.

d) අවසන් අදියරේ සිදුවන හානි

මල් හටගන්නා අවස්ථාවේ සිට අස්වනු නෙළන අවස්ථාව දක්වා සිදු වන හානි මෙහි දී රක්ෂණ ආවරණ මුදලින් 100%ක් ම වන්දි වශයෙන් ගෙවනු ලබන්නේ 20% ක ක්‍රියාත්මක අතිරික්තයට යටත්ව ය.

ක්‍රියාත්මක අතිරික්තය (Operative Excess): රක්ෂිතයා විසින් දරාගත යුතු මූලික හානි ප්‍රතිශතය ක්‍රියාත්මක අතිරික්තයයි. රක්ෂණ ආයතනය විසින් මෙම හානි ප්‍රතිශතය සඳහා වන්දි ගෙවනු නොලබයි.

3.4.6 වන්දි සැකසීම

හානි තක්සේරුවෙන් පසුව, එක් එක් හානිවලට ගෙවිය යුතු වන්දි ප්‍රමාණයන් හානි දැනුම් දීමේ ලේඛනයේ ගණනය කරනු ලබයි. මෙය කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාලවල දී සිදු කරනු ලබයි. එසේ සම්පූර්ණ කරන ලද හානි ලේඛනය (LNR) ප්‍රධාන කාර්යාලයේ ජීවනාංකික හා පර්යේෂණ අංශය (Acturial and Research Division) වෙත භාර දෙනු ලබන අතර එහි දී නෛතික වශයෙන් දිස්ත්‍රික් කාර්යාලවලින් සකස් කොට ඇති වන්දි ප්‍රමාණවල නිරවද්‍යතාවය පරීක්ෂා කරනු ලබයි. ඒ අනුව ගෙවිය හැකි වන්දි ප්‍රමාණයන් ජීවනාංකික හා පර්යේෂණ අංශයේ අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබයි.

හානි ප්‍රතිශතය හා වන්දි ප්‍රමාණයන් පහත පරිදි ගණනය කළ හැකිය.

$$\text{මුළු හානි ප්‍රතිශතය} = \frac{(\text{සම්මත අස්වැන්න} - \text{තක්සේරු අස්වැන්න})}{\text{සම්මත අස්වැන්න}} \times 100$$

රක්ෂණය කළ හැකි හානි ප්‍රතිශතය = මුළු හානි ප්‍රතිශතය - රක්ෂණය කළ නොහැකි හේතු මත සිදු වී ඇති හානි ප්‍රතිශතය

හානි දර්ශකය = රක්ෂණ ආවරණ වටිනාකම X (රක්ෂණය කළ හැකි හානි % - ක්‍රියාත්මක අතිරික්තය) X හානි දර්ශකය

කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් සකසා ඇති හානි දර්ශක වගුව මගින් එක් එක් අදියරට අදාළ අගයන් සෘජුවම ලබා ගත හැකිය.

වගු අංක 3.3: හානි දර්ශකය (රක්ෂණ ආවරණ වටිනාකම රු.6,000/= ට අදාළව)

හානි සිදු වූ අදියර / හානි ප්‍රතිශතය (%)	පළමු අදියර	දෙවැනි අදියර	අවසන් අදියර
0-20.0	0	0	0
20.1-27.5	180	240	300
27.5-32.5	360	480	600
32.6-37.5	540	720	900
37.6-42.5	720	960	1,200
42.6-47.5	900	1,200	1,500
47.5-52.5	1,080	1,440	1,800

මූලාශ්‍රය: AAIB

වන්දි දර්ශකය = හානි දර්ශකය X රක්ෂිත වගා බිම් ප්‍රමාණය X අයිතිවාසිකම් ප්‍රතිශතය

ඉඩම් අයිතිවාසිකම් ස්වභාවය අනුව ප්‍රතිශතය පහත පරිදි දැක්විය හැකිය.

ඉඩම් හිමියන් = 25%
ඉඩම් හිමි ගොවීන් = 100%
අඳ ගොවීන් = 75%

3.4.7 වන්දි ගෙවීම

එක් එක් ගොවිජන සේවා ප්‍රදේශයේ කාර්යාලවලට රක්ෂිතයාගේ නමින් වන්දි ගෙවීමේ ලේඛනයට අනුකූලව (IPR) චෙක්පත් යවනු ලබයි. වගා ණය ලබා ගත් අය සඳහා අදාළ වන්දි මුදල බැංකුව වෙත යොමු කරනු ලබන අතර එහි දී බැංකුව මගින් ණය මුදල කපා ගනු ලබයි.

3.4.8 අභියාචනා

තමා ඉල්ලුම් කළ වන්දියට සාපේක්ෂ ව ලැබූ වන්දිය සම්බන්ධයෙන් යම් ගොවියෙකු සෑහීමකට පත් නොවන්නේ නම් ඔහුට මණ්ඩලය වෙත නැවත අභියාචනාවක් ඉදිරිපත් කළ හැකි අතර, එය වන්දි ඉල්ලුම්පත ප්‍රතික්ෂේප වූ බව දැන් වූ දින සිට දින 30 ක් ඇතුළත සිදු කළ යුතුය.

3.5 අනිකුත් රක්ෂණ ව්‍යාපෘති

3.5.1 අතිරේක භෝග වගා රක්ෂණ ව්‍යාපෘතිය

වී වගා රක්ෂණය ආරම්භ කිරීමෙන් අවුරුදු 10 කට පසු එහි අත්දැකීම් ද සහිතව, 1984 දී කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් අතිරේක භෝග වගා රක්ෂණය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ මූලිකව ම මිරිස්, මුං ඇට, සෝයා බෝංචි, කව්පි සහ උක් යන වගාවන් රක්ෂණය කරන ලදී.

3.5.2 අනිකුත් භෝග රක්ෂණ ව්‍යාපෘතිය

මේ යටතේ කෙසෙල්, කජු, අල, පලතුරු සහ අනිකුත් භෝගයන් රක්ෂණය කරන ලද අතර, නියඟය, සුළං, වන සතුන්ගෙන් වන හානි, කෘමි හා ලෙඩ රෝග, ගංවතුර, ගිනි මගින් සහ වතුර වැඩිකම යන කරුණු යටතේ සිදු වන හානි සඳහා ආවරණය සපයනු ලබයි.

3.5.3 අපනයන භෝග රක්ෂණ ව්‍යාපෘතිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද සහාය සහිතව 2002 වර්ෂයේ දී කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් අපනයන භෝග සඳහා රක්ෂණ ආවරණය සැපයීම ආරම්භ කරන ලදී. ගම්මිරිස්, කෝපි, කොකෝවා, පුවක් සහ කුරුඳු යන භෝගයන් මූලිකව ම මේ ව්‍යාපෘතිය යටතේ ආවරණය කරන ලදී.

3.5.4 විසිතුරු මල් සහ පැළෑටි රක්ෂණය

මේ යටතේ ඇන්තූරියම්, ඕකිඩ් විසිතුරු පැළෑටි සහ හරිතාගාර ගෘහ යටතේ සිදු කරන වගාවන් රක්ෂණය කරන ලදී.

3.5.5 පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

කිරි හරක් කර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් යුක්ත ව, පශු සම්පත් රක්ෂණ ක්‍රමය 1975 අග භාගයේ දී ආරම්භ කරන ලදී. මෙහි දී ලෝක බැංකුවේ, ජාත්‍යන්තර සංවර්ධනයේ ණය ව්‍යාපෘතිය යටතේ ආනයනය කරන ලද හරකුන් රක්ෂණය කිරීම මූලිකව ම ආරම්භ කරන ලදී. මෙම පශු සම්පත් ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් සතුන් සඳහා රක්ෂණ ආවරණය සපයනු ලබයි.

i. සාමාන්‍ය ගව රක්ෂණය
ii. ආනයනික දෙමුහුන් ගව රක්ෂණය
iii. එළුවන් රක්ෂණය
iv. බැටළුවන් රක්ෂණය
v. ආනයනය කරන ලද උසස් ගවයන් රක්ෂණය
vi. කුකුළු පැටවුන් රක්ෂණය

3.5.5.1 සතුන් රක්ෂණය සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි

- රක්ෂණය කරන සතුන් යහපත් සෞඛ්‍ය තත්ත්වයේ පසු විය යුතුය
- ලෙඩ රෝග සඳහා ලබාදිය යුතු නිසි එන්නත් කිරීම් සිදු කර තිබිය යුතුය
- රක්ෂණයට යටත් කොට ඇති සියලුම සතුන් පහසුවෙන් හඳුනාගත හැකි පරිදි පහත සඳහන් එක් ක්‍රමයකට අනුව සලකුණු කළ යුතුය.
  i. ලේබලයක් එල්ලීම
  ii. වර්ග කිරීම
  iii. පච්ච කෙරීම
- අයාලේ යන සතුන් රක්ෂණය කළ නොහැක

3.5.5.2 රක්ෂණ ආවරණය ලබා ගත හැකි හේතූන්

- හදිසි අනතුරක් හේතුවෙන් සිදු වන මරණය
- රෝගයක් හේතුවෙන් සිදු වන මරණය
- සම්පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම

3.5.5.3 වාර්ික මුදල සහ රක්ෂණ ආවරණය

වාර්ික මුදල්

i. ගවයාගේ වටිනාකම රු.15,000/= ට අඩු නම් වාර්ික මුදල එම වටිනාකමෙන් 3.5% කි.
ii. ගවයාගේ වටිනාකම රු. 15,000/= ට වැඩි නම් වාර්ික මුදල එම වටිනාකමින් 4% කි.
iii. එළුවාගේ වටිනාකම රු.5,000/= ක් හෝ ඊට අඩු නම්, වටිනාකමින් 4% කි.
iv. එළුවාගේ වටිනාකම රු.5,000/= - රු.7,500/= ක අතර නම්, වටිනාකමින් 5% කි.
v. බැටළුවාගේ වටිනාකම රු.5,000/= ක් නම් වටිනාකමින් 4% ක් වාර මුදල වේ.

වගු අංක 3.4: සතුන් වර්ගය, වයස් සීමාවන් හා උපරිම රක්ෂණ වටිනාකම්

සතුන් වර්ගය	වයස් සීමාව (අවුරුදු)	රක්ෂණ ආවරණ වටිනාකම (රුපියල්)
කිරි එළදෙනුන්	2-12	25,000/=
කිරි මී දෙනුන්	4-14	25,000/=
පට්ටි එළහරක්	2-3	25,000/=
පට්ටි මී හරක්	3	25,000/=
බර අදින එළ හරක්	3-12	25,000/=
බර අදින හා සී සෑමට ගන්නා මී හරක්	3-12	25,000/=
දෙමුහුන් එළුවන්	1-6	10,000/=
සාමාන්‍ය එළුවන්	1-6	20,000/=
බැටළුවන්	1-6	5,000/=
කුකුළු පැටවුන්	දින 1 සිට සති 7 දක්වා	150 (එක් කුකුළු පැටවකු සඳහා)

මූලාශ්‍රය: AAIB

3.5.5.4 වට්ටම් ප්‍රමාණය

සතුන් කණ්ඩායම් වශයෙන් රක්ෂණය කිරීමේ දී වට්ටම් ලබා දෙනු ලබයි.

වගු අංක 3.5: සතුන් කණ්ඩායම් අනුව වට්ටම

සතුන් ප්‍රමාණය	වට්ටම් ප්‍රතිශතය %
පළමු කණ්ඩායම 11-25	10
දෙවන කණ්ඩායම 26-50	15
තෙවන කණ්ඩායම 50 හෝ වැඩි	20

මූලාශ්‍රය: AAIB

3.5.5.5 ප්‍රතිලාභ ලබාදීම

- අවුරුදු 5 ක් අඛණ්ඩව ම රක්ෂණය කර ඇති නමුත් කිසිදු වන්දියක් ලබා ගෙන නැත්නම් ඒ සඳහා ප්‍රතිලාභ හිමි වේ.
- ගොවීන් විසින් රක්ෂිත සතුන් සඳහා නොකඩවා වාර මුදල් ගෙවා ඇත්නම්, ගෙවා ඇති මුළු වාර මුදලෙන් 25% ක් ප්‍රතිලාභ වශයෙන් ලබා ගත හැකිය.

3.5.5.6 වන්දි ගෙවීම

- හදිසි අනතුරකින් හෝ රෝගයකින් රක්ෂිත සතෙකුගේ මරණය සිදු වූ විට, රක්ෂිත මුදලින් 90% ක් වන්දි වශයෙන් ගෙවනු ලබයි.

- රක්ෂිත සතෙකු සදාකාලිකව ආබාධිත වීමක් හෝ විනාශ වීමක් සිදු වූ විට ද රක්ෂණ වටිනාකමින් 90% ක් වන්දි වශයෙන් ගෙවනු ලබයි. එසේ නොවුන විට රක්ෂිත වටිනාකමින් 50%ක් වන්දි වශයෙන් ලබාගත හැකිය.

3.5.6 වී ගබඩා රක්ෂණය

1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මගින්, බලය පවරා ඇති පරිදි රක්ෂණ මණ්ඩලය විසින් වී ගබඩා සඳහා ද රක්ෂණ ආවරණය සපයන ලදී. මෙහි මූලික පියවර 2001 අප්‍රේල් මාසයේ සිට ආරම්භ විය.

මෙම වී ගබඩා රක්ෂණය තුළින් අපේක්ෂිත අරමුණු පහත පරිදිය:

- ගොවීන් විසින් සිය නිවාසවල පවත්වා ගෙන යන වී ගබඩා සඳහා රක්ෂණ ආවරණය සැපැයීම තුළින් ඉහළ වෙළෙඳපළ වටිනාකමක් ලබා දීම.
- වී මිල දී ගන්නා ආයතනවල වී ගබඩා කර තබා ගැනීමේ දී සිදු වන අනපේක්ෂිත හානි සඳහා රක්ෂණ ආවරණය සැපයීම.
- වී ගබඩා කරන ආයතන ණය ලබා ගැනීමේ දී ඇපකරුවකු සේ ක්‍රියා කිරීම.

මේ යටතේ වී වගා කරන සහ නිවෙස්වල ගබඩා කර තබා ගන්නා ගොවීන් මෙන් ම, ගොවි සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන ගබඩා, සමූපකාර සමිති, ගොවි සමාගම් හා පුද්ගලික ව පවත්වා ගෙන යනු ලබන වී මිල දී ගැනීමේ මධ්‍යස්ථාන යන ඒවා රක්ෂණය කරනු ලබයි. මෙම රක්ෂණ ව්‍යාපෘතිය ජනප්‍රිය කර වීමේ අරමුණින් යුක්ත ව, පොළොන්නරුව, අනුරාධපුරය, කුරුණෑගල, හම්බන්තොට යන වී ගබඩා කරන ප්‍රධාන දිස්ත්‍රික්කවලට මූලික වශයෙන් මෙම ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලද අතර, මහවැලි ප්‍රදේශවල ද එය හඳුන්වා දෙන ලදී.

3.5.7 ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

3.5.7.1 සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක අවශ්‍යතාවය

ගොවීන්ගේ ආදායම් අස්ථායීතාවය සහ පුරෝකතනය කළ නොහැකි ආර්ථික තත්ත්වය තුළ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක අවශ්‍යතාවය තදින් දැනේ. ගොවීන්ගෙන් ආර්ථිකයට සිදු වන දායකත්වය පිළිබඳ හඳුනා ගැනීම තුළින් මෙම විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. 1987 අංක 12 දරණ පනත මගින් ස්ථාපිත කරන ලද මෙම රක්ෂණ යෝජනා ක්‍රමය 1987 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක කරන ලදී. මේ තුළින් සැපයෙන්නේ ජීවිත කාලය පුරාම විශ්‍රාම වැටුපක් පමණක් නොවන අතර ආබාධිත අවස්ථාවන්හි දී මූල්‍යමය සහනයක් සහ රක්ෂිතයාගේ අකල් මරණයක දී ඔහුගෙන් යැපෙන්නන්ට මූලික ආධාර ද සපයනු ලබයි. මේ තුළින් දිගු කාලීන අරමුණක් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අතර, බොහෝ තරුණ පිරිස් විශ්වාසයකින් යුක්ත ව රැකියාවක් වශයෙන් කෘෂිකර්මයේ යෙදීමට ද මේ තුළින් අපේක්ෂා කරනු ලබයි.

3.5.7.2 අරමුණු

- වයස්ගත වීමේ දී හා ආබාධිත තත්ත්වයක දී ගොවීන්ට මූල්‍යමය සහනයක් ලබා දීම
- අනපේක්ෂිත ලෙස සිදු වන මරණයක දී යැපෙන්නන්ට මරණ පාර්තෝෂික දීමනාවක් මගින් මූල්‍ය සහනයක් සැලසීම
- ජීවිත රක්ෂණය, අර්ථාන්විත වූ සමාජ ආරක්ෂණ ක්‍රමයක් බවට පත් කිරීම

- ගොවීන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම
- ආර්ථිකය තුළ ගොවීන්ගේ කාර්යයයේ වටිනාකම හඳුනා ගැනීම තුළින් ගොවිතැන ආරක්ෂිත වෘත්තියක් බවට පත් කිරීම

3.5.7.3 අවශ්‍ය සුදුසුකම් (හැකියාව)

- බඳවා ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 29 ට නොවැඩි විය යුතුය.
- එම ගොවීන් පහත සඳහන් භෝගයන්ගෙන් එකක් හෝ වගා කරන, ඉඩම් හිමියෙකු, වගා කරුවෙකු, අඳගොවියෙකු බද්දට වගා කරන්නෙකු විය යුතුය.
  1. වී සහ ධාන්‍ය
  2. අතිරේක භෝග හෝ එළවළු
  3. අල භෝග
  4. පලතුරු
  5. බුලත්
  6. උක්
- අක්කර 2 ට අඩු තේ වගා කරනු ලබන ඉඩම් හිමි වගාකරුවෙකු
- අක්කර 3 ට අඩු රබර් වගා කරනු ලබන ඉඩම් හිමි වගාකරුවෙකු
- අක්කර 5 ට අඩු පොල් වගා කරනු ලබන ඉඩම් හිමි වගාකරුවෙකු
- අක්කර 3 ට අඩු මිශ්‍ර භෝග වගා කරන ඉඩම් හිමි වගාකරුවෙකු
- පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැළී ගොවියෙකු
- කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියුක්ත වූවන්

3.5.7.4 මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

i. ගොවියෙකු විසින් සිය දායක මුදල් සම්පූර්ණ වශයෙන් ගෙවා අවසන් වූ විට, අවුරුදු 60 න් පසු ජීවිත කාලය පුරා ම විශ්‍රාම වැටුප් ලබාගත හැකිය.
ii. අවුරුදු 55-59 අතර වයස් පරතරයේ සිටින ගොවීන්ට තම විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අවුරුදු 5 කට පසුව හැකියාව ලැබේ.
iii. දායකයා විසින් තම විශ්‍රාම වැටුප ලබා ගන්නා අතරතුර දී මරණය සිදු වුවහොත් ස්වාමි පුරුෂයා හෝ භාර්යාවට අවුරුදු 80 තෙක් විශ්‍රාම වැටුප ලබා ගතහැකිය.
iv. දායකයා විසින් සිය විශ්‍රාම වැටුප ලබා ගැනීමට පෙර සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වුවහොත්, රු.50,000/= ක උපරිමයකට යටත් ව පූර්ණ බෙලහීනතාවය සිදු වූ දින සිට මාසික දීමනාවකට හිමිකම් ලබා දීම.
v. විශ්‍රාම වැටුප ලැබීමට පෙර අර්ධ බෙලහීනතාවයට පත් වුවහොත් රු.25,000/= ක උපරිමයකට යටත් ව වන්දි මුදල හා ශුද්ධ වාරික මුදල හා පොලිය ලබා දීම හෝ වයස සම්පූර්ණ වූ දින සිට ජීවිතාන්තය දක්වා විශ්‍රාම වැටුපක් මාසිකව ලබා දීම.

3.5.8 "සුවසෙත" සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් හඳුන්වා දෙන ලද මෙම රක්ෂණ ක්‍රමය 2000 මාර්තු 8 වෙනි දා සිට ක්‍රියාවට නංවන ලදී. මෙයින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන රක්ෂණ ආයතනවල අවධානයට ලක් නොවූ ගොවීන්ගේ සෞඛ්‍ය පිළිබඳ අවධානය යොමු කරන ලදී.

ඒ අනුව ගොවීන්ගේ අසනීපයක දී, ආරෝග්‍යශාලා ගාස්තු, සැත්කම්වල දී වැය වන ගාස්තු, විශේෂ ඖෂධ සඳහා වන ගාස්තු, විකිරණ ගාස්තු ආදිය සඳහා අවශ්‍ය මූල්‍යමය සහනය ලබා දීම අපේක්ෂා කරන ලදී. මෙම රක්ෂණ ව්‍යාපෘතිය යටතේ ගොවීන් විසින් රු.350/= ක වාර්ෂික මුදලක් ගෙවිය යුතු අතර, ඉහත සඳහන් පිරිවැය සඳහා රක්ෂණ මණ්ඩලය විසින් රු.25,000/= ක මුදලක් ගෙවනු ලබයි.

දිස්ත්‍රික්ක කාර්යාලවල සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අතර, දිස්ත්‍රික්ක කාර්යාලවල සහකාර අධ්‍යක්ෂවරුන් විසින් දිස්ත්‍රික්ක මට්ටමින් එහි අධීක්ෂණ කටයුතු හා මෙහෙයුම් කටයුතු පිළිබඳව සොයා බලනු ලබයි.

3.5.9 ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

1991 අංක 23 දරණ පනත මගින්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ඒකාබද්ධ සහයෝගීතාවයෙන් යුක්ත ව මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ක්‍රියාත්මක කෙරේ.

හතරවන පරිච්ඡේදය

පෞද්ගලික අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය

4.1 හැඳින්වීම

සංවර්ධනය වෙමින් පවතින හා කාර්මික රටවල් බොහොමයක, පෞද්ගලික අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයන් සාම්ප්‍රදායික ව රක්ෂණය කරනු ලැබුවේ සෞඛ්‍ය හා දේපළ පමණකි. නමුත් පසුගිය වසර කීපයක දී එය ලොව පුරා භෝගයන් 60 ක් ආවරණය කළේ ය. සංවර්ධනය වෙමින් පවතින රටවල පෞද්ගලික අංශයේ වගා රක්ෂණ ව්‍යාප්ත කිරීම සඳහා සැලකිය යුතු මට්ටමේ විභවතාවක් පැවතිය ද බාධාවන් කිහිපයක්ද පවතී. ඒවා නම්,

i. ඇතැම් රටවල පෞද්ගලික අංශයේ වගා රක්ෂණය නීතිමය වශයෙන් සීමා කර තිබීම. විශේෂයෙන් ම දැනටමත් රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන රටවල මෙම තත්ත්වය දැකිය හැක.
ii. පෞද්ගලික අංශයට ක්‍රියාත්මක වීමට ඉඩ ලබා දුන්න ද, විශාල ලෙස සහනාධාර ලබා දෙන රාජ්‍ය අංශය සමඟ එයට තරඟ කිරීමට අපහසු වීම.
iii. ගොවීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන යැපුම් මට්ටමේ කර්මාන්තයක් වශයෙන් බොහෝ විට සලකන කෘෂිකර්මාන්තය සඳහා, කෘෂිකාර්මික නොවන අංශවලට සාපේක්ෂ ව, කෘෂි රක්ෂණය ස්ථාපිත කිරීමට අපහසු වීම.
iv. කෘෂිකාර්මික අංශයේ රක්ෂණය සඳහා ජාත්‍යන්තර වශයෙන් ප්‍රති රක්ෂණ ක්‍රමයන් ලබා ගැනීම සීමා වීම. වර්තමානයේ ප්‍රතිරක්ෂණය මිල දී ගත හැක්කේ යුරෝපීය වෙළඳපළේ පමණක් වන අතර ඇමෙරිකාව සහ ජපානයේ රක්ෂණ වෙළෙඳපළ වලින් ඒ සඳහා සහභාගි වීමට අකමැත්ත පළ කරනු ලබයි.

රජය මගින් මෙම බාධාවන් ජයගැනීම සඳහා උපකාරී වීම තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවල පෞද්ගලික අංශයේ රක්ෂණ ආයතනවලට, කෘෂි රක්ෂණය සඳහා විශාල මෙහෙයක් සිදු කළ හැකිය. කෙසේ නමුත් ඉහත දක්වන අසීරුතා හා කෘෂිකාර්මික අවදානම් රක්ෂණය කිරීමේ දී දැරීමට වන පිරිවැය මත පෞද්ගලික අංශයේ කෘෂි රක්ෂණ කටයුතු පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමේ විභවතාවය සීමා වී පවතී (Agricultural Insurance in Asia, Seminar Report, 1990, Japan).

1980 මුල් භාගයේ ලංකාවේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පෞද්ගලික අංශයේ රක්ෂණ ආයතන සඳහා විවෘත කරනු ලැබී ය. කෙසේ වුව ද කෘෂිකාර්මික රක්ෂණ අංශයට එවැනි නිදහසක් ලබා නොදුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලය වී වගා රක්ෂණය සඳහා වූ තමන්ගේ ඒකාධිකාරී බලය නොකඩවා භුක්ති විඳින ලදී. අතිරේක භෝග හා පශු සම්පත් අංශ සඳහා උක්ත සීමාවන් නොවුණ ද, අඩු වෙළඳපොළ පරිමාව නිසා එම ක්ෂේත්‍රයන්හි කෘෂිකාර්මික රක්ෂණයන් සඳහා පෞද්ගලික අංශයේ රක්ෂණ ආයතන පෙළඹී නොමැත. උසස් ගොවිපළ තාක්ෂණයේ උපකාරය සහිත වාණිජ කෘෂිකර්මාන්තයක් පවතින සංවර්ධිත රටවල පවා, පෞද්ගලික අංශය කෘෂි රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි පුළුල් ලෙස පෙළඹවීම අපහසු වී ඇත්තේ වාණිජ මට්ටමේ ලාභදායීත්වය හා ආකර්ෂණීය ප්‍රතිලාභ ලබා ගැනීමේ පවතින අඩු විභවතාවය හේතුවෙනි.

ශ්‍රී ලංකාවේ 1999 - අංක 20 දරණ කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතින්, පෞද්ගලික රක්ෂණ ආයතන සඳහා කෘෂි රක්ෂණය ආරම්භ කිරීමට අවසර ලබා දෙන ලදී. පෞද්ගලික අංශයට

කෘෂිකාර්මික රක්ෂණ ක්‍රම විධිමත් වීමෙන් පසු තෝරාගත් ප්‍රදේශවල සීමිත වූ රක්ෂණ යෝජනා ක්‍රම ආරම්භ කළ පළමුවැනි රක්ෂණ ආයතනය, සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගමයි.

සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය තුළ ඇති ප්‍රමුඛ පෙළේ රක්ෂණ ආයතන අතරින් වසර 50 ක අත්දැකීම් ඇති ආයතනය සේ ම, ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම පෞද්ගලික රක්ෂණ ආයතනය ද වෙයි. සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම 1992/93 මහ කන්නයේ දී නියමු ව්‍යාපෘතියක් ලෙස "ගොවි රක්ෂණය" නමින් රක්ෂණ ක්‍රමයක් මහවැලි C, H සහ U කලාපවල, ක්‍රියාත්මක කරන ලදී. 1999 නව පනත් නිකුත් කිරීමෙන් අනතුරුව සී/ස. සෙලින්කෝ රක්ෂණ සමාගම ගොවීන්ගේ ජීවිත රක්ෂණය වැනි විවිධ අංශ ඔස්සේ තමන්ගේ සේවාව පුළුල් කරන ලදී.

සී/ස. සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් 1993 දී රක්ෂණය කරන ලද කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 1,170ක් වූ අතර එකතු කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය රුපියල් මිලියනයට ආසන්න විය. කුඹුරු බිම්වලට වන්දි වශයෙන් ගොවීන්ට ගෙවන ලද මුදල රුපියල් මිලියන 1.09 ක් විය. සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් රක්ෂණය කරන ලද කුඹුරු ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් වැඩි වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. 2004 දී සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 15,310ක් විය. එය 1993 දී රක්ෂිත ප්‍රමාණය සමඟ සැසඳීමේ දී හෙක්ටයාර 14,140 ක වර්ධනය වීමකි. 1999 නව රක්ෂණ පනත යටතේ සෙලින්කෝ රක්ෂණ සමාගම තමන්ගේ සේවාව විවිධ අංශ යටතේ නොයෙක් විෂය පථයන් ඔස්සේ පුළුල් කරන ලදී. වගු අංක 4.1 මගින් පෙන්නුම් කරන්නේ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් රක්ෂණය කර ඇති වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය යි.

වගු අංක 4.1: සෙලින්කෝ රක්ෂණ සමාගමේ වී වගා රක්ෂණයේ ක්‍රියාකාරීත්වය

කන්නය	වගා කළ වී බිම් ප්‍රමාණය (හෙක්.ඒ000)	රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය (හෙක්.ඒ000)	වගාකළ මුළු වී බිම් ප්‍රමාණයට සාපේක්ෂව රක්ෂණය කළ වී වගා බිම් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස
1993 යල	289	0.42	0.1
1993/94	581	0.78	0.1
1994 යල	349	0.28	0.1
1994/95මහ	567	0.20	0.03
1995 යල	348	0.14	0.04
1995/96 මහ	499	0.43	0.1
1996 යල	250	0.02	0.1
1996/97 මහ	473	0.45	0.1
1997 යල	257	0.17	0.1
1997/98 මහ	574	0.57	0.1
1998 යල	298	0.43	0.1
1998/99 මහ	538	0.78	0.1
1999 යල	341	0.71	0.2
1999/2000 මහ	549	1.96	0.3
2000 යල	812	2.25	0.3
2000/2001 මහ	479	4.92	1
2001 යල	319	2.63	1
2001/2002 මහ	531	5.12	1
2002 යල	319	2.85	1
2002/2003 මහ	618	3.56	0.6
2003 යල	401	6.68	1.7
2003/2004 මහ	542	11.55	2.1
2004 යල	258	3.76	1.4

මූලාශ්‍රය: CICL

4.2 සංවිධාන ව්‍යුහය හා පරිපාලනය

සී/ස. සෙලින්කෝ රක්ෂණ සමාගමේ සංවිධාන ව්‍යුහය පහත දැක්වේ.

සටහන 4.1: සී/ස. සෙලින්කෝ රක්ෂණ සමාගමේ සංවිධාන ව්‍යුහය



සී/ස. සෙලින්කෝ රක්ෂණ සමාගම අනෙකුත් රක්ෂණ ක්‍රම හා සසඳන විට කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපෘතියට සම්බන්ධ ව ඇති සේවක ප්‍රමාණය ප්‍රමාණාත්මකව අඩු ය. ආයතනය මගින් විවිධ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කරනු ලබන අතර අධ්‍යක්ෂවරු, අතිරේක සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කාර්මික කළමනාකරු ආයතනයේ විවිධ රක්ෂණ අංශවල සේ ම කෘෂි රක්ෂණ අංශයේ ද ප්‍රතිපත්ති විධිමත්ව සකස් කිරීමට ක්‍රියාත්මක වේ. සැම මෙහෙයුම් ක්‍රියාවක් ම කාර්මික කළමනාකරු මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලයේ එක් කාර්මික කළමනාකරුවෙක් පමණක් සිටී. ආයතනයේ ශාඛා මගින් දිස්ත්‍රික් පදනමින් කෘෂිකාර්මික රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කරනු ලබන අතර සහකාර කාර්මිකයින් 16 දෙනෙකු එම සැම ශාඛාවකට ම සම්බන්ධ ව ඇත. එම දිස්ත්‍රික්ක නම්

අනුරාධපුරය, කැකිරාව, දඹුල්ල, අම්පාර, කන්තලේ, කඳුරුවෙල, මොණරාගල, නුවරඑළිය, යාපනය, කුරුණෑගල, මහියංගනය, බණ්ඩාරවෙල, තිස්සමහාරාමය හා ඇඹිලිපිටිය වේ.

4.3 කෘෂිකාර්මික රක්ෂණ ක්‍රම

කෘෂිකාර්මික රක්ෂණ අංශයේ ක්‍රියාත්මක එක ම පෞද්ගලික රක්ෂණ ආයතනය වන සෙලින්කෝ රක්ෂණ සමාගම ඔවුන්ගේ සේවාව අනිකුත් අංශ මෙන් ම අනිකුත් භෝග රක්ෂණය දක්වා ම පුළුල් කර තිබේ. 1993 දී පශුසම්පත් රක්ෂණ ක්‍රමය ආරම්භ කරන ලදී. මෑතක සිට එම ආයතනය තමන්ගේ රක්ෂණ පථය එළවළු, අර්තාපල් සහ හරිතාගාර යටතේ කරන වගාවන් වන රෝස, ජර්බෙරා සහ කානේෂන් යන වගාවන් සඳහා ද ව්‍යාප්ත කරන ලදී. එමෙන්ම තම කටයුතු වඩාත් පුළුල් කරමින්, සෙලින්කෝ ගොවි විශ්‍රාම ජීවිත රක්ෂණ ක්‍රමය ද, සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ද, හදිසි අනතුරු හා මරණ සඳහා වන රක්ෂණ ක්‍රමයන් ද ස්ථාපිත කරන ලදී.

සෙලින්කෝ රක්ෂණ සමාගම මහින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ ක්‍රමයන් පහත පරිදි වේ.

i. වී වගා රක්ෂණ ක්‍රමය

ii. අතිරේක භෝග රක්ෂණ ක්‍රමය
- කව්පි
- සෝයා බෝංචි
- මුංඇට
- රටකජු
- ලොකුළූණු
- රතුළූණු
- මිරිස්

iii. අනෙකුත් භෝග සඳහා වන රක්ෂණ ක්‍රම
- සෘතුමය භෝග
- තල
- බඩඉරිඟු වගාව
- වාර්ෂික භෝග
  - අන්නාසි
  - කෙසෙල්
  - කජු
- වැවිලි භෝග
  - උක්
  - පොල්
  - රබර්

iv. පශු සම්පත් රක්ෂණ ක්‍රම

v. පෞද්ගලික අනතුරු හා මරණාධාර රක්ෂණ ක්‍රම

vi. වගා උපකරණ රක්ෂණ ක්‍රමය

vii. ජීවිත රක්ෂණ ක්‍රමය

viii. වෛද්‍ය රක්ෂණ ක්‍රමය

4.4 වී වගා රක්ෂණයේ ක්‍රියාකාරීත්වය

පහත දැක්වෙන ස්වභාවික උපද්‍රව මගින් ඵලදාවට පූර්ණ ලෙස හෝ කොටස් ලෙස සිදු වන හානි සඳහා වී වගා රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණ ආවරණය සපයනු ලබයි.

- කෘමි රෝග
- ගොයම් රෝග
- ගංවතුර
- නියඟය
- ජල හිඟය
- ජල අතිරික්තය
- කුරුල්ලන් හා වන සතුන් මගින් වන හානි

රක්ෂණ කාල සීමාව

වැපිරීමෙන් හෝ වගා කිරීමෙන් දින 7 කට පසු, අස්වනු නෙළීම දක්වා මෙය වලංගු වේ.

4.4.1 රක්ෂණ වාර මුදල්/රක්ෂණ ආවරණය

මහා වාරි හා සුළු වාරි ක්‍රම යටතේ රක්ෂණ ආවරණ මුදලෙන් 6% ක් ද, වර්ෂා පෝෂිත තත්වය යටතේ රක්ෂණ ආවරණ මුදලින් 8% ක් ද රක්ෂණ වාරික වශයෙන් අය කරන අතර රක්ෂණ වාර මුදල වගා කාලසටහනට අනුව වැපිරීමට හෝ වගා කිරීමට ප්‍රථම ගෙවා තිබිය යුතුය.

රක්ෂණය බැංකු හා වගා ණය මත පදනම් ව ක්‍රියාත්මක වන බැවින් ගොවියා විසින් සිය ණය අයදුම්පත බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එය වැපිරීමට හෝ වගා කිරීමට ප්‍රථමයෙන් සිදු කළ යුතුය.

වගු අංක 4.2: රක්ෂණ ආවරණය හා රක්ෂණ වාරමුදල්

ආවරණය කරන ඉඩම් පංතිය	රක්ෂණ ආවරණ මුදල අක්කරයකට/රු.	රක්ෂණාවරණ මුදල් අනුපාතය (%)	රක්ෂණ වාර මුදල්
සියළුම භූමි වර්ග සඳහා	5,000/= 30,000/=	6%-8%	300/= 2,400/=

මූලාශ්‍රය: CICL

4.4.2 වගා රක්ෂණ කාලසටහන

තාක්ෂණික කළමනාකරුගේ උපදේශකත්වය යටතේ, අදාළ තාක්ෂණික සහකාරවරුන් එක් එක් ප්‍රදේශවලට අදාළව වගා රක්ෂණ කාලසටහනක් සකසනු ලබයි. මේ තුළින් රක්ෂණ වාරික ගෙවිය යුතු කාලසීමාව, වගා කළ යුතු කාල සීමාව, හානි දැනුම් දීම, හානි තක්සේරු කිරීම යනා දී රක්ෂණයට සම්බන්ධ සියලුම ක්‍රියාකාරීත්වයන් දක්වනු ලබයි.

සටහන 4.2: වගා රක්ෂණ කාලසටහනේ ආකෘතිය

වී වර්ගයේ නම	කාල සීමාව	කාලසීමාව (දින වශයෙන්)	වැපිරීම හෝ වගා කිරීම ආරම්භ කිරීමේ දිනය	වැපිරීම හෝ වගා කිරීම අවසන් කළ යුතු දිනය	වාරික මුදල් ගෙවිය යුතු අවසාන දිනය

මූලාශ්‍රය: CICL

4.4.3 ගෙවූ රක්ෂණ වාරික මුදලේ වලංගු භාවය

රක්ෂිතයෙකු විසින් යම් වගා කන්නයක් සඳහා ගෙවූ රක්ෂණ වාර මුදල එම අදාළ කන්නය සඳහා පමණක් වලංගු වේ. නමුත් යම් හේතුවක් මත අදාළ කන්නයේ වගාව සිදු කිරීමට නොහැකි වූ විට එය ඉදිරි කන්නය සඳහා වලංගු වන අතර එසේ වීමට නම්, වගා කාල සටහනට අනුව අදාළ කන්නය අවසන් වීමට ප්‍රථම එසේ වගා කිරීම නොහැකි වූ හේතුව සෙලින්කෝ රක්ෂණ සමාගමට දැනුම් දිය යුතුය. ඒ අනුව අදාළ කන්නයේ වගා කිරීමට නොහැකි වූ හේතුව සමාගම පිළිගන්නේ නම් එම රක්ෂණ වාරිකය ඉදිරි වගා කන්නය සඳහා වලංගු වේ.

4.4.4 හානි වීම් වාර්තා කිරීම

රක්ෂිත හේතු මත යම් ප්‍රදේශයක යම් වගා හානි වීමක් සිදු වුවහොත් ඒ බව සෙලින්කෝ රක්ෂණ ආයතනයේ නියම කරන ලද ශාඛාවකට ගොස් සෙලින්කෝ ගොවි රක්ෂණ හිමිකම් අයදුම්පතක් මාර්ගයෙන් හානිය සිදු වී දින 7 ක් ඇතුළත දැනුම් දිය යුතුය.

4.4.5 රක්ෂණය කරන ලද ආපදා වූ ප්‍රදේශ පිරික්සුම

හානි තක්සේරු කණ්ඩායම ආපදාව සිදු වූ රක්ෂණය කරන ලද කුඹුරු ඉඩම අස්වනු නෙළීමට සති දෙකකටමත් පෙර නිරීක්ෂණය කරනු ලබයි. යම් වගා හානියක් සිදු වූ කුඹුරු ඉඩමක හානි තක්සේරු කමිටුව පැමිණ තක්සේරු කිරීමට ප්‍රථම අස්වනු නෙළීමට නොහැකිය. බොහෝ විට ඇස් මට්ටමින් හානි තක්සේරුව සිදු කරනු ලබයි.

4.4.6 සම්මත අස්වැන්න

එක් එක් ප්‍රදේශවලට අනුව යල සහ මහ කන්නයට අදාළව සම්මත අස්වැන්න අනුව, හානි වී ඇති අස්වනු ප්‍රමාණයේ වටිනාකම තීරණය කරනු ලබයි. සම්මත අස්වැන්න අඛණ්ඩ ව කන්න කිහිපයක් තුළ ලබා ගත් සාමාන්‍ය අස්වැන්න අනුව තීරණය කරනු ලබන අතර එය යල සහ මහ කන්නයේ දී වෙන් වෙන් ව ගනු ලබයි. සම්මත අස්වැන්නේ සිදුවන යම් අඩු වීමක් රක්ෂිත යම් හේතුවක් මත සිදු වී ඇත්නම්, එය රක්ෂණ ආවරණය ලබා දිය හැකි හේතුවක් මත සිදු වූ වගා හානියක් ලෙස සලකනු ලබයි. හානි ප්‍රමාණය, සම්මත අස්වැන්නේ ප්‍රතිශතයක් වශයෙන් ගණනය කරනු ලබන අතර සම්මත අස්වැන්න ලෙස ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සම්මත අස්වැන්න සලකනු ලබයි.

4.4.7 අස්වනු කැපීමේ අවස්ථාවේ අස්වනු තක්සේරුව

වන්දි ලැබීම සඳහා හිමිකම් ලබා ඇති සංඛ්‍යාවෙන් 10%ක් පමණ වන නියැදියක් සසම්භාවී ලෙස තෝරා ගෙන අස්වනු නෙළන අවස්ථාවේ දී සරල ක්‍රමයක් යොදා ගෙන තක්සේරු කරනු ලබයි. මෙසේ සිදු කරනු ලබන්නේ අස්වනු තක්සේරු කමිටුව මගින් යම් අධි තක්සේරුවක් හෝ අක්‍රමිකතාවයක් සිදු කර ඇද්ද යන්න පරීක්ෂා කිරීම සඳහාය.

4.4.8 රක්ෂණ වන්දි ගෙවීම

(අ) පළමු අදියරේ ආපදාවන් සඳහා
වැපිරීමෙන් හෝ වගා කිරීමෙන් දින 30ක් දක්වා සිදු වූ අලාභහානි සඳහා රක්ෂණ ආවරණ මුදලින් 60% ක් සහ 20% ක මෙහෙයුම් අතිරික්තයට යටත් ව ගෙවනු ලබයි.

(ආ) දෙවන අදියරේ ආපදාවන් සඳහා
වැපිරීමෙන් හෝ වගා කිරීමෙන් දින 31 සිට මල් හටගන්නා කාලය දක්වා සිදු වන අලාභහානි සඳහා රක්ෂණ ආවරණ මුදලින් 80% ක් සහ 20% ක මෙහෙයුම් අතිරික්තයකට යටත් ව ගෙවනු ලබයි.

(ඇ) අවසාන අදියරේ අලාභහානි සඳහා ගෙවීම්
මල් හට ගැනීමේ සිට අස්වනු නෙළන කාලය දක්වා සිදු වන අලාභහානි සඳහා රක්ෂණ ආවරණ මුදලින් 100%ක රක්ෂණ වන්දි වශයෙන් ගෙවනු ලබන්නේ 20%ක මෙහෙයුම් අතිරික්තයකට යටත්වය.

20%ක මෙහෙයුම් අතිරික්තය, මෙම රක්ෂණ ක්‍රමය යටතේ ද ක්‍රියාත්මක වන අතර එයින් අදහස් වන්නේ 20% ක් හෝ ඊට අඩු හානි සඳහා ගෙවීම් නොකරන බවයි.

වගා කිරීමට යොදා ගන්නා නොයෙක් වී වර්ග අනුව වගා කිරීමේ සිට මල් දැරීමට හා අස්වනු නෙළීමට ගත වන කාල සීමාව වෙනස් වේ. ඉහත සඳහන් කරුණු පදනම් කොට ගෙන ඉහත ආපදා අවස්ථා තුන තීරණය කරනු ලබයි.

4.4.9 හානි ප්‍රතිශතය තීරණය කිරීම

සම්මත අස්වනු ප්‍රමාණයේ සිදු වන අඩු වීම මත හානිය තීරණය කරනු ලබයි. තක්සේරු කරන ලද අස්වනු ප්‍රමාණය සම්මත අස්වනු ප්‍රමාණයට සමාන හෝ ඊට වැඩි නම් එහි අස්වනු හානියක් නොමැති බවට තීරණය කරන අතර රක්ෂණ වන්දි නොගෙවනු ලබයි.

තක්සේරු කරන ලද අස්වනු ප්‍රමාණය සම්මත අස්වනු ප්‍රමාණයට වඩා අඩු නම් පහත දැක්වෙන පරිදි හානි ප්‍රතිශතය තීරණය කරනු ලබයි.

$$\text{මුළු හානි ප්‍රතිශතය} = \frac{\text{සම්මත අස්වැන්න- තක්සේරු කළ අස්වැන්න}}{\text{සම්මත අස්වැන්න}} \times 100\%$$

4.4.10 වන්දි ගෙවීම් ගණනය කිරීම

- රක්ෂිත හානි ප්‍රතිශතය = මුළු හානි ප්‍රතිශතය - රක්ෂණය නොකරන ලද හේතුමත සිදු වූ හානි ප්‍රතිශතය

- ගෙවිය හැකි වන්දි ප්‍රතිශතය = රක්ෂණ හානි ප්‍රතිශතය - 20% ක මෙහෙයුම් අතිරික්තය

- හානි සඳහා ගෙවීම් = රක්ෂණ ආවරණ මුදල X ගෙවිය හැකි වන්දි ප්‍රතිශතය X හානි සිදුවූ අවස්ථාව අනුව ප්‍රතිශතය X වන්දි ගෙවිය හැකි භූමි ප්‍රමාණය (අක්කර) X ඉඩම් අයිති ස්වභාවයේ ප්‍රතිශතය

4.4.11 සෙලින්කෝ රක්ෂණ සමාගමේ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය

සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් වී වගා රක්ෂණය ආරම්භ කළ මුල් ම වසර 5 ක කාලසීමාව තුළ ඒ සඳහා ගොවීන්ගේ සහභාගිත්වය පැවතියේ අවම මට්ටමකිනි. 1999/2000 මහ කන්නයේ සිට ඒ යටතේ රක්ෂිත කුඹුරු ඉඩම් ප්‍රමාණයේ ඉහළ යාමක් පෙන්නුම් කරන ලද අතර ක්‍රමක්‍රමයෙන් එහි ඉහළ යාමක් දක්නට ලැබුණි. කෙසේ නමුත් මෙම රක්ෂණ ක්‍රමය ආරම්භ කළ කාලයේ සිට වර්තමානය දක්වා සෙලින්කෝ රක්ෂණ සමාගමට රක්ෂණ වාර මුදල ඉක්මවා වන්දි ගෙවීමට සිදු වී ඇත්තේ කන්න තුනක දී පමණි. 2003/2004 මහ කන්නයේ මෙම සමාගම යටතේ රක්ෂිත බිම් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතුණි (ඇමුණුම අංක 2).

4.5 අනෙකුත් රක්ෂණ ක්‍රම

4.5.1 අතිරේක භෝග රක්ෂණ ක්‍රම

පහත සඳහන් වගාවන් මෙම ක්‍රමය යටතේ රක්ෂණය කරනු ලබයි.

- ලොකුළූණු
- මිරිස්
- සෝයා බෝංචි
- කව්පි
- මුංඇට
- රටකජු

මෙම භෝග රක්ෂණය සඳහා වන හේතු, වී වගා රක්ෂණයට අදාළ වන හේතුම වේ.

4.5.2 අනෙකුත් වගාවන් සඳහා වන රක්ෂණ ක්‍රම

මෙම රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රධාන භෝග වර්ග තුනක් දැක්විය හැක.

- සෘතුමය භෝග
  - තල
  - බඩඉරිඟු
- වාර්ෂික භෝග
  - අන්නාසි
  - කෙසෙල්
- වැවිලි භෝග
  - උක්
  - පොල්
  - රබර්

රක්ෂණය සඳහා වන හේතු කෘමි වසංගත, ලෙඩරෝග, නියඟය, වන සතුන්, සුළි සුළං ගිනි ගැනීම් සහ ජල අතිරික්තය වේ. මෙම හේතු භෝගයෙන් භෝගයට වෙනස් වේ.

4.5.3 පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

ගව රක්ෂණය:

- කිරි එළදෙනුන්
- කිරි මීදෙනුන්
- පට්ටි ගවයින්
- පට්ටි මීහරක්
- සී සාන ගවයන්
- බර අදින හා සී සාන ගවයන්

එළුවන් රක්ෂණය:

- දෙමුහුම් වර්ගය (Cross Breed)
- පට්ටි වර්ග (Stud Breed)
- නුමුහුන් වර්ගය (Pure Breed)
- දේශිය වර්ග (Local Breed)

පශු සම්පත් රක්ෂණය යටතේ රක්ෂණ ආවරණ වර්ග දෙකක් වේ. එනම් අවම ආවරණය හා උපරිම ආවරණය ලෙසයි.

1991 සිට 2005 දක්වා පශු සම්පත් රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පහත සඳහන් වගු සටහන මගින් පෙන්වා දිය හැකිය.

වගු අංක 4.3: රක්ෂිත සතුන් සංඛ්‍යාව හා වන්දි ගෙවූ ප්‍රතිශතය

වර්ෂය	රක්ෂිත සතුන් සංඛ්‍යාව	දළ වාරික ආදායම (රු.)	දළ වන්දි ගෙවීම් ප්‍රමාණය (රු.)	වන්දි ගෙවූ ප්‍රතිශතය
1991	501	150,497/=	13,500/=	9%
1992	523	157,097/=	26,100/=	16%
1993	757	227,202/=	78,750/=	34%
1994	1,299	389,670/=	148,632/=	38%
1995	431	129,462/=	235,056/=	181%
1996	1,010	303,061/=	152,361/=	50%
1997	2,584	775,324/=	228,550/=	29%
1998	2,004	601,544/=	195,090/=	32%
1999	1,884	566,817/=	234,005/=	41%
2000	2,010	612,064/=	127,234/=	21%
2001	NA	105,346/=	165,379/=	156%
2002	NA	327,328/=	158,615/=	48%
2003	NA	595,368/=	232,920/=	39%
2004	NA	534,304/=	295,283/=	55%
2005	NA	329,716/=	304,119/=	92%

මූලාශ්‍රය: CICL
NA = වාර්තා වී නොමැත

වැඩිම වන්දි මුදල් ගෙවීමක් වාර්තා වී ඇත්තේ 1995 වර්ෂයේ වන අතර එය එකතු වූ වාරික මුදල්වලට සාපේක්ෂව 181% ක ප්‍රමාණයකි. 2001 වර්ෂයේදී දී ඉහළ වන්දි ගෙවීම් ප්‍රතිශතයක් වාර්තා වූ අතර එය 156% කි.

4.5.4 සෙලින්කෝ "ග්‍රාමීන්"

මෙම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන්නේ එළවළු, වී හා අනිකුත් භෝග වගාවන් සඳහා වගා ණය ලබා ගන්නා කාන්තාවන් වෙනුවෙනි. ඉහත සඳහන් ඕනෑම භෝගයක් වෙනුවෙන් ලබා ගන්නා ණය මුදලෙන් 4% ක මුදලක් රක්ෂණ වාරික වශයෙන් අය කර ගන්නා අතර වගා හානියක දී රක්ෂණ වන්දි ගෙවීමේ දී මෙහෙයුම් අතිරික්තයට යටත් නොවී වන්දිය ගෙවනු ලබයි (මෙහෙයුම් අතිරික්තයේ යම් ප්‍රතිශතයක් අඩු නොකරයි). මෙම ක්‍රමය යටතේ රු.50,000/= ක් දක්වා වන ණය මුදල් සඳහා රක්ෂණ වාරික මුදල රු.165/= ක් වන අතර රු.50,000/= සිට රු.100,000/= ක් දක්වා වන ණය මුදල් සඳහා රක්ෂණ වාරික මුදල රු.250/= ක් වේ.

4.5.5 සෙලින්කෝ "ගොවි විශ්‍රාම"

මෙම ක්‍රමය හඳුන්වා දී ඇත්තේ තම මහලු වියේ දී අතිරේක ලාභයක් නොලබන හා පිහිටක් නොමැති ගොවීන්ට මූල්‍යමය උපකාරයක් කිරීමේ අරමුණෙනි. සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමෙන් අනතුරුව තමාට හැකි පරිදි වාරික ගෙවීමට හැකි අතර ඒ සඳහා විකල්පයන් පවතී. ගෙවන මුදල අනුව විශ්‍රාම වැටුප තීරණය කරනු ලබයි.

පස්වන පරිච්ඡේදය

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය

5.1 අතීත ක්‍රියාකාරීත්වය විමර්ශනය

1958 දී නියමු ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කරන ලද වී වගා රක්ෂණ ක්‍රමය යටතේ වී වගා බිම් අක්කර 28,000 ක් රක්ෂණය කරන ලදී. 1962/63 මහ කන්නයේ සිට 1972 දක්වා ක්‍රියාත්මක වූ දෙවන අදියර යටතේ රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය අක්කර 200,000 දක්වා ඉහළ ගොස් තිබිණි. 1958 සිට 1973 දක්වා අවුරුදු 15 ක කාලසීමාව තුළ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

1958 දී රක්ෂණය කළ වී වගා බිම් ප්‍රමාණය	- අක්කර 28,000
1973 වන විට රක්ෂිත මුළු වී වගා බිම් ප්‍රමාණය	- අක්කර 300,000
එම කාලය තුළ (1958-73) ගෙවූ වන්දි ප්‍රමාණය	- රු. මිලියන 15.9
එම කාලය තුළ (1958-73) අය විය යුතු රක්ෂණ වාර මුදල්	- රු. මිලියන 16.9
අයකරන ලද වාරිකවලට සාපේක්ෂ ව ගෙවූ වන්දි අනුව හානි දර්ශකය	- 245%

1973 අංක 27 දරණ කෘෂිරක්ෂණ පනත 1974 දී ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර ඒ තුළින් ප්‍රධාන වෙනස්කම් කිහිපයක් සිදු කරන ලදී. 1973-1983 දක්වා කාලය තුළ ක්‍රියාකාරීත්වයෙහි පහත ලක්ෂණ දැකිය හැකි විය.

i. වී වගාව සඳහා අනිවාර්ය රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට නීති පැවතිය ද, සමාජ ආර්ථික හා යම් දේශපාලන බලපෑම් මත එය සම්පූර්ණයෙන් ම තදින් ක්‍රියාත්මක නොවන ලදී.

ii. රක්ෂණ ක්‍රමය මඟින් අවරණය කරන ලද රක්ෂණ ආවරණ වටිනාකම, සත්‍ය වශයෙන් වගා සඳහා වැය වන පිරිවැයට නොගැළපුණි.

iii. ගොවීන්ගේ අඩු සහභාගීත්වය සහ ඉහළ අවදානමක් සහිත වගා බිම් පමණක් රක්ෂණය කිරීම සඳහා ගොවීන්ගේ පවතින දැඩි නැඹුරුතාවය කැපී පෙනුණි.

iv. ඇතැම් කන්න තුළ රජය විසින් මූල්‍යමය සහයක් ලබා දුන්න ද, සාමාන්‍ය කන්නවල, කෘෂි රක්ෂණ මණ්ඩලයට සිය රක්ෂණ වගකීම්වලින් 15% ඉක්මවන පරිදි, මුළු වන්දි ප්‍රමාණය සිය අරමුදලෙන් ගෙවීමට සිදු නොවීය.

1983 සිට 1999 දක්වා කාලය තුළද කෘෂිරක්ෂණ මණ්ඩලයට ඇතැම් පරිපාලනමය හා ප්‍රතිපත්තිමය වෙනස් වීම්වලට මුහුණ දීමට සිදු විය. කෙසේ නමුත් 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත මඟින් රක්ෂණ කටයුතු ඉතා පුළුල් පරාසයක ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් ස්වයං මූල්‍ය පදනමක් තුළ මෙම කටයුතු සිදු කරන ලදී. පහත සඳහන් වගුව මඟින් කෘෂි රක්ෂණ කටයුතු වල ව්‍යාප්තිය පෙන්නුම් කරන ලදී.

වගු අංක 5.1: පරිපාලනය, රක්ෂිත බිම් ප්‍රමාණය, වාරික හා වන්දි මුදල් ප්‍රමාණය (1958-2006)

කාලසීමාව	පරිපාලනය	ප්‍රදේශ	වාරික මුදල අක්කරයකට (රු.)	වන්දි මුදල අක්කරයට (රු.)	අවම හානි %
1958-1974	ගොවිජන සේවා දෙපාර්තමේන්තුව	තෝරාගත් දිස්ත්‍රික්ක	6/=	100/= -180/=	30
1975-1983	කෘෂි රක්ෂණ මණ්ඩලය	දිවයින පුරා	3/= - 30/=	300/= - 500/=	30
1984-1999	කෘෂි රක්ෂණ මණ්ඩලය	දිවයින පුරා	36/= - 114/=	600/= - 2,200/=	20
1999 සිට	කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	දිවයින පුරා	100/= - 300/=	1,000/= - 6,000/=	20

මූලාශ්‍රය: AAIB

5.2 රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය අනුව, අවුරුදු දහයක කාල සීමාව තුළ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය

වී වගා රක්ෂණය මුළු දිවයින පුරා ක්‍රියාත්මක වන අතර, ප්‍රතිපත්ති වෙනස් වීම් හා ක්‍රියාකාර සැලසුම්වල වෙනස් කිරීම් මහින් ගොවීන්ගේ ඉහළ සහභාගීත්වයක් ඒ සඳහා අපේක්ෂා කළ ද, වී වගා රක්ෂණය කරන ලද බිම් ප්‍රමාණය අනුව සැලකීමේ දී පසුගිය වසර දහයක කාලසීමාව තුළ, අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබයි.

සටහන 5.1: පසුගිය වසර දහයක කාල සීමාව තුළ රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය



ඉහත සටහනට අනුව 1994/95 මහ කන්නයේ සිට 2004/2005 මහ කන්නය දක්වා (යල හා මහ කන්න 2 ම ඇතුළත් ව) රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබයි. කෘෂිකාර්මික හා ගොවිරක්ෂණ මණ්ඩලය විසින් 2004/2005 මහ කන්නය තුළ වී වගා බිම් හෙක්ටයාර් 5,800 ක් රක්ෂණය කර ඇති අතර එය 1994/95 මහ කන්නයේ රක්ෂිත වී වගා බිම් හෙක්ටයාර 50,000 සමහ සැසඳීමේ දී හෙක්ටයාර 44,200ක පහළ යාමකි. වී වගා රක්ෂණය සම්බන්ධව ගොවීන්ගේ අඩු සහභාගීත්වය ඒ සඳහා හේතු වී තිබේ. කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ඇතැම් ප්‍රදේශ සඳහා රක්ෂණ ආවරණය සැපයීම නවත්වා තිබීම මෙම තත්ත්වය වඩාත් තීව්‍ර කරන ලදී. උදාහරණ වශයෙන් 2000 වර්ෂයේ දී තෙත් කලාපයේ, කොළඹ, ගම්පහ, කළුතර, කෑගල්ල, ගාල්ල, නුවරඑළිය සහ රත්නපුර යන දිස්ත්‍රික්කවලට ප්‍රතිපත්තිමය විසඳුම් වශයෙන් රක්ෂණ ආවරණය සැපයීම අත්හිටවන ලදී. එමෙන්ම අධික අවදානම් කලාපවල පවතින වගා බිම් සඳහා රක්ෂණ ආවරණ සැපයීම ද තෝරාගත් ප්‍රදේශවල පමණක් ක්‍රියාත්මක කරන ලදී. හානි සිදු වීමේ මට්ටම ඉහළ යාම සමහ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් මණ්ඩලයේ මූල්‍යමය ශක්තිය පිරිහීයාම සමහර දිස්ත්‍රික්ක හා ප්‍රදේශවලට රක්ෂණ ආවරණය සැපයීම සීමා කිරීමට හේතුවක් විය. එමෙන්ම මෙහෙයුම් ගැටලු මත මන්නාරම්, මුලතිව්, කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල සම්පූර්ණ වශයෙන් ද, යාපනය හා වව්නියා යන දිස්ත්‍රික්කවල තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පමණක් සීමා සහිතව ද වී වගා රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම සෑම දිස්ත්‍රික්කයක ම පාහේ වර්ෂා පෝෂිත වගා බිම් රක්ෂණය කිරීම ජනප්‍රිය කර වීමට රක්ෂණ මණ්ඩලය උත්සුක නොවේ. වී වගා රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය වන කුඹුරු වැඩි ප්‍රතිශතයක් වගා ණය ලබාගන්නා ගොවීන්ගේ කුඹුරු බැවින්, බොහෝ ගොවීන් ණය පැහැර හැරීම හේතු කොට ගෙන බැංකු ණය සීමා කිරීම නිසා වී වගා රක්ෂණයේ ප්‍රගතිය කෙරෙහි ද මේ තත්වය බලපාන ලදී.

5.3 වී වගා රක්ෂණයේ ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම

වී වගා රක්ෂණයේ ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම සඳහා පහත සඳහන් දර්ශක භාවිතා කරනු ලබයි.

- හානි දර්ශකය
- ගෙවීම් දර්ශකය
- වියදම් දර්ශකය
- සහභාගීත්ව දර්ශකය

1994/95 මහ කන්නයේ සිට 2004/2005 මහ කන්නය දක්වා අවුරුදු 10 ක කාල සීමාව තුළ වී වගා රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පහත සඳහන් දත්ත හා දර්ශක මඟින් පෙන්වා දිය හැකිය.

$$\text{හානි දර්ශකය} = \frac{\text{ගෙවූ වන්දි ප්‍රමාණය (රුපියල්)}}{\text{අය කර ගත් වාරික මුදල් ප්‍රමාණය (රුපියල්)}}$$

$$\text{ගෙවීම් දර්ශකය} = \frac{\text{ගෙවූ වන්දි ප්‍රමාණය}}{\text{උපරිම රක්ෂණ වගකීම (රුපියල්)}} \times 100$$

$$\text{වියදම් දර්ශකය} = \frac{\text{මුළු වියදම (රුපියල්)}}{\text{අය කර ගත් වාර මුදල් ප්‍රමාණය}}$$

$$\text{සහභාගීත්ව දර්ශකය වගා කළ බිම් ප්‍රමාණය අනුව} = \frac{\text{රක්ෂිත මුළු බිම් ප්‍රමාණය (හෙක්.)}}{\text{වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්.)}} \times 100$$

5.3.1 හානි දර්ශක විශ්ලේෂණය

හානි දර්ශකය මගින් වගා රක්ෂණ ක්‍රමයේ මූල්‍යමය ස්ථායිතාවය විධිමත් ලෙස විශ්ලේෂණය කිරීමේ හැකියාව පවතී. වී වගා රක්ෂණ ක්‍රමය යටතේ, සාපේක්ෂ ව අඩු රක්ෂණ වාර මුදලක් අයකරනු ලබන්නේ සුළු පරිමාණ ගොවීන්ට පහසුවෙන් දරාගත හැකි මුදලක් විය යුතු හෙයිනි. එසේ වුවත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සිය ආදායම මූලිකව ම උපයා ගනු ලබන්නේ අය කරනු ලබන රක්ෂණ වාර මුදලෙනි. රක්ෂණ මණ්ඩලයේ එම අරමුදල තුළින් රක්ෂණ මෙහෙයුම් කටයුතු, වන්දි ගෙවීම් සහ පරිපාලන වියදම් සිදු කළ යුතුය. ඒ අනුව අය කරගන්නා රක්ෂණ වාර මුදල් ප්‍රමාණය සහ ගෙවූ රක්ෂණ වන්දි ප්‍රමාණය අනුව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දළ හානි දර්ශකය ගණනය කළ හැකිය. පහත වගු සටහන එය පෙන්නුම් කරනු ලබයි.

වගු අංක 5.2: හානි දර්ශක විශ්ලේෂණය

කන්නය/වර්ෂය	එකතු වූ රක්ෂණ වාර මුදල (රු. '000)	ගෙවූ වන්දි මුදල (රු. '000)	වාර මුදල හා වන්දි මුදල අතර වෙනස (රු. '000)	දළ හානි දර්ශකය
1994/95 මහ	30,554/=	21,484/=	9,070/=	0.7
1995 යල	8,926/=	4,471/=	4,455/=	0.5
1995/96 මහ	12,357/=	17,135/=	- 4,778/=	1.4
1996 යල	3,751/=	2,577/=	1,174/=	0.7
1996/97 මහ	9,736/=	5,467/=	4,269/=	0.6
1997 යල	3,174/=	18,852/=	1,322/=	0.6
1997/98 මහ	6,597/=	1,003/=	5,594/=	0.2
1998 යල	2,657/=	4,818/=	- 2,161/=	1.8
1998/99 මහ	5,373/=	4,337/=	1,036/=	0.8
1999 යල	2,930/=	1,472/=	1,458/=	0.5
1999/2000 මහ	5,012/=	3,388/=	1,624/=	0.7
2000 යල	2,067/=	592/=	1,475/=	0.3
2000/2001 මහ	1,653/=	2,689/=	- 1,036/=	1.6
2001 යල	1,028/=	280/=	748/=	0.3
2001/02 මහ	1,499/=	992/=	507/=	0.7
2002 යල	1,040/=	981/=	59/=	0.9
200/03 මහ	3,361/=	2,860/=	501/=	0.9
2003 යල	2,632/=	944/=	1,688/=	0.4
2003/04 මහ	3,611/=	7,892/=	- 4,281/=	2.2
2004 යල	1,488/=	679/=	809/=	0.5
2004/2005 මහ	4,448/=	3,453/=	995/=	0.8

මූලාශ්‍රය: AAIB

වී වගා රක්ෂණ ක්‍රමයේ මුල් අවුරුදු කිහිපය තුළ අය වූ රක්ෂණ වාර මුදලට සාපේක්ෂ ව ගෙවිය යුතු වන්දි මුදල ඉතා ඉහළ අගයක් ගන්නා ලදී (ඇතැම් කන්නවලදී). ඒ සඳහා යම් යම් කාල සීමාවල ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ බලපාන ලදී. 1970-1980 කාලය තුළ ඇතැම් කන්නවල වන්දි ගෙවීම් ප්‍රමාණය, එකතු වූ වාර මුදල ඉක්මවා යාම හේතුවෙන් දළ හානි දර්ශකය ඉහළ මට්ටමක (1 ට වඩා වැඩි) පැවතුණි (ඇමුණුම් අංක 3). මෙම හිඟය අවම කිරීම සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය පියවර කිහිපයක් ගන්නා ලදී.

- අවුරුදු 5 ක කාලසීමාවක් තුළ අඛණ්ඩ ව හානියට ලක් වූ වගා බිම් රක්ෂණය නවතා දැමීම හා අධික අවදානම් ප්‍රදේශවල තෝරාගත් වගා බිම් සඳහා පමණක් රක්ෂණ ආවරණය සැපයීම.

- සෑම දිස්ත්‍රික්යක ම පාහේ වාර්ෂාපෝෂිත වගා බිම් රක්ෂණය සිදු නොකල අතර අනිකුත් ප්‍රදේශවල වගා ණය ලබා ගන්නා ගොවීන් සඳහා පමණක් වගා රක්ෂණය සීමා කිරීම.

(වාර්ෂික වාර්තාව -AAIB-2002)

ඉහත වගුවට අනුව, අයකරන ලද වාරමුදලට සාපේක්ෂ ව ගෙවන ලද වන්දි මුදල කන්න හතරක දී පමණක් ඉහළ ගොස් තිබිණි. ඒවා නම් 1995/96 මහ, 1998 යල, 2000/2001 මහ කන්නය සහ 2003/2004 මහ කන්නය වෙයි. මෙම කන්න හතර තුළදී දළ හානි දර්ශකය 1ට වඩා වැඩි අගයක් ගෙන ඇති බව පෙනී යයි. එහි දී වැඩිම දළ හානි දර්ශකය 2003/2004 මහ කන්නය තුළ 2.2 වශයෙන් වාර්තා වූ අතර මන්නාරම දිස්ත්‍රික්කය තුළ පැවති නියඟය හේතුවෙන් විශාල වශයෙන් වගා හානි සිදුවීම මත විශාල වන්දි මුදලක් ගෙවීමට සිදු වීම මේ සඳහා හේතුව බව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය පෙන්වා දෙනුලබයි. මෙම කන්නය තුළ රක්ෂණ වන්දි වශයෙන් ගෙවූ මුළු මුදල රු. 7,892,000/= ක් වූ අතර රක්ෂණ වාරික වශයෙන් අය වූ මුදල රු. 3,611,000/= කි.

2000/2001 මහ කන්නය තුළදී ද අම්පාර හා මඩකලපු දිස්ත්‍රික්ක වල සිදු වූ ජල ගැලීම් හේතුවෙන් ද රක්ෂණ මණ්ඩලයට විශාල වන්දි ප්‍රමාණයක් ගෙවීමට සිදු වූ අතර දළ හානි දර්ශකයේ ඉහළ යාම කෙරෙහි එම තත්ත්වය සෘජුව ම බලපාන ලදී. වගුවට අනුව 1994/95 මහ කන්නයේ සිට 2004/2005 මහ කන්නය දක්වා අවුරුදු 10 ක කාල සීමාව තුළ රක්ෂණ මණ්ඩලය විසින් එකතු කළ මුළු වාර මුදල් වටිනාකම රුපියල් මිලියන 114 ක් වූ අතර, එම කාලය තුල වන්දි වශයෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 89 ක් විය. ඒ අනුව එම අවුරුදු 10ක කාල සීමාව තුළ රක්ෂණ මණ්ඩලයේ දළ හානි දර්ශකය 0.7ක් වූ අතර එය 1ට වඩා අඩු අගයක් බැවින්, මණ්ඩලයේ රක්ෂණ වාරික එකතු වීම හා වන්දි ගෙවීම් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සැහීමකට පත් විය හැකි බව පෙනී යයි. 1994/95 මහ කන්නය තුළ එකතු කරන ලද රක්ෂණ වාර මුදල් වටිනාකම රු.30,554,000/= වූ අතර එය 2004/2005 මහ කන්නය වන විට රු. 4,448,000/= දක්වා පහළ ගොස් ඇති බව පැහැදිලි වෙයි. ඒ අනුව එම වර්ෂ දහයක කාල සීමාව තුළ මණ්ඩලයේ රක්ෂණ වාර මුදල් ආදායම 85% කින් පහළ යාම තුළින් රක්ෂණ වී වගා බිම් ප්‍රමාණයේ ක්‍රමික අඩු වීම පැහැදිලි ව ඉස්මතු කර පෙන්වනු ලබයි.

5.3.2 ගෙවීම් දර්ශකය

රක්ෂණ මණ්ඩලයේ උපරිම රක්ෂණ වගකීමෙන් කොපමණ ප්‍රතිශතයක් වන්දි වශයෙන් ගෙවන්නේ ද යන්න පිළිබඳ සලකා බැලීම ගෙවීම් දර්ශකය වන අතර රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාර්ත්වය ඇගයීම සඳහා එම දර්ශකය ද ඉතා වැදගත්ය.

වගු අංක 5.3: වන්දි ගෙවීම් දර්ශක විශ්ලේෂණය

කන්නය	ගෙවූ වන්දි මුදල (රුපියල්)	උපරිම රක්ෂණ වගකීම (රුපියල්)	ගෙවීම් දර්ශකය %
1995/96 මහ	17,135,000/=	240,926,000/=	7.1
1996 යල	2,577,000/=	78,577,800/=	3.3
1996/97 මහ	5,467,000/=	209,540,800/=	2.6
1997 යල	1,853,000/=	65,481,500/=	2.8
1997/98 මහ	10,003,000/=	133,321,500/=	0.8
1998 යල	4,818,000/=	57,886,600/=	8.3
1998/99 මහ	4,337,000/=	108,405,500/=	4.0
1999 යල	1,472,000/=	64,039,900/=	2.3
1999/2000 මහ	3,388,000/=	102,936,600/=	3.3
2000 යල	592,000/=	46,883,800/=	1.3
2000/2001 මහ	2,689,000/=	48,717,600/=	5.5
2001 යල	280,000/=	22,525,000/=	1.2
2001/2002 මහ	992,000/=	28,810,800/=	3.4
2002 යල	981,000/=	23,574,400/=	4.2
2002/2003 මහ	2,860,000/=	61,554,200/=	4.6
2003 යල	944,000/=	48,457,900/=	1.9
2003/2004 මහ	7,892,000/=	52,385,200/=	15.1
2004 යල	679,000/=	26,192,600/=	2.6
2004/2005 මහ	2,852,165/=	75,959,600/=	3.8
2005 යල	456,878/=	46,634,700/=	1.0

මූලාශ්‍රය: AAIB

විශාල වශයෙන් සිදු වන ස්වභාවික ව්‍යසනයක දී හැරුණු විට, කෘෂිකාර්මාන්තය තුළ 100% කින් ම වගා හානියක් සිදු වීමේ ප්‍රවණතාවය දුලභය. බොහෝ ප්‍රදේශවල වගා හානි වාර්තා වන්නේ කොටසකට පමණය. කෙසේ නමුත් වී වගා රක්ෂණයේ දී, මණ්ඩලය විසින් සිය උපරිම රක්ෂණ වගකීමෙන් 15% දක්වා වන රක්ෂණ වන්දි ගෙවීම් දරා ගත යුතු අතර 15%ට වඩා වැඩිවන අවස්ථාවල දී එම අතිරික්ත වන්දි මුදල රජය විසින් ගෙවනු ලබයි. නමුත් 1999 කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත ඇති කිරීමත් සමඟ රජයේ මෙම සහනාධාරය අත්හිටුවන ලදී. කෙසේ වුවත් ඉහත සඳහන් වගුව අනුව බලන කල, 1995/96 මහ කන්නයේ සිට 2005 යල කන්නය දක්වා කාල සීමාව තුළ රක්ෂණ මණ්ඩලයේ උපරිම රක්ෂණ වගකීමෙන් 15% ක වන්දි ප්‍රමාණයක් ගෙවීමට සිදු වී ඇත්තේ 2003/2004 මහ කන්නයේ දී පමණි. ඒ සඳහා හේතු වී ඇත්තේ එම කන්නය තුල මන්නාරම දිස්ත්‍රික්කය සඳහා විශාල වශයෙන් වන්දි ගෙවීමට සිදු වීමයි. ඒ හැර අනිකුත් කන්නවලදී, රක්ෂණ මණ්ඩලයට සිය උපරිම රක්ෂණ වගකීමෙන් වන්දි වශයෙන් ගෙවීමට සිදු වී ඇත්තේ 1%-8% අතර ප්‍රතිශතයක් පමණි. මෙයින් පැහැදිලි වන්නේ සාමාන්‍යයෙන්, බොහොමයක් වගා කන්නවල දී, රක්ෂණ මණ්ඩලයට රක්ෂණ වන්දි වශයෙන් ගෙවිය යුතු වන මුදල, සිය උපරිම රක්ෂණ වගකීමෙන් ඉතා අඩු ප්‍රතිශතයක් බවයි.

5.3.3 සහභාගීත්ව දර්ශකය

සහභාගීත්ව දර්ශකය ආකාර 2 කට විශ්ලේෂණය කිරීම සිදු කළ හැකිය.

- රක්ෂණ කළ වගාබිම් ප්‍රමාණය අනුව
- රක්ෂණ ආවරණය ලබා ගත් ගොවීන් සංඛ්‍යාව අනුව

වගු අංක 5.4: රක්ෂණය කළ වගා බිම් ප්‍රමාණය අනුව සහභාගීත්ව දර්ශකය

කන්නය/වර්ෂය	වී වගා කළ බිම් ප්‍රමාණය (හෙක්ටයාර් '000)	රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර් '000)	වගා කළ මුළු වී බිම් ප්‍රමාණයට සාපේක්ෂව සහභාගීත්ව %
1994/95මහ	567	50	8.8
1995යල	348	16	4.6
1995/96 මහ	499	20	4.0
1996 යල	250	6	2.4
1996/97 මහ	473	16	3.4
1997 යල	257	5	1.9
1997/98 මහ	574	10.18	1.8
1998යල	298	4.42	1.5
1998/99 මහ	538	8.27	1.5
1999 යල	341	4.89	1.4
1999/2000 මහ	549	7.86	1.4
2000 යල	812	3.58	0.4
2000/01මහ	479	3.72	0.8
2001 යල	319	1.72	0.5
2001/02 මහ	531	2.2	0.4
2002 යල	319	1.8	0.6
2002/03 මහ	618	4.7	0.8
2003 යල	401	3.7	0.9
2003/04 මහ	542	4.0	0.7
2004 යල	258	2.0	0.8
2004/05 මහ	581	5.8	0.9

මූලාශ්‍රය: AAIB

1977/78 මහ කන්නය තුළ වී වගා කරන ලද බිම් ප්‍රමාණයන් රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණයෙන් 40%ක් වූ අතර එය 1994/95 මහ කන්නය වනවිට 9% දක්වා පහළ බැසීමක් පෙන්නුම් කරනු ලබයි. 1994/95 මහ කන්නයෙන් පසු මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය තවදුරටත් ක්‍රමිකව පහළ බැසීමක් පෙන්නුම් කරන ලදී. එය 1994/95 මහ කන්නයේ සිට 2004/2005 මහ කන්නය දක්වා 9%-1% දක්වා පහළ බැසීමකි.

වගු අංක 5.5: සහභාගීත්ව දර්ශකය රක්ෂණ ආවරණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව අනුව

කන්නය/වර්ෂය	වී වගා රක්ෂණ ව්‍යාපෘතියට සම්බන්ධ වූ ගොවීන්ගේ සංඛ්‍යාව
1994/95 මහ	47,856
1995 යල	15,260
1995/96 මහ	22,480
1996 යල	7,200
1996/97 මහ	14,800
1997 යල	5,422
1997/98 මහ	9,801
1998 යල	4,254
1998/1999 මහ	7,897
1999 යල	4,571
1999/2000 මහ	7,365
2000 යල	3,237
2000/2001මහ	3,344
2001 යල	1,559
2001/2002 මහ	1,926
2002 යල	1,457
2002/2003 මහ	4,350

මූලාශ්‍රය: AAIB

ඉහත වගු සටහනට අනුව 1994/95 මහ කන්නය තුළ වී වගා රක්ෂණයට සම්බන්ධ ගොවීන්ගේ සංඛ්‍යාව 47,856 ක් වූ අතර එය 2002/2003 මහ කන්නය වන විට ගොවීන් 4,350ක් දක්වා පහළ ගොස් තිබුණි. එය 1994/95 මහ කන්නයට සාපේක්ෂ ව 91% ක පහළ යාමකි. රක්ෂණ ක්‍රමය සඳහා ගොවීන්ගේ සහභාගීත්වය තුළ ද ඔවුන්ගේ ස්වේච්ඡා සහභාගීත්වය ඉතාමත් අඩු මට්ටමක පවතී. 1983 සිට 1989 දක්වා කාලය තුළ කෘෂි රක්ෂණ මණ්ඩලය විසින්, ගොවීන්ගේ ස්වේච්ඡා සහභාගීත්වය ඉහළ නැංවීම පිණිස, රක්ෂණ ආවරණ මට්ටම වැඩි කිරීම වැනි විවිධ ක්‍රියාමාර්ග මඟින් විවිධ උත්සාහයන් දැරුව ද, අවසාන ප්‍රතිඵලයේ සැලකිය යුතු වෙනසක් සිදු නොවුණි. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වී වගා රක්ෂණයට ගොවීන්ගේ සහභාගීත්වය, ඍජුව ම වගා සඳහා ගොවීන් විසින් ගනු ලබන බැංකු ණය සමඟ සම්බන්ධ ව පවතී. එය පහත පරිදි වගුව 5.6 තුළින් පෙන්වා දිය හැකිය.

වගු අංක 5.6: රක්ෂණ ආවරණය ලබාගත් මුළු ගොවීන්ගේ ප්‍රතිශතය සහභාගීත්ව ක්‍රමය අනුව

කන්නය	සෘජු සහභාගීත්ව %	ණය ලබාගැනීමේ පදනම මත සහභාගීත්වය
1994/95 මහ	5	95
1995 යල	8	92
1995/96 මහ	8	92
1996 යල	9	91
1996/97 මහ	5	95
1997 යල	6	94
1997/98 මහ	2	98
1998 යල	1	99

මූලාශ්‍රය: AAIB

ඉහත වගු සටහනට අනුව පෙනී යන්නේ වී වගා රක්ෂණය සඳහා සහභාගී වී ඇති ගොවීන්ගෙන් 90% කට වැඩි ප්‍රතිශතයක් ඒ සඳහා දායක වී ඇත්තේ වගා ණය ලබා ගැනීමේ පූර්ව කොන්දේසියක් සම්පූර්ණ කිරීමක් වශයෙන් බවයි. ස්වේච්ඡා සහභාගීත්වය ඉතාමත් අඩු මට්ටමක පවතින අතර 1994/95 මහ කන්නයේ 5% ක් වූ ස්වේච්ඡා සහභාගීත්වය 1998 යල කන්නය වන විට 1% දක්වා පහළ බැසීමක් පෙන්නුම් කරනු ලබයි.

5.3.4 වියදම් දර්ශකය විශ්ලේෂණය

ව්‍යාපාරික වශයෙන් ක්‍රියාත්මක වීමේ අරමුණකින් තොරව ක්‍රියාත්මක වන වී වගා රක්ෂණ ක්‍රමය ස්වභාවික හා අනිකුත් වගා හානි සඳහා රක්ෂණ ආවරණය සපයනු ලබයි. රක්ෂණ වාර මුදල් අය කිරීම සඳහා දැරිය යුතු මුළු වියදම මෙම දර්ශකය මගින් පෙන්නුම් කරනු ලබයි. පහත සඳහන් වගුවට අනුව 1995-2005 කාලය තුල වියදම් දර්ශකය පෙන්වා දී ඇති අතර බොහොමයක් වර්ෂවල වියදම් දර්ශකය ඉහළ මට්ටමක පවතී. රුපියලක රක්ෂණ වාර මුදලක් අය කිරීමට මණ්ඩලය විසින් දැරිය යුතු පරිපාලන හා මෙහෙයුම් වියදම ඉතා ඉහළය. 2001 සහ 2002 වර්ෂ තුල මෙම දර්ශකය කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත.

වගු අංක 5.7: වියදම් දර්ශකය

වර්ෂය	එකතු වූ වාර මුදල් ප්‍රමාණය (රු.)	මෙහෙයුම් වියදම් (රු.)	පරිපාලන වියදම් (රු.)	මුළු වියදම (රු.)	වියදම් දර්ශකය
1995	42,430,660/=	2,525,237/=	24,053,011/=	26,578,248/=	0.63
1996	15,770,090/=	1,405,589/=	25,123,900/=	26,529,489/=	1.70
1997	13,297,204/=	1,098,303/=	30,359,812/=	31,458,115/=	2.40
1998	9,250,889/=	719,310/=	19,910,238/=	20,629,548/=	2.23
1999	7,864,368/=	114,353/=	18,825,404/=	18,939,757/=	2.41
2000	6,968,986/=	404,607/=	35,360,293/=	35,764,900/=	5.13
2001	3,392,140/=	368,648/=	37,785,116/=	38,153,764/=	11.25
2002	2,717,416/=	205,580/=	36,304,181/=	36,509,761/=	13.43
2003	5,992,708/=	259,948/=	8,307,965/=	8,567,913/=	1.43
2004	4,912,341/=	460,756/=	15,456,072/=	15,916,828/=	3.24
2005	7,037,535/=	325,377/=	8,939,717/=	9,265,094/=	1.32

මූලාශ්‍රය: AAIB

රක්ෂණ මණ්ඩලයේ වන්දි ගෙවීම්, පරිපාලන හා මෙහෙයුම් වියදම් ප්‍රමාණය, එකතු වන වාරික මුදල් ආදායමට වඩා ඉහළ ගොස් ඇති බව පෙනී යයි. මෙම තත්වය වගා රක්ෂණය සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. 2005 වර්ෂයේ වී වගා රක්ෂණයේ ආදායම් හා වියදම් ගිණුම අනුව පරිපාලන වියදම් වන්දි ගෙවීම් ප්‍රමාණය ඉක්මවා ඇති අතර මණ්ඩලයේ මුළු වියදම් ප්‍රමාණයෙන් 65% ක් ඉක්මවා පරිපාලන වියදම් පවතී (වගු අංක 5.8).

වගු අංක 5.8: 2005 වර්ෂයේ වී වගා රක්ෂණයේ ආදායම් සහ වියදම් ගිණුම

ආදායම	රුපියල්
අය කර ගත් වාරික මුදල් ප්‍රමාණය	4,061,655/=
අනෙකුත් ආදායම්	253,155/=
අයෝජන සඳහා පොලිය	5,586,960/=
මුළු ආදායම	9,901,766/=
වියදම්	**රුපියල්**
වන්දි ගෙවීම්	4,014,167/=
මෙහෙයුම් වියදම්	325,378/=
පරිපාලන වියදම්	8,939,717/=
මුළු වියදම්	3,279,262/=

මූලාශ්‍රය: AAIB

හයවන පරිච්ඡේදය

කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අනෙකුත් රක්ෂණ ක්‍රමයන් පිළිබඳ විමසුමක් සහ රාජ්‍ය මැදිහත් වීම

6.1 අනිකුත් රක්ෂණ ව්‍යාපෘතීන්

6.1.1 පශු සම්පත් රක්ෂණය

1976 දී ආරම්භ වූ පශු සම්පත් රක්ෂණ ව්‍යාපෘතිය, මුල් වරට අන්තර් ජාතික සංවර්ධන ව්‍යාපාරයේ (IDA) ආධාර යටතේ, කිරි කර්මාන්තය නංවාලීමේ ව්‍යාපෘතිය යටතේ ගොවීන්ට ලබා දුන් කිරි එළදෙනුන්ට පමණක් සීමා විය. මෙම ව්‍යාපෘතියේ මුල් කාලයේ දී ආනයනය කරන ලද, එම ගවයන්ගේ මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පැවති අතර, ලංකාවේ පැවති දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ගැටලුව එම ගවයින් සඳහා පැවතීම එයට හේතුවයි. 1979 දී ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ, දේශීය සතුන් සඳහා ද රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර ඒ යටතේ විශේෂ ව්‍යාපාරයන් හි කිරි ගවයන් සඳහා ද, දිවා රාත්‍රී කාලයේ ගාල් කරනු ලබන කිරි දෙනුන් සඳහාද, ණය මුදලකින් හෝ අත්පිට මුදලින් මිල දී ගන්නා කිරි දෙනුන් සඳහා ද ක්‍රියාත්මක විය. මීට අමතරව බර අදින ගොනුන්, බර අදින මී ගවයන්, පට්ටි ගොනුන් හා මී ගොනුන් සඳහා ද මේ රක්ෂණය ව්‍යාප්ත විය. කාලයත් සමඟ රක්ෂිත සතුන් ප්‍රමාණයේ ඉහළ යාමත් සමඟ සතුන්ගේ මරණ අනුපාතිකයේ ක්‍රමික පහළ යාමක් ද දක්නට හැකි විය.

2005 වර්ෂය වන විට, පශු සම්පත් රක්ෂණය අවුරුදු 29 ක් පුරා ක්‍රියාත්මක වී පැවතෙන රක්ෂණ ව්‍යාපෘතියකි. ආරම්භයේදී ගවයින් සඳහා පමණක් ක්‍රියාත්මක වූ මෙය පසු කාලීනව, එළුවන්, වැස්සි පැටවුන්, බැටළුවන් හා කුකුළු පැටවුන් සඳහා ව්‍යාප්ත වූ අතර දිවයින පුරාම සාර්ථකව ව්‍යාප්ත වන්නට විය.

1996-2005 කාල සීමාව තුළ පශු සම්පත් රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පහත වගුව මඟින් පෙන්වා දිය හැකිය. 2005 වර්ෂය අවසන් වන විට, මේ රක්ෂණ ව්‍යාපෘතිය යටතේ රක්ෂණය කරන ලද සියලුම සතුන්ගේ සංඛ්‍යාව, එහි ආරම්භයේ සිට සලකා බැලීමේ දී 100,000 ඉක්මවා ඇත.

වගු අංක 6.1: පශු සම්පත් රක්ෂණ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය (1996 - 2005 දක්වා)

වර්ෂය	රක්ෂිත සතුන් ප්‍රමාණය	රක්ෂණ වාර මුදල් (රුපියල්)	ගෙවූ වන්දි (රුපියල්)	දළ හානි දර්ශකය
1996	8,289	3,214,732/=	1,025,854/=	0.3
1997	4,977	1,717,306/=	760,506/=	0.4
1998	7,297	2,566,577/=	1,257,978/=	0.5
1999	10,301	3,659,886/=	1,319,974/=	0.4
2000	10,109	3,673,493/=	1,427,957/=	0.4
2001	8,991	3,021,410/=	1,246,855/=	0.4
2002	7,460	2,596,220/=	204,659/=	0.1
2003	9,389	2,979,536/=	2,495,558/=	0.8
2004	26,339	2,873,710/=	1,768,017/=	0.6
2005	13,016	4,123,458/=	1,827,568/=	0.4

මූලාශ්‍රය: AAIB

ඉහත වගුවට අනුව පශු සම්පත් රක්ෂණ ව්‍යාපාතියේ දළ හානි දර්ශකය 1996-2005 දක්වා සෑම වර්ෂයක ම 1ට වඩා අඩු අගයක් ගන්නා බව කැපී පෙනෙන ලක්ෂණයකි. එම සලකා බලනු ලැබූ වර්ෂ 10 තුළ, අයකරන ලද සාමාන්‍ය රක්ෂණ වාරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 30ක් වන අතර වන්දි වශයෙන් ගෙවූ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 13 කි. මෙම වර්ෂ 10ක කාල සීමාව තුළ රක්ෂණ වාර මුදල් ආදායම 28%කින් ඉහළ යාමක් පෙන්නුම් කරනු ලබයි. කෙසේ වු වත් එම කාලය තුළ ම ගෙවූ වන්දි මුදල ද 78%කින් ඉහළ යාමක් වාර්තා කරන ලදී. 1996 වර්ෂයේ දී රක්ෂිත මුළු සතුන් සංඛ්‍යාව 8,289ක් වූ අතර 2005 වර්ෂයේ දී එම සංඛ්‍යාව 13,016ක් විය. 2001 සිට 2005 වර්ෂය දක්වා රක්ෂිත සතුන් සංඛ්‍යාව සතුන් වර්ග අනුව පහත වගුව මඟින් පෙන්වා දිය හැකිය.

වගු අංක 6.2: රක්ෂිත සතුන් සංඛ්‍යාව වර්ග අනුව

සතුන් වර්ගය	2001	2002	2003	2004	2005
කිරි එළදෙනුන්	3,348	546	-	-	19
ගවයන්	1,557	1,759	1, 951	2,305	3,315
එළුවන්	4,089	5,155	5,323	4,661	4,078
කුකුළු පැටවුන්	-	-	-	19,373	5,604
මුළු එකතුව	**8,994**	**7,460**	**7,274**	**26,339**	**13,016**

මූලාශ්‍රය: AAIB

ඉහත සටහනට අනුව 2001-2005 කාලය තුළ ගවයන් හා එළුවන් රක්ෂණය, ස්ථාවර වර්ධනයක පැවති බව පෙනී යයි. කුකුළු පැටවුන් රක්ෂණය 2004 වර්ෂය තුළ ආරම්භ වූ අතර 2004, 2005 වර්ෂ තුළ අනිකුත් සතුන්ට සාපේක්ෂ ව ඉහළ ප්‍රමාණයක සතුන් සංඛ්‍යාවක් රක්ෂණය කර ඇත.

වගු අංක 6.3: වන්දි ගෙවීම

වර්ෂය	රක්ෂිත මුළු සතුන් සංඛ්‍යාව	වන්දි ගෙවූ සතුන් සංඛ්‍යාව	වන්දි ගෙවූ සතුන් ප්‍රතිශතය, රක්ෂිත සතුන්ට සාපේක්ෂව
2001	8,994	313	3%
2002	7,460	419	6%
2003	7,274	444	6%
2004	26,339	342	1%
2005	13,016	278	2%

මූලාශ්‍රය: AAIB

ඉහත වගුවට අනුව රක්ෂිත සතුන්ට සාපේක්ෂව වන්දි ගෙවීමට සිදුවී ඇති සතුන් ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතී. බොහෝ වර්ෂවල එය 4% කටත් අඩු ප්‍රමාණයකි.

වගු අංක 6.4: පශු සම්පත් රක්ෂණ ව්‍යාපෘතිය යටතේ රක්ෂණය කිරීමට ඉලක්ක ගත සතුන් සංඛ්‍යාව සහ රක්ෂිත සතුන් සංඛ්‍යාව

වර්ෂය	ඉලක්ක ගත සතුන් සංඛ්‍යාව	සත්‍ය වශයෙන් රක්ෂිත සතුන් සංඛ්‍යාව	රක්ෂිත සතුන් ප්‍රතිශතය ඉලක්ක සතුන්ට සාපේක්ෂව
2001	11,570	8,994	77%
2002	11,825	7,460	63%
2003	10,980	7,274	66%
2004	87,200	26,339	30%
2005	73,519	13,016	18%

මූලාශ්‍රය: AAIB

2001-2005 වර්ෂ තුළ රක්ෂණය කිරීමට අපේක්ෂිත සතුන් සංඛ්‍යාව සහ රක්ෂිත සතුන් සංඛ්‍යාව සැලකීමේ දී, 2001, 2002, 2003 යන වර්ෂවල රක්ෂිත සතුන් සංඛ්‍යාව අපේක්ෂිත රක්ෂණ මට්ටමින් 60% ඉක්මවා ඇති බව වගු අංක 6.4 මගින් පෙනේ. කෙසේ නමුත් වගා රක්ෂණ ව්‍යාපෘතිය සමඟ සංසන්දනය කිරීමේ දී, පශු සම්පත් රක්ෂණ ව්‍යාපෘතිය යම් සාර්ථක මට්ටමකින් යුක්තව ක්‍රියාත්මක වන බව පෙනී යන අතර, අවදානම් ස්වභාවය ද සාපේක්ෂ ව අවම මට්ටමක පවතී.

6.1.2 අතිරේක භෝග රක්ෂණය සහ අනිකුත් භෝග රක්ෂණ ව්‍යාපෘතිය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින්, අතිරේක භෝග සහ අනිකුත් භෝග එනම්, වාර්ෂික භෝග, වැවිලි භෝග, වැනි භෝග වර්ග රාශියක් සඳහා රක්ෂණ ආවරණය සපයා ඇත. 1984 යල කන්නයේ සිට රක්ෂණ මණ්ඩලය විසින් සෝයා බෝංචි වගාවන් සඳහා තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයකට රක්ෂණ ආවරණය සපයන ලද අතර සෝයා බෝංචි, මුංඇට, කව්පි, මිරිස්, රටකජු වැනි අතිරේක භෝග රාශියක් සඳහා රක්ෂණය සැපයීම සිදු කරන ලද්දේ 1984/85 මහ කන්නයේ සිට, වියළි කලාපයේ දිස්ත්‍රික්ක සඳහා වූ උස්බිම් වගා කිරීමේ ව්‍යාපෘතිය යටතේ ය. ජනපද ව්‍යාපාර යටතේ උක් වගා ද රක්ෂණයට යටත් කරන ලදී. තෙත් කලාපීය ව වාණිජ භෝගයක් වශයෙන් බුලත් වගාව ද රක්ෂණය කරන ලද අතර මෙය නියමු ව්‍යාපෘතියක් වශයෙන් දිස්ත්‍රික්ක 2ක් තුළ ක්‍රියාත්මක විය. ආනයන වෙළෙඳපොළ සඳහා වූ වාණිජ භෝගයක් වශයෙන් සැලකිය හැකි ගර්කින්

වගාව ද රක්ෂණය යටතට අයත් වන අතර තෝරා ගත් ප්‍රදේශවල අන්නාසි වගාකරුවන් ද මෙයට අයත් විය.

අනිකුත් භෝග රක්ෂණය යටතේ, රක්ෂණ මණ්ඩලය විසින් 2001 වර්ෂයේ දුම්කොළ හා තල වගාව සඳහා නව රක්ෂණයක් හඳුන්වා දෙන ලදී. විසිතුරු මල් වගා රක්ෂණය යටතේ වාණිජ මට්ටමේ ඇන්තූරියම් සහ ඕකිඩ් වගාවන්ට ද රක්ෂණය ව්‍යාප්ත විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව කෘෂිරක්ෂණ මණ්ඩලය විසින් අපනයන භෝග සඳහා ද රක්ෂණයක් හඳුන්වා දෙන ලදී. 2001 වර්ෂයේ අග භාගයේ හම්බන්තොට, මොණරාගල, ගම්පහ සහ මහනුවර යන දිස්ත්‍රික්කවල පැවති නියඟය අපනයන භෝගවලට තදින් බලපෑම මේ සඳහා හේතු විය.

වගු අංක 6.5: උක් වගා රක්ෂණය

වර්ෂය	රක්ෂිත අක්කර ගණන	රක්ෂණ වාරික (රුපියල්)	වන්දි මුදල (රුපියල්)	දළ හානි ප්‍රතිශතය
1994	335.8	62,926/=	9,288/=	0.1
1995	2127.0	473,770/=	218,957/=	0.5
1996	937.0	183,481/=	259,551/=	1.4
1997	786.0	250,000/=	141,703/=	0.6
1998	314.7	66,670/=	124,185/=	1.9
1999	380.0	106,698/=	15,644/=	0.1
2000	976.0	385,024/=	353,553/=	0.9
2001	722.0	324,834/=	364,353/=	1.1
2002	703.0	337,844/=	112,903/=	0.3
2003	144.5	65,410/=	0	0

මූලාශ්‍රය: AAIB

ඉහත වගුවට අනුව, 1994 - 2003 දක්වා කාලය තුළ, වැඩි අවුරුදු ගණනක දළ හානි දර්ශකය 1 ට වඩා අඩු වීම මඟින්, ගෙවූ වන්දි මුදලට සාපේක්ෂ ව අය කරන ලද වාර මුදල ඉහළ මට්ටමක පවතින බව පෙනී යයි.

වගු අංක 6.6: පොල් වගා රක්ෂණය

වර්ෂය	රක්ෂිත අක්කර	එකතු වූ වාර මුදල් (රු.)	ගෙවූ වන්දි මුදල (රු.)	දළ හානි දර්ශකය
1994	1,190	529,793/=	56,469/=	0.1
1995	1,550	675,000/=	40,600/=	0.1
1996	5,490	2,358,842/=	36,910/=	0.2
1997	277	155,000/=	12,255/=	0.1
1998	31	15,254/=	221,370/=	14.0
1999	100	19,500/=	51,550/=	2.6
2000	2.33	1,216/=	0	NA
2001	NA	NA	NA	NA
2002	35.5	28,420/=	0	NA
2003	16.0	3,480/=	0	NA

මූලාශ්‍රය: AAIB
NA - දත්ත නොමැත

1994-1997 දක්වා කාලය තුළ දළ හානි දර්ශකය ඉතා ම අඩු මට්ටමක පැවති අතර, 1998 වර්ෂයේ හානි දර්ශකය ඉතා ම ඉහළ අගයක් ගන්නා ලදී. රක්ෂිත අක්කර ගණන ද සැලකිය යුතු මට්ටමකින් පහළ ගොස් ඇත. 1997 වර්ෂයෙන් පසු මේ තත්ත්වය වඩාත් කැපී පෙනෙන ලදී.

මිරිස් වගා රක්ෂණය සම්බන්ධයෙන් සැලකීමේ දී, 1996 න් පසු රක්ෂිත වගා බිම් ප්‍රමාණයේ සැලකිය යුතු මට්ටමේ පහළ යාමක් දක්නට ලැබුණි.

වගු අංක 6.7: මිරිස් වගා රක්ෂණය

වර්ෂය	රක්ෂිත අක්කර ගණන	රක්ෂණ වාර මුදල් (රු.)	වන්දි ගෙවීම (රු.)	දළ හානි දර්ශකය
1994	2,150	1,242,330/=	4,381,452/=	3.5
1995	3,102	1,862,850/=	2,941,421/=	1.6
1996	370	183,680/=	397,360/=	2.2
1997	692.5	404,940/=	NA	NA
1998	NA	NA	NA	NA
1999	696.25	417,750/=	116,200/=	0.3
2000	161.5	114,150/=	NA	NA
2001	184	115,650/=	79,440/=	0.6
2002	70.25	42,150/=	23,487/=	0.5
2003	23.5	22,480/=	NA	NA

මූලාශ්‍රය: AAIB
NA - දත්ත නොමැත

වගු අංක 6.8: ලොකු එැණු වගා රක්ෂණය

වර්ෂය	රක්ෂිත අක්කර	වාර මුදල් (රු.)	වන්දි මුදල් (රු.)	දළ හානි දර්ශකය
1995	961	1,241,450/=	346,566/=	0.3
1996	370	166,600/=	259,551/=	1.5
1997	172	173,175/=	3,825/=	0.02
1998	11	11,700/=	NA	NA
1999	78.33	101,900/=	135,256/=	1.3
2000	17	25,500/=	59,906/=	2.3
2001	81.25	121,875/=	106,290/=	0.8
2002	NA	NA	NA	NA
2003	3.3	4,875/=	13,563/=	2.8

මූලාශ්‍රය: AAIB

NA- දත්ත නොමැත

1997 න් පසු රක්ෂිත ලොකු එැණු වගා බිම් ප්‍රමාණය ද ක්‍රමික ව සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇති අතර දළ හානි දර්ශකය ද ඉහළ මට්ටමක පවතී.

6.1.3 ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

මෙය වගා රක්ෂණ කමය සමඟ සෘජුව ම සම්බන්ධ නො වුව ද ගොවීන් සඳහා වන විශ්‍රාම වැටුප් ක්‍රමයක් බැවින් සමීප සම්බන්ධතාවයක් පවතී. 1987 අංක 12 දරණ පනතින් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ඇති කරන ලදී. හුදු විශ්‍රාම වැටුප් පමණක් ම ලැබෙන ක්‍රමයක් නොවන මෙය සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ද වේ. විශ්‍රාම වැටුපත් සමඟ ගොවියා රක්ෂණය වීමක් ද මේ සමඟ ම සිදු වෙයි. 1997 සිට 1990 වර්ෂය වන විට මෙම රක්ෂණ ක්‍රමයට දායක වූ ගොවීන් සංඛ්‍යාව 50,000 ඉක්ම වූ අතර වාරික වශයෙන් රු.32,324,706/= ක මුදලක් ද අය වී තිබුණි. එමෙන්ම එම කාලය තුළ වාර්තා වූ මරණ 133කට හා අබාධිත තත්ත්වයට පත් වීම් 7ක් සඳහා වන්දි වශයෙන් රු.2,123,000/= ක මුදලක් ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි. මෙම රක්ෂණ ක්‍රමයට දායක වී ඇති ගොවීන් සංඛ්‍යාව වගු අංක 6.9 න් දැක්වේ.

වගු අංක 6.9: ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක වී ඇති ගොවීන් සංඛ්‍යාව

වර්ෂය	ගොවීන් සඛ්‍යාව
1987	13,459
1988	21,810
1989	9,455
1990	38,712
1991	86,094
1992	45,004
1993	17,762
1994	10,973
1995	15,952
1996	45,404
1997	28,915
1998	94,243
1999	80,120
2000	68,334
2001	72,208
2002	30,953
2003	35,524
2004	44,358
2005	32,799
එකතුව	**792,147**

මූලාශ්‍රය: AAIB

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භයේ සිට 2005 වර්ෂය වන තෙක් කාල සීමාව තුළ මෙම රක්ෂණ ව්‍යාපෘතියට දායක වී ඇති මුළු ගොවීන් සංඛ්‍යාව 750,000 ඉක්මවනු ලබයි. 1987 වර්ෂයේ ගොවීන් 13,459 ක් මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී ඇති අතර, 2005 වර්ෂයේ ගොවීන් 32,799 ක් එයට සහභාගි වී ඇත. එය 1987 වර්ෂය සමඟ සැසඳීමේ දී ගොවීන් 19,340 ක ඉහළ යාමකි. ඉහත වගු අංක 6.9 ට අනුව, පසුගිය වර්ෂ 8 ක කාල සීමාව තුළ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වූ ගොවීන්ගේ සංඛ්‍යාවේ සාපේක්ෂ ඉහළ යාමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. 2001 වර්ෂයේ මේ රක්ෂණ ව්‍යාපෘතිය යටතේ "රැකවරණය" නම් විශේෂ රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

සටහන 6.1: ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ක්‍රියාකාරිත්වය



වගු අංක 6.10: ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ඉලක්ක සහ බඳවා ගැනීම්

වර්ෂය	ඉලක්ක ගත ප්‍රමාණය	බඳවා ගත් ප්‍රමාණය	ඉලක්කගත ප්‍රමාණයේ ප්‍රතිශතය
2001	60,000	72,208	120%
2002	50,000	30,953	62%
2003	50,000	35,524	71%
2004	54,000	44,358	82%
2005	58,000	32,799	57%

මූලාශ්‍රය: AAIB

2001 වර්ෂයේ මණ්ඩලයේ ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 60,000ක් වූ අතර ගොවීන් 72,208 ක් ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී තිබුණි. එය ඉලක්කගත සංඛ්‍යාව ඉක්මවා යාමකි. ඉහත වගුවට අනුව ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා ගොවීන්ගේ සහභාගිත්වය ඉහළ මට්ටමක පවතින බව පෙනී යන අතර බොහෝ වර්ෂවල එය ඉලක්කගත ප්‍රමාණයෙන් 50% ඉක්මවා ඇත.

වගු අංක 6.11: 1987 සිට 2005 ජූලි 31 දින දක්වා ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී ඇති ගොවීන් සංඛ්‍යාව (වයස් පරතරයන් අනුව)

වයස් පරතරය (අවුරුදු)	18-29	30-35	36-45	46-50	51-54	55-59	එකතුව
ගොවීන් සංඛ්‍යාව	349,715	148,288	196,536	69,665	50,049	65,219	779,472
ප්‍රතිශතය	32%	19%	25%	9%	7%	8%	100%

මූලාශ්‍රය: AAIB

ඉහත වගුවට අනුව, 1987 සිට 2005 ජූලි 31 දක්වා කාලය තුළ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී ඇති ගොවීන්ගේ වයස් පරතරය සම්බන්ධයෙන් සැලකීමේ දී වැඩි ම ගොවීන් ප්‍රතිශතයක් වූ 32%ක් තරුණ වයසේ සිටින ගොවීන් බව පැහැදිලි ව පෙනෙන කරුණකි. එනම් වයස අවුරුදු 18-29 ත් අතර ගොවීන් ය.

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ, ශුද්ධ වාරික ආදායම හා විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවූ මුදල් පිළිබඳව තොරතුරු පහත සඳහන් වගු අංක 6.12 මඟින් පෙන්වා දිය හැකිය.

වගු අංක 6.12: ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය

වර්ෂය	ශුද්ධ වාරික ආදායම (රුපියල්) (1)	විශ්‍රාම වැටුප් සඳහා ගෙවීම් (රු.) (2)	(1)-(2) අතර වෙනස (රු.)	ශුද්ධ හානි දර්ශකය
1992	44,321,377/=	1,711,500/=	39,609,877/=	0.04
1993	43,955,669/=	4,887,202/=	39,068,467/=	0.10
1994	40,752,423/=	797,189/=	39,955,237/=	0.02
1995	49,789,118/=	13,193,390/=	36,595,728/=	0.30
1996	109,907,878/=	31,371,336/=	78,536,542/=	0.30
1997	80,011,432/=	50,678,085/=	29,333,347/=	0.60
1998	112,964,881/=	62,591,948/=	50,372,933/=	0.50
1999	139,122,070/=	74,198,822/=	64,923,248/=	0.50
2000	198,090,641/=	88,585,200/=	109,505,441/=	0.40
2001	212,264,839/=	116,202,030/=	96,062,809/=	0.50
2002	220,680,792/=	166,742,791/=	53,938,001/=	0.70
2003	152,171,304/=	224,700,646/=	-72,529,342/=	1.50
2004	169,973,147/=	334,710,182/=	-164,737,035/=	2.00
2005	161,843,217/=	416,185,474/=	-254,362,257/=	2.60

මූලාශ්‍රය: AAIB

රජය විසින් ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා "ගොවි විශ්‍රාම වැටුප් අරමුදලක්" පවත්වාගෙන යාමට මණ්ඩලයට අනුමැතිය ලබා දෙන ලදී. මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ග වශයෙන් ගොවීන්ගේ රක්ෂණ වාරික මුදල්, රජයේ ප්‍රදානයන්

සහ අතිරික්ත මුදල් ආයෝජනය කිරීමෙන් උපයා ගන්නා පොළී යන ඒවා සැලකිය හැකිය. මෙම අරමුදලේ ප්‍රධාන වියදම් වශයෙන් ගොවීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් සහ පොළී ආදායමෙන් 2% ක් පමණ වන පරිපාලන වියදම් සැලකිය හැක. කෙසේ නමුත් මෙම රක්ෂණ ක්‍රමය ආරම්භයේ සිට මුල් අවුරුදු 5 ඇතුළත විශ්‍රාම වැටුප් අරමුදල ශක්තිමත්ව ගොඩ නැංවීම එහි අරමුණ විය.

ඉහත වගු අංක 6:12 ට අනුව, මුල් කාලීනව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ශුද්ධ හානි දර්ශකය ඉතාමත් අවම මට්ටමක පැවතුණි. නමුත් 1996න් පසු එය ක්‍රමික ව වැඩි වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලද අතර 2003-2005 වර්ෂ තුළ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ප්‍රමාණය, අය වූ වාරික මුදල් ප්‍රමාණය ඉක්මවා තිබුණි. 1996-2005 දක්වා කාලය තුළ වාරික මුදල් ආදායම 292%කින් වර්ධනය වීමක් පෙන්නුම් කළ අතර මෙම රක්ෂණ ව්‍යාපෘතිය සඳහා ගොවීන්ගේ සහභාගිත්වය ඉහළ යාම ඒ සඳහා හේතු විය. කෙසේ වුවත් එම කාලය තුළ එනම් 1996 වර්ෂය හා 2005 වර්ෂය අතර කාලසීමාව තුළ ගෙවූ විශ්‍රාම වැටුප ද 24,000% කින් පමණ කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් තිබුණි. මේ සඳහා හේතු සාධක කිහිපයක් බලපාන ලදී.

සමස්තයක් වශයෙන් ගත් කළ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා තරුණ ගොවීන්ගේ සහභාගිත්වය ඉහළ මට්ටමක පැවතිය ද, 2002 වර්ෂයේ සිට අවුරුදු 55-59 අතර වයස් කාණ්ඩයේ ගොවියන්ගේ සහභාගිත්වය ඉහළ මට්ටමක පැවතුණි. මෙය ආරම්භක වර්ෂ කිහිපය තුළ 20%ක් වශයෙන් පැවති අතර 2002 වර්ෂය වන විට 40%ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් ගෙවිය යුතු මට්ටමේ ගොවීන්ගේ ඉහළ යාම හේතුවෙන් වැඩි වියදමක් දැරිය යුතු විය. නමුත් මේ සඳහා බලපාන ලද ප්‍රධාන හේතුව වශයෙන් සැකිය හැකි වන්නේ, 1992 සිට 2005 වර්ෂය දක්වා ගෙවිය යුතු අවම විශ්‍රාම මුදල කිහිප වරක් ම ඉහළ දැමුව ද, එම ක්‍රමය ආරම්භයේ සිට ම, වාරික මුදලේ කිසිදු වෙනස් වීමක් සිදු නොවුණි. මේ තත්ත්වය හේතුවෙන්, අයකරන වාරික මුදල නොවෙනස් ව පැවතියත් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් මුදල ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී.

6.1.4 "සුවසෙත" සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත අනුව රක්ෂණ මණ්ඩලය විසින් ආරම්භ කරන ලද මෙම රක්ෂණ ක්‍රමය 2000 වර්ෂයේ මැයි මාසයේ සිට ක්‍රියාත්මක වීම ආරම්භ විය. කෘෂිකාර්මිකයන් සඳහා ආරෝග්‍යශාලා ගාස්තු, සැත්කම් ගාස්තු, විශේෂඥ වෛද්‍ය උපදෙස්, එක්ස් කිරණ, ඊසීජී කිරණ, විද්‍යුත් රේඩියම් පරීක්ෂණ ගාස්තු ආදිය සඳහා මූල්‍යමය ප්‍රතිලාභ සැලසීම අරමුණු කොට ගෙන මෙම සුවසෙත රක්ෂණ යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. මෙහි දී කෘෂිකාර්මිකයෙකුගෙන් අවුරුද්දක දායකත්වය සඳහා රු.300/=ක් වාරික වශයෙන් අය කරන අතර ඉහත දක්වන ආපදා වෙනුවෙන් රු.25,000/= දක්වා වන්දි මුදලක් ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත. 2001 වර්ෂයේ සිට 2006 අප්‍රේල් මාසය දක්වා මෙම රක්ෂණ යෝජනා ක්‍රමයට දායක වී ඇති ගොවීන් සංඛ්‍යාව වගු අංක 6.13 මගින් පෙන්වා දී ඇත.

වගු අංක 6.13: සුවසෙත සෞඛ්‍ය රක්ෂණය සඳහා දායකත්වය

වර්ෂය	ගොවීන් සංඛ්‍යාව
2001	3,649
2002	549
2003	905
2004	1,453
2005	2,090
2006 අප්‍රේල් දක්වා	4,100

මූලාශ්‍රය: AAIB

6.2 කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය සහ රාජ්‍ය මැදිහත් වීම

සංවර්ධනය වෙමින් පවතින බොහොමයක් රටවල ආර්ථිකයේ කෘෂිකර්මාන්තය සුවිශේෂී වූ කාර්ය කොටසක් සිදු කරන බැවින්, එම ක්ෂේත්‍රයේ පවතින අවදානම් කළමනාකරණ කටයුතු සඳහා රාජ්‍ය අංශය විසින් මැදිහත් වීම බොහෝ විට සිදු වනු ලබයි.

වගා රක්ෂණය සඳහා රාජ්‍ය මැදිහත් වීම,

i. රජයක් විසින් සෘජුව ම හෝ වක්‍ර වශයෙන් කෘෂි රක්ෂණයේ පරිපාලන වගකීම දැරීම සහ පරිපාලන වියදම සම්පූර්ණ වශයෙන් හෝ පරිපාලන වියදමේ ප්‍රධාන කොටසක් දැරීම.

ii. පවතින නිෂ්පාදන අවදානමෙන් කොටසක් රජය විසින් දැරීම හෝ ගොවීන් විසින් ගෙවිය යුතු වාරික මුදලින් කොටසක් දැරීම.

iii. රජය විසින් ප්‍රාග්ධන අරමුදල් සම්පාදනය කර දීම මගින් රක්ෂණ ක්‍රමයක අතිරික්ත අවදානම් කපා හැරීම, ප්‍රතිරක්ෂණය කිරීම හෝ ණය සපයා දීම (මෙය ජපානයේ සහ කැනඩාවේ ක්‍රියාත්මක වේ) හෝ රජයේ සාමාන්‍ය අයවැය අරමුදලෙන් විශේෂ ප්‍රදානයන් ලබා දීම.

යන ඉහත සඳහන් ක්‍රම තුනෙන් එකකට අනුව සිදු කළ හැකිය (Mishra, 1996).

රජයක් විසින් එසේ දරණ පිරිවැය හා අවදානම් දරා ගැනීම් මූලික වශයෙන් කරුණු 2ක් මත සාධාරණීකරණය කිරීම සිදු කළ හැකිය.

i. ස්වභාවික උපද්‍රවයකින් සිදු වන පාඩු සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රය විශේෂයෙන් ම භෝග නිෂ්පාදනය පහසුවෙන් ගොදුරු වීමේ හැකියාව වැඩි අතර එය ගොවීන්ට පාලනය කළ නොහැකි හෝ පහසුවෙන් පාලනය කළ නොහැකි වීම.

ii. ආහාර නිෂ්පාදනය හා වෙනත් අත්‍යවශ්‍ය කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය මත මුළු ආර්ථික ක්‍රමය ම රැඳී ඇති විට කෘෂි නිෂ්පාදන අංශය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ගොවි ප්‍රජාවක් ඇති කිරීම සඳහා රාජ්‍ය මැදිහත් වීම අවශ්‍ය වේ (Ray, 1987).

කෙසේ නමුත් ලෝකයේ ක්‍රියාත්මක කෘෂි රක්ෂණ ව්‍යාපාතීන් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, ඒවා ක්‍රියාත්මක කරන ආයතන බෝහොමයක් රාජ්‍ය අයිතිය යටතේ පවතින ඒවා හෝ රාජ්‍ය ක්‍රියාකාරිත්වය අනුව ක්‍රියාත්මක වන ඒවා හෝ වේ. ජපානයේ, ආචාර්ය රොහෙල් කදා විසින් පෙන්වා

දෙන පරිදි ජපානයේ වී වගා රක්ෂණ ව්‍යාපෘතිය සාර්ථක වීම සඳහා බලපාන ලද කරුණු කිහිපයක් පවතී.

i. මනා තුලිත වූ රාජ්‍ය නායකත්වය හා ගොවීන්ගේ ස්වේච්ඡා සහභාගිත්වය.
ii. මනාව සංවිධානය කරන ලද සමාජ යටිතල පහසුකම්.
iii. ජාතික රජය විසින් අඛණ්ඩ ව සපයනු ලබන මූල්‍යමය සහයෝගය.

ඉහත හා පහත සඳහන් කරුණු සලකා බැලීමේ දී, සංවර්ධන වෙමින් පවතින රටවල කෘෂි රක්ෂණ ව්‍යාපෘතීන් සඳහා රාජ්‍ය අංශයේ මැදිහත් වීම ඉතා වැදගත් බව පෙනී යයි. පහත සඳහන් කරුණු දැනට ඒ සඳහා රජයකට පවතින වැඩි හැකියාව හා සාධාරණත්වය පෙන්නුම් කරනු ලබයි.

i. පවතින තොරතුරු ජාලය ඇසුරෙන් ගොවීන් හා ඔවුන්ගේ අවදානම් සම්බන්ධයෙන් තොරතුරු රැස් කර ගැනීමේ වඩා සාර්ථක ප්‍රවේශයක් රජයකට පවතී. එමෙන්ම පෞද්ගලික අංශය විසින් අනෙකුත් අංශයන්ට සාපේක්ෂ ව වැඩි අවදානමකින් යුක්ත කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම සඳහා ද වැඩි නැඹුරුතාවයක් නොදක්වයි.

ii. එමෙන්ම රජයක්, කාර්මික හා අනිකුත් කෘෂිකාර්මික නොවන අංශ සඳහා විශාල වශයෙන් මූල්‍යාධාර වෙන් කිරීමට සූදානම් නම්, බොහොමයක් රටවල ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා ද එම සහයෝගය ම ලබා දිය යුතු ව පවතී. රාජ්‍ය මැදිහත් වීම හා අනුග්‍රහය පවතී නම් ගොවීන්ද කෘෂි නිෂ්පාදන හා ආදායම ඉහළ නැංවීම සඳහා අභිප්‍රේරණය වේ (Agricultural Insurance in Asia, Seminar Report, 1990, Japan).

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණය ලාභ උපයන ව්‍යාපාරයක් වශයෙන් සැලකිය නොහැක. රාජ්‍ය ආධාර මත ක්‍රියාත්මක වීම තුළින් එය සේවාවක් සපයන ව්‍යාපාරයක් වශයෙන් ස්වභාවයෙන් ම පවතී. කෙසේ නමුත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට, රාජ්‍ය අනුග්‍රහය යටතේ, ගොවීන්ට සපයනු ලබන සුභසාධන සේවාවක් වශයෙන් මෙම කෘෂිකාර්මික රක්ෂණය ලබා දීමේ හැකියාව පවතී. කෙසේ නමුත් 1998 සිට, රජය විසින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට ලබා දෙන ආධාර අත්හිටුවන බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව රක්ෂණ මණ්ඩලයට, ස්වයං මූල්‍ය පදනමකින් යුක්තව ක්‍රියාත්මක වීම සඳහා සංවිධානය විය යුතු විය. එමෙන්ම විවෘත නව ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ රක්ෂණ මණ්ඩලයට පෞද්ගලික අංශය සමග තරඟ කිරීමේ අභියෝගයට ද මුහුණ දීමට සිදු විය. කෙසේ නමුත් කෘෂි රක්ෂණ මණ්ඩලයේ සෑම වර්ෂයක ම පාහේ, ආදායමට සාපේක්ෂ ව වියදම ඉහළ මට්ටමක පවතී. ඒ අනුව මණ්ඩලයට රාජ්‍ය ප්‍රදාන මත යැපීමට සිදු වී ඇති අතර රක්ෂණ මණ්ඩලයේ සම්පූර්ණ පරිපාලන වියදම රජය මඟින් කරනු ලබයි. 1995-2002 වර්ෂ තුළ ශ්‍රී ලංකා රජය විසින් පරිපාලන වියදම් වශයෙන් රක්ෂණ මණ්ඩලයට ලබා දෙන මුදල් ප්‍රමාණය පහත සඳහන් 6.14 වගුව මඟින් පෙන්වා දිය හැකිය.

වගු අංක 6.14: පරිපාලන වියදම් සඳහා රජයේ ආධාර ප්‍රමාණයන්

වර්ෂය	ආධාර ප්‍රමාණය (රුපියල්)
1995	11,165,533/=
1996	8,600,000/=
1997	10,000,000/=
1998	14,600,000/=
1999	17,500,000/=
2000	33,050,900/=
2001	36,197,500/=
2002	32,200,000/=

මූලාශ්‍රය: AAIB

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රාග්ධනය සඳහා රජයේ මුදල් වැය කිරීම් පහත වගුව මඟින් දක්වා ඇත.

වගු අංක 6.15 : ප්‍රාග්ධනය සඳහා රජයේ ආධාර

වර්ෂය	රජයේ ආධාර (රු.මිලියන)
1991	24
1992	30
1993	38
1994	39
1995	39
1996	41
1997	44
1998	46
1999	51
2000	54
2001	58
2002	60

මූලාශ්‍රය: AAIB

රක්ෂණ මණ්ඩලය ආරම්භයේ සිට ම, වාර්ෂික ව රජයේ ආධාර ලබා ගත් අතර ඒ තුළින් සිය ක්‍රියාකාරකම් කළමනාකරණය කර ගන්නා ලද්දේ, ගොවි ප්‍රජාව වෙත සුභසාධන සේවාවක් සැපයීමක් වශයෙනි. 1999 අංක 20 දරණ පනත මඟින් මණ්ඩලය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත ව ක්‍රියාත්මක වන ආයතනයක් වශයෙන් සලකන ලදී.

රාජ්‍ය උපදේශක මණ්ඩලයේ නිර්දේශවලට අනුව, රජය විසින් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට රුපියල් මිලියන 750 ක් අවුරුදු 10ක් ඇතුළත වර්ෂයකට රුපියල් මිලියන 75 මගින් ලබා දිය යුතු විය. නමුත් එම රාජ්‍ය දායකත්වය අරමුදලට ලැබුණේ අවුරුදු 4ක් පමණ වන අතර එය පහත පරිදි වේ.

වගු අංක 6.16: ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට රජයේ දායකත්වය

වර්ෂය	රජයේ දායකත්වය (රුපියල්)
1987	66,750,000/=
1988	75,000,000/=
1989	25,000,000/=
1990	6,500,000/=

මූලාශ්‍රය: AAIB

ඉහත වගුවට අනුව පෙනී යන්නේ රජය විසින් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු මුදලින් රුපියල් මිලියන 173ක් පමණක් එනම් මුළු මුදලින් 23%ක් පමණක් ගෙවා ඇති බවය. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2000 වර්ෂයේ වාර්ෂික වාර්තාවට අනුව, 1992-2000 කාලය තුළ ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ඉතා අවදානම් තත්ත්වයක පවතින බව පෙනී යයි. ලැබිය යුතු රාජ්‍ය මුදල් නොලැබී යාම මේ සඳහා එක් හේතුවක් වන අතර දැනට පවතින අරමුදලින් ගෙවිය හැකි වන්නේ යෝජිත විශ්‍රාම වැටුප් ප්‍රමාණයෙන් 18.5% ක් පමණි.

හත්වන පරිච්ඡේදය

වී වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ දායකත්වය

7.1 හැඳින්වීම

කෘෂිකාර්මික රක්ෂණය ප්‍රධාන වශයෙන් රැඳී හා බැඳී පවතින්නේ ඒ සඳහා පවතින ගොවීන්ගේ සහභාගීත්වය මතයි. ශ්‍රී ලංකාවේ වගා රක්ෂණ ක්‍රමයේ මූලික අරමුණ වන්නේ කෘෂිකර්මාන්තයේ නියැළී සිටින ගොවීන්ගේ අවදානම අවම කිරීම සඳහා යම් වගා හානියක දී සුදුසු පරිදි වන්දි ගෙවීම තුළින් ඔවුන්ගේ ආදායම් ස්ථායීතාවය ඇති කිරීමයි.

කෙසේ නමුත් කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමයක සාර්ථකත්වය රඳා පවතින්නේ විශාල ගොවීන් සංඛ්‍යාවක් අතර එය සාර්ථකව පුළුල් ව ව්‍යාප්ත වී ඇති ආකාරය අනුවය. නමුත් වගා රක්ෂණ ක්‍රමය කෙරෙහි ගොවීන්ගේ අඩු දායකත්වය කැපී පෙනෙන ලක්ෂණයක් ව පවතී. වගා රක්ෂණය කෙරෙහි ගොවීන්ගේ අඩු දායක්තවය හා ඒ කෙරෙහි ඔවුන්ගේ අඩු අභිප්‍රේරණ තත්වයට හේතු වන පරිදි ගොවීන් කාණ්ඩ 03 ක් ඇති බව Steven Holmstrom පෙන්වා දෙන ලදී (Holmstrom, *et al*, 1981). එනම්;

i. අඩු අවදානම් ප්‍රදේශවල ජීවත් වන, තමාගේ ම ප්‍රාග්ධනයන් සහිත වගා හානියකට මුහුණ දීමට තරම් ආර්ථික ශක්තියක් සහිත ගොවීන් වගා රක්ෂණය කෙරෙහි යොමු නොවෙයි.
ii. වෙනත් ජීවනෝපාය මාර්ගයක් සහිත, අර්ධ කාලීන වශයෙන් ගොවිතැනෙහි නියුක්ත වී සිටින ගොවීන් ද වගා රක්ෂණය කෙරෙහි උනන්දු නොවෙයි.
iii. කුඩා ඉඩම්වල යැපුම් මට්ටමේ කෘෂිකාර්මික කටයුතුවල නියැළි, රක්ෂණ වාරිකය හෝ ගෙවාගත නොහැකි මට්ටමේ ගොවීන් ද මේ සඳහා උනන්දු නොවෙයි.

කෙසේ නමුත් වගා රක්ෂණයක් ගොවීන් සමඟ ම දැඩි ලෙස සම්බන්ධ ව ඇති බැවින් ඒ සඳහා ගොවීන්ගේ දායකත්වය අත්‍යවශ්‍ය අංගයක් ව පවතී. වගා රක්ෂණයක් සඳහා ගොවීන්ගේ සහභාගීත්වය ඉතා සාර්ථක ව ලබාගැනීම සඳහා, ඒ සඳහා පවතින ගැටලු, බාධක සහ ගොවීන්ගේ අදහස් හා යෝජනා ආදිය හඳුනා ගැනීම ඉතා වැදගත්ය. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා අධ්‍යයනය තුළින් තෝරාගත් ප්‍රධාන වී වගා දිස්ත්‍රික්ක 4 ක් තුළ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ යන දෙඅංශයේ ම රක්ෂණ ආවරණය ලබාගත් ගොවීන්ගේ නියැදියක් තුළින් තොරතුරු සම්පාදනය කර ගන්නා ලදී.

7.2 අධ්‍යයන ප්‍රදේශ තුළ තෝරා ගත් ගොවීන්ගේ නියැදියේ සමාජ ආර්ථික පසුබිම

7.2.1 අධ්‍යාපන මට්ටම සහ වයස් කාණ්ඩය

අනුරාධපුර, පොළොන්නරුව, හම්බන්තොට සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක හතර තුළ තෝරාගත් මුළු ගොවීන්ගේ නියැදිය 295ක් වන අතර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ වී වගා රක්ෂිත ගොවීන් 202කින්ද සෙලින්කෝ රක්ෂණ සමාගම යටතේ වී වගා රක්ෂිත ගොවීන් 93කින්ද මුළු නියැදිය සමන්විත වෙයි. පහත සඳහන් වගු අංක 7.1 මගින් ඉලක්ක ජනගහනයේ හා නියැදි ප්‍රමාණයේ ව්‍යාප්තිය දිස්ත්‍රික්ක අනුව පෙන්වා දිය හැකිය.

ගො.ප.පු ආ
ARTI

වගු අංක 7.1: දිස්ත්‍රික්ක අනුව ගොවීන්ගේ නියැදියේ ව්‍යාප්තිය

දිස්ත්‍රික්කය	AAIB		සෙලින්කෝ් රක්ෂණ සමාගම	
	ඉලක්ක ජනගහනය	නියැදි ප්‍රමාණය	ඉලක්ක ජනගහනය	නියැදි ප්‍රමාණය
කුරුණෑගල	278	56	56	11
අනුරාධපුර	117	23	45	9
පොළොන්නරුව	325	65	164	33
හම්බන්තොට	291	58	200	40
එකතුව	**1011**	**202**	**202**	**93**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

මුළු නියැදි ප්‍රමාණයෙන් 78% ක් පුරුෂයන් වූ අතර, ඉතිරි ප්‍රමාණය ස්ත්‍රීන් විය. වගු අංක 7.2 මහින් මුළු නියැදියේ ව්‍යාප්තිය වයස් කාණ්ඩය අනුව පෙන්වා දී ඇත.

වගු අංක 7.2: වයස් කාණ්ඩ අනුව නියැදියේ ව්‍යාප්තිය

වයස් කාණ්ඩය	ප්‍රතිශතය
20<30	5
30<40	17
40<50	27
50<60	29
අවුරුදු 60 වැඩි	22

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත වගු සටහනට අනුව ගොවීන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් එනම් 29%ක් අවුරුදු 50-60 ත් අතර වන අතර 27% ක් වයස අවුරුදු 40-50ත් අතර වෙයි. මේ මහින් තහවුරු වන්නේ වී වගා රක්ෂණයට දායක වී ඇති ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් අවුරුදු 40 ඉක්මවා ඇති අය බවයි. වගා රක්ෂණයට දායක වී ඇති තරුණ ගොවීන් සංඛ්‍යාව අඩු මට්ටමක පවතී. අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගේ නියැදියේ අධ්‍යාපන මට්ටම අනුව පහත පරිදි වගු අංක 7.3 මහින් පෙන්වා දිය හැක.

වගු අංක 7.3: අධ්‍යාපන මට්ටම

අධ්‍යාපන මට්ටම	ප්‍රතිශතය
පාසල් නොගිය	03
මූලික අධ්‍යාපනය ලද (1-5)	24
ද්විතීයික අධ්‍යාපනය ලද (6-10)	31
අ.පො.ස. සාමාන්‍ය පෙළ (O/L)	28
අ.පො.ස. උසස් පෙළ (A/L)	12
තාක්ෂණික/ඩිප්ලෝමා	01
උපාධිධාරී	01
එකතුව	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත දත්ත අනුව අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් බහුතරයක් ද්විතීයික අධ්‍යාපනය එනම් 6 ශ්‍රේණියේ සිට 10 වැනි ශ්‍රේණිය දක්වා අධ්‍යාපන ලබා ඇති අය වන අතර, 28%ක ප්‍රමාණයක් අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් අය වෙති. මේ තත්ත්වය අනුව, ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් හොඳ අධ්‍යාපන තත්වයකින් පසුවන බව පෙනී යන අතර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් සාර්ථක දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නම්, එය මනාව අවබෝධ කර ගැනීමට තරම් සාර්ථක මට්ටමක මෙම ගොවීන් සිටින බව පැහැදිලිය. ඒ අනුව වගා රක්ෂණය කෙරෙහි ස්වේච්ඡාවෙන් නැඹුරු වීමේ ප්‍රවණතාව ඉහළ නංවා ගත හැකිය.

7.2.2 මූලික රැකියාව සහ මාසික ගෘහ ආදායම

මූලික රැකියාව අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය ප්‍රතිශතයක් වශයෙන් පහත පරිදි වගු අංක 7.4 මඟින් පෙන්වා දිය හැකිය.

වගු අංක 7.4: මූලික රැකියාව

මූලික රැකියාව	ප්‍රතිශතය (%)
ගොවිතැන	87
වෙළඳාම	01
ස්වයං රැකියා	01
රජයේ රැකියා	08
විශ්‍රාමික	02
සත්ව පාලනය	01
එකතුව	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

අපේක්ෂා කළ පරිදි ම, රක්ෂිත ගොවීන්ගෙන් 87%ක් වූ බහුතරය, සිය ප්‍රධාන ජීවනෝපාය වශයෙන් තෝරා ගෙන ඇත්තේ ගොවිතැනයි. තවදුරටත් මාසික ආදායම් මට්ටම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී කුරුණෑගල, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල, අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයකගේ මාසික ආදායම රු.10,000/= - රු.20,000/= ත් අතර පවතින බවත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයකගේ ආදායම රු. 1,000/= - රු.10,000/= ත් අතර පවතින බවත් පැහැදිලි විය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ මාසික ආදායම සැලකීමේ දී, වැඩි ප්‍රමාණයකගේ ආදායම රු. 20,000/= ට වඩා ඉහළ බවත් පෙනී ගිය කරුණකි.

වගු අංක 7.5 : මාසික ගෘහ ඒකක ආදායම

දිස්ත්‍රික්කය	< රු.1000/=	රු.1,000/= ≥ රු.10,000/=	රු.10,000/= ≥ රු.20,000/=	රු.20,000/= ≥	එකතුව
කුරුණෑගල	8%	38%	39%	15%	100
අනුරාධපුර	4%	40%	39%	17%	100
පොළොන්නරුව	-	22%	53%	25%	100
හම්බන්තොට	-	13%	42%	45%	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.3 ඉඩම් අයිතියේ ස්වභාවය සහ වාරි ක්‍රමය

7.3.1 ඉඩම් අයිතියේ ස්වභාවය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගේ 70% කට අධික ප්‍රමාණයක්, තම තනි අයිතිය යටතේ ඇති ඉඩම් රක්ෂණ ආවරණයට යටත් කොට ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ නියැදියෙන් 61% ක් තනි අයිතිය යටතේ ඇති ඉඩම් රක්ෂණය කර ඇති අතර 30%ක ප්‍රමාණයක් අඳ අයිතිය යටතේ ඇති ඉඩම් රක්ෂණය කර ඇත. අනිකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂ ව හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ අඳ අයිතිය යටතේ වගා කරන බිම් ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී. කෙසේ නමුත් සමස්තයක් වශයෙන් ගත් කල, අධ්‍යයනයට ලක් කළ දිස්ත්‍රික්කවල ගොවීන්ගේ නියැදියෙන් බහුතරයක් පිරිස, වගා රක්ෂණය කර ඇත්තේ තම තනි අයිතිය යටතේ ඇති වගාබිම්ය. පහත සඳහන් වගුව මගින් ඒ තත්වය පැහැදිලි ව පෙන්වා දිය හැකිය.

වගු අංක 7.6: ඉඩම් අයිතියේ ස්වභාවය අනුව නියැදියේ ව්‍යාප්තිය

දිස්ත්‍රික්කය	ඉඩම් අයිතියේ ස්වභාවය අනුව %					එකතුව
	තනි අයිතිය	හවුල් අයිතිය	අඳ අයිතිය	බදු අයිතිය	උකස් අයිතිය	
කුරුණෑගල	70%	11%	18%	-	1%	100
අනුරාධපුර	75%	7%	8%	8%	2%	100
පොළොන්නරුව	83%	-	13%	4%	-	100
හම්බන්තොට	61%	3%	30%	5%	1%	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.3.2 වාරි ක්‍රමය අනුව නියැදියේ ව්‍යාප්තිය

අධ්‍යයන ප්‍රදේශ තෝරා ගැනීමේ දී ප්‍රධාන වී වගා කරන දිස්ත්‍රික්ක තෝරාගත් බැවින්, අධ්‍යයනයට ලක් වූ ග්‍රාමීය ප්‍රදේශ බහුතරයකට මහාවාරි මාර්ග පහසුකම් පැවතුණි. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් 46% ක් වර්ෂා ජලයෙන් ගොවිතැන් කරන අය වූ අතර 4% ක් සුළු වාරි පහසුකම් යටතේ ද 50%ක් මහාවාරි පහසුකම් යටතේ ද වගා කරන පුද්ගලයන් විය. සුළු වාරි යටතේ වගාව සිදු කරන ගොවීන් 36% ක ප්‍රමාණයක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ අතර පොළොන්නරුව, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල අධ්‍යයනයට ලක් කළ සියලුම ගොවීන් මහාවාරි

යටතේ ගොවිතැන් කරන වගාබිම් මෙම රක්ෂණ ක්‍රමයෙන් දැඩි ව අභිප්‍රේරණය කර නොමැති බව ඉන් පෙනී යන අතර වගු අංක 7.7 මගින් ඉහත තත්වය පෙන්නුම් කරනු ලබයි.

වගු අංක 7.7 : වාර් ක්‍රමය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

දිස්ත්‍රික්කය	වාරි ක්‍රමය අනුව ව්‍යාප්තියේ ප්‍රතිශතය (%)			එකතුව
	මහා වාරි	සුළු වාරි	වර්ෂා පෝෂිත	
කුරුණෑගල	50	04	46	100
අනුරාධපුර	64	36	-	100
පොළොන්නරුව	100	-	-	100
හම්බන්තොට	100	-	-	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.3.3 වගා කල බිම් ප්‍රමාණය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

වගු අංක 7.8: වගාකල බිම් ප්‍රමාණය අනුව ව්‍යාප්තිය

දිස්ත්‍රික්කය	වගා කළ බිම් ප්‍රමාණය (අක්කර) අනුව ව්‍යාප්තියේ ප්‍රතිශතය (%)				එකතුව
	< 1	$1 \geq 3$	$3 \geq 5$	$5 \geq$	
කුරුණෑගල	22	64	11	03	100
අනුරාධපුර	03	43	39	15	100
පොළොන්නරුව	-	69	18	13	100
හම්බන්තොට	01	34	52	13	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත දත්තවලට අනුව කුරුණෑගල හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් 60%කට වැඩි ප්‍රමාණයක්, අක්කර 1-3 ත් අතර වී වගා කරන ගොවීන් වේ. නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩි ගොවීන් පිරිසක් එනම් 52%ක් වී වගාව අක්කර 3-5ත් අතර වගා කරන ගොවීන් වශයෙන් හඳුනාගත හැකි විය. සමස්තයක් වශයෙන් ගත් කල අධ්‍යයනයට ලක් කල රක්ෂණ ආවරණ ලබා ගත් ගොවීන්ගේ 75% කට වැඩි ප්‍රමාණයක් වී වගා කරනු ලබන්නේ අක්කර 1-5 ත් අතරය. එනම් වී වගා රක්ෂණයට දායක වී ඇති වැඩි ගොවීන් පිරිසක් සුළු පරිමාණ වශයෙන් වී වගා කරන ගොවීන් වශයෙන් හඳුනාගත හැකි විය.

7.4 වගාව සඳහා ණය ලබාගැනීම

7.4.1 ණය ලබා ගැනීමේ මූලාශ්‍ර

වගා රක්ෂණ යෝජනා ක්‍රමය වගාව සඳහා අවශ්‍ය වගා ණය ලබා ගැනීමේ හැකියාව මත සෘජුව ම සම්බන්ධ ව පවතී. ගොවීන් විසින් ලබාගන්නා වගා ණය ප්‍රමාණය, රක්ෂණ ආවරණ මට්ටම අනුව ප්‍රධාන වශයෙන් තීරණය කරනු ලබයි. වගු අංක 7.9 මගින් ගොවීන් තම වගාවන් සඳහා ණය ගැනීම පිළිබඳ දක්වන අදහස් පෙන්නුම් කරනු ලබයි.

වගු අංක 7.9: වගා ණය ලබා ගැනීම සම්බන්ධව ගොවීන් දක්වන ලද ප්‍රතිචාර

දිස්ත්‍රික්කය	වගා ණය ලබා ගැනීම සම්බන්ධයෙන් ගොවීන්ගේ ප්‍රතිචාරවල ප්‍රතිශතය (%)		එකතුව
	වගා ණය ලබාගනී	ලබා නොගනී	
කුරුණෑගල	96	4	100
අනුරාධපුර	92	8	100
පොළොන්නරුව	97	3	100
හම්බන්තොට	97	3	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

අධ්‍යයනයට ලක් කළ දිස්ත්‍රික්ක හතර තුළම රක්ෂිත ගොවීන්ගෙන් බහුතර ප්‍රතිශතයක් එනම් 92%-97% අතර ප්‍රමාණයක් තමාගේ වගාව සඳහා ණය දෙන ආයතනවලින් වගා ණය ලබා ගන්නා බව ඉහත දත්තවලට අනුව පෙනී යයි. මේ තත්වය පෞද්ගලික අංශයේ සෙලින්කෝ රක්ෂණ සමාගම යටතේ ගොවීන් සම්බන්ධයෙන් ගත් විට 100% වන අතර ඒ සඳහා හේතු වන්නේ පෞද්ගලික අංශය යටතේ වගා රක්ෂණය සම්බන්ධයෙන් ස්වේච්ඡා සහභාගීත්වයක් දක්නට නොලැබීමයි.

කෘෂි යෙදවුම් සඳහා දැරීමට සිදුවන අධික පිරිවැය ගොවීන් මෙසේ වගා ණය වෙත යොමු වීමේ මූලික පදනම වෙයි. බොහොමයක් ණය දෙන ආයතන විසින් වගා රක්ෂණ ක්‍රමයක නිසි ආවරණය ලබා නොගෙන ඇත්නම්, එවන් ගොවීන් සඳහා ණය ලබාදීමට නො පෙළඹේ. ඒ අනුව බලන විට මෙය වගා ණය රක්ෂණ ක්‍රමයක් වශයෙන් ද හැඳින්විය හැක. මෙම ක්‍රමය ගොවීන්ට මෙන් ම ණය දෙන මූල්‍ය ආයතනවලට ද සහනයක් සපයා දෙනු ලබයි. ගොවීන්ට සිය වගාවන් හෝ නිෂ්පාදනවලට හානි සිදු වීමේ දී ඒ සඳහා ආරක්ෂාවක් රක්ෂණය මගින් ලැබෙන අතර, ගොවීන්ට ණය ලබා දෙන බැංකු සඳහා ද එය ආරක්ෂාවක් සපයනු ලබයි. එනම් යම් වගා හානියකට මුහුණ දුන් ගොවියෙකුට තම ණය මුදල ගෙවා ගත නොහැකි වන අතර රක්ෂණ ක්‍රමයක නිසි ආවරණය ලැබී ඇත්නම් එසේ ලැබෙන වන්දි මුදල තුළින් තම ණය ආපසු අය කරගැනීමේ හැකියාව බැංකුවට ලැබේ. ඒ තුළින් ඔවුන්ගේ ණය ලබා දීම තුළින් ඇති වන අවදානම ද යම් තාක් දුරකට අවම කර ගැනීමේ හැකියාව පවතී.

වගු අංක 7.10: ණය ලබා ගන්නා මූලාශ්‍ර

දිස්ත්‍රික්කය	ණය ලබා ගන්නා මූලාශ්‍ර අනුව ගොවීන්ගේ ව්‍යාපත්තියේ ප්‍රතිශතය (%)			එකතුව
	රාජ්‍ය බැංකු	පුද්ගලික බැංකු	වෙනත්	
කුරුණෑගල	96	-	4	100
අනුරාධපුර	66	32	2	100
පොළොන්නරුව	99	1	-	100
හම්බන්තොට	81	19	-	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත සටහනට අනුව පෙනී යන්නේ දිස්ත්‍රික්ක හතර තුළ ම ගොවීන්ගේ නියැදියෙන් බහුතරයක් සිය වගා කටයුතු සඳහා අවශ්‍ය ණය මුදල් රාජ්‍ය බැංකු මගින් ලබා ගන්නා බවයි. මේ අනුව පැහැදිලි වන්නේ ගොවීන්ගෙන් බහුතරයක් රාජ්‍ය බැංකු සමඟ ගනුදෙනු කරන බැවින්, රාජ්‍ය බැංකු මගින් වගා

ණය නිකුත් කිරීමේ දී වගා රක්ෂණය ලබා ගැනීම අනිවාර්ය කිරීම තුළින්, වගා රක්ෂණය හා වගා ණය සම්බන්ධ කළහොත් වැඩි ප්‍රමාණයක් ගොවීන් වගා රක්ෂණය සඳහා දායක කර ගත හැකි බවයි.

7.4.2 ණය ප්‍රමාණය

අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගේ නියැදිය විසින් ණය දෙන ආයතනවලින් ලබා ගන්නා ලද ණය ප්‍රමාණය පහත සඳහන් වගු අංක 7.11 මගින් පැහැදිලි වේ.

වගු අංක 7.11: ණය ප්‍රමාණය

දිස්ත්‍රික්කය	ලබාගන්නා ලද ණය ප්‍රමාණය අනුව ගොවීන්ගේ ව්‍යාප්තියේ ප්‍රතිශතය %					
	< රු.10,000/=	රු.10,000/= ≥ රු. 20,000/=	රු.20,000/= ≥ රු.30,000/=	රු.30,000/= ≥ රු.40,000/=	රු.40,000/= ≥ රු.50,000/=	රු.50,000/ = ≥
කුරුණෑගල	41%	26%	21%	6%	3%	3%
අනුරාධපුර	26%	36%	26%	4%	4%	4%
පොළොන්නරුව	-	26%	59%	15%	-	-
හම්බන්තොට	4%	11%	46%	14%	18%	7%

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වැඩි ගොවීන් ප්‍රතිශතයක් එනම් 41%ක් ලබා ගෙන ඇත්තේ රු. 10,000/=ට අඩු වගා ණය ප්‍රමාණයක් වන අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ 36%ක් වන බහුතර ගොවීන් පිරිස රු. 10,000/= - රු. 20,000/- අතර ප්‍රමාණයක වගා ණය ලබා ගෙන තිබේ. කෙසේ නමුත් පොළොන්නරුව හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ගොවීන්ගේ නියැදියෙන් වැඩි පිරිසක් රු. 20,000/= - රු.30,000/= අතර වගා ණය ලබා ගෙන තිබේ. රු.50,000/= වැඩි ණය ලබාගත් ගොවීන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළින් වාර්තා වන අතර එය 7% කි. අනිකුත් දිස්ත්‍රික්ක 2ට සාපේක්ෂ ව පොළොන්නරුව හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල වගා බිම් ප්‍රමාණය විශාල වීම මෙසේ වගා ණය ප්‍රමාණය ඉහළ යාම කෙරෙහි එක් හේතුවක් වන බව පැහැදිලිය.

වගු අංක 7.12: ලබා ගත් ණය මුදලේ සහ රක්ෂිත අක්කර ප්‍රමාණයේ මධ්‍ය අගයන්

දිස්ත්‍රික්කය	ණය මුදලේ ප්‍රමාණයේ මධ්‍ය අගයන් (රු.)	රක්ෂිත අක්කර ප්‍රමාණයේ මධ්‍ය අගයන් (අක්කර)
කුරුණෑගල	13,860/=	1.83
අනුරාධපුර	11,830/=	2.45
පොළොන්නරුව	28,826/=	3.26
හම්බන්තොට	31,948/=	3.55

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත දත්ත වලට අනුව නියැදි ගොවීන්ගේ ලබා ගත් ණය මුදලේ මධ්‍ය අගයන් හා රක්ෂිත වී වගා බිම් ප්‍රමාණයේ මධ්‍ය අගයන් සැලකූවිට පොළොන්නරුව හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ලබා ගන්නා ලද ණය මුදලේ මධ්‍ය අගයන් ඉහළ බව පෙනී යන අතර එමෙන්ම රක්ෂිත වී වගා අක්කර ප්‍රමාණය ද සාපේක්ෂ ව ඉහළ බව පෙනී යයි.

7.4.3 ණය ආපසු ගෙවීම

ණය ආපසු අය කර ගැනීමේ නොහැකියාව ඉහළ මට්ටමක පැවතීම බොහෝ ණය දෙන ආයතනවලට මුහුණ දීමට සිදුවන ප්‍රධාන බාධකයකි. කෙසේ නමුත් අවධානයට ලක් කළ දිස්ත්‍රික්ක හතර තුළ ගොවීන්ගේ නියැදියට අනුව ණය ආපසු ගෙවීමේ තත්වය සාර්ථක මට්ටමක පවතී. දිස්ත්‍රික්ක හතර තුළ ම 60%ට වැඩි ගොවීන් පිරිසක් වගා ණය සම්පූර්ණයෙන් ම ගෙවා අවසන් තත්වයේ පසු වේ. ඔවුන්ගේ අදහස්වලට අනුව, අසීරුතාවයෙන් හෝ සිය වගා ණය ආපසු නොගෙවීමෙන් ඊළඟ කන්නය සඳහා වගා ණය ලබා ගත නොහැකි වීමේ ගැටලුවට මුහුණ දීමට සිදු වනු ලබයි.

වගු අංක 7.13: වගා ණය ආපසු ගෙවීම

දිස්ත්‍රික්කය	වගා ණය ආපසු ගෙවීම අනුව ගොවීන්ගේ ව්‍යාප්තියේ %					එකතුව
	සම්පූර්ණයෙන් ගෙවා අවසන්	ගෙවමින් පවතී	ගෙවීමට කාලය ඇත	ගෙවා අවසන් නැත	කන්නය අවසානයේ එකවර ගෙවයි	
කුරුණෑගල	60	24	-	16	-	100
අනුරාධපුර	66	18	-	16	-	100
පොළොන්නරුව	72	13	3	12	-	100
හම්බන්තොට	90	3	-	5	2	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත වගුවට අනුව ණය ආපසු ගෙවා ඇති ප්‍රතිශතය පොළොන්නරුව හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල සාපේක්ෂ ව සාර්ථක මට්ටමක පවතී. මෙම දිස්ත්‍රික්ක 2ක තුළ ගොවීන්ගේ මාසික ආදායම් තත්ත්වය ද සාපේක්ෂ ව ඉහළ මට්ටමක පැවතීම මේ සඳහා එක් හේතුවක් වේ.

7.4.4 වගා ණය ව්‍යාපෘතිය යටතේ වගා රක්ෂණ ක්‍රමයේ අවශ්‍යතාවය

කෘෂිකාර්මික රක්ෂණ ව්‍යාපෘතිය මගින් ආයතනිකමය වශයෙන් ණය ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා යම් සහනයක් ලබා දීම සිදු කරනු ලබයි. ණය දෙන ආයතන විසින් ගොවීන්ට වගා ණය ලබා දී ඇති අවස්ථාවක, වගා හානියක් සිදු වීමේ දී එසේ දුන් වගා ණය ආපසු අය කර ගත නොහැකි වීමේ අවදානමට මුහුණ දීමට සිදුවේ. ඒ තත්වය ඉදිරි ණය දීමේ කටයුතු සඳහා මූල්‍ය ආයතනවල ද්‍රවශීලතාවය සම්බන්ධයෙන් ගැටලුවක් මතු කරනු ලබයි. කෘෂිකාර්මික රක්ෂණයක් මගින් ණය ලබා දෙන ආයතනවල මෙම ගැටලුව සඳහා තරමක සහනයක් ලබා දීම තුළින් එහි අවදානම යම් මට්ටමකින් අඩු කිරීම සඳහා උපකාර වෙයි (Sandarathne, 1974).

රාජ්‍ය හා පෞද්ගලික බැංකු බොහොමයක, වගා ණය ලබා දීමේ දී රක්ෂණ වාරික ගෙවා තිබීම අනිවාර්ය අංගයක් සේ සලකනු ලබයි. යම් වගා හානි අවස්ථාවක දී, රක්ෂණ මණ්ඩලය විසින් එකඟ වී ඇති පරිදි රක්ෂණ වන්දි මුදලක් ණය ලබා දුන් බැංකුව වෙත ගෙවනු ලබයි. බොහෝ අවස්ථාවල එසේ ලබා දෙන වන්දි මුදල මුළු ණය මුදල ආවරණය කිරීමට තරම් ප්‍රමාණවත් නො වුව ද, එය යම් මට්ටමකින් හෝ ගොවීන්ගේ ණයගැති භාවය අඩු කිරීම සඳහා උපකාර වෙයි. වෙනත් අයුරකින් පවසනවා නම්, වගා රක්ෂණ ක්‍රමයක් නොපවතී නම් වගා හානියකින් පසුව ගොවීන්ට අඛණ්ඩ ව ණය ගැති භාවය තුළ ම රැඳී සිටීමට සිදු වනු ඇත. අධ්‍යයනයට ලක් කළ රක්ෂිත ගොවීන්ගේ නියැදියට අනුව වගා ණය ලබා ගැනීමේ දී වගා රක්ෂණයට දායක වීම පූර්ව කොන්දේසියක්ව පැවතියේ ද යන්න විමසීමේ දී ලබා දුන් ප්‍රතිචාර පහත පරිදි වගු අංක 7.14 මගින් පෙන්වා ඇත.

වගු අංක 7.14: වගා ණය ලබා ගැනීමේ දී වගා රක්ෂණය ලබා ගැනීම පිළිබඳ පූර්ව අවශ්‍යතාවය

දිස්ත්‍රික්කය	වගා ණය ලබා ගැනීමේ දී වගා රක්ෂණය අනිවාර්ය කොන්දේසියක් ද?		එකතුව
	ඔව්	නැත	
කුරුණෑගල	92%	8%	100
අනුරාධපුර	94%	6%	100
පොලොන්නරුව	100%	-	100
හම්බන්තොට	98%	2%	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

සටහන 7.1: වගා රක්ෂණය හා වගා ණයෙහි ක්‍රියාකාරීත්වය



1. රක්ෂණ වාරික
2. වන්දි ගෙවීම
3. කෘෂිකාර්මික ණය

7.5 වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ සහභාගීත්වයට බලපාන සාධක

7.5.1 වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත් භාවය

පහත සඳහන් වගු අංක 7.15 ට අනුව, දිස්ත්‍රික්ක හතර තුළ තෝරා ගත් මුළු රක්ෂණ ගොවීන්ගේ නියැදියෙන් 50%කට අධික පිරිසක් රක්ෂණ ආවරණය ලබා ගෙන ඇත්තේ ඒ පිළිබඳව කිසිදු දැනුවත් භාවයක් ලබාගැනීමෙන් තොරවය.

වගු අංක 7.15: ගොවීන්ගේ දැනුවත් භාවය

දිස්ත්‍රික්කය	වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත් භාවය අනුව ව්‍යාප්තියේ ප්‍රතිශතය		එකතුව
	දැනුවත් වී ඇත	දැනුවත් වී නැත	
කුරුණෑගල	37%	63%	100
අනුරාධපුර	50%	50%	100
පොළොන්නරුව	43%	57%	100
හම්බන්තොට	32%	68%%	100
එකතුව	41%	59%	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

රක්ෂණයට දායක වී ඇති ගොවීන් වගා රක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් වී ඇත්තේ ණය දෙන ආයතනවල, වගා ණය ලබාගැනීමට අවශ්‍ය පූර්ව කොන්දේසියක් වශයෙන් පමණි. ඒ හැර වගා රක්ෂණය සම්බන්ධ ව පවතින වැදගත් භාවය හෝ එහි පවතින වාසිදායක තත්වයන් පිළිබඳව අවබෝධයක් අධ්‍යයනයට ලක් කළ ගොවීන් බහුතරයක් තුළ දක්නට නොවුණි.

මෙම අධ්‍යයනය තුළින් හෙළිදරව් වූ කරුණුවලට අනුව, රක්ෂණ ආවරණය ලබාගෙන ඇති ගොවීන් සියල්ලක් ම පාහේ තම වගාව සඳහා වගා ණය ලබාගත් අය වෙති. වගු අංක 7.16 මඟින් පෙන්වා දෙන පරිදි, ගොවීන්ගෙන් බහුතර ප්‍රතිශතයක් රක්ෂණ ආවරණය ලබා ගෙන ඇත්තේ වගා ණය ලබා ගැනීමට අවශ්‍ය පූර්ව කොන්දේසියක් ඉටු කිරීම සඳහාය. මේ අනුව වගා රක්ෂණය යන්න අවදානම් කළමනාකරණ කිරීමේ එක් මෙවලමක් වුව ද ඒ සම්බන්ධ ව ගොවීන්ගේ දැනුම ඉතාමත් අඩු මට්ටමක පවතී.

වගු අංක 7.16: රක්ෂණය සඳහා සහභාගී වීමට බලපාන හේතු සාධක

දිස්ත්‍රික්කය	රක්ෂණය සඳහා සහභාගී වීමට බලපාන ලද හේතු සාධක අනුව ව්‍යාප්තියේ ප්‍රතිශතය (%)			එකතුව
	වගා ණය ලබා ගැනීම සඳහා	ස්වභාවික උපද්‍රව වලින් ආරක්ෂා වීමට	වගා ණය ලබා ගැනීම හා භෝග සඳහා ආරක්ෂාව ලබා ගැනීම	
කුරුණෑගල	96	4	-	100
අනුරාධපුර	95	-	5	100
පොළොන්නරුව	94	-	6	100
හම්බන්තොට	100	-	-	100
එකතුව	93	4	3	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.5.2 රක්ෂණය පිළිබඳ දැනුවත් වීමේ මාර්ගයන්

වගා රක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් භාවයක් ලබාගෙන ඇති ගොවීන් ඒ පිළිබඳව දැනුවත් වී ඇති මාර්ග හෙවත් ආකාර හතක් හඳුනාගෙන ඇති අතර එය පහත පරිදි වගු අංක 7.17 මගින් පෙන්වා දිය හැකිය.

වගු අංක 7.17: දැනුවත් භාවය ලබාගත් මාර්ගයන්

දැනුවත් බව ලබාගත් මාර්ගයන්	ගොවීන්ගේ ප්‍රතිශතය
රක්ෂණ නිලධාරී මගින්	40
මාධ්‍ය මගින්	3
බැංකු මගින්	38
අනෙකුත් ගොවීන් මගින්	11
කෘෂිකර්ම නිලධාරීන් මගින්	1
ගොවි නියාමක මගින්	1
මහවැලි නිලධාරී මගින්	1
වෙනත්	5
එකතුව	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත සටහනට අනුව වැඩි ම ගොවීන් පිරිසක් රක්ෂණය පිළිබඳව දැනුවත් භාවය ලබාගෙන ඇත්තේ රක්ෂණ නිලධාරීන් මගින්ය. එය 40% ක ප්‍රමාණයකි. එමෙන්ම බොහෝ ගොවීන් සිය වගාව සඳහා ණය ලබා ගැනීමට බැංකුවට යාම මගින් ඒ තුළින් රක්ෂණය පිළිබඳ ව දැනුවත් වීම ද ඉහළ මට්ටමක පවතී. එනම් 38%කි. කෙසේ නමුත් මින් පෙනී යන්නේ කෘෂිකර්ම නිලධාරී, ගොවිනියාමක, මහවැලි නිලධාරී වැනි ග්‍රාමීය මට්ටමේ නිලධාරීන්, වගා රක්ෂණය ගොවීන් අතරට ගෙන යාම සඳහා දක්වනු ලබන දායකත්වය ඉතාමත් අවම මට්ටමක පවතින බවයි.

7.5.3 රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය

2004/2005 මහ කන්නයේ අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගේ නියැදිය විසින් රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය පහත සඳහන් වගු අංක 7.18 මගින් පෙන්වා දිය හැකිය.

වගු අංක 7.18: රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය

දිස්ත්‍රික්කය	රක්ෂිත වී වගා බිම් ප්‍රමාණයේ ප්‍රතිශතය						එකතුව
	අක්කර 1 ට අඩු	අක්කර 2 ට අඩු	අක්කර 3 ට අඩු	අක්කර 4 ට අඩු	අක්කර 5 ට අඩු	අක්කර 5 ට වැඩි	
කුරුණෑගල	58	17	17	4	-	4	100
අනුරාධපුර	15	26	57	2	-	-	100
පොළොන්නරුව	-	4	96	-	-	-	100
හම්බන්තොට	5	15	44	23	8	5	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් භාගයකට වඩා වැඩි ප්‍රතිශතයක් රක්ෂණය කර ඇති වී වගා බිම් ප්‍රමාණය අක්කරයට වඩා අඩු ප්‍රමාණයකි. එමෙන්ම අනිකුත් දිස්ත්‍රික්ක තුනේ ම ගොවීන්ගේ බහුතර ප්‍රතිශතයක් රක්ෂණය කර ඇති වී වගා බිම් ප්‍රමාණය අක්කර 2 ට වැඩි හා අක්කර 3 ට අඩු පරාසයක පවතී. අනිකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂ ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 4 ට වඩා වැඩියෙන් රක්ෂණය කළ වී වගා බිම් ප්‍රමාණයක් හිමි ගොවීන්ගේ ප්‍රතිශතය ඉහළය.

වගු අංක 7.19: වගා කළ වී වගා බිම් ප්‍රමාණයේ හා රක්ෂිත වී වගා බිම් ප්‍රමාණයේ මධ්‍ය අගයන්

දිස්ත්‍රික්කය	වගා කළ වී වගා බිම් ප්‍රමාණය (අක්කර) මධ්‍ය අගය	රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය (අක්කර) මධ්‍ය අගය	වගා කළ බිම් ප්‍රමාණයට සාපෙක්ෂ ව රක්ෂිත බිම් ප්‍රමාණයේ ප්‍රතිශතය (%)
කුරුණෑගල	3.91	2.00	51%
අනුරාධපුර	6.40	2.95	46%
පොළොන්නරුව	7.64	3.24	42%
හම්බන්තොට	7.28	3.47	48%

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත වගුවට අනුව, අධ්‍යයනයට ලක් වූ දිස්ත්‍රික්ක හතර තුළ ගොවීන්ගේ නියැදිය විසින් වගා කළ බිම් ප්‍රමාණය හා රක්ෂිත බිම් ප්‍රමාණය පිළිබඳ අදහසක් දක්වා ඇත. වගා කළ බිම් ප්‍රමාණයට සාපේක්ෂව රක්ෂණය කරන ලද වැඩි ම බිම් ප්‍රමාණයක් එනම් 51%ක් වාර්තා වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙනි. මේ සඳහා ප්‍රධාන හේතුවක් වශයෙන් පෙන්වා දිය හැක්කේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ වැඩි ප්‍රතිශතයක් වාර්ෂා පෝෂිත ක්‍රමය අනුව වී වගා කරන බැවින් සාපේක්ෂ ව අවදානම වැඩි බැවින් වැඩි බිම් කොටසක් රක්ෂණයට යොමු කිරීමයි. ඒ අනුව තම කුඹුරු ඉඩම්වලින් අවදානම වැඩි කොටස රක්ෂණය කිරීමට ඔවුන් නැඹුරුතාවයක් දක්වනු ලබයි.

කෙසේ නමුත් දිස්ත්‍රික්ක හතර ම සමස්තයක් වශයෙන් ගත් විට, අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක්, වගා කරනු ලැබූ වී වගා අක්කර ප්‍රමාණය 2 1/2 -5 අතර පවතී. එමෙන්ම ඔවුන්ගේ වැඩි ප්‍රතිශතයක් රක්ෂණය කර ඇති වී වගා බිම් ප්‍රමාණය අක්කර 1- 2 1/2 අතර ප්‍රමාණයකි. මින් පැහැදිලි වන්නේ අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් බහුතරයක් විසින් රක්ෂණය කර ඇත්තේ අක්කර 1 සිට 2 1/2 පමණ වී වගා බිම් ප්‍රමාණයක් වීම තුළින් පැහැදිලි වන්නේ සුළු පරිමාණ ගොවීන් වැඩි වශයෙන් වගා රක්ෂණය කෙරෙහි යොමු වී ඇති බවයි. මේ තත්වය පහත පරිදි වගු අංක 7.20 මඟින් පෙන්වා දෙනු ලබයි.

වගු අංක 7.20: වගා කළ වී වගා බිම් ප්‍රමාණය සහ රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය (අක්කර) / වගා කළ බිම් ප්‍රමාණය (අක්කර)	1 <	1 ≥ 2 1/2	2 1/2 ≥ 5	5 ≥ 7 1/2
1 <	2%	-	-	-
1 ≥ 2 1/2	6%	3%	-	-
2 1/2 ≥ 5	4%	25%	10%	-
5 ≥ 7 1/2	1%	4%	17%	4%
7 1/2 ≥ 10	-	12%	10%	2%

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.6 රක්ෂණ වාරික මුදල් සහ රක්ෂණ ආවරණය

7.6.1 වාරික මුදල් මට්ටම

වගා රක්ෂණය ක්‍රියාත්මක කිරීමේ දී එය ලාභය අරමුණු කර ගත් ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක නොවන අතර රජය විසින් පරිපාලන වියදම් දරනු ලබයි. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ වාර් මුදල් තීරණය කිරීමේ දී වාරික ක්‍රමය සහ පසුගිය රක්ෂණ අත්දැකීම් අනුව අවදානම් මට්ටම පදනම් කරගනු ලබයි. පහත සඳහන් වගුව මගින් අධ්‍යයනයට ලක් කළ දිස්ත්‍රික්ක හතර තුළ ගොවීන්ගේ නියැදියේ ව්‍යාප්තිය ඔවුන් විසින් ගෙවනු ලබන රක්ෂණ වාර මුදල අනුව දක්වා ඇත.

වගු අංක 7.21: වාරික මුදල් ප්‍රමාණය සහ ගොවීන්ගේ ව්‍යාප්තියේ ප්‍රතිශතය

දිස්ත්‍රික්කය	වාරික මුදල (අක්කරයට/රුපියල්)				එකතුව
	100 > 250	250 > 300	300 > 500	500 > 750	
කුරුණෑගල	61%	26%	9%	4%	100
අනුරාධපුර	25%	71%	4%	-	100
පොළොන්නරුව	-	18%	81%	1%	100
හම්බන්තොට	22%	68%	7%	3%	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත සඳහන් කළ පරිදි කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය රක්ෂණ වාර මුදල් මට්ටම් කිහිපයක් හඳුන්වා දී ඇති අතර ගොවීන්ට තමාට ගෙවිය හැකි රක්ෂණ වාර මුදල තීරණය කිරීමේ විවිධ විකල්පයන් පවතී. ඉහත සටහනට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් එනම් 61%ක් තම රක්ෂණ වාරික මුදල වශයෙන් ගෙවනු ලබන්නේ අක්කරයට රු.250/= කට වඩා අඩු මුදලකි. නමුත් අනුරාධපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල බහුතරයක් ගොවීන් තම සාමාන්‍ය රක්ෂණ වාර මුදල වශයෙන් අක්කරයකට රු. 250/= - රු. 350/= අතර ප්‍රමාණයක් ගෙවනු ලබයි. මේ අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් බහුතරයක් රක්ෂණ වාරික මුදල රු. 300/= - රු.500/= අතර ගෙවනු ලබයි. සාමාන්‍යයෙන් ගොවීන් විසින් තමාට ගෙවිය හැකි රක්ෂණ

වාර මුදල තීරණය කිරීමේ දී තමාගේ ආදායම හා ගෙවීමට පවතින හැකියාව පිළිබඳව අවධානය යොමු කරනු ලැබිය යුතු වුවද, අධ්‍යයනය තුළින් පැහැදිලි වූයේ ගොවීන්ගෙන් බහුතරය තම රක්ෂණ වාර මුදල වශයෙන් තෝරා ගනු ලබන්නේ පවතින අවම රක්ෂණ වාර මුදල් වටිනාකම වේ.

7.6.2 රක්ෂණ වාර මුදල් ගෙවීමේ මාර්ගයන්

පෙර සඳහන් කළ පරිදි වගා රක්ෂණ ක්‍රමය ප්‍රධාන වශයෙන් වගා ණය ක්‍රමය සමඟ සම්බන්ධ ව පවතී. ඒ අනුව රක්ෂණ වාරික අය කිරීමේ හා රක්ෂණ වන්දි ගෙවීමේ ප්‍රධාන කාර්යයන් රජයේ හෝ පුද්ගලික බැංකු හරහා සිදු වනු ලබයි. පහත සඳහන් වගුව මඟින් පැහැදිලි වන පරිදි ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් තම රක්ෂණ වාරික මුදල ගෙවනු ලබන්නේ බැංකු හරහාය. එය බොහෝ වීට ණය ලබා දෙන අවස්ථාවේදී ම බැංකුව විසින් අයකරගනු ලබයි. කෙසේ නමුත් වගා රක්ෂණය හා වගා ණය අතර පවතින මෙම සම්බන්ධතාවය රක්ෂණ ක්‍රමයේ පවතින, රක්ෂණ වාරිකවල අසමානතාවය, වන්දි ගෙවීමේ ප්‍රමාදය හා වන්දි මුදල ප්‍රමාණවත් නොවීම යන ගැටලු සඳහා පිළියමක් සපයනු නොලබයි.

වගු අංක 7.22: රක්ෂණ වාරික ගෙවීමේ මාර්ගයන්

දිස්ත්‍රික්කය	රක්ෂණ වාරික ගෙවීමේ ක්‍රමය අනුව ගොවීන්ගේ ව්‍යාප්තියේ ප්‍රතිශතය %				එකතුව
	වගා ණය ලබාගැනීමේදී බැංකුවට ගෙවීම	රක්ෂණ නිලධාරියාට ගෙවීම	දිස්ත්‍රික්ක කාර්යාලයට ගෙවීම	වෙනත්	
කුරුණෑගල	58	17	-	25	100
අනුරාධපුර	76	19	5	-	100
පොළොන්නරුව	94	-	-	6	100
හම්බන්තොට	100	-	-	-	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත දත්තවලට අනුව ද පෙනී යන්නේ ගොවීන් වගා රක්ෂණය ලබා ගෙන ඇත්තේ වගා ණය ලබා ගැනීමේ පූර්ව කොන්දේසියක් සපුරාලීමේ අවශ්‍යතාවයක් වශයෙන් බවයි.

7.6.3 රක්ෂණ ආවරණය

රක්ෂණ ආවරණ මුදල තීරණය කිරීමේ දී කරුණු 3ක් පදනම් කරගනු ලබයි.

i. නිෂ්පාදන (වගා) පිරිවැය
ii. අස්වනු වටිනාකමේ යම් කොටසක්
iii. වගා ණයෙහි ප්‍රමාණය

ශ්‍රී ලංකාවේ දී රක්ෂණ ආවරණ මුදල තීරණය කිරීමේ දී පදනම් කරගනු ලබන්නේ වගාව සඳහා වැයවෙන පිරිවැයයි. බිම් සකස් කිරීමේ සිට, යෙදවුම් පිරිවැය ආදී වූ වගාව සඳහා වන පිරිවැය අනුව එය තීරණය කිරීම වඩාත් පහසුය. කෙසේ නමුත් රක්ෂණ ආවරණ මුදල තීරණය කිරීමේ දී ද, වී වගා බිම්වල පවත්නා අවදානම් මට්ටම සහ වාර ක්‍රමය ද ඉතා වැදගත් කොට සලකනු ලබයි. පහත දැක්වෙන වගුව මඟින් සලකා බලනු ලැබූ දිස්ත්‍රික්ක හතර තුළ රක්ෂණ ආවරණ මුදලේ සාමාන්‍ය අගය, නිෂ්පාදන පිරිවැයේ සාමාන්‍ය අගය හා ණය මුදලේ සාමාන්‍ය අගය පෙන්වා දෙනු ලබයි. ඒ

අනුව පැහැදිලි වන්නේ බොහෝ විට රක්ෂණ ආවරණ මුදල, ණය මුදල ආවරණය කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බවයි. එමෙන්ම එය නිෂ්පාදන පිරිවැය ආවරණය කිරීමටත් ප්‍රමාණවත් නොවෙයි. වගා රක්ෂණ ක්‍රමය ගොවීන් අතර ජනප්‍රිය කර වීම සඳහා පවතින එක් බාධාවක් වශයෙන් ද මේ තත්වය පෙන්වා දිය හැකිය.

වගු අංක 7.23: රක්ෂණ ආවරණ මුදල, ණය මුදල හා නිෂ්පාදන පිරිවැය

දිස්ත්‍රික්කය	රක්ෂණ ආවරණ මුදල (රු.) (මධ්‍යන්‍ය අගය)	නිෂ්පාදන පිරිවැය (රු.) (මධ්‍යන්‍ය අගය)	ණය මුදල (රු.) (මධ්‍යන්‍ය අගය)
කුරුණෑගල	11,478/=	15,600/=	13,860/=
අනුරාධපුර	14,671/=	18,688/=	16,830/=
පොළොන්නරුව	30,484/=	21,206/=	26,826/=
හම්බන්තොට	17,567/=	21,996/=	31,948/=

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

අධ්‍යයනයට අනුව පැහැදිලි වූ කරුණක් වූයේ රක්ෂිත ගොවීන්ගෙන් බහුතරයක් තමාගේ රක්ෂණ ආවරණ මුදල සම්බන්ධයෙන් කිසිදු දැනුවත් භාවයක් ලබා නොමැති බවයි. ඔවුන් දැනුවත් වී ඇති එකම කරුණ වන්නේ වගා ණයක් ලබා ගැනීමේ දී බැංකුව විසින් රක්ෂණ වාරික මුදල වශයෙන් යම් මුදලක් අය කර ගන්නා බව පමණකි.

7.7 වී වගාව සඳහා වන හානි

7.7.1 වී වගාව සඳහා සිදු වන හානි වර්ග

වගාව සඳහා රක්ෂණ ආවරණය ලබා ගැනීමේ දී වගා හානිය සිදු වී නොතිබිය යුතුය. එමෙන්ම වී වගාවේ සිට අස්වැන්න නෙළන අවස්ථාව දක්වා භෝගයේ මුළු වටිනාකම දැනගැනීමේ හාකියාව ද නොපවතී. කෙසේ නමුත් කෘෂිකර්මාන්තය තුළ ස්වභාවිකව සිදු වන විශාල ව්‍යසනයක දී හැරුණු විට වගාවට 100%කින් ම සිදු වන විනාශයන් වාර්තා වීම දුර්ලභය. බොහෝ විට වාර්තාවන්නේ වගාවෙන් යම් කොටසකට සිදු වන හානි පමණි. ශ්‍රී ලංකාව තුළ වී වගාව සඳහා සිදු වන සියලුම ස්වාභාවික උවදුරු රක්ෂණය කළ හැකිය. තුන්වන පරිච්ඡේදයේ දී සඳහන් කළ පරිදි රක්ෂණය කළ හැකි හේතුන් හෙවත් උපද්‍රවයන් හතක් පවතී. ඒ අනුව වගා රක්ෂණය කළ ගොවියෙකුට එම සඳහන් ස්වභාවික උවදුරු එකකින් හෝ කිහිපයකින් සිදු වන හානි සඳහා වන්දි ලබා ගැනීමේ හැකියාව පවතී. අධ්‍යයනයට ලක් කළ ප්‍රදේශවල ගොවීන් විසින් වාර්තා කරන ලද හානි අනුව ඔවුන්ගේ ව්‍යාප්තිය පහත වගුව මගින් පෙන්වා දිය හැකිය.

වගු අංක 7.24: භෝග සඳහා වන හානි වර්ග

දිස්ත්‍රික්කය	වාර්තා වූ හානි වර්ග අනුව ගොවීන්ගේ ව්‍යාප්තියේ ප්‍රතිශතය							එකතුව
	ගං වතුර	නියඟය	ජලය හිඟකම	ජලය වැඩිකම	කෘමි රෝග	ගොයම් රෝග	වල් සතුන්ගෙන් වන හානි	
කුරුණෑගල	-	78%	11%	-	11%	-	-	100
අනුරාධපුර	-	24%	9%	-	43%	14%	10%	100
පොළොන්නරුව	10%	-	12%	6%	22%	32%	18%	100
හම්බන්තොට	12%	4%	4%	13%	38%	29%	-	100
එකතුව	**10%**	**12%**	**8%**	**6%**	**31%**	**26%**	**7%**	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන් වැඩි ප්‍රතිශතයක් ප්‍රකාශ කළේ ඔවුන්ගේ වී වගාව සඳහා ප්‍රධාන වශයෙන් හානි සිදු වන්නේ නියඟය හේතුවෙන් බවයි. නමුත් පොළොන්නරුව, අනුරාධපුර, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල වී වගාව සඳහා ප්‍රධාන වශයෙන් සිදු වන හානි වශයෙන් වාර්තා වන්නේ කෘමි හා ගොයම් රෝග වෙයි. නියඟයෙන් හෝ ජලය හිඟකමෙන් සිදු වන වගා හානි මෙම දිස්ත්‍රික්ක තුළ සාපේක්ෂ ව අඩු මට්ටමක පවතින අතර මහා වාරි ක්‍රමය අනුව වැඩි ගොවීන් පිරිසක් වී වගා කිරීම ඒ සඳහා හේතු වෙයි. වන සතුන්ගෙන් වන හානි කුරුණෑගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වලින් වාර්තා නොවුණි.

සටහන 7.2: අධ්‍යයනයට ලක් කළ ප්‍රදේශවල වාර්තා වූ මුළු වගා හානි ප්‍රතිශතයන්



7.7.2 වගා හානි සිදු වන අවස්ථා

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් වී වගාව සිදු කළ දිනයේ සිට අස්වනු නෙළන අවස්ථාව දක්වා භෝගයට සිදු විය හැකි හානි අදියර හතරක් යටතේ වර්ගකොට තිබේ.

- මූලික අවස්ථාව
- ප්‍රථම අවස්ථාව
- දෙවන අවස්ථාව
- අවසාන අවස්ථාව

වන්දි ගෙවීම ද මෙම විවිධ අවස්ථා අනුව වෙනස් වනු ලබයි. පහත සඳහන් වගු අංක 7.25 මගින් පෙන්නුම් කරන්නේ අධ්‍යයනයට ලක් කල ගොවීන් විසින් වගාව සඳහා සිදු වූ හානිය එහි අවස්ථාව අනුව පෙන්වා දුන් ආකාරයයි. සටහනට අනුව සෑම දිස්ත්‍රික්කය ම පාහේ වගා හානි වැඩි වශයෙන් වාර්තා වී ඇත්තේ එහි දෙවන අදියරේදීය. එනම් වගා කොට මාසයක කාලසීමාවේ සිට වගාවේ මල්හට ගන්නා අවස්ථාව දක්වා වූ කාලසීමාවේ දී ය. මූලික හා ප්‍රථම අවස්ථාවේ සිදු වූ හානි වාර්තා වී ඇත්තේ ඉතාමත් සුළු වශයෙනි.

වගු අංක 7.25: වගා හානි සිදු වී ඇති අදියරයන්

දිස්ත්‍රික්කය	වගා හානි සිදු වූ අවස්ථාව අනුව ගොවීන්ගේ ව්‍යාප්තියේ ප්‍රතිශතය				එකතුව
	මූලික අවස්ථාව	ප්‍රථම අවස්ථාව	දෙවන අවස්ථාව	අවසාන අවස්ථාව	
කුරුණෑගල	-	-	78	22	100
අනුරාධපුර	-	5	71	24	100
පොළොන්නරුව	6	8	60	26	100
හම්බන්තොට	8	-	67	25	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.7.3 වගා හානි දැනුම් දීම සඳහා ගත වන කාලය

සාර්ථක ව ක්‍රියාත්මක වන වගා රක්ෂණ ක්‍රමයක් සඳහා කඩිනමින් සිදු කෙරෙන අධීක්ෂණය හානි තක්සේරුව හා කඩිනමින් සිදු වන වන්දි ගෙවීම අත්‍යාවශ්‍ය වේ. මේ තත්ත්වය ළඟා කර ගැනීමට ගොවීන් විසින් තමාට සිදුවන වගා හානියක් දින 14ක් ඇතුලත දැනුම් දිය යුතුය. ඒ අනුව රක්ෂණ ආවරණය සපයන හේතුවක් මත සිදු වන හානි දින 14ක් ඇතුළත ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයට හෝ අදාළ නිලධාරියෙකුට දැනුම් දීම කළ යුතුය. එම හානිය ගොවියා විසින්ම දැනුම් දිය යුතු අතර පෞද්ගලික ව පැමිණ එසේ දැනුම් දීමට නොහැකි අවස්ථාවක ගොවියා විසින් බලය පවරන ලද ලිපියක් ඇතිව නියෝජිතයෙකු මගින් හෝ තැපැල් මගින් හෝ දැනුම් දීම කළ හැකිය. එම ලිපියේ වගා හානියට අදාළ සියලු තොරතුරු ඇතුළත් විය යුතුය. වගු අංක 7.26 මගින් ගොවීන් විසින් සිය වගා හානිය දැනුම් දීමට ගත් කාලසීමාව අනුව ඔවුන්ගේ ව්‍යාප්තිය පෙන්නුම් කරනු ලබයි. ඒ අනුව පැහැදිලි වන්නේ සෑම දිස්ත්‍රික්කයක ම පාහේ වැඩි ගොවීන් ප්‍රතිශතයක්, තම වගාවට හානියක් සිදු වී සතියක් ඇතුලත ඒ බව අදාල ආයතන හෝ පුද්ගලයන් වෙත දන්වන බවයි. කෙසේ වුවත් කුරුණෑගල, හම්බන්තොට, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල සැලකිය යුතු මට්ටමේ ප්‍රතිශතයක් ඒ සඳහා සති 2 ට වඩා කාලයක් ගෙන ඇති බව ද පැහැදිලිය. මේ තත්වය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන්නේ වගා රක්ෂණයේ නීතිරීති හා ක්‍රියාමාර්ග පිළිබඳ නිසි අවබෝධයක් ඔවුන් තුළ නොවීමයි.

වගු අංක 7.26: වගා හානි වාර්තා කිරීම සඳහා ගත වන කාලය

දිස්ත්‍රික්කය	වගා හානි වාර්තා කිරීමට ගතවන කාලය අනුව ව්‍යාප්තිය				එකතුව
	හානිය සිදු වූ දින ම	සතියක් ඇතුළත	සති 2 ක් ඇතුළත	සති 2 ට වඩා වැඩි	
කුරුණෑගල	-	43	14	43	100
අනුරාධපුර	-	90	10	-	100
පොළොන්නරුව	3	72	10	15	100
හම්බන්තොට	-	84	5	11	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.7.4 හානි දැනුම්දීම

කුරුණෑගල, අනුරාධපුර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් තම වගා හානිය වාර්තා කර ඇත්තේ ගොවිජන සේවා මධ්‍යස්ථානයටය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැඩි ගොවීන් ප්‍රතිශතයක් මහවැලි නිලධාරීන්ට එය වාර්තා කොට ඇත. මේ තත්වය මත, ගොවීන් වැඩි පිරිසක් තම රක්ෂණ ක්ෂේත්‍ර නිලධාරියාට සාපේක්ෂව වැඩි සම්බඳතාවක් පහළ මට්ටමේ අනිකුත් නිලධාරීන් සමඟ පවත්නා බව පෙනී යයි.

වගු අංක 7.27: හානි දැනුම් දීම

දිස්ත්‍රික්කය	වගා හානි දැනුම් දීම අනුව ව්‍යාප්තිය (%)				එකතුව
	ගොවිජන සේවා මධ්‍යස්ථානය	මහවැලි නිලධාරි	බැංකු	රක්ෂණ නිලධාරි	
කුරුණෑගල	72	-	14	14	100
අනුරාධපුර	78	-	-	22	100
පොළොන්නරුව	13	74	3	10	100
හම්බන්තොට	94	-	-	6	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.7.5 හානි වූ බිම් ප්‍රමාණය

පහත සඳහන් වගු අංක 7.28 මගින් සමස්තයක් වශයෙන් අධ්‍යයනයට ලක් කළ ප්‍රදේශවල වගා කළ බිම් ප්‍රමාණය, රක්ෂිත බිම් ප්‍රමාණය හා හානි වූ බිම් ප්‍රමාණය පිළිබඳව විශ්ලේෂණයක් ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ වගා කළ මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 51%ක ප්‍රමාණයක් රක්ෂණය කර ඇති අතර රක්ෂිත බිම් ප්‍රමාණයෙන් 75%ක ප්‍රමාණයක් සඳහා හානි ද වාර්තා වී ඇත. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ රක්ෂිත බිම් ප්‍රමාණවලින් වැඩි ප්‍රතිශතයක් අධික අවදානමක් සහිත වගා බිම් බව පැහැදිලිය. රක්ෂිත වගා බිම්වලට සාපේක්ෂ ව අඩු ම වගා හානි ප්‍රතිශතයක් වාර්තා වී ඇත්තේ පොළොන්නරුව හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවලිනි.

වගු අංක 7.28: වගා හානි වූ බිම් ප්‍රමාණය

දිස්ත්‍රික්කය	වගා කළ වී බිම් ප්‍රමාණය අක්කර (මධ්‍යන්‍ය අගය)	රක්ෂිත වී වගාබිම් ප්‍රමාණය අක්කර (මධ්‍යන්‍ය අගය)	හානි වූ වී වගා බිම් ප්‍රමාණය අක්කර (මධ්‍යන්‍ය අගය)	වගාකළ බිම් ප්‍රමාණයට සාපේක්ෂ රක්ෂිත බිම් ප්‍රමාණය (%)	රක්ෂිත බිම් ප්‍රමාණයට සාපේක්ෂ හානි වූ බිම් ප්‍රමාණය (%)
කුරුණෑගල	3.19	2.00	1.50	51%	75%
අනුරාධපුර	6.40	2.95	1.63	46%	55%
පොළොන්නරුව	7.64	3.24	1.46	42%	19%
හම්බන්තොට	7.28	3.47	0.92	48%	26%

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.8 හානි තක්සේරුව, වන්දි ගෙවීම් සහ ප්‍රතිලාභ

7.8.1 හානි තක්සේරු කිරීමේ හා අගය කිරීමේ අදියර

ශ්‍රී ලංකාවේ වගා රක්ෂණ ක්‍රමයේ ප්‍රධාන අරමුණ වන්නේ, කෘෂිකර්මාන්තයේ දී සිදු වන යම් වගා හානියක දී ගොවීන්ට මුහුණ දීමට සිදු වන හානිය අවම කරමින් ඒ සඳහා ඔවුන්ට සුදුසු පරිදි වන්දි ලබා දීමයි. මේ අරමුණ ළඟා කර ගැනීම සඳහා විවිධ අදියරයන්හී පවතින වගාවන් සඳහා එනම් පැළ තවාන් මට්ටමේ දී, පැළ සිටුවීමත් සමඟ සිදු වන හානි, යනා දී අවස්ථාවන් සැලකිල්ලට ගත යුතුය. වගා හානි තක්සේරුව බොහෝ විට ඇස් මට්ටමේ තක්සේරුවකි. පහත සඳහන් වගු අංක 7.29 මඟින් හානි තක්සේරුව සිදු වන ආකාරය පෙන්වනු ලබයි. සාමාන්‍යයෙන් හානි දැන්වීම් පතෙහි අවශ්‍ය සියලු විස්තර රක්ෂකයා විසින් සම්පූර්ණව හා නිවැරදි ව සපයා තිබිය යුතු අතර හානි තක්සේරු කමිටුව තිදෙනෙකු ගෙන් සමන්විත විය යුතුය. හානි දැනුම් දී ඇති එක් එක් කුඹුරු නිවැරදිව හඳුනාගත් බවටත් එම කුඹුරේ හානි අවස්ථාව අනුව තක්සේරු කළ වන්දිය තක්සේරු කමිටුව සහතික කළ යුතු වෙයි. කෙසේ නමුත් කෘෂිකර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් හානි දැනුම් දීමේ පත්‍රිකාව පරීක්ෂා කරමින් එහි වන්දි ගෙවීමට හැකි නිත්‍යානුකූලභාවය පිළිබඳව සලකා බලනු ලබයි. පහත සඳහන් වගුවට අනුව අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් 51% ක ප්‍රමාණයක් ප්‍රකාශ කළේ තම වගා හානි තක්සේරුව, හානි තක්සේරු කමිටුව විසින් සිදු කළ බවයි. අනිකුත් පිරිස ප්‍රකාශ කළේ කෘෂිරක්ෂණ නිලධාරියා පමණක් හානි තක්සේරුව සඳහා සහභාගී වූ බවය.

වගු අංක 7.29: තක්සේරු කමිටුවේ ස්වභාවය

තක්සේරු කළ අය	ප්‍රතිශතය %
කෘෂි රක්ෂණ නිලධාරියා පමණක්	49
හානි තක්සේරු කමිටුව	51
එකතුව	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

හානි තක්සේරු කරනු ලැබූ අවස්ථාව සම්බන්ධයෙන් සලකා බැලීමේ දී වාර්තා වූයේ, හානි තක්සේරු කිරීම බොහෝ විට සිදු වී ඇත්තේ තුන්වැනි අදියර හෙවත් අවසන් අදියරේ දී බවය. නමුත් පෙර සඳහන් කළ පරිදි වැඩි වශයෙන් වගා හානි දෙවන අදියරේ දී සිදු වුවත් තක්සේරුව සිදු වී ඇත්තේ අවසන් අදියරේදීය. මේ තත්ත්වය වගු අංක 7.30 මඟින් පෙන්වා දිය හැකිය.

වගු අංක 7.30: තක්සේරු කරන අවස්ථාව

දිස්ත්‍රික්කය	තක්සේරු කරන අවස්ථාව			එකතුව
	පළමු අදියර	දෙ වන අදියර	තෙ වන අදියර	
කුරුණෑගල	-	25	75	100
අනුරාධපුර	-	43	57	100
පොළොන්නරුව	10	30	60	100
හම්බන්තොට	07	33	60	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.8.2 වන්දි ගෙවීමේ ක්‍රමය

කෘෂිකර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ජීවනාංකික හා පර්යේෂණ අංශය විසින් දිස්ත්‍රික් කාර්යාලය මගින් සකසා එවනු ලබන වන්දි ගෙවීමේ නිත්‍යානුකූල භාවය පිළිබඳ සලකා බලනු ලබයි. ඒ අනුව ගෙවිය හැකි වන්දි සඳහා එම අංශයේ අධ්‍යක්ෂවරයා විසින් අනුමැතිය ලබා දෙනු ලබයි. ඒ අනුව වන්දි ගෙවීම ආකාර කිහිපයකට සිදු කළ හැකිය. මෙය වගු අංක 7.31 මගින් පෙන්වා දිය හැකිය. වී වගා රක්ෂණය සාපුව ම වගා ණය සමඟ සම්බන්ධ බැවින් වන්දි ගෙවීම ද බොහෝ විට බැංකු හරහා සිදු වනු ලබයි. සටහන 7.1 දී දැක් වූ පරිදි රක්ෂණ ආයතනය විසින් වන්දි මුදල අදාළ බැංකු වෙත යවන අතර බැංකු විසින් අදාළ වගා ණය මුදල කපා හරිනු ලබයි . කෙසේ නමුත් වන්දි ගෙවීම සිදු නොකළ හැකි හෝ නවත්වා ඇති විට ඒ පිළිබඳව රක්ෂිත ගොවියා දැනුවත් කිරීම සිදු කළ යුතු ය. නමුත් අධ්‍යයනය තුළින් වාර්තා වූ අන්දමට, ගොවීන්ගේ වන්දි ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වී ඇති විට හෝ ගෙවීමට නොහැකි විට ඒ සඳහා හේතුව ගොවීන් වෙත දන්වා නොමැති බව පැහැදිලි විය.

වගු අංක 7.31: වන්දි ලැබෙන මාර්ගයන්

දිස්ත්‍රික්කය	වන්දි ලැබෙන මාර්ගයන් අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය			එකතුව
	ගොවියාට ම චෙක්පතක් මගින්	ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා	බැංකු හරහා	
කුරුණෑගල	-	-	100	100
අනුරාධපුර	12	12	76	100
පොළොන්නරුව	6	-	94	100
හම්බන්තොට	-	29	71	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

7.8.3 වන්දි ලැබීමට ගත වන කාලසීමාව

වගා රක්ෂණ ක්‍රමයක් සම්බන්ධයෙන් ගොවීන්ගේ විශ්වාසය තහවුරු වීම සහ උනන්දුවක් ඇති වීම සඳහා වගා හානියක දී ඉක්මන් අධීක්ෂණය සහ ප්‍රමාදයකින් තොරව කඩිනමින් වන්දි ගෙවීම ඉතා අවශ්‍යය. වගු අංක 7.32 මගින් අධ්‍යයනයට ලක් කළ ගොවීන් හට තම රක්ෂණ වන්දි ලැබීම සඳහා ගත වූ කාලය සම්බන්ධයෙන් ඔවුන් විසින් දක්වන ලද ප්‍රතිචාර පැහැදිලි කර ඇත.

වගු අංක 7.32: වන්දි ලැබීමට ගත වන කාලය

කාල පරාසය	මාසයක් තුළ	මාස 2ක් තුළ	මාස 3 ක් තුළ	මාස 3ට වැඩි
අදහස් දැක් වූ ගොවීන්ගේ ප්‍රතිශතය	7	33	14	46

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් බහුතර පිරිසක් එනම් 46%ක් ම ප්‍රකාශ කළේ තම වගා හානි සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීමට මාස 3කට වඩා වැඩි කාලයක් ගත වූ බවයි. රක්ෂණ වන්දි මුදල ලබා ගැනීම සඳහා මාස 3 කටත් වඩා වැඩි කාලයක් ගත වීම තුළින් වගා රක්ෂණ ක්‍රමයක් තුළින් අපේක්ෂා කරන කඩිනමින් වන්දි ලබා දීමේ අරමුණ ගිලිහී ගොස් ඇති බව පෙනේ. මේ තත්ත්වය ගොවීන් වී වගා රක්ෂණය සඳහා අඩු දායකත්වයක් දැක්වීම සඳහා හේතු වූ එක්තරා කරුණක් වශයෙන් සැලකිය හැකිය. වන්දි ලබා දීම සඳහා මාස 3ක් හෝ 3කට වඩා වැඩි කාලයක් ගත වීම තුළින්, ගොවීන්ට තමාගේ ඊළඟ වගා කන්නය සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමේ අපහසුතාවයට මුහුණ දීමට සිදු වන අතර ඒ අනුව සාර්ථක වගා රක්ෂණ ක්‍රමයක් වීමට නම් අවම වශයෙන් මාස 2ක් ඇතුළත හෝ රක්ෂණ වන්දි ලබා දීම සිදු කළ යුතුය.

7.8.4 වගා හානි සඳහා වන්දි ලැබීම

ප්‍රමාණවත් පරිදි රක්ෂණ වන්දි නොලැබීම, වී වගා රක්ෂණය කෙරෙහි ගොවීන්ගේ අප්‍රසාදය සඳහා එක්තරා හේතුවක් ව පවතී. වගු අංක 7.33 මගින් ලැබූ වන්දි මුදලේ මධ්‍ය අගයත් එය රක්ෂණ ආවරණ මුදලේ වටිනාකමින් කිනම් ප්‍රතිශතයක් ද යන්නත් පෙන්වා දී ඇත.

වගු අංක 7.33: රක්ෂණ වන්දි ලැබීම

දිස්ත්‍රික්කය	රක්ෂණ ආවරණ මුදල (මධ්‍ය අගය) (රු.)	වන්දි මුදල (මධ්‍ය අගය) (රු.)	රක්ෂණ ආවරණ මුදලට සාපේක්ෂ ගෙවූ වන්දි මුදල %
කුරුණෑගල	15,247.74	8,332.50	55%
අනුරාධපුර	20,823.00	3,890.00	19%
පොළොන්නරුව	29,483.52	3,141.50	11%
හම්බන්තොට	20,785.71	1,733.33	8%

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත දත්තවලට අනුව, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ රක්ෂණ ආවරණ මුදලින් 50% කට වැඩි ප්‍රතිශතයක් රක්ෂණ වන්දි මුදල වශයෙන් ගෙවා ඇති අතර අනිකුත් දිස්ත්‍රික්කවල එය 20% කට වඩා අඩු ප්‍රමාණයකි.

7.8.5 වන්දි ගෙවීම සම්බන්ධයෙන් ගොවීන්ගේ තෘප්තිමත් භාවය සහ අභියාචනා

වගු අංක 7.34 මගින් වන්දි ලැබීම් සම්බන්ධයෙන් ගොවීන්ගේ තෘප්තිමත් භාවය පිළිබඳව අදහස් දක්වා ඇත. ඒ අනුව බලන විට සියලුම ගොවීන් පාහේ තමාට ලැබුන වන්දි මුදල සම්බන්ධයෙන් සෑහීමකට පත් වී නොමැති අතර ඒ පිළිබඳව අප්‍රසාදය පළ කරනු ලබයි. මේ තත්ත්වය කුරුණෑගල හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ 100% කි.

වගු අංක 7.34: ගොවීන්ගේ තෘප්තිමත් භාවය

දිස්ත්‍රික්කය	තෘප්තිමත් භාවය හා ගොවීන්ගේ ව්‍යාප්තිය (%)		එකතුව
	තෘප්තිමත්ය	තෘප්තිමත් නැත	
කුරුණෑගල	-	100	100
අනුරාධපුර	30	70	100
පොළොන්නරුව	16	84	100
හම්බන්තොට	-	100	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ගොවීන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කරන ලද්දේ ලැබෙන රක්ෂණ වන්දි මුදල අක්කරයක නිෂ්පාදන පිරිවැයෙන් 1/4 ක් හෝ ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවන බවත්, සිදු වූ වගා හානිය ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවන බවත්ය. ඔවුන් ප්‍රකාශ කරන ලද්දේ හානිය තක්සේරු කිරීමේ දී අඩුවෙන් තක්සේරු කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන බවයි. මේ තත්ත්වය ගොවීන් වගා රක්ෂණය කෙරෙහි අප්‍රසාදය පළ කිරීමට හේතුවන කරුණක් බව පෙනී යයි. කෙසේ නමුත් ගොවීන්ට තමාට ලැබුන වන්දි මුදල සම්බන්ධයෙන් එකඟ විය නොහැකි නම් හෝ ප්‍රමාණවත් නොවන්නේ නම්, රක්ෂණ මණ්ඩලය විසින් ගෙවන වන්දි මුදල පිළිබඳව දැන් වූ දින සිට දින 30ක් ඇතුළත රක්ෂණ මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවන් අභියාචනාවක් ලැබුන විට රක්ෂණ මණ්ඩලය විසින් ඒ පිළිබඳව සොයා බැලීමක් හා නැවත අධ්‍යයනයක් කරනු ලබයි. නමුත් මෙම අධ්‍යයනය තුළින් තමාගේ වන්දි මුදල ප්‍රමාණවත් නො වූව ද නැවත අභියාචනයක් ඉදිරිපත් කළ ගොවීන් වාර්තා වූයේ නැත. ඒ සඳහා ප්‍රධාන හේතුව වශයෙන් සැලකිය හැක්කේ ඔවුන් ඒ පිළිබඳව නොදැනුවත් වීමයි.

7.8.6 රක්ෂිත ගොවීන්ට ලැබෙන අනිකුත් ප්‍රතිලාභ

කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය යටතේ, තම වී වගා බිම් රක්ෂණය කරන ලද ගොවීන් අඛණ්ඩ ව කන්න හයක් එනම් අවුරුදු 3ක් තම වගාව රක්ෂණය කර ඇත්නම්, එමෙන්ම එම කාලය තුළ කිසිදු වන්දියක් ලබා ගෙන නොමැති නම්, හත්වන කන්නය සඳහා නොමිලේ රක්ෂණ ආවරණයක් සැපයේ. මේ තුළින් අපේක්ෂා කරනු ලබන්නේ වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ සහභාගීත්වය අඛණ්ඩ ව ලබා ගැනීමයි. නමුත් වගු අංක 7.35 ට අනුව එම තත්වය ඉටු වී නොමැති බව පෙනී යයි.

වගු අංක 7.35: වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ දායකත්වයේ ස්වභාවය

දිස්ත්‍රික්කය	ගොවීන්ගේ සහභාගීත්වයේ ප්‍රතිශතය		එකතුව
	අඛණ්ඩ ව	වරින්වර	
කුරුණෑගල	39%	61%	100
අනුරාධපුර	36%	64%	100
පොළොන්නරුව	49%	51%	100
හම්බන්තොට	58%	42%	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහත දත්තවලට අනුව කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ගොවීන්ගෙන් බහුතරයක් වරින් වර තම වගාව සඳහා රක්ෂණ ආවරණය ලබා ගත් ගොවීන් වේ. තමාගේ වගාව සඳහා වගා ණය අවශ්‍ය වූ විට වරින් වර රක්ෂණය ලබා ගැනීම එයට හේතුවයි. නමුත් හම්බන්තොට

දිස්ත්‍රික්කයේ ගොවීන් වැඩි ප්‍රතිශතයක් අඛණ්ඩ ව තම වගාව සඳහා රක්ෂණය ලබා ගෙන ඇත. නමුත් එසේ අඛණ්ඩ ව රක්ෂණ ආවරණය ලබා ගත් ගොවීන් පිරිස අතරින් වුවත් අතිරේක ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබූ ගොවීන් වාර්තා නොවීය.

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන වී වගා රක්ෂණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක්

8.1 හැඳින්වීම

කෘෂි රක්ෂණ මණ්ඩලය 1973දී ආරම්භ කරන ලද අතර එම කාලයේ දී සියලුම රක්ෂණ ක්‍රම සඳහා ඒකාධිකාරය රජය සතුව පැවතුණි. කෘෂිකාර්මික අංශයෙහි නොයෙකුත් ක්ෂේත්‍රයන් තුළ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ බලතල කෘෂිරක්ෂණ මණ්ඩලය සතු විය. වර්ෂ 1980 දී රක්ෂණ ව්‍යාපාරය පුද්ගලික අංශය සඳහා ද විවෘත විය. නමුත් කෘෂිකාර්මික රක්ෂණය මගින් වාණිජ මට්ටමින් ප්‍රතිලාභ ලබා ගැනීමේ ඇති හැකියාව අඩු නිසා ඒ සඳහා පුද්ගලික අංශයෙහි සහභාගීත්වයක් දක්නට නොලැබුණි. කෘෂිකාර්මික රක්ෂණය සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වය මුලින් ම දක්නට ලැබුනේ 1993දී සෙලින්කෝ රක්ෂණ සමාගම මගිනි. 1999 අංක 20 දරණ කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනත මගින් පුද්ගලික අංශය සමඟ තරඟකාරීත්වයක් ඇති කිරීම සඳහා කෘෂි ක්ෂේත්‍රය තුළ කෘෂි රක්ෂණ මණ්ඩලයේ සේවාවන් වඩාත් පුළුල් කරන ලදී.

8.2 වී වගා රක්ෂණයේ ක්‍රියාකාරීත්වය

8.2.1 පරිපාලනය

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් දිස්ත්‍රික් කාර්යාල 25ක් සහ උප කාර්යාල 5ක් ක්‍රියාත්මක කරනු ලබන අතර, එහි සංවිධාන ව්‍යුහය තුළ සංවර්ධන නිලධාරීන් 44ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් 72ක් පමණ එම කාර්යාල සඳහා අනුයුක්ත කර ඇත. නමුත් පුද්ගලික රක්ෂණ සමාගමෙහි සංවිධාන ව්‍යුහය තුළ සියලුම කෘෂිරක්ෂණ කටයුතු සිදු කරනු ලබන්නේ කාර්මික සහායකයින් (Technical Assistants) 16 දෙනෙකු පමණි.

8.2.2 රක්ෂිත වගා බිම් ප්‍රමාණය

සටහන 8.1න් දැක්වෙන පරිදි 1975 සිට 1990 අග භාගය දක්වා කාලය තුළ කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් රක්ෂණය කරන ලද වී වගා බිම් ප්‍රමාණය සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතුණි. නමුත් 1993 සිට 2000 දක්වා කාලය තුළ පුද්ගලික අංශයෙහි වී වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ දායකත්වය සාපේක්ෂ ව අඩු මට්ටමක පැවතුණි. වී වගා රක්ෂණය සඳහා පුද්ගලික අංශයෙහි දායකත්වය සමඟ ගොවීන්ගේ වැඩි සහභාගීත්වයක් අපේක්ෂා කළ ද, වී වගා සඳහා රක්ෂණය කරන ලද මුළු බිම් ප්‍රමාණය සැලකීමේ දී කැපී පෙනෙන අඩුවීමක් 90 දශකයේ මුල් කාලයේ සිට දක්නට ලැබුණි. කෙසේ වුව ද වර්ෂ 2000න් පසුව පුද්ගලික අංශය තුළ රක්ෂිත වී වගා බිම් ප්‍රමාණයෙහි වර්ධනයක් දක්නට ලැබුණු නමුත් කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ රක්ෂණය කරන ලද මුළු වගා බිම් ප්‍රමාණයෙහි අඩු වීමක් පෙන්නුම් කරයි. 2000/01 මහ කන්නයේ සිට 2005 යල කන්නය දක්වා කාලය තුළ රක්ෂණය කරන ලද මුළු වගා බිම් ප්‍රමාණය සැලකීමේ දී පුද්ගලික අංශය තුළ රක්ෂණය කරන ලද බිම් ප්‍රමාණය කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් රක්ෂිත බිම් ප්‍රමාණයට වඩා සාපේක්ෂ ඉහළ මට්ටමක පැවති අතර 2002/03 මහ කන්නයෙහි සහ 2005 යල කන්නයේ දී පමණක් කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ රක්ෂිත වගා බිම් ප්‍රමාණය පුද්ගලික අංශයට සාපේක්ෂ ව ඉහළ මට්ටමක පැවතුණි.

සටහන 8.1: කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් රක්ෂණය කරන ලද මුළු වී වගා බිම් ප්‍රමාණය



ගොවීන්ගේ වැඩි සහභාගීත්වයක් සෙලින්කෝ රක්ෂණ සමාගම තුළ දක්නට ලැබෙන හෙයින් එම රක්ෂණ ක්‍රමය කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ ක්‍රමවේදයට සාපේක්ෂ ව සාර්ථක වී ඇත. එසේ ම ඔවුන් 16 දෙනෙකුගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩලයක් මගින් තම රක්ෂණ කටයුතු ව්‍යාප්ත කරනු ලබයි.

සෙලින්කෝ රක්ෂණ සමාගම තුළ කෘෂිරක්ෂණය සඳහා ගොවීන්ගේ දායකත්වය සපයා ගනු ලබන්නේ, බැංකු මගින් වගා ණය ලබා දීමේ වැඩ පිළිවෙළ හරහාය. නමුත් කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය තුළ කෘෂි රක්ෂණය සඳහා කැමැත්තෙන් දායක වන ගොවීන් කොටසක් ද සිටින අතර වගුව 8.1 න් දැක්වෙන පරිදි එය 4% ක ප්‍රතිශතයකි. 96% ක් පමණ ගොවීන් බැංකු මගින් වගා ණය ලබා ගැනීම මගින් රක්ෂණයට දායක වේ.

වගු අංක 8.1: වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ සහභාගීත්වයට බලපාන හේතු

රක්ෂණ ක්‍රමය	රක්ෂණයට දායක වීම සඳහා බලපෑ හේතු ප්‍රතිශතයක් ලෙස	
	වගා ණය ලබාගැනීම සඳහා	ස්වභාවික විපත් සඳහා
කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය	96%	4%
සෙලින්කෝ රක්ෂණ සමාගම	100%	-

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

8.2.3 දළ හානි දර්ශකය (Gross Loss Ratio)

වගුව 8.2 න් දැක්වෙන පරිදි 1994/95 මහ කන්නයේ සිට 2004/05 මහ කන්නය දක්වා අවු. 10 ක කාලය තුළ කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයෙහි දළ හානි දර්ශකය සැලකීමේ දී එය 1 කට වඩා වැඩි වන අවස්ථා කන්න 4 ක් තුළ දක්නට ලැබුණි. එනම්, ගෙවන ලද වන්දි ප්‍රමාණය වාරික ප්‍රමාණයට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන ඇත. නමුත් සෙලින්කෝ රක්ෂණ සමාගමෙහි එම හානි දර්ශක අගය 1ට වඩා වැඩිවන අවස්ථා දක්නට ලැබෙන්නේ 2003/04 මහ කන්නයේ දී පමණි. දළ හානි දර්ශක අගය 1ට අඩුවෙන් පවත්වා ගැනීම රක්ෂණ ආයතනයකට වැදගත් වේ. 2003/04 මහ කන්නයේ දී හානි දර්ශකය, සෙලින්කෝ රක්ෂණ සමාගම සඳහා 2.2 ක් වශයෙන් ද, කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා 1.3ක් ද වශයෙන් සටහන් විය. එයට හේතුව 2003/04 මහ කන්නයේ පැවති නියං සහිත කාලගුණික තත්ත්වයයි.

වගු අංක 8.2: කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන වී වගා රක්ෂණයෙහි දළ හානි දර්ශක අගයන් සැසඳීම

කන්නය	කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයෙහි දළ හානි දර්ශක අගයන්	සෙලින්කෝ රක්ෂණ මණ්ඩලයෙහි දළ හානි දර්ශක අගයන්
1994/95 මහ	0.7	0.5
1995 යල	0.5	0.4
1995/96 මහ	1.4	0.7
1996 යල	0.7	NA
1996/97 මහ	0.6	0.3
1997 යල	0.6	NA
1997/98 මහ	0.2	0.6
1998 යල	1.8	0.3
1998/99 මහ	0.8	0.7
1999 යල	0.5	0.4
1999/2000 මහ	0.7	0.5
2000 යල	0.3	0.6
2000/01 මහ	1.6	0.8
2001 යල	0.3	0.6
2001/02 මහ	0.7	0.5
2002 යල	0.9	0.7
2002/03	0.9	0.5
2003 යල	0.4	0.2
2003/04 මහ	2.2	1.3
2004 යල	0.5	0.3
2004/05 මහ	0.8	0.5

මූලාශ්‍රය: AAIB සහ සෙලින්කෝ රක්ෂණ සමාගම
NA = දත්ත නොමැත

8.2.4 රක්ෂණ වාරික ප්‍රමාණය සහ රක්ෂණ ආවරණය

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් රක්ෂණ වාර මුදල සහ ආවරණ වටිනාකම තීරණය කිරීමේ දී මහා වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වාර්පෝෂිත ලෙස වාර් ක්‍රමය පදනම් කර ගනු ලබයි. එසේ ම අවදානම් මට්ටම ද (ඉහළ, මධ්‍යම සහ සුළු අවදානම් ලෙස) පදනම් කර ගනු ලබයි. ඊට අමතර ව සාමාන්‍ය රක්ෂණ ක්‍රමය යටතේ නියමිත වාරික ප්‍රමාණය සහ රක්ෂණ ආවරණ ප්‍රමාණයක් පවතින අතර, බිත්තර වී නිෂ්පාදනය සහ යාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විශේෂ රක්ෂණ ආවරණයක් සහ වාරික ප්‍රමාණයක් ඇතුළත් රක්ෂණ ක්‍රමයක් ලෙස රක්ෂණ ක්‍රම 2 ක් ක්‍රියාත්මක කරනු ලබයි. නමුත් සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන්නේ එක් රක්ෂණ ක්‍රමයක් පමණක් වන අතර එය වාරික්‍රමය සහ අවදානම් මට්ටම අනුව වර්ග කිරීමක් නොමැත. නමුත් එම රක්ෂණ ආයතන දෙක මගින් මහවැලි ප්‍රදේශ සඳහා විශේෂ රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලබයි.

වගු අංක 8.3 මගින් කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් සහ සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ ආවරණය සඳහා වන උපරිම සහ අවම ආවරණ ප්‍රමාණය ද, වාරික ප්‍රමාණයන් සඳහා වන උපරිම සහ අවම වාරික ප්‍රමාණය ද දක්වා ඇත.

වගු අංක 8.3: රක්ෂණ ආවරණ ප්‍රමාණය සහ වාරික ප්‍රමාණයන් සැසඳීම

රක්ෂණ ක්‍රමය	රක්ෂණ ආවරණය (අක්කරයකට රුපියල්)		වාරික ප්‍රමාණය (අක්කරයකට රුපියල්)	
	උපරිම ආවරණ වටිනාකම	අවම ආවරණ වටිනාකම	උපරිම ආවරණ වටිනාකම	අවම ආවරණ වටිනාකම
AAIB (සාමාන්‍ය රක්ෂණ ක්‍රමය)	6,000/=	1,000/=	300/=	100/=
AAIB (විශේෂිත රක්ෂණ ක්‍රමය)	15,000/=	5,000/=	750/=	300/=
සෙලින්කෝ රක්ෂණ සමාගම	30,000/=	5,000/=	2,400/=	300/=

මූලාශ්‍රය: AAIB සහ සෙලින්කෝ රක්ෂණ සමාගම

මහා වාරි ක්‍රම යටතේ කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් අක්කරයකට රු. 6,000/= ක උපරිම ආවරණ මට්ටමක් ලබා දෙන අතර වාර්පෝෂිත තත්ත්වය යටතේ වැඩි අවදානම් ප්‍රදේශ සඳහා අක්කරයකට රු. 1,000/= ක අවම ආවරණයක් ලබා දේ. නමුත්, සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් සියලුම ඉඩම් වර්ගීකරණයන් සඳහා පොදු වූ රක්ෂණ ආවරණ ප්‍රමාණයන් සහ වාරික ප්‍රමාණයන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ ආවරණ වටිනාකම අක්කරයකට රු. 5,000/= සිට රු.30,000/= ක් අතර අගයක් ගනී.

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ වාරික මුදල් ප්‍රමාණය අවදානම් අඩු ප්‍රදේශ සඳහා අක්කරයකට රු.300/= ක් ද අවදානම් වැඩි වාර්පෝෂිත ප්‍රදේශ සඳහා අක්කරයකට රු.100/= ක් ද වේ.

එසේම, විශේෂ රක්ෂණ ක්‍රමය යටතේ රු.750/= ක උපරිම වාරික ප්‍රමාණයක් ද, අක්කරයකට රු.300/= ක අවම වාරික මුදල් ප්‍රමාණයක් ද ලෙස ක්‍රියාත්මක වේ. නමුත් සෙලින්කෝ රක්ෂණ සමාගම මඟින් අක්කරයකට රු.2,400/= ක උපරිම වාරික ප්‍රමාණයක් ද අක්කරයකට රු.300/= ක අවම වාරික ප්‍රමාණයක් ද ක්‍රියාත්මක කරනු ලබයි.

ඉහතින් විස්තර කළ පරිදි රක්ෂණ ආයතන 2 මඟින් ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණ ආවරණ ප්‍රමාණයෙහි සහ වාරික ප්‍රමාණයෙහි කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබේ.

8.3 වී වගා රක්ෂණය සඳහා ගොවීන්ගේ සහභාගීත්වය

8.3.1 වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත් භාවය

හයවන පරිච්ඡේදයෙන් විස්තර කළ පරිදි, තෝරාගත් මුළු රක්ෂිත ගොවීන්ගේ නියැදියෙන් හරි අඩකට වැඩි පිරිසක් රක්ෂණය වී තිබුණේ ඒ පිළිබඳව කිසිදු දැනුවත් භාවයකින් තොරවය. වගුව 8.4 මඟින් වගා රක්ෂණය පිළිබඳව දැනුවත් වූ ගොවීන් ඒ පිළිබඳව දැනුවත් වීමේ මාර්ගයන් විස්තර කරනු ලබයි.

වගු අංක 8.4: රක්ෂණය පිළිබඳව දැනුවත් භාවය ලබා ගත් මාර්ගයන්

දැනුවත් භාවය ලබා ගත් ක්‍රමය	කෘ.ගො.ර.ම. තුළ රක්ෂණය වූ ගොවීන්	සෙලින්කෝ රක්ෂණ සමාගම තුළ රක්ෂණය වූ ගොවීන්	එකතුව
රක්ෂණ නිලධාරී	57	22	79
මාධ්‍ය	5	1	6
බැංකු	42	32	74
අනෙකුත් ගොවීන්	15	6	21
කෘෂිකර්ම නිලධාරී	2	0	2
ගොවි නියාමක	2	0	2
මහවැලි නිලධාරී	1	1	2
අනෙකුත්	6	4	10

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

වගුව 8.4 න් දැක්වෙන පරිදි රක්ෂණ ආයතන 2 සඳහා වැඩි ම ගොවීන් පිරිසක් රක්ෂණය පිළිබඳ දැනුවත් භාවය ලබාගෙන ඇත්තේ රක්ෂණ නිලධාරීන් මඟින් සහ බැංකු හරහාය. කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ රක්ෂණය වූ ගොවීන් බහුතරයක් (57 දෙනෙකු) රක්ෂණය පිළිබඳ දැනුවත් භාවය ලබාගෙන ඇත්තේ රක්ෂණ නිලධාරීන් ගෙනි. නමුත්, සෙලින්කෝ රක්ෂණ සමාගම තුළ රක්ෂණය වූ ගොවීන්ගෙන් වැඩි පිරිසක් (32 දෙනෙකු) රක්ෂණය පිළිබඳ දැනුවත් වී ඇත්තේ වගා ණය ලබා ගැනීමේ දී බැංකු හරහාය.

8.3.2 හානි දැනුම් දීම

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය තුළ රක්ෂණය වී සිටින අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් 46%ක ප්‍රමාණයක් තම වගා හානි පිළිබඳ වාර්තා කර ඇත්තේ ගොවිජන සේවා මධ්‍යස්ථානවලටය. එසේම 39%ක ගොවීන් ප්‍රමාණයක් මහවැලි නිලධාරීන්ට එය වාර්තා කොට ඇත. නමුත්, සෙලින්කෝ රක්ෂණ සමාගම යටතේ රක්ෂණය වූ ගොවීන්ගෙන් වැඩි පිරිසක් එනම්

අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් 39% ක ප්‍රමාණයක් වගා හානි පිළිබඳ දැනුම් දී ඇත්තේ බැංකු වලටය. එයට හේතුව දිස්ත්‍රික්ක මට්ටමින් ඔවුන්ගේ නිලධාරීන් අනුයුක්ත කර නොමැති වීමත්, රක්ෂණය වී ඇත්තේ වගා ණය ලබා ගැනීමේ දී වන නිසාත් ඔවුන් බැංකු වෙත වගා හානි දැනුම් දීමට පෙළඹී සිටී.

වගු අංක 8.5: රක්ෂණ ක්‍රම 2 යටතේ රක්ෂිත ගොවීන් වගා හානි පිළිබඳ දැනුම් දීම

වගා හානි පිළිබඳ දැනුම් දීම	AAIB (%)	සෙලින්කෝ රක්ෂණ සමාගම (%)
ගොවිජන සේවා මධ්‍යස්ථාන	46	28
මහවැලි නිලධාරීන්	39	22
බැංකු	4	39
රක්ෂණ නිලධාරීන්	11	11
එකතුව	**100**	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

8.3.3 වගා සඳහා ණය ලබා ගැනීමේ මූලාශ්‍ර

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ රක්ෂණ ක්‍රමවේදය තුළ අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගෙන් බහුතරයක් එනම් 85% ක පමණ ප්‍රමාණයක් සිය වගා කටයුතු සඳහා අවශ්‍ය ණය මුදල් රාජ්‍ය බැංකු මගින් ලබා ගෙන ඇත. එයට හේතුව එම රක්ෂණ ආයතන රාජ්‍ය බැංකු හරහා කෘෂි රක්ෂණය ව්‍යාප්ත කර තිබීමයි. නමුත් සෙලින්කෝ රක්ෂණ සමාගම තුළ රක්ෂණය වූ ගොවීන්ගෙන් 53% ක ප්‍රමාණයක් පුද්ගලික බැංකු මගින් වගා ණය ලබා ගෙන තිබූ අතර රාජ්‍ය බැංකු මගින්ද ණය ලබා ගැනීම 47% ක් විය. එමගින් පෙන්නුම් කරනු ලබන්නේ එම රක්ෂණ සමාගම මගින් පුද්ගලික සහ රාජ්‍ය යන බැංකු දෙවර්ගයෙහි ම තම රක්ෂණ කටයුතු ව්‍යාප්ත කර තිබීමයි.

වගු අංක 8.6: රක්ෂණ ක්‍රම 2 යටතේ වගා ණය ලබා ගැනීමේ මූලාශ්‍ර

රක්ෂණ ක්‍රමය	ණය ලබා ගැනීමේ මූලාශ්‍රයන් (%)		
	රාජ්‍ය බැංකු	පුද්ගලික බැංකු	අනෙකුත්
කෘ.ගො.ර.ම	85	13	2
සෙලින්කෝ රක්ෂණ සමාගම	47	53	-

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

8.3.4 වන්දි ගෙවීම

රක්ෂණ ක්‍රම දෙක යටතේ ම 46% ක ගොවීන් පිරිසක් වගා හානි පිළිබඳ දැනුම් දී ඇත. සෙලින්කෝ රක්ෂණ සමාගම මගින් ගොවීන්ගෙන් 32% ක් සඳහා වන්දි ලබා දී ඇති අතර කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් ගොවීන්ගෙන් 23%කට පමණ වන්දි ලබා දී ඇත. මෙමගින් පෙන්නුම් කරනු ලබන්නේ පුද්ගලික අංශයෙහි වන්දි ගෙවීමේ වැඩ පිළිවෙළ වඩා සාර්ථක බවයි.

වගු අංක 8.7: රක්ෂණ ආයතන 2 යටතේ වගා හානි සඳහා වන්දි ගෙවීම

අදාල තොරතුරු	රක්ෂණ ක්‍රමය	
	AAIB	සෙලින්කෝ රක්ෂණ සමාගම
රක්ෂණය වූ ගොවීන් සංඛ්‍යාව	210	95
හානි දැනුම් දුන් සංඛ්‍යාව	97	44
හානි දැනුම් දීම ප්‍රතිශතයක් ලෙස	46%	46%
වන්දි ලබා ගත් ගොවීන් සංඛ්‍යාව	22	14
වන්දි ලබා ගැනීම හානි දැනුම් දුන් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස	23%	32%

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

8.3.5 වන්දි ගෙවීමේ ක්‍රමය

වගු අංක 8.8න් දැක්වෙන පරිදි ගොවීන්ගෙන් බහුතරයක් තම වන්දි මුදල් ලබා ගෙන ඇත්තේ බැංකු හරහාය. එය අධ්‍යයනයට අනුව, සෙලින්කෝ රක්ෂණ සමාගම තුළ රක්ෂිත ගොවීන්ගෙන් 96% ක් සහ කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය තුළ රක්ෂණය වූ ගොවීන්ගෙන් 84% ක් විය. ඊට අමතරව ගොවීන් සමහරක් ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් සහ චෙක්පත් මඟින් වන්දි මුදල් ලබා ගෙන ඇත.

වගු අංක 8.8: රක්ෂණ ආයතන 2 යටතේ රක්ෂණය වූ ගොවීන් වන්දි ලබා ගැනීමේ මාර්ගයන්

වන්දි ලබා ගැනීමේ මාර්ගය	ගොවීන් සංඛ්‍යාව (%)	
	AAIB	සෙලින්කෝ රක්ෂණ සමාගම
චෙක්පත් මඟින්	7	-
ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින්	9	-
බැංකු මඟින්	84	96
අනෙකුත්	-	4
මුළු එකතුව	100	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

8.3.6 වන්දි ලබා ගැනීමට ගත වන කාලය

කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය තුළ රක්ෂණය වූ ගොවීන්ගෙන් 46% ක ප්‍රමාණයක් වන්දි මුදල් ලබා ගෙන ඇත්තේ මාස 3කට වැඩි කාලයක් ගත වූ විටය. එසේම ගොවීන් 33%ක් පමණ මාස 2ක් ඇතුළත වන්දි මුදල් ලබා ගෙන ඇත. නමුත්, සෙලින්කෝ රක්ෂණ සමාගම යටතේ රක්ෂණය වූ ගොවීන්ගෙන් 60% ක් පමණ වගා හානි දැනුම් දී මාසයක් හෝ මාස 2ක් ඇතුළත වන්දි මුදල් ලබා ගෙන ඇත. වන්දි මුදල් ලබා ගැනීමේ කාලය දිර්ඝ වූ විට ගොවීන්ට තමාගේ ඊළඟ කන්නය වගා කිරීම සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමේ දුෂ්කරතාවයට මුහුණ දෙන නිසා, සාර්ථක වගා රක්ෂණ වැඩ පිළිවෙළක දී අවම වශයෙන් මාස 2ක් ඇතුළත හෝ රක්ෂණ වන්දි මුදල් ලබා දිය යුතුය. එබැවින් පුද්ගලික රක්ෂණ සමාගම වන්දි ලබා දීම රාජ්‍ය අංශයට සාපේක්ෂ ව කාර්යක්ෂම වේ.

වගු අංක 8.9: රක්ෂණ ක්‍රම 2 යටතේ වන්දි ලබා ගැනීමට ගත වන කාලය

රක්ෂණ ක්‍රමය	වන්දි ලබා ගැනීමට ගත වූ කාලය (%)			
	මාස 1	මාස 2	මාස 3	මාස 3 ට වැඩි
AAIB	7	33	14	46
සෙලින්කෝ රක්ෂණ සමාගම	20	40	25	15

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

8.3.7 ගොවියන්ගේ තෘප්තිමත්භාවය

රක්ෂණ ක්‍රම 2 යටතේ ම අධ්‍යයනයට ලක් කරන ලද ගොවීන්ගෙන් සැලකිය යුතු පිරිසක් වන්දි ලබා ගැනීම පිළිබඳ සෑහීමකට පත් වී නොමැත. එසේ ම, අධ්‍යයනයට ලක් කළ ගොවීන් වගා හානි වලට මුහුණ දී ඇත්තේ අඩුවෙනි.

වගු අංක 8.10: රක්ෂණ ක්‍රම 2 යටතේ වන්දි ලබා දීම පිළිබඳ ගොවීන්ගේ තෘප්තිමත්භාවය

රක්ෂණ ක්‍රමය	ගොවියන්ගේ තෘප්තිමත් භාවය (%)		
	ඔව්	නැත	වාර්තා වී නොමැත
AAIB	3	21	76
සෙලින්කෝ රක්ෂණ සමාගම	7	25	68

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත HARTI, 2006

ඉහතින් විස්තර කරන ලද කරුණුවලට අමතර ව පොදුවේ සැලකූ විට සෙලින්කෝ රක්ෂණ සමාගම යටතේ රක්ෂණය වීම සහ ඔවුන් සමඟ ගනුදෙනු කිරීම වඩාත් පහසු බව ගොවීන්ගේ අදහසයි. එමඟින් පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන් පුද්ගලික අංශයේ රක්ෂණ ක්‍රමය පිළිබඳ ව දක්වන තෘප්තිමත්භාවය කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ රක්ෂණ ක්‍රමයට සාපේක්ෂ ව ඉහළ බවයි.

කෘෂිකර්ම රක්ෂණය සඳහා සහභාගීවන පාර්ශවයන් මුහුණ පාන ගැටලු සහ ඔවුන්ගේ යෝජනා

9.1 පසුබිම

සුළු පරිමාණ ගොවීන් විසින් මුහුණ දෙනු ලබන අවදානම් කාරී තත්ත්වයන් අවම කිරීමේ අරමුණින් 1973 වර්ෂයේ දී කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය ස්ථාපිත කරන ලදී. පසු කාලීනව පෞද්ගලික අංශය ද මෙම විෂය ක්ෂේත්‍රයට අවතීර්ණ විය. කෘෂිකර්ම රක්ෂණ ව්‍යාපෘතීන් හි අසාර්ථකත්වය, මෙම රක්ෂණ ව්‍යාපෘතීන් සඳහා දායක වී ඇති ගොවීන් ගේ සංඛ්‍යාවෙන්ම පැහැදිලි වේ. එබැවින්, කෘෂිකර්ම රක්ෂණ ව්‍යාපෘතීන් සඳහා පවතින මෙම අඩු දායකත්වයට හේතු වූ කරුණු පිළිබඳ මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කිරීමට උත්සාහ කෙරේ. මෙම පරිච්ඡේදය වෙන් වන්නේ කෘෂිරක්ෂණය හා සම්බන්ධ වී ඇති මෙම ආයතන දෙකෙහි ක්‍රියාකාරිත්වයේ දී මුහුණ පා ඇති ගැටලු සහ දුෂ්කරතාවන් පිළිබඳ වූ විග්‍රහයකට වේ.

9.2 ගොවීන්ගේ දෘෂ්ටිකෝණයට අනුව කෘෂි රක්ෂණය පිළිබඳ ගැටලු හා ඔවුන්ගේ යෝජනා

පසුගිය දශක තුනක කාලයක සිට ප්‍රධාන වශයෙන් වී වගාවටත්, පශු සම්පත් නිෂ්පාදනයටත් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ ආවරණය ලබා දී ඇත. කෙසේ වෙතත්, මෙම ක්ෂේත්‍රයන් දෙක සම්බන්ධයෙන් ම පැන නැගී ඇති ගැටලු නිසා රක්ෂණ ආයතන දෙක මඟින් ම ලබා දී ඇති රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳව ගොවීන් සෑහීමකට පත් වී අතර ඒ පිළිබඳ ඔවුන් තුළ එතරම් ධනාත්මක ආකල්පයක් නොමැත. අධ්‍යයනයේදී ගොවීන් විසින් ලබා දී ඇති තොරතුරු සහ පෙන්වා දුන් ගැටලු පෙළ ගැස් වූ ආකාරයට ම මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡාවට බඳුන් වේ (ඇමුණුම 4 මඟින් දක්වා ඇති ආකාරයට ගොවීන් මෙම ගැටලු පෙළ ගස්වන ලදී).

නියැදියේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 17%ක් ම මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වන්නේ තමා විසින් ගෙවනු ලබන වාරිකයට ප්‍රතිලාභ නොලැබීමයි. භෝග රක්ෂණ ගිවිසුම අනුව, වගා පාළු ඇස්තමේන්තු කිරීමේ කමිටුවට අදාළ ගොවි මහතා ද ඇතුලත් වේ. නමුත් බොහෝ අවස්ථාවල දී ප්‍රායෝගිකව එසේ සිදු නොවේ. එම නිසා රක්ෂණ ආවරණය නොලැබීමට හේතු මොනවාද යන්න පිළිබඳව අදාළ ගොවි මහතා දැනුවත් වන්නේ නැත.

නියැදියෙන් 16%ක් පමණ ගොවීන් සංඛ්‍යාවක් කෘෂිකර්ම රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමේ දුර්වලතාය ගැන වාර්තා කරන ලදී. ඒ පිළිබඳව ඉහළ ම ප්‍රතිශතය වාර්තා කරනු ලැබුවේ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙනි. තුලනාත්මක දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා ප්‍රමාණවත් ක්ෂේත්‍ර නිලධාරීන් සංඛ්‍යාවක් කෘෂිකර්ම සංවර්ධන මණ්ඩලය සතුව නොමැති බව දක්වයි. එම නිසා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් මාර්ගයෙන් මෙය ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය බලාපොරොත්තු වේ.

අධ්‍යයනයට භාජනය කළ නියැදියෙන් 16%ක් පමණ වාර්තා කරනු ලැබුවේ ලැබෙන රක්ෂණ අවරණය, නිෂ්පාදන පිරිවැය හා රක්ෂණ ගිවිසුමේ ඇති ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාණවත් නොවන බවයි. අධ්‍යයනයට අනුව වී අක්කරයක් වගා කිරීම සඳහා රු.21,000/= සිට රු.25,000/= අතර පිරිවැයක්

දැරීමට සිදු වේ. කෙසේ වෙතත් සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ලබා ගත හැකි රක්ෂණ ආවරණය අක්කරයක් සඳහා රු.6,000/= කි. බීජ නිෂ්පාදනයේ දී එය රු.15,000/=ක් හා විශේෂ ව්‍යාපෘතිවල දී එය රු.10,000/= කි. තව ද රක්ෂණ ආවරණය හානියට පත් වූ භෝග වගාවේ අවස්ථාව අනුව වෙනස් වේ. වගා හානියෙන් 20%ක් පරිපාලන වියදම් වශයෙන් අඩුකර ගනී. තව ද වගා හානි ඇස්තමේන්තු කිරීමේ නිර්ණායක අනුව භෝග වගාවේ අවධිය හා අක්කරයකින් ලබා ගත හැකි සාමාන්‍ය අස්වැන්න මත රක්ෂණ ආවරණය වෙනස් වේ. බොහෝ අවස්ථාවල දී රක්ෂණ ආවරණය ඇස්තමේන්තු කිරීම සඳහා පාදක කරගනු ලබන සම්මත අස්වැන්න ප්‍රදේශයේ පවතින අස්වැන්නට වඩා අඩු වේ. වගා හානිය ඇස්තමේන්තු කරනු ලබන්නේ පියවි ඇසින් නිරීක්ෂණය කිරීමෙනි. වගාවේ පළමු හා දෙවන වගා අවධියේ දී වගා හානි ඇස්තමේන්තු කළ ද රක්ෂණ ආවරණය ලැබෙනුයේ මාස දෙක තුනක් ඉක්මවා යාමෙන් අනතුරුව වගාවේ අවසාන භාගයේ දී ය.

ඉහත සඳහන් හේතුවලට අතිරේකව, සමීක්ෂණයට ලක් වූ සියලුම දිස්ත්‍රික්කවල ගොවීන් පහත සඳහන් වන ගැටලුවලට මුහුණ පා සිටි බව අනාවරණය විය.

i. කෘෂිකර්ම රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අනුයුක්ත කර සිටි නිලධාරීන්ගේ ආකාර්යක්ෂමතාවය.
ii. මූලික අවස්ථාවේ දී සිදුවන හානි තක්සේරු කිරීම ප්‍රමාද වීම නිසා නැවත වගා කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීම.
iii. කෘෂිකර්ම රක්ෂණ ගිවිසුමේ වගන්තිවලට අනුකූලව වගා කටයුතු සිදු කිරීමට නොහැකි වීම.
iv. සුළු පරිමාණ හානි ඇස්තමේන්තු නොකිරීම.
v. වගා හානි සඳහා ලබාදෙන අවරණ ප්‍රතිලාභ ප්‍රමාද වීම නිසා බැංකුවලට ගෙවීමට ඇති පොලී ප්‍රමාණය වැඩි වීම.
vi. කෘෂිකර්ම රක්ෂණ ආයතන සහ ගොවීන් අතර සෘජු සම්බන්ධතාවක් නොතිබීම.
vii. සත්ව හානි සඳහා වගා රක්ෂණ ආවරණ ලබා ගැනීම අපහසු වීම.
viii. වගා හානි සඳහා ලබාදෙන අවරණ ප්‍රතිලාභ ප්‍රමාද වීම නිසා බැංකුවලට ගෙවීමට ඇති පොලී ප්‍රමාණය වැඩි වීම.
ix. අස්වනු සමයේ සිදු වන වගා හානි තක්සේරු කිරීම නොසලකා හැරීම.
x. වගා හානි අයදුම් කිරීම සඳහා ගොවීන් විසින් ඉදිරිපත් කළ යුතු අයදුම්පත් සංකීර්ණ වීම නිසා සම්පූර්ණ කිරීම අපහසු වීම.

තවද, සෑම ප්‍රදේශයක ම ගොවීන් වගා රක්ෂණ ක්‍රමයට සම්බන්ධ වීමට පෙර වගා ණය ලබාගන්නේ ද යන්න තීරණය කරයි. වගා හානි ආවරණය ලබා දීම පිළිබඳ තොරතුරු (නියඟයෙන් වන හානි කෘමීන් විසින් හානි සිදුකිරීම සහ ලෙඩරෝග මඟින් හානි සිදුකිරීම ආදී වශයෙන්) පිළිබඳව සමහර ගොවීන් දැනුවත් වී නොමැත. නිලධාරීන් විසින් වගා රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කරනු ලබන්නේ පෙර කන්න රැස්වීමේ දී පමණි. නමුත් ක්ෂේත්‍ර මට්ටමේ දී කෘෂිරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමක් සිදු වන්නේ නැත. පෙර කන්න රැස්වීම සඳහා සහභාගී වන ගොවීන් සංඛ්‍යාව ප්‍රදේශයේ මුළු කෘෂි ජනගහනයෙන් 15% කට වඩා අඩුය. තව ද රක්ෂණ වාරිකය ලබාගැනීමෙන් අනතුරුව වගා රක්ෂණය හා සම්බන්ධ නිලධාරීන් සහ ගොවීන් අතර සම්බන්ධීකරණය ඉතාම සීමිතය.

9.3 කෘෂිකර්ම රක්ෂණ ආයතන මුහුණ පාන ගැටලු

කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් ඔවුන්ගේ කෘෂිකර්ම රක්ෂණ වැඩසටහන ක්ෂේත්‍ර මට්ටමේ දී ක්‍රියාත්මක කරනු ලබන්නේ, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් හරහා ය. මොවුන් වෙනත් දෙපාර්තමේන්තුවකට අනුයුක්ත කර ඇති නිලධාරීන් පිරිසක් වන අතර කෘෂිකර්ම රක්ෂණය පිළිබඳ රාජකාරි කටයුතු ඔවුන්ගේ රාජකාරි ලැයිස්තුවට ඇතුළත් ව නොමැති බැවින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය බලාපොරොත්තුවන ආකාරයේ ඉහළ සේවාවක් ලබා දීමට නොහැකි වී තිබේ. ගොවි සහභාගීත්වය ඉතා අඩු මට්ටමක පවතින නිසා වගා හානි තක්සේරු කිරීම පිළිබඳ විනිවිදභාවයක් නැත. ඊට අතිරේක ව, සමහර ප්‍රදේශවල දේශපාලන මැදිහත් වීම් සහ නිලධාරීන්ගේ අක්‍රමිකතා පවතී. ගොවි ප්‍රජාව තුළ කෘෂිකර්ම රක්ෂණ අධිකාරිය පවත්වාගෙන යන සන්නිවේදන ක්‍රමයෙහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ අධික පිරිවැයක් දැරීමට සිදු වීමයි. එම නිසා ප්‍රචාරණය බොහො දුරට සීමා වී ඇත.

කෘෂිකර්ම රක්ෂණ අධිකාරි පනත මගින් එම ආයතනයේ අවදානම අවම කර ගැනීම සඳහා ප්‍රති රක්ෂණ වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන සපයා ඇත. නමුත් කිසිම රක්ෂණ සමාගමක් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය වෙනුවෙන් ප්‍රතිරක්ෂණයක් ලබා දීමට ඉදිරිපත් වී නැත. ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙළක් නොමැතිව පවත්වාගෙන යන කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ අනාගතය අභියෝගාත්මක අවදානමක පවතී. කෙසේ වෙතත් පෞද්ගලික අංශයේ ඉදිරියෙන් සිටින සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම වැනි ආයතන ප්‍රති-රක්ෂණ ආවරණයක් යටතේ ඔවුන්ගේ රක්ෂණ වැඩසටහන් පවත්වා ගෙන යනු ලැබේ.

කෘෂිකර්ම රක්ෂණ වැඩසටහන් කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ ම කොටසකි. නමුත් ක්ෂේත්‍ර මට්ටමේ දී අදාළ අනෙකුත් දෙපාර්තමේන්තු කෘෂිකර්ම රක්ෂණ වැඩසටහන් සඳහා ඒකාබද්ධ වීමක් නොදක්වයි. කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය සඳහා ප්‍රමාණවත් ක්ෂේත්‍ර නිලධාරීන් නොමැති නිසා වෙනත් අදාළ දෙපාර්තමේන්තුවක නිලධාරීන් මත යැපීමට සිදු ව තිබේ. ගොවිජන සේවා මධ්‍යස්ථාන 546 ක් සඳහා නිලධාරීන් (ක්ෂේත්‍ර නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන්) 116 ක් මත යැපීමට සිදු වී තිබේ. කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය, කෘෂිකර්ම රක්ෂණ ක්ෂේත්‍රය මෙහෙයවන්නා මෙන් ම කෘෂිකර්ම රක්ෂණ සේවාව ලබා දෙන ව්‍යාපාරික අරමුණින් යුතු ව්‍යවසායකයෙකු බවට ආකල්පමය වෙනසක් අවශ්‍යයෙන් ම සිදු කළ යුතු වේ. පෞද්ගලික අංශය, රක්ෂණ ව්‍යාපාරය සඳහා යොමු වීමත් සමඟ ණය නිලධාරීන් ඔවුන්ගේ සේවාවන් සඳහා ප්‍රතිලාභ ලබාදෙනු ලැබේ. එම නිසා ඉහළ සේවාවක් ලබාදීම සඳහා ඔවුන් පෞද්ගලික අංශය උනන්දු කරනු ලැබේ. වර්තමානයේ දී සමහර රාජ්‍ය සහ පෞද්ගලික බැංකු රක්ෂණ ආවරණයකින් තොරව වගා ණය නිකුත් කරනු ලැබේ. ලංකා බැංකුව මගින් "රන් ගොවි ගිණුම" නමින් විශේෂ ඉතුරුම් ක්‍රමයක් හඳුන්වා දෙමින් වගා ණය ලාබ දීම සිදු කරයි. තව ද රජරට බැංකුව ද වගා ණය නිකුත් කිරීමේ දී වගා රක්ෂණ ණය පූර්ව කොන්දේසියක් ලෙස දක්වා නැත. වගා රක්ෂණ ක්‍රමය හා වගා ණය ලබා දීම අතර ඇති සම්බන්ධතාවය පවත්වා ගෙන යාම සඳහා මෙම ප්‍රවණතාව යහපත් පෙර නිමිත්තක් නොවේ.

පශු සම්පත් රක්ෂණ අංශය ගැන සලකා බලන විට, කෘෂි රක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් විසින් ඒ හා බැඳුණු ගැටළු සමහරක් හඳුනාගෙන ඇත.

i. පශු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණ ආවරණය ලබා දිය හැකි සෞඛ්‍ය මට්ටමින් යුතු සතුන් නොමැති වීම.
ii. ග්‍රාමීය මට්ටමේ ප්‍රමාණවත් තරම් පශු වෛද්‍යවරු නොමැති වීම.

දේශිය හා විදේශිය වශයෙන් ලබා දෙන පුහුණු වීම් නොමැති වීම නිලධාරීන් අධෛර්යමත් කරයි. විශේෂයෙන්ම ආසියාතික හා පැසිපික් කලාපයේ විදේශ රටවල පළපුරුද්ද හුවමාරු කර ගැනීම හා එම රටවල රක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

9.4 ගොවීන්ගේ යෝජනා

කෘෂිකර්ම රක්ෂණ වැඩසටහනේ දී පැන නැගී ඇති ගැටළු විසදීම හෝ අවම කරගැනීම සඳහා ගොවීන් ඉදිරිපත් කරන යෝජනා පිළිබඳ අධ්‍යනයේ දී අවධානය යොමු කරන ලදී. ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා විග්‍රහ කිරීමේ දී දිස්ත්‍රික්ක වශයෙන් ගෙන පෙළ ගස්වන ලදී. එම විග්‍රහයට අනුව යෝජනාවල ප්‍රමුඛතා හඳුනා ගනු ලැබීය.

සමීක්ෂණයට භාජනය කළ ගොවීන්ගෙන් 16%-39% පරාසයක් තුළ ගොවීන් විසින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් කෘෂිකර්ම රක්ෂණ වැඩසටහන පිළිබඳව ගොවීන් දැනුවත් කළ යුතු බව යෝජනා කරන ලදී. එම ප්‍රමාණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ දී 39%ක් හා දෙවනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ 35%ක් ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 26%ක් හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ 16%ක් ලෙස ද වාර්තා විය.

කුරුණෑගල හා අනුරාධපුර යන දිස්ත්‍රික්ක දෙකෙහි ගොවීන් 26%ක් ඔවුන් මුහුණපාන ඉහළ අවදානම නිසා කෘෂිකර්ම රක්ෂණ ක්‍රමයක අවශ්‍යතාවය අවධාරණය කර තිබුණි. සමීක්ෂණයට භාජනය කළ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් 17%ක් සෘජුව ම රක්ෂණ සමාගම් සමඟ ගනුදෙනු කිරීමේ අවස්ථාව ලබාදෙන ලෙස යෝජනා කර තිබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් වැඩි ම ප්‍රතිශතය (22%) යෝජනා කර තිබුණේ වගා ණය ලබා දීමේ දී වගා රක්ෂණය පූර්ව කොන්දේසියක් ලෙස ඉදිරිපත් නො කළ යුතු බවයි (ඇමුණුම 5).

ගොවීන් විසින් ඉදිපත් කරන ලද අනෙකුත් යෝජනා මේ සමඟ යාකර ඇත. එය කෘෂිකර්ම රක්ෂණ වැඩසටහන පිළිබඳ ගොවීන් අවධානය යොමුකර ඇති අනුපිළිවෙළ අනුව ම මෙහි දී දැක්වේ.

i. වගා රක්ෂණ ගිවිසුමට එළඹෙන විට රක්ෂණය මගින් ආවරණය කරනු ලබන හානි පිළිබඳ තොරතුරු හා ආවරණය ලබා දෙනු ලබන ගෙවීම් පිළිබඳ ගොවීන් හට තොරතුරු ලබා දිය යුතුය.
ii. කෘෂි රක්ෂණ ගිවිසුමෙහි ඇති එකඟතාවන් අනුව ම කටයුතු කළ යුතු වේ.
iii. රක්ෂණ ආවරණය ලබාදීමෙන් අනතුරුවද ගොවීන් පිළිබඳ සොයා බැලිය යුතු වේ.
iv. වගා හානි තක්සේරු කිරීමේ වැඩපිළිවෙළ සඳහා ගොවියාගේ සහභාගීත්වය ද ලබා ගත යුතු වේ.
v. මූලික අවස්ථාවේ වගා හානිය ඇස්තමේන්තු කිරීමේ කටයුතු කඩිනම් කළ යුතු වේ
vi. කෘෂිකර්ම රක්ෂණ නිලධාරීන් ඔවුන්ගේ වගකීම නියාමාකාර ව ඉෂ්ට කළ යුතු වේ.
vii. වගාව සම්පූර්ණයෙන් හානි වූ විට වගා ණය සම්පූර්ණයෙන් ගෙවා දැමීම සඳහා ප්‍රමාණවත් වන පරිදි ආවරණ වටිනාකම ලබා දිය යුතු වේ.
viii. කෘෂි රක්ෂණ වැඩසටහන හා බැඳී ඇති නිත්‍ය ගොවීන් සඳහා අතිරේක ප්‍රතිලාභ වශයෙන් දිරිදීමනා හඳුන්වා දිය යුතු අතර ඒ පිළිබඳව ගොවීන් දැනුවත් කළයුතුය.
ix. රක්ෂණ වාරිකය ඉහළ දැමිය යුතු වේ.
x. ක්ෂේත්‍ර මට්ටමේ රක්ෂණ නිලධාරීන් සහ ගොවීන් අතර මනා සබඳතාවයක් පවත්වාගෙන යා යුතුය.
xi. ලබාදෙන රක්ෂණ ප්‍රතිලාභය ඉහළ නැංවිය යුතු වේ.

xii. ගොවීන් සඳහා සෘජුව ම කෘෂිරක්ෂණ ආයතන සමඟ ගනු දෙනු කිරීමේ අවස්ථාව සලසා දිය යුතු වේ.

9.5 කෘෂි රක්ෂණ ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

කෘෂිරක්ෂණ මණ්ඩලයේ සේවක සංඛ්‍යාව ඉහළ නැංවීම සිදු කිරීම අවශ්‍ය වේ. එහි අනුමත සේවක සංඛ්‍යාව 457ක් වන අතර දැනට සේවයේ යොදා ඇත්තේ 303 දෙනෙකු පමණි. එසේම කෘෂි රක්ෂණ මණ්ඩල බී ශ්‍රේණියේ ව්‍යාවස්ථාපිත ආයතනයක් වුව ද එහි වැටුප් පරිමාණයන් බී ශ්‍රේණියේ ආයතනයකට වඩා අඩුය.

පසුගිය වසර 19ක කාලයක් තුළ දී ගොවීන් සහ ධීවරයින් සඳහා ක්‍රියාත්මක වන විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලබන ආවරණ මුදල වෙනසකට භාජනය වී නැත. එය ආයතනයෙහි අරමුදල් නාස්ති කිරීමක් බවට පත් වී තිබේ. එම නිසා සියලුම රක්ෂණ යෝජනා ක්‍රමයන්ගේ ආවරණ මුදල් ප්‍රමාණය වැඩි කළ යුතු අතර එම වැඩසටහන් ගොවි මහතුන්ගේ ආකර්ශනය දිනා ගැනීම සඳහා නැවත සංවිධානය කළ යුතු වේ.

කෘෂි රක්ෂණ මණ්ඩලයේ අවදානම අවම කිරීම සඳහා රජයේ මැදිහත් වීම අත්‍යාවශ්‍ය වේ. වී වගා රක්ෂණය කිරීම අනිවාර්යය කළ යුතුය. ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අදාළ දෙපාර්තමේන්තු සමඟ සහයෝගී ව වැඩසහනක් ක්‍රියාත්මක කළ යුතු වේ. වගා රක්ෂණ ක්‍රමය ජීවිත රක්ෂණය හා සම්බන්ධ කළ යුතු වේ. තව ද සුවසෙත රක්ෂණ ක්‍රමය දිවයින පුරා ව්‍යාප්ත කළ යුතු අතර ආකර්ෂණිය ප්‍රචාරණ වැඩසටහනක් දියත් කළ යුතුය.

අතිරේක යෝජනා කිහිපයක් පහත සඳහන් වේ

i. ජාතික ව්‍යසනයක දී සිදුවන හානි සමනය කිරීම සඳහා හොඳින් සංවිධානය වූ ජාතික ආයතනයක් සංවිධානය කර කාලීනව ක්‍රියාත්මක කළ යුතු වේ.
ii. වගා රක්ෂණ වැඩසහන ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල අනිවාර්ය කළ යුතුය.
iii. කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා සියලුම සහනාධාර සැපයීය යුතු අතර වගා රක්ෂණය අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස සැලකිය යුතු වේ.
iv. කෘෂිකර්මය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සැලසිය යුතු අතර එහිදී කෘෂි රක්ෂණයට ප්‍රමුඛතාවක් ලබා දිය යුතු වේ.
v. රාජ්‍ය බැංකුවලින් වගා ණය ලබා ගැනීමේ වගා රක්ෂණය අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස සැලකිය යුතු වේ.

දහවන පරිච්ඡේදය

නිගමන සහ යෝජනා

10.1 නිගමන

වර්තමාන කෘෂිකර්මික ක්ෂේත්‍රය තුළ කෘෂිකාර්මික රක්ෂණය, එක්තරා අවදානම් කළමනාකරණ උපකරණයක් වශයෙන් සැලකේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආයෝජන අවදානම අවම කරමින් එහි ආයෝජනයට ගොවීන් පෙළඹ වීම තුළින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඵලදායකත්වය ඉහළ නැංවීම ඒ තුළින් අපේක්ෂා කෙරේ. වර්තමානයේ වී වගා රක්ෂණය ශ්‍රී ලංකාව තුළ සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් පැතිර ඇති අතර ඊට අමතර ව විවිධ භෝගයන් සහ පශු සම්පත් ක්ෂේත්‍රය ද ආවරණය කර ඇත. කෙසේ නමුත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB) අධික අවදානම් කලාප ආවරණය කිරීමට පෙළඹවීමෙන් වැළකී සිටින්නේ මණ්ඩලයේ මූල්‍ය තත්වය එම අවදානම් සඳහා වන්දි ගෙවීමට තරම් ශක්තිමත් නොවීම මතයි. මෙම අධ්‍යයනය තුළින් හඳුනාගත් කරුණක් වූයේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, එය පිහිටු වීම තුළින් අපේක්ෂා කරන ලද අරමුණු ළඟා කර ගැනීමට අපොහොසත් වී ඇති බවකි.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB) 1977/78 මහ කන්නයේදී ශ්‍රී ලංකාවේ මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 40% ක ප්‍රමාණයක් රක්ෂණ ආවරණය කරන ලද අතර එම ප්‍රතිශතය 2004/05 මහ කන්නය වන විට 1% දක්වා කැපී පෙනෙන පහළ යාමක් වාර්තා කරන ලදී. මේ අතර කෘෂිකර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රගතිය සමඟ සැසඳීමේ දී පෞද්ගලික අංශයේ ආවරණය ලබා ගෙන ඇති වගා බිම් ප්‍රමාණය ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබයි. කෙසේ නමුත්, ගොවිජන රක්ෂණ මණ්ඩලය සහ පෞද්ගලික අංශය යන දෙඅංශය ම රක්ෂණය කර ඇති වගා බිම් ප්‍රමාණය ඉතාමත් අවම වන අතර 2004/05 මහ කන්නයේ එම දෙඅංශයම රක්ෂණ ආවරණයට යටත් කර තිබුනේ මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 2%ක පමණ ප්‍රමාණයකි. මෙම ප්‍රමාණය සඳහා පවා රක්ෂණ ආවරණය ලබා ගෙන තිබුණේ, වගා ණය ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. මේ තුළින් පැහැදිලි වන්නේ කෘෂිකාර්මික රක්ෂණ ප්‍රතිපත්තිය, ඉල්ලුමක් තුළින් ජනිත වන්නා වූ ප්‍රතිපත්තියක් නොවන බවයි (It is not a demand driven policy).

ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව තුළ බහුතරයක් වන සුළු පරිමාණ ගොවීන් සඳහා ඉතාමත් වැදගත් වන්නා වූ වැඩසටහනක් වශයෙන් වගා රක්ෂණ ක්‍රමය හඳුන්වා දී තිබුණ ද ඒ කෙරෙහි ගොවීන්ගේ විශ්වාසයක් නොමැති අතර ඒ සඳහා ඔවුන්ගේ දායකත්වය ද කැපී පෙනෙන ලෙස පහළ ගොස් ඇත. නිෂ්පාදන වියදම සමඟ සැසඳීමේ දී සහ, සිදු වූ වගා හානි ප්‍රමාණය සමඟ සැසඳීමේ දී ලැබෙන වන්දි ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම සහ වන්දි ගෙවීමේ දී සිදුවන ප්‍රමාදයන්, බොහොමයක් ගොවීන් මෙම වගා රක්ෂණ ක්‍රමය කෙරෙහි අප්‍රසාදය පළ කිරීම සඳහා හේතු වී තිබෙයි. එමෙන්ම හානි තක්සේරු කිරීම සහ වන්දි ගෙවීමේ විනිවිද භාවය ද අඩු මට්ටමක පවතින අතර හානි ප්‍රමාණය අඩුවෙන් තක්සේරු කිරීම ද ගොවීන්ගේ අප්‍රසාදය පිණිස හේතුවක් වශයෙන් හඳුනාගත හැකිය. මේ අනුව ගොවීන්ගෙන් බහුතරයක් වගා රක්ෂණය කෙරෙහි උනන්දුවක් නොදක්වන අතර එය එක්තරා අතිරේක බරක් වශයෙන් සලකනු ලබයි. යම් වගා හානියක දී වන්දි සැපයීම තුළින් ගොවීන්ට සහනයක් සැලසීම යන මණ්ඩලයේ මූලික අරමුණ පවත්වාගෙන යාම සඳහා මණ්ඩලය අපොහොසත් වී ඇති බව ඒ කෙරෙහි ගොවීන්ගේ සහභාගීත්වය පහළ යාම තුළින් පෙන්නුම් කෙරේ. මෙසේ ගොවීන්ගේ අඩු සහභාගීත්වය, මණ්ඩලය තුළ එක් ගොවියෙකු වෙනුවෙන් සිදු කරනු ලබන පරිපාලන වියදම් ඉහළ යාම, වාරික එකතු කිරීමේ වියදම හා හානි තක්සේරු වියදම් ඉහළ යාම කෙරෙහි හේතු වනු ලබයි.

වගා රක්ෂණ ක්‍රමයට දායක වී ඇති ගොවීන්ගෙන් 99%ක් ම ඒ සඳහා යොමු වී ඇත්තේ වගා ණය ලබා ගැනීම සඳහා ඇතැම් බැංකු විසින් ඉදිරිපත් කර ඇති පූර්ව කොන්දේසියක් හෝ රීතියක් ඉටු කිරීම සඳහාය. මෙයින් පැහැදිලි වන්නේ ගොවීන් වගා රක්ෂණයට දායක වී ඇත්තේ, තම වගා හානියක දී සිදු වන අවදානම ආවරණය කර ගැනීමේ අරමුණින් නොවන බවයි. වගා ණය ලබා ගැනීමේ අරමුණක් නොමැතිව වගා රක්ෂණයට දායක වී ඇති ගොවීන් රක්ෂණ ආවරණය ලබාගෙන ඇත්තේ තම වගා බිම් ප්‍රමාණයේ යම් හානියක් පහසුවෙන් සිදු විය හැකි කොටස සඳහා පමණි (Damage prone portion of their holdings). මේ අනුව පැහැදළි වන්නේ ස්වේච්ඡාවෙන් වගා රක්ෂණය කිරීමට පෙළඹෙන බවයි (Adverse Selection). ඒ හැරුණු විට තම වගාව සඳහා වගා ණය ලබා නොගන්නා ගොවීන් වගා රක්ෂණ ආවරණය ලබා ගැනීම සඳහා උනන්දුවක් දක්වනු නොලබයි. අධ්‍යයනයට ලක් කරන ලද දිස්ත්‍රික්ක හතර තුළම ගොවීන්ගේ මුළු නියැදියෙන් 59% ක පමණ ප්‍රමාණයක් කෘෂිකාර්මික ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ සෙලින්කෝ රක්ෂණ සමාගමේ ක්‍රියාත්මක වගා රක්ෂණ ක්‍රමය පිළිබඳ හෝ එහි ප්‍රතිලාභ හෝ ක්‍රියාත්මක වන ස්වභාවය පිළිබඳ හෝ මනා දැනුවත් වීමක් ලබා නොමැත. ගොවීන් සහ රක්ෂණ නිලධාරීන් අතර මනා සංනිවේදනයක් සිදු නොවීම, සංකීර්ණ වූ ඉල්ලුම්පත් පිරවීමේ ක්‍රමය ද ගොවීන් අතර මෙම වගා රක්ෂණ ක්‍රමය ව්‍යාප්ත නොවීමට එක්තරා හේතුවක් වශයෙන් සැලකිය හැකිය. වර්තමාන වගා රක්ෂණ ක්‍රමය තුළින් හානි සඳහා වන්දි ගෙවනු ලබන්නේ වගාවේ සිට අස්වනු නෙලා ගන්නා අවස්ථාව දක්වා පමණක් වන අතර, ඒවා අලෙවි කර ගැනීමේ අවස්ථාව දක්වා සිදු වන හානි සඳහා රක්ෂණ ආවරණයක් සපයනු නොලබයි. වර්තමානයේ ඇතැම් බැංකු විසින් වගා ණය සැපයීමේ දී අවශ්‍ය පූර්ව කොන්දේසියක් වශයෙන් වගා රක්ෂණ ක්‍රමය නොසලකන අතර, මේ තත්වය ඉදිරියේ දී වගා රක්ෂණ ක්‍රමයට ගොවීන්ගේ සහභාගීත්වය තවදුරටත් පහළ යාමේ අවදානමක් පෙන්නුම් කරනු ලබයි.

වන්දි ගෙවීමේ දී කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට සාපේක්ෂව පුද්ගලික අංශයේ (සෙලින්කෝ රක්ෂණ සමාගම), ඉහළ කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි. අධ්‍යයනයට ලක් වූ පෞද්ගලික අංශයේ රක්ෂණ ආවරණය ලබා ගත් නියැදියෙන් 60% ක් පමණ තම වන්දි මාසයක් හෝ දෙකක් ඇතුළත ලබා ගෙන ඇත. එමෙන්ම පෞද්ගලික අංශයේ ඉල්ලුම්පත් පිරවීමේ ක්‍රමය ද ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ඉල්ලුම්පත් පිරවීමේ ක්‍රමයට සාපේක්ෂව ඉතාමත් සරල වන අතර, ගොවීන්ට එය පහසුවකි. ඒ අනුව ගොවීන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කළ, කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සමඟ ගනුදෙනු කිරීමට සාපේක්ෂ ව, පෞද්ගලික අංශය සමඟ ගනුදෙනු කිරීම පහසු බවයි.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලන වියදම, වී වගා අංශයේ සහ අනිකුත් රක්ෂණ අංශවල වන්දි ගෙවීමට සාපේක්ෂ ව ඉහළ මට්ටමක පවතී. වන්දි ගෙවීම් ප්‍රමාණය, පරිපාලන වියදම් ප්‍රමාණය සහ මෙහෙයුම් වියදම යන සියලුම වියදම්, වාරික ආදායමට සාපේක්ෂ ව ඉතාමත් ඉහළය. පරිපාලනමය වශයෙන් පවත්නා දුර්වලතා, වාරික අයකිරීම්වල දී, වන්දි ගෙවීම්වල දී, හානි තක්සේරු කිරීමේ දී, සිදු වන යම් යම් අක්‍රමිකතා මෙම වගා රක්ෂණ ක්‍රමය පුළුල් ලෙස ව්‍යාප්ත වීම කෙරෙහි අයහපත් ලෙස බලපානු ලබයි.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ, රක්ෂණ යෝජනා ක්‍රමය කෙරෙහි ගොවීන් උනන්දුවක් දක්වන අතර, අවුරුදු 48න් පසු ලැබෙන විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් ගොවීන් තුළ යම් විශ්වාසයක් පැවතීම ඒ සඳහා හේතු වෙයි (මේ තත්වය 1995 සිට 2005 දක්වා කාලය තුළ මෙම රක්ෂණ ක්‍රමය කෙරෙහි ගොවීන්ගේ සහභාගීත්වය 106%කින් ඉහළ යාම තළින් පෙන්නුම් කෙරේ). එමෙන්ම සමහර වර්ෂවල ඉලක්කගත ප්‍රමාණයට සාපේක්ෂ ව සත්‍ය වශයෙන් රක්ෂණයට දායකවී ඇති ප්‍රමාණයේ ඉහළ යාමක් පෙන්නුම් කරයි (උදා: වශයෙන් 2001 වර්ෂයේ එය 120% කි). කෙසේ නමුත් රාජ්‍ය අනුග්‍රහය සීමා වීම මත මෙම විශ්‍රාම වැටුප් අරමුදල දුර්වල තත්ත්වයේ පවතී. ගෙවන විශ්‍රාම වැටුප් ප්‍රමාණය කිහිප වරක් ම ඉහළ දමමින් සංශෝධනය කළ ද එකතු කරනු ලබන වාරිකය, එහි ආරම්භයේ සිට ම එකම ප්‍රමාණයකි (සංශෝධනයට ලක් වී නොමැත). මේ තත්වය ද ගොවි විශ්‍රාම වැටුප්

අරමුදලේ අයහපත් තත්වය කෙරෙහි හේතු වී තිබේ. 2005 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම, එකතු වූ මුදලෙන් 257% කි.

පසුගිය වසර කිහිපය තුළම මණ්ඩලය විසින් වගා රක්ෂණ ක්‍රමය කෙරෙහි දක්වන ලද උනන්දුව (තබන ලද බර) පහළ ගොස් ඇත. 1995-2005 අතර කාලය තුළ වී වගා රක්ෂණ සඳහා දරණ ලද මෙහෙයුම් වියදම 87%කින් පහළ ගොස් ඇත. එමෙන්ම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් වී වගා රක්ෂණය වැඩි වශයෙන් වගා හානි අවම වූ මහා වාර්මාර්ග ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්ත කිරීමට උත්සාහ දරා ඇති අතර, මූල්‍යමය ස්ථායීතාවය උදෙසා අනිකුත් ලාභදායී රක්ෂණ ක්‍රම (සුවසෙත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය වැනි) වෙත නැඹුරු වීමක් දක්නට ලැබෙයි. මේ අනුව සමස්තයක් වශයෙන් නිගමනය කළ හැක්කේ, ස්වාභාවික උපද්‍රව තුළින් ගොවීන්ට සහන සැලසීම යන වගා රක්ෂණ ක්‍රමයේ ප්‍රධාන අරමුණ, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ඉටු කර ගැනීමට අපොහොසත් වී ඇති බවයි.

10.2 යෝජනා

- සාර්ථකව ක්‍රියාත්මක වන්නා වූ වගා රක්ෂණ ක්‍රමයක් සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් කඩිනම් අධීක්ෂණය, කඩිනම් හා නිවැරදි වගා හානි තක්සේරු ක්‍රමයක් සහ කලට වේලාවට ඉක්මණින් වන්දි ගෙවීමේ ක්‍රමයන් කෙරෙහි වඩාත් අවධානය යොමු කළ යුතුය. වන්දි ගෙවීමේ දී සිදු වන ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා, පරිපාලන ව්‍යුහය විමධ්‍යගත කිරීම සිදු කළ යුතු අතර, ඒ තුළින් දිවයින පුරා ඇති ශාඛා කාර්යාලවලින් වන්දි ගෙවීම සිදු කළ හැකිය. එමෙන්ම හානි තක්සේරු කිරීමේ දී එහි නිරවද්‍යතාවය තහවුරු කිරීම හා කඩිනමින් වන්දි ගෙවීම සඳහා ඒ කාර්යය සඳහා මනා ලෙස පුහුණුකළ නිලධාරීන් යෙදවීම අවශ්‍ය වේ. ඇස් මට්ටමින් සිදු කරන හානි තක්සේරු ක්‍රමය සඳහා අවම තාක්ෂණික ක්‍රම හෝ භාවිතා කිරීම වැදගත්ය.

- වගා රක්ෂණ ක්‍රමයේ දී රක්ෂණ ආවරණ වටිනාකම අවම වශයෙන් වගා කිරීම සඳහා දරණ පිරිවැයෙන් 2/3 ක් හෝ ආවරණය වන පරිදි වැඩි කළ යුතු අතර, එම ආවරණ වටිනාකම කාලීනව නිෂ්පාදන පිරිවැයට අනුකූලව ම සංශෝධනය කළ යුතුය. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රක්ෂණ වාරිකය සාධාරණ ලෙස ඉහළ දැමිය යුතුය. කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීමේ ව්‍යාප්ති වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු අතර එම කාර්යයන් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන හා කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර වරුන් සමඟ සම්බන්ධීකරණය කරමින් සිදු කළ හැකිය.

- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බැංකු මඟින් වගා ණය ගොවීන් වෙත නිකුත් කිරීමේ දී, වගා රක්ෂණය සඳහා දායක වීම අනිවාර්ය කළ යුතුය. රාජ්‍ය අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පොහොර සහනාධාර ක්‍රමය සමඟ ද මෙම වගා රක්ෂණ ක්‍රමය සම්බන්ධ කළ හැකිය. එමෙන්ම සාර්ථක වගා රක්ෂණ ක්‍රමයක් සඳහා දේශපාලන මැදිහත් වීම් තුළින් තොර වූ ශක්තිමත් පදනමක් තිබිය යුතුය.

- ප්‍රතිරක්ෂණ ක්‍රමය සහ මනා ලෙස පරිගණකගත කරන ලද දත්ත පද්ධතියක් ඇති කළ යුතුය.

- වන්දි ගෙවීම් ප්‍රමාණය අරමුදලෙන් 15% ඉක්මවන අවස්ථාවල දී, වගාරක්ෂණ ක්‍රමය සඳහා රාජ්‍ය මැදිහත් වීම අවශ්‍යය.

- ගොවීන් කණ්ඩායම් වශයෙන් රක්ෂණයට යොමු කිරීමෙන් සුළු පරිමාණ ගොවීන් සඳහා වන පරිපාලන වියදම් අඩු කිරීම කළ හැකි අතර, ගොවීන් තුළද සාමූහික වශයෙන් රක්ෂණය සඳහා සංවිධානය වීමේ වැඩි නැඹුරුතාවයක් ඇති වේ. මෙය ගොවීන්ට සහ රක්ෂණ ආයතන යන දෙපාර්ශවයටම වාසිදායක වේ.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Amarabandu, W. P. (1987), "Sri Lanka". *Crop Insurance in Asia,* Asian Productivity Organization, Tokyo.

Amarabandu, W.P. (1987), "Agricultural Insurance in Sri Lanka and Possible Private Sector Involvement". *Economic Review*, People's Bank Publication, Sri Lanka.

Agrarian and Agricultural Insurance Board of Sri Lanka (2001), "Annual Report", Agrarian and Agricultural Insurance Board of Sri Lanka, Colombo, Sri Lanka.

Agrarian and Agricultural Insurance Board of Sri Lanka (2002), "Annual Report", Agrarian and Agricultural Insurance Board of Sri Lanka, Colombo, Sri Lanka.

Central Bank of Sri Lanka (2003), "Annual Report", Central Bank of Sri Lanka, Colombo, Sri Lanka.

Ekanayake, C. M. (1991), "Sri Lanka". *Agricultural Insurance in Asia: Planning and Practices,* Asian Productivity Organization, Tokyo.

Haputantri, S. (1999), "Sri Lanka". *Development and Operation of Agricultural Insurance Schemes in Asia,* Asian Productivity Organization, Tokyo.

Hazell, P. *et al.* (1986), *"Crop Insurance for Agricultural Development",* Johns Hopkins University Press, Baltimore and London.

Mishra, P. K. (1996), "A study of the Impact and Design of India's Comprehensive Crop Insurance Scheme". *Agricultural Risk, Insurance and Income,* England.

Sandaratne, N. (1974), "Using Insurance to Reduce Risks in Peasant Agriculture". The Agricultural Development Council, U.S.A.

Siriwaradena, S. M. A. (1981), *"Experience of Crop Insurance Schems in Sri Lanka".* In Staff Studies, Central Bank of Sri Lanka, April/September, 1994, Vol. 8, pp 99-111.

Sivarajah, P. and Ahamad, A.N. (1989), "The paddy insurance in Sri Lanka- An Overview". *Economic Review*, People's Bank Publication, Sri Lanka.

ඇමුණුම 1: කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාල වල සිටින නිලධාරීන් සංඛ්‍යාව

දිස්ත්‍රික්කය	සහකාර අධ්‍යක්ෂ	සංවර්ධන නිලධාරීන්	ක්ෂේත්‍ර නිලධාරීන්
කොළඹ	1	1	2
ගම්පහ	1	2	3
කළුතර	1	2	3
නුවර	1	4	2
මාතලේ	1	3	1
නුවරඑළිය	1	2	3
ගාල්ල	1	2	4
මාතර	1	1	3
හම්බන්තොට	1	1	4
මඩකලපුව	1	1	2
යාපනය	1		1
අම්පාර	1	1	4
ත්‍රිකුණාමලය	1	1	4
කුරුණෑගල	1	5	
පුත්තලම	1	3	1
අනුරාධපුරය	1	1	5
පොළොන්නරුව බකමූණ (මහවැලි-G)	1	1	3
බදුල්ල	1	2	4
මොණරාගල	1	2	4
රත්නපුර	1	1	2
කෑගල්ල	1	3	1
මහව	1	2	3
උඩවලව (මහවැලි-U)		1	2
තඹුත්තේගම (මහවැලි-H)	1	1	4
ගිරාදුරුකෝට්ටේ (මහවැලි-C)	1	1	1
මනම්පිටිය(මහවැලි-B)			2
මන්නාරම	1		2
වව්නියාව			
කිලිනොච්චිය	1		2
මුලතිව්			
එකතුව	**26**	**44**	**72**

ඇමුණුම 2: සි/ස සෙලින්කෝ රක්ෂණ සමාගමේ වී වගා රක්ෂණයේ ක්‍රියාකාරිත්වය

කන්නය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්. '000) (1)	රක්ෂිත බිම් ප්‍රමාණය (හෙක්. '000) (2)	අයවූ වාර මුදල් (රු. '000) (3)	ගෙවූ වන්දි මුදල් (රු. '000) (4)	අයවූ වාර මුදල් හා ගෙවූ වන්දි මුදල් අතර වෙනස (රු. '000) (3)-(4)	දළ හානි දර්ශකය
1993 යල	289	0.42	310	64	247	0.21
1993/94 මහ	581	0.75	558	1,028	-470	1.84
1994 යල	349	0.28	206	112	94	0.54
1994/95 මහ	567	0.2	151	70	81	0.46
1995 යල	348	0.14	107	47	60	0.44
1995/96 මහ	499	0.43	317	215	102	0.68
1996 යල	250	0.02	16	-	16	0
1996/97 මහ	473	0.45	332	104	228	0.31
1997 යල	257	0.17	129	-	129	0
1997/98 මහ	574	0.57	423	262	161	0.62
1998 යල	298	0.43	100	34	66	0.34
1998/99 මහ	538	0.78	656	449	207	0.68
1999 යල	341	0.71	632	253	379	0.40
1999/00 මහ	549	1.96	3,897	2,135	1,762	0.55
2000 යල	812	2.25	2,006	1,127	879	0.56
2000/01 මහ	479	4.92	4,376	3,608	768	0.82
2001 යල	319	2.63	2,336	1,490	846	0.64
2001/02 මහ	531	5.12	4,512	2,422	2,090	0.54
2002 යල	319	2.85	2,565	1,816	747	0.71
2002/03 මහ	618	3.56	3,957	2,104	1,853	0.53
2003 යල	401	6.68	8,250	1,327	6,923	0.16
2003/04 මහ	542	11.55	15,335	20,148	-4,813	1.31
2004 යල	258	3.76	6,039	1,893	4,146	0.31

ඇමුණුම 3: කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වී වගා රක්ෂණයේ ක්‍රියාකාරිත්වය

කන්නය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්. '000) (1)	රක්ෂිත බිම් ප්‍රමාණය (හෙක්. '000) (2)	අයවූ වාර මුදල් (රු. '000) (3)	ගෙවූ වන්දි මුදල් (රු. '000) (4)	අයවූ වාර මුදල් හා ගෙවූ වන්දි මුදල් අතර වෙනස (රු. '000) (3)-(4)	දළ හානි දර්ශකය
1975 යල	624	54	800	1,299	-499	1.62
1975/76 මහ	1,147	198	3,854	4,734	-880	1.22
1976 යල	642	114	1,568	2,846	-1,278	1.81
1976/77 මහ	1,329	288	4,155	3,091	1,064	0.74
1977 යල	718	58	801	452	349	0.56
1978 යල	301	33	1,270	1,881	-611	1.48
1978/79 මහ	562	62	3,721	9,465	-5,744	2.50
1979 යල	255	22	1,301	3,503	-2,202	2.69
1979/80 මහ	628	38	3,037	4,706	-1,669	1.55
1980 යල	246	18	1,287	1,988	-701	1.54
1980/81 මහ	600	37	3,893	2,845	1,048	0.73
1981 යල	381	11	1,436	668	768	0.46
1981/82 මහ	508	34	5,032	6,059	-1,027	1.20
1982 යල	282	5	768	333	435	0.43
1982/83 මහ	633	24	3,567	2,120	1,447	0.59
1983 යල	237	6	953	1,126	-173	1.18
1983/84 මහ	623	34	6,499	13,416	-6,917	2.06
1984 යල	384	12	2,619	4,565	-1,946	1.74
1984/85 මහ	570	24	6,322	7,207	-885	1.14
1985 යල	312	11	2,803	4,693	-1,890	1.67
1985/86 මහ	555	30	7,373	16,146	-8,773	2.19
1986 යල	340	22	6,630	13,194	-6,564	1.99
1986/87 මහ	508	48	12,960	37,240	-24,280	2.87
1987 යල	273	20	5,750	10,060	-4,310	1.75
1987/88 මහ	533	40	12,100	17,437	-5,337	1.44
1988 යල	130	13	3,488	4,127	-639	1.18
1988/89 මහ	469	24	6,137	7,619	-1,482	1.24
1989 යල	258	13	3,266	3,128	138	0.96
1989/90 මහ	531	25	6,783	6,577	206	0.99
1990 යල	333	15	4,072	2,410	1,662	0.59
1990/91 මහ	501	38	10,378	6,533	3,845	0.63
1991 යල	329	16	4,231	2,683	1,548	0.63
1991/92 මහ	577	30	8,371	5,152	3,219	0.61
1992 යල	255	9	2,439	1,806	633	0.74
1992/93 මහ	546	23	10,103	3,616	6,487	0.36

ඉතිරි කොටස.........

කන්නය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්. '000) (1)	රක්ෂිත බිම් ප්‍රමාණය (හෙක්. '000) (2)	අයවූ වාර මුදල් (රු. '000) (3)	ගෙවූ වන්දි මුදල් (රු. '000) (4)	අයවූ වාර මුදල් හා ගෙවූ වන්දි මුදල් අතර වෙනස (රු. '000) (3)-(4)	දළ හානි දර්ශකය
1993 යල	289	11	4,479	2,350	2,129	0.52
1993/94 මහ	581	28	10,723	20,193	-9,470	1.88
1994 යල	349	11	6,413	6,689	-276	1.04
1994/95 මහ	567	50	30,554	21,484	9,070	0.70
1995 යල	348	16	8,926	4,471	4,455	0.5
1995/96 මහ	499	20	12,357	17,135	-4,778	1.39
1996 යල	250	6	3,751	2,577	1,174	0.69
1996/97 මහ	473	16	9,736	5,467	4,269	0.56
1997 යල	257	5	3,174	1,852	1,322	0.58
1997/98 මහ	574	10.18	6,597	1,003	5,594	0.15
1998 යල	298	4.42	2,657	4,818	-2,161	1.81
1998/99 මහ	538	8.27	5,373	4,337	1,036	0.81
1999 යල	341	4.89	2,930	1,472	1,458	0.50
1999/00 මහ	549	7.86	5,012	3,388	1,624	0.67
2000 යල	812	3.58	2,067	592	1,475	0.29
2000/01 මහ	479	3.72	1,653	2,689	-1,036	1.63
2001 යල	319	1.72	1,028	280	748	0.27
2001/02 මහ	531	2.2	1,499	992	507	0.66
2002 යල	319	1.8	1040	981	59	0.94
2002/03 මහ	618	4.7	3,361	2,860	501	0.85
2003 යල	401	3.7	2,632	944	1,688	0.36
2003/04 මහ	542	4	3,611	7,892	-4,281	2.18
2004 යල	258	2	1,488	679	809	0.46
2004/05 මහ		5.8	4,448	2,852	1,596	0.64

ඇමුණුම 4: ගොවියන් මුහුණුදුන් ගැටලු

ගැටලු	ප්‍රතිශතය
වන්දි නොගෙවීම පිළිබඳව හේතු නොදැක්වීම	17
කෘෂිකර්ම රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රමාණවත් දැනුවත් කිරීමක් නොමැති වීම	16
වන්දි මුදල ප්‍රමාණත් නොවීම සහ ප්‍රමාදවී ලබාදීම	16
කෘෂිකර්ම රක්ෂණ ක්‍රමය හා සම්බන්ධ නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව සහ අයථා ගනුදෙනු	12
වන්දි මුදල් ප්‍රමාදවීම නිසා, බැංකුවෙන් ලබාගත් කෘෂිකාර්මික ණය සඳහා පොලිය ඉහළයාම	8
නිත්‍යානුකූල නොවන වගා ඉඩම් රක්ෂණය කිරීමේ ගැටලු	6
වන සත්ව හානි සඳහා වන්දි මුදල් ලබාගැනීම අපහසුවීම	6
ආරම්භක අවදියේදී වගා හානි ඇස්තමේන්තු කිරීමේ ප්‍රමාදයන් නිසා නැවත වගා කිරීම ප්‍රමාදවීම	5
රක්ෂණ ගිවිසුමේ කොන්දේසි වලට අනුකූලවම කටයුතු සිදු නොවීම	4
රක්ෂණ වන්දි ඉල්ලුම්පත්‍රය ගොවීන්ට අවබෝධ කර ගැනීමට අපහසුවීම	4
සුළු වගා හානි නොසලකා හැරීම	3
ගොවීන් සහ කෘෂිකර්ම රක්ෂණ සමාගම අතර සෘජු සම්බන්ධතාවයක් නොමැති වීම	2
අස්වනු ලබාගන්නා අවදියේ සිදුවන වගා හානි ඇස්තමේන්තු කිරීම නොසලකා හැරීම	1
එකතුව	100

ඇමුණුම 5: ගොවියන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

යෝජනා	දිස්ත්‍රික්කය %			
	කුරුණෑගල	අනුරාධපුරය	පොළොන්නරුව	හම්බන්තොට
කෘෂිකර්ම රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ ගොවීන් සෘජුව දැනුවත් කිරීම	39	35	26	16
අවධානම ඉහළ අවස්ථා වලදී කෘෂිකර්ම රක්ෂණ අත්‍යාවශ්‍ය වේ	26	26	12	12
කෘෂික්ම රක්ෂණ හා සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන් සහ ගොවීන් යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීම	8	1	1	2
රක්ෂණ අනිවාර්යය කළයුතු නොවේ	-	2	8	22
ගෙවන වන්දි ප්‍රමාණය ඉහළ නැංවීම	5	11	11	8
ගොවීන්ට සෘජුවම කෘෂි රක්ෂණ සමාගම සමඟ සම්බන්ධතාවය පවත්වාගෙන යාමට අවස්ථාව තිබිය යුතුය	-	3	17	14
ගොවීන් සමඟ කෘෂිකර්ම රක්ෂණ ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ දීම වන්දි ලබාදෙන පිළිවෙල සහ අදාල වගා හානි පිළිබඳව තොරතුරු ලබාදීම	3	5	4	10
කෘෂි රක්ෂණ ගිවිසුමේ කොන්දේසි වලට අනුකූලවම අදාල කටයුතු සිදු කිරීම	3	3	2	3
වගා හානිය ඇස්තමේන්තු කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම	3	2	5	-
වගා හානිය තක්සේරු කිරීම සඳහා ගොවියාටද සහභාගී වීමට අවස්ථාවක් ලබාදීම	-	3	1	1
පළමු අදියරේදී වගා හානි ඇස්තමේන්තු කිරීම කඩිනමින් සිදු කිරීම	5	7	3	-
කෘෂි රක්ෂණ නිලධාරීන්ගේ වගකීම සම්පූර්ණයෙන්ම ඉටු කිරීම	3	-	1	1
වගාව සම්පූර්ණයෙන් හානි වූ අවස්ථාවේදී වගා ණය සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි වන්දි මුදල් ලබාදීම	-	1	2	1
නොකඩවා දිගටම කෘෂි රක්ෂණ වැඩ සටහන සමඟ සම්බන්ධවී ඇති ගොවීන් සඳහා අතිරේක ප්‍රතිලාභ ලබාදීම සහ ඒ පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම	-	-	3	3
රක්ෂණ ආවරණය මුදල වැඩි කිරීම	5	1	4	7
එකතුව	100	100	100	100